

ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

1979 අංක 28 දරන
දේශීය ආදායම් පනත

[සභානිකය සභාගත් කළේ 1979 මැයි මස 21 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1979 මැයි මස 25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : රු. 16.35 සි නැපැල් ගාස්තුව : රු. 1.00 සි

පටුන

වගන්තිය		පිටුව
1.	පුනුඩු නාමය	1

I වන පරිච්ඡේදය

ආදයම් බද්ද පැනවීම

2.	ආදයම් බද්ද පැනවීම	1

II වන පරිච්ඡේදය

බදු නියම කළ හැකි ආදයම

3.	බදු නියම කළ හැකි ආදයම	1
4.	සේවානියුක්තියෙන් ලැබෙන ලාභ	2
5.	ඉඩමක හා එහි ඇති වැඩිදියුණු කිරීමවල ශුද්ධ වාර්ෂික වටිනාකම	4
6.	ඉඩම සහ ඒවායේ වැඩිදියුණු කිරීම කුලියට දීමෙන් ඇතිවන ලාභ හෝ ආදයම ...	4
7.	ප්‍රාග්ධන ලාභ	4

III වන පරිච්ඡේදය

ආදයම් බද්දෙන් නිදහස් කිරීම

8.	ඇතැම් තැනැත්තන් (පුද්ගලයන් හැර) ඔවුන් ලබන ලාභ සහ ආදයම්වල මුළු ප්‍රමාණය හෝ ඉන් යම් කොටසක් මත ආදයම් බද්දෙන් නිදහස් කිරීම	10
9.	ඇතැම් නිලධරයන්ගේ සහ සේවා නියුක්තයන්ගේ ඇතැම් ලාභ සහ ආදයම්, ආදයම් බද්දෙන් නිදහස් කිරීම	14
10.	ලැබුන ඇතැම් පොලි ආදයම් බද්දෙන් නිදහස් කිරීම	19
11.	ඇතැම් ලාභාංශ ආදයම් බද්දෙන් නිදහස් කිරීම	20
12.	ඉඩම් සහ ඒවායේ වැඩිදියුණු කිරීම්වලින් ලබන ඇතැම් ලාභ සහ ආදයම්, ආදයම් බද්දෙන් නිදහස් කිරීම	21
13.	ඇතැම් සහනාධාර ආදයම් බද්දෙන් නිදහස් කිරීම	22
14.	ඇතැම් ප්‍රාග්ධන ලාභ, ආදයම් බද්දෙන් නිදහස් කිරීම	23
15.	ආදයම් බද්දෙන් විවිධ නිදහස් කිරීම	24
16.	සංචාරක හෝටල් හා සම්බන්ධ ඇතැම් ව්‍යවසායවල ලාභ සහ ආදයම්, ආදයම් බද්දෙන් නිදහස් කිරීම	25
17.	දිවර කර්මාන්තයෙහි, සත්ව පාලනයෙහි, පටපණුවන් ඇති කිරීමෙහි සහ කෘෂිකර්මාන්තයෙහි යෙදී සිටින ඇතැම් සමාගම්වල ලාභ සහ ආදයම්, ආදයම් බද්දෙන් නිදහස් කිරීම ...	26
18.	වෙළෙඳ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම හෝ සැදීම සඳහා වූ ඇතැම් කුඩා පරිමාණ ව්‍යවසායවල ලාභ සහ ආදයම්, ආදයම් බද්දෙන් නිදහස් කිරීම	27
19.	වී කෙටීම සඳහා වූ ඇතැම් ව්‍යවසායවල ලාභ සහ ආදයම්, ආදයම් බද්දෙන් නිදහස් කිරීම ...	28
20.	ඇතැම් ව්‍යවසායවල අපනයන ලාභ සහ ආදයම්, ආදයම් බද්දෙන් නිදහස් කිරීම ...	28
21.	ඇතැම් නිවාස ඉදිකිරීමෙන් සහ පළමුවන විකිණීමෙන් ලබන ලාභ, ආදයම් බද්දෙන් නිදහස් කිරීම	30
22.	ඇතැම් නිර්වාසික කොන්ත්‍රාත්කරුවන්ගේ ලාභ සහ ආදයම්, ආදයම් බද්දෙන් නිදහස් කිරීම ...	30

IV වන පරිච්ඡේදය

ලාභ හෝ ආදයම් නිශ්චය කිරීම

23.	ලාභ හෝ ආදයම් නිශ්චය කිරීම	31
24.	ලාභ සහ ආදයම් නිශ්චය කිරීමේ දී ඉඩ නොදිය යුතු අඩු කිරීම්	39

2—ඒ 32979—13,900 (79/02)

වගන්තිය පිටුව

V වන පරිච්ඡේදය

මුළු ව්‍යවස්ථාපිත ආදයම නිශ්චය කිරීම

25. ව්‍යවස්ථාපිත ආදයම් ආගණනය කිරීමේ පදනම 41
26. ලාභ බෙදී වෙන් කිරීම 42
27. මුළු ව්‍යවස්ථාපිත ආදයම 43
28. දරුවකුගේ මුළු ව්‍යවස්ථාපිත ආදයම ඔහුගේ දෙමව්පියකුගේ ආදයමට එකතු කළ යුතු බව 43

VI වන පරිච්ඡේදය

තක්සේරු කළ හැකි ආදයම නිශ්චය කිරීම

29. තක්සේරු කළ හැකි ආදයම ගණන් බැලීමේ දී මුළු ව්‍යවස්ථාපිත ආදයමින් කරනු ලබන අඩු කිරීම් 43

VII වන පරිච්ඡේදය

බදු අය කළ හැකි ආදයම නිශ්චය කිරීම

30. බදු අය කළ හැකි ආදයම 49
31. සුදුසුකම් ලබන ගෙවීම් සම්බන්ධයෙන් දීමනාවක් 50

VIII වන පරිච්ඡේදය

සමාගම් නොවන තැනැත්තන් සඳහා ආදයම් බදු අනු ප්‍රමාණ

32. සමාගම් නොවන තැනැත්තන් සඳහා ආදයම් බදු අනු ප්‍රමාණය 56

IX වන පරිච්ඡේදය

සමාගම්

33. වාසික සමාගම් ගෙවීමට යටත් ආදයම් බද්ද 59
34. නිර්වාසික සමාගම් ගෙවීමට යටත් ආදයම් බද්ද 61
35. ඇතැම් ලාභාංශ, ලබාගන්නා සමාගමේ තක්සේරු කළ හැකි ආදයමේ කොටසක් නොවන බව ... 62
36. තම කොටස්කරුවන් සමඟ කරන ගණුදෙනුවලින් ලැබෙන සමාගමක ලාභ 62
37. නිර්වාසික සමාගමකට ගෙවිය යුතු ලාභාංශවලින් සියයට පහක බද්දක් වාසික සමාගම් විසින් අඩු කිරීම 62
38. යම් ලාභාංශයකින් සියයට 33 1/3ක බද්දක් අඩුකර ගැනීමට වාසික සමාගමකට හිමිකම් ඇති බව 63
39. ඇතැම් බෙදා හරිනු නොලැබූ ලාභ බෙදා හරිනු ලැබූ ලෙස සැලකිය යුතු බව ... 64
40. සමාගමක ලාභ සහ ආදයම සමාගමේ අධ්‍යක්ෂවරයකු විසින් නතුකර ගන්නා අවස්ථාවක අදළ වන විධිවිධාන 67

X වන පරිච්ඡේදය

ධන බද්ද නියම කිරීම

41. ධන බද්ද අය කිරීම 67
42. මේ පරිච්ඡේදය අදළ නොවිය යුතු තැනැත්තෝ 67
43. ධනය යන්නෙහි අර්ථ කථනය 68
44. ඇතැම් දේපළ ධනයට ඇතුළත් විය යුතු බව 68
45. ඇතැම් දේපළ ධනයෙන් බැහැර කළ යුතු බව 69
46. දරුවකුගේ ධනය ඔහුගේ දෙමව්පියන්ගෙන් කෙනෙකුගේ ධනය සමඟ එකතු කිරීම ... 71
47. ශුද්ධ ධනය 71
48. බදු අය කළ හැකි ධනය 72
49. ධනය සමන්විත වන දේපළෙහි විවිධාකාරය 73
50. ගෙවිය යුතු ධන බද්ද එක්තරා ප්‍රමාණයක් නොඉක්ම විය යුතු බව 74

විනය්කිය පිටුව

XI වන පරිච්ඡේදය

ත්‍යාග බද්ද පැනවීම

51. ත්‍යාග බද්ද අය කිරීම 74
52. ත්‍යාගය යන්නෙහි අර්ථය 74
53. ඇතැම් පැවැරීම් ත්‍යාගවලට ඇතුළත් විය යුතු බව 75
54. සමහර පැවරීම්වලට ත්‍යාග ඇතුළත් නොවන බව 76
55. බදු ගෙවිය යුතු ත්‍යාග සහ ගෙවිය යුතු ත්‍යාග බද්ද ආගණනය කිරීම 77
56. ත්‍යාගවල වටිනාකම නිශ්චය කිරීම 78
57. ගෙවිය යුතු ත්‍යාග බද්දෙන් මුද්දර ගාස්තුව අඩු කිරීම 78
58. ඇතැම් අවස්ථාවල දී, ත්‍යාග බද්ද ගෙවීමට ත්‍යාගලාභියා යටත්වන බව 78

XII වන පරිච්ඡේදය

විශේෂ අවස්ථා

අ. දරුවෝ

59. දරුවකුගේ ආදායම සහ ධනය තක්සේරු කිරීම 79

ආ. භාරගැනුම්කරුවෝ, භාරකරුවෝ හා පොල්මෑකරුවෝ යනාදිහු

60. භාරගැනුම්කරුවන් සහ භාරකරුවන් විසින් වාර්තා සැපයිය යුතු බව සහ බදු ගෙවීමට ඔවුන් යටත් වන බව 81
61. අබලතාවකට පත් තැනැත්තකුගේ භාරකරුවකු ආදායම බද්ද ගෙවීමට යටත් වන බව ... 82
62. මියගිය තැනැත්තකු විසින් ගෙවිය යුතු බදු ගෙවීමට පොල්මෑකරුවකු යටත් වන බව ... 82
63. පොල්මෑකරුවන් විසින් සැපයිය යුතු වාර්තා හා පොල්මෑකරුවන් හා අර්ථලාභීන් බදු අය කර ගනු ලැබීමට යටත් බව 83
64. භවුල් භාරකරුවෝ හා පොල්මෑකරුවෝ 84

ඇ. භවුල් ව්‍යාපාර

65. භවුල් ව්‍යාපාරයක ආදායම තක්සේරු කිරීම 84
66. ඇතැම් අවස්ථාවල දී භවුල් ව්‍යාපාරයේ නාමයෙන් තක්සේරුවක් කළ යුතු බව ... 87

ඈ. වාසික භාවය

67. වාසික භාවය යන්නෙන් අදහස් වන්නේ කුමක් ද යන වග 88

ඉ. නිර්වාසික තැනැත්තන්ගේ බැදීම්

68. නිර්වාසික තැනැත්තකු වෙනුවෙන් තක්සේරු කරනු ලැබිය හැකි තැනැත්තෝ ... 89
69. ඇතැම් නිර්වාසික තැනැත්තන්ගේ බැදීම් 89
70. ඇතැම් ව්‍යාපාරවල ලාභ, පිරිවැටුමේ ප්‍රතිශතය මත ආගණනය කළ යුතු බව 91
71. අපනයන නිෂ්පාදන විකිණීමෙන් නිර්වාසික තැනැත්තකුට ලැබෙන ලාභ 91
72. නිර්වාසික තැනැත්තන්ගේ ඇතැම් ලාභ ආදායම් බද්දට යටත් වීම 91
73. ඇතැම් අවස්ථාවල දී නිර්වාසික තැනැත්තන්ගේ ආදායම නිදහස් කිරීම සහ ඇතැම් නිර්වාසික තැනැත්තන් අඩු කළ අනුප්‍රමාණ අනුව ආදායම් බදු ගෙවීමට යටත් වීම 92

වගන්තිය පිටුව

ඊ. නැව් කටයුතු සහ ගුවන් යානා කටයුතු

74. නිර්වාසික නැව් හිමියන්ගේ හෝ නැව් කුලියට් ගන්නන්ගේ ලාභ 92
75. නැවක ප්‍රධානයා අනුයෝජිතයකු බව 93
76. ආදයම් බද්ද ගෙවීම ගිහව ඇති විට ආපසු යාත්‍රා කිරීමට අවසර දීම ප්‍රතික්ෂේප කිරීම ... 93
77. නිර්වාසික ගුවන් යානා අයිතිකරුවන්ගේ හා ගුවන් යානා කුලියට ගන්නන්ගේ ලාභ ... 94
78. නිර්වාසික ගුවන් යානා අයිතිකරුවන්ගේ සහ කුලියට ගන්නන්ගේ ලාභවලට 74 (2) වන, 75 වන සහ 76 වන වගන්ති අදළ වීම 95

උ. රක්ෂණය

79. රක්ෂණ සමාගම්වල ලාභ නිශ්චය කිරීම 96
80. ජීවිත රක්ෂණ ව්‍යාපාරයෙන් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ලබන ලාභ නිශ්චය කිරීම ... 97

ඌ. ශ්‍රී ලංකාවෙන් පිට තැනැත්තන්ට ගෙවිය යුතු පොලි ආදියෙන් ආදයම් බදු අඩු කිරීම

81. ශ්‍රී ලංකාවෙන් පිට තැනැත්තන්ට ගෙවිය යුතු පොලියෙන් ආදයම් බදු අඩු කර ගැනීම ... 98

එ. ද්විත්ව බදු අය කිරීම්වල දී යහන

82. ද්විත්ව බදු සහන සඳහා වන ගිවිසුම්වල බලපෑම 99
83. පොදු රාජ්‍ය මණ්ඩල ආදයම් බද්ද සම්බන්ධයෙන් සහන 100
84. ශ්‍රී ලංකාවේ ධන බද්ද සම්බන්ධයෙන් දෙනු ලබන සහන 102

ඒ. සංචාරක ව්‍යාපාර හා සම්බන්ධ සමාගම්වල ඇතැම් ලාභ සහ ආදයම් සම්බන්ධ යහන

85. සංචාරක හෝටල හා සම්බන්ධ සමාගම්වල ඇතැම් ලාභ හා ආදයම වෙනුවෙන් ආදයම් බදු සහන 102

ඔ. ඇතැම් අවස්ථාවල දී ධන බද්ද අඩු කිරීම

86. ආදයම් බද්දෙහි හා ධන බද්දෙහි මුළු ගණන ඇතැම් සීමාවන් ඉක්මවන විට ධන බද්ද අඩු කිරීම ... 103

ඕ. විවිධ කරුණු

87. විශේෂ ලාභ හෝ ආදයම් මාර්ග සම්බන්ධයෙන් විධිවිධාන අදළ කිරීම 103
88. ඇතැම් ලාභාංශවලින් ලැබෙන ආදයමෙහි ඒ පිළිබඳ වූ අයබදු ද ඇතුළත් විය යුතු බව ... 103
89. රක්ෂණයෙන් ලැබෙන ඇතැම් ලැබීම් කෙසේ සලකනු ලැබිය යුතු ද යන වග 104
90. සමාජශාලාවල හා වෙළඳ සමිති ආදියෙහි ආදයම් නිශ්චය කිරීම 104
91. ඇතැම් ගනුදෙනු හා බැහැර කිරීම් සැලකිල්ලට නොගත යුතු බව 105

XIII වන පරිච්ඡේදය

වාර්තා යනාදිය

92. වාර්තා හා කොරතුරු සැපයිය යුතු බව 105
93. වෙනත් තැනැත්තන්ගේ ගණනට ලබාගත් හෝ වෙනත් තැනැත්තන්ට ගෙවනු ලැබූ ආදයම් පිළිබඳව වාර්තා සැපයිය යුතු බව 107
94. ගෙවිය යුතු කුලි පිළිබඳ වාර්තා පදිංචිකරු විසින් සැපයිය යුතු බව 107
95. නවාතැන්කරුවන් හා නේවාසිකයන් පිළිබඳ වාර්තා 107
96. වාර්තා සැපයීම පැහැර හැරීම සම්බන්ධයෙන් දණ්ඩනයක් නියම කිරීමට කොමසාරිස් ජනරාල් වරයාට ඇති බලය 108

වගන්තිය		පිටුව

XIV වන පරිච්ඡේදය

ස්වයං තක්සේරු කිරීමෙන් බද්ද ගෙවීම

97. ස්වයං තක්සේරු කිරීමෙන් බද්ද ගෙවීම 108

XV වන පරිච්ඡේදය

සේවායෝජකයන් විසින් සේවානියුක්තයන්ගේ පාරිශ්‍රමිකයෙන් ආදයම් බද්ද අඩු කිරීම

98. සේවායෝජකයන් විසින් ආදයම් බද්ද අඩු කළ යුතු බව 109
99. සේවායෝජකයන් විසින් කොමසාරිස් ජනරාල්වරයා වෙත දන්වීමක් කළ යුතු බව ... 109
100. ආදයම් බදු වක්‍ර අදළ කිරීම 110
101. සේවායෝජකයන්ට විධාන 112
102. සේවායෝජකයන් විසින් නිසි වාර්තා තබා ගත යුතු බව 113
103. ආදයම් බද්ද අඩුකිරීමෙන් පසු සේවායෝජකයන් සතු කාර්ය 113
104. නොගෙවන ලද හෝ වැඩියෙන් ගෙවන ලද ආදයම් බදු මුදල් විධිමත් කිරීම 114
105. අවශ්‍ය අඩුකිරීම් නොකරනු ලබන විට, සේවානියුක්තයා විසින් දන්වීමක් කළ යුතු බව ... 115
106. අඩුකරන ලද ආදයම් බද්ද සේවා යෝජකයන්ගේ වත්කම්වල කොටසක් නොවිය යුතු බව ... 115
107. ආදයම් බද්ද අඩුකිරීම හෝ ගෙවීම පැහැර හැරීම 115
108. සේවායෝජකයන් වෙත තක්සේරු කිරීම් නිකුත් කිරීම 116
109. අභියාචන 117
110. පැහැර හැරීම් සම්බන්ධයෙන් දණ්ඩනය 118
111. ගෙවන ලද බද්ද අඩු කිරීම 118
112. ආකෘති සම්බන්ධයෙන් මේ පරිච්ඡේදයේ විධිවිධානවලට අනුව ක්‍රියා කිරීම 118
113. අර්ථ නිරූපණය 119

XVI වන පරිච්ඡේදය

ඇතැම් අර්ථසාධක අරමුදල්වල මුදල් රඳවා ගැනීම

114. නිශ්චිත අර්ථසාධක අරමුදලක, දයකයාගේ බැරට තිබෙන මුදලින් සියයට 15 ක් එම මුදල් වෙනුවෙන් ගෙවිය යුතු බද්ද ගෙවීමට රඳවා ගත යුතු බව 120

XVII වන පරිච්ඡේදය

තක්සේරු කිරීම්

115. තක්සේරු කිරීම සහ අතිරේක තක්සේරු කිරීම 121
116. තක්සේරු දන්වීම 123

XVIII වන පරිච්ඡේදය

අභියාචන

අ. කොමසාරිස් ජනරාල්වරයා වෙත කරනු ලබන අභියාචන

117. කොමසාරිස් ජනරාල්වරයා වෙත කරනු ලබන අභියාචන 123

ආ. සමාලෝචන මණ්ඩලය වෙත කරනු ලබන අභියාචන

118. සමාලෝචන මණ්ඩලයෙහි සංයුතිය 125
119. සමාලෝචන මණ්ඩලය වෙත අභියාචන කිරීම 126
120. කොමසාරිස් ජනරාල්වරයා විසින් සමාලෝචන මණ්ඩලය වෙත අභියාචන යොමු කළ හැකි බව 127
121. සමාලෝචන මණ්ඩලය විසින් අභියාචන විභාග කිරීම සහ තීරණය කිරීම 127

ඇ. අභියාචනාධිකරණය වෙත කරනු ලබන අභියාචන

122. නීති ප්‍රශ්නයක් මත අභියාචනාධිකරණය වෙත කරනු ලබන අභියාචනය 128

XIX වන පරිච්ඡේදය

තක්සේරුකිරීම්වල අවසානාත්මක භාවය සහ වැරදි වාර්තා සම්බන්ධයෙන් දණ්ඩන

123. තක්සේරු හෝ සංශෝධිත තක්සේරු අවසානාත්මක විය යුතු බව 130
124. සාවද්‍ය වාර්තා සම්බන්ධයෙන් දණ්ඩනය 131

XX වන පරිච්ඡේදය

පැහැර හරිනු ලැබූ බද්ද සහ එයට එකතු කරනු ලබන මුදල්

125. පැහැර හරිනු ලැබූ බද්ද සහ එයට එකතු කරනු ලබන මුදල් 132

XXI වන පරිච්ඡේදය

බදු අයකර ගැනීම

126. බද්දට දඩ ආදිය ඇතුළත් විය යුතු බව 136
127. බද්ද ප්‍රථම වැය බරක් විය යුතු බව 136
128. පැහැර හරින්නන් වෙත කරනු ලබන දැනුම්දීම 137
129. කහනම කොට විකිණීමෙන් බද්ද අයකර ගැනීම 137
130. අයකර ගැනීම සඳහා මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නීති කාර්‍ය්‍ය ... 139
131. ණය ආදියෙන් බද්ද අයකර ගැනීම 140
132. පැහැර හරින ලද බදු සේවානියුක්තයාගේ පාරිශ්‍රමිකයෙන් අයකර ගත යුතු බව ... 142
133. භවුල්කරුවකුගේ පැහැර හරිනු ලැබූ බද්ද භවුල් ව්‍යාපාරයේ වත්කම්වලින් අයකර ගත යුතු බව... 144
134. දරුවකුගේ ආදායමෙන් හෝ ධනයෙන් ආදායම් බදු හෝ ධන බදු අයකර ගැනීම ... 144
135. අර්ථලාභියකු විසින් ගෙවිය යුතු ආදායම් බද්ද සහ ධන බද්ද භාරකරුවකුගෙන් අයකර ගැනීම 144
136. අර්ථලාභියකු විසින් ගෙවිය යුතු ආදායම් බද්ද හා ධන බද්ද පොල්මෑකරුගෙන් අයකර ගැනීම... 145
137. ඇතැම් අවස්ථාවල දී කෑගි බද්ද ත්‍යාග ලාභියාගෙන් අයකර ගත යුතු බව 145
138. ශ්‍රී ලංකාවෙන් බැහැර යන කැනැත්තන්ගෙන් බදු අය කර ගැනීම 145
139. බදු අය කරගැනීමේ මාර්ගවලින් එකකට වැඩි ගණනක් ප්‍රයෝජනයට ගැනීම ... 146
140. බදු අයකර ගැනීම සඳහා තොරතුරු ලබා ගැනීම පිළිබඳව කොමසාරිස් ජනරාල්වරයා සතු බලය 146
141. ඇවර කරනු ලබන පුද්ගලික සමාගමක අධ්‍යක්ෂවරයන්ගේ වගකීම 146
142. කොමසාරිස් ජනරාල්වරයාගේ බලතල හා කර්තව්‍ය පැවරීම 146

XXII වන පරිච්ඡේදය

විවිධ කරුණු

143. අක්සන හා දන්වීම් භාර දීම 147
144. දන්වීම්, තක්සේරු කිරීම් ආදියෙහි වලංගුභාවය 147
145. භවුල් ව්‍යාපාරයක් වෙනුවෙන් ප්‍රමුඛ භවුල්කරු ක්‍රියා කළ යුතු බව 148
146. සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් වෙනුවට ප්‍රධාන නිලධරයා ක්‍රියා කළ යුතු බව ... 149
147. බෙලහින වූ හෝ නිර්වාසික කැනැත්තන් වෙනුවෙන් කවරකු විසින් ක්‍රියා කළ හැකි ද යන බව 149
148. නියෝජිතයා ආරක්ෂා කිරීම 149

වගන්තිය පිටුව

XXIII වන පරිච්ඡේදය

ආපසු ගෙවීම

149. වැඩිපුර ගෙවනු ලැබූ බද්ද ආපසු ගෙවිය යුතු බව 150
150. ඇතැම් අවස්ථාවල දී ආපසු ගෙවන මුදලක් වෙනුවෙන් ගෙවිය යුතු පොළිය 152

XXIV වන පරිච්ඡේදය

වැරදි සහ දණ්ඩන

151. වාර්තා සැපැයීම පැහැර හැරීම, යාවද්‍ය වාර්තා සැපැයීම ආදිය සම්බන්ධයෙන් දඩුවම් ... 152
152. රහස්‍යතාව කඩ කිරීම හා වෙනත් කාරණා වැරදි වන බව 155
153. වංචාව ආදිය සම්බන්ධයෙන් දණ්ඩන විධිවිධාන 156
154. මේ පනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් යම් නඩු පැවැරීමක් හෝ වරදකරු කිරීමක් නොතකා බදු ගෙවිය යුතු බව 157
155. නඩු පැවැරීම් කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමතය ඇතිව විය යුතු බව 157
156. ප්‍රකාශ සහ ලේඛන සාක්ෂියේ දී අවශ්‍ය කිරීම 157

XXV වන පරිච්ඡේදය

පරිපාලනය

157. නිලධරයෝ 158
158. නිල රහස්‍යතාව 158

XXVI වන පරිච්ඡේදය

පොදු කාරණා

159. නියෝග 163
160. ආකෘති 164
161. ගොඩනැගිලි හෝ ස්ථාන සෝදිසි කිරීමට ඇති බලය 165

XVII වන පරිච්ඡේදය

1979 අප්‍රේල් මස 01 වන දින ආරම්භවන තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු ආදායම් බද්ද සම්බන්ධ විශේෂ විධිවිධාන

162. 1979 අප්‍රේල් මස 01 වන දිනයෙන් ආරම්භවන තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු ආදායම් බද්දට අදාළ වන විශේෂ විධිවිධාන 167

XXVIII වන පරිච්ඡේදය

166. අර්ථ නිරූපණය 172

XXIX වන පරිච්ඡේදය

1963 අංක 4 දරන දේශීය ආදායම් පනත අදාළ කිරීම

164. 1963 අංක 4 දරන දේශීය ආදායම් පනත අදාළ කිරීම 179
උපලේඛන 180

1979 අංක 28 දරන දේශීය ආදායම් පනත

[සභාතිකය සටහන් කළේ 1979 මැයි මස 21 වන දින]

එල්. ඩී.—ඕ. 80/78

1979 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බද්ද, ධන බද්ද සහ න්‍යාග බද්ද පැනවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **පුහුඹු නාමය.**

I වන පරිච්ඡේදය

ආදායම් බද්ද පැනවීම

2. (1) 1979 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහා ම, ඒ තක්සේරු වර්ෂය සඳහා සෑම තැනැත්තකුගේම ලාභ සහ ආදායම වෙනුවෙන් ආදායම් බද්ද— **ආදායම් බද්ද පැනවීම.**

(අ) ඒ තක්සේරු වර්ෂය තුළ දී ශ්‍රී ලංකාවෙහි වාසිකව සිටි තැනැත්තකු සම්බන්ධයෙන් වූ විට කොතැනක වුවද ඇති වන ලාභ හා ආදායම සම්බන්ධයෙන් ද

(ආ) වෙනත් සෑම තැනැත්තකු ම සම්බන්ධයෙන් වූ විට, ශ්‍රී ලංකාව තුළ ඇතිවන හෝ ශ්‍රී ලංකාවෙන් ලැබෙන හෝ ලාභ හා ආදායම සම්බන්ධයෙන් ද

මේ පනතේ පළමුවන, දෙවන සහ තුන්වන උපලේඛනවල සඳහන් නිසි ප්‍රමාණ අනුව, මේ පනතේ විධිවිධානවලට යටත්ව, අය කරනු ලැබිය යුතු ය.

(2) මේ පනතෙහි කාර්ය සඳහා "ශ්‍රී ලංකාව තුළ ඇතිවන හෝ ශ්‍රී ලංකාවෙන් ලැබෙන හෝ ලාභ හා ආදායම" යන්නට, ශ්‍රී ලංකාවෙහි දී කරනු ලැබූ සේවාවන්ගෙන් හෝ, ශ්‍රී ලංකාවෙහි වූ දේපළවලින් හෝ, කෙළින් ම නැතහොත් අනුයෝජිතයකුගේ මාර්ගයෙන් හෝ ශ්‍රී ලංකාවෙහි දී කරනු ලැබූ ව්‍යාපාරික, කටයුත්තකින් හෝ ලැබුණු සියලුම ලාභ හා ආදායම ඇතුළත් වේ.

II වන පරිච්ඡේදය

බදු නියම කළ හැකි ආදායම

3. මේ පනතේ කාර්ය සඳහා "ලාභ හා ආදායම" නැතහොත් "ලාභ" හෝ "ආදායම" යන්නෙන්— **බදු නියම කළ හැකි ආදායම.**

(අ) පවත්වාගෙන යනු ලැබූ හෝ කරගෙන යනු ලැබූ කාලසීමාව කෙතරම් කෙටි වුවද, යම් වෙළෙඳාමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින් හෝ රක්ෂාවකින් ලැබෙන ලාභ;

(ආ) යම් සේවානියුක්තියකින් ලැබෙන ලාභ;

(ඇ) වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රක්ෂාවක කාර්ය සඳහා පදිංචි වී නොසිටින තැනක් දුරට, අයිතිකරු විසින් හෝ අයිතිකරු වෙනුවෙන් හෝ පදිංචි වී සිටිනු ලබන යම් ඉඩමක හා ඒ ඉඩමෙහි වැඩිදියුණු කිරීම්වල ශුද්ධ වාර්ෂික වටිනාකම;

(ඈ) මේ වගන්තියේ (අ), (ආ) හෝ (ඇ) ඡේද යටතේ ලාභ හා ආදායම නිශ්චය කිරීමේ දී ගණන් ගනු නොලැබේ නම්, පදිංචිකරු විසින් කුලී නොගෙවා ප්‍රයෝජන ගනු ලැබූ යම් ඉඩමක හෝ ඒ ඉඩමෙහි වැඩිදියුණු කිරීම්වල හෝ ශුද්ධ වාර්ෂික වටිනාකම, නැතහොත් ඒ ඉඩමට හෝ වැඩිදියුණු කිරීම්වලට ගෙවන ලද කුලිය ශුද්ධ වාර්ෂික වටිනාකමට වඩා අඩුවන අවස්ථාවක ඒ එක් එක් අවස්ථාවේ දී පදිංචි කරුගේ ආදායම වශයෙන් සැලකිය යුතු කුලිය ඉක්මවා සිටින ඒ වාර්ෂික ශුද්ධ වටිනාකමෙහි අතිරික්තය;

(ඉ) ලාභාංශ, පොලී හෝ වට්ටම්;

(ඊ) අයවිම් හෝ වාර්ෂිකයන්;

(උ) කුලී, රාජ්‍යභාග හා අධිමිල;

(ඌ) ප්‍රාග්ධන ලාභ; සහ

(එ) අනියම් හා අනාවර්ත ස්වභාවයක ලාභ හැර, වෙනත් කවර වූ හෝ ප්‍රභවයකින් ලැබෙන ආදායම

අදහස් වේ.

සේවානියුක්තියෙන් ලැබෙන ලාභවලට

4. යම් සේවා නියුක්තියකින් ලැබෙන ලාභවලට—

(අ) සේවායෝජකගෙන් හෝ වෙනත් තැනැත්තන්ගෙන් ලැබුණ ද උද්ගත වුව ද—

(i) යම් වැටුපක්, වේතනයක්, දීමනාවක්, නිවාඩු පඩියක්, ගාස්තුවක්, විශ්‍රාම වැටුපක්, කොමිස් මුදලක්, ප්‍රසාද මුදලක්, පාරිතෝෂිකයක්, අමතර ලැබීමක් හෝ තම සේවා නියුක්තියෙහි යෙදී සිටින අතරතුර සේවා නියුක්තියකු විසින් ලබා ගන්නා වූ මුදලින් වූ එවැනි වෙනත් ගෙවීමක්;

(ii) යම් නිවාඩු ගමන් බලපත්‍රයක නැතහොත් යාන පත්‍රයක වටිනාකම ඇතුළුව සේවා නියුක්තයා හෝ සේවා නියුක්තයාගේ භාර්යාව නැතහොත් ස්වාමි පුරුෂයා හෝ දරුවකු හෝ දෙමව්පියන්ගෙන් කෙනකු හෝ ලබන යම් ප්‍රතිලාභවල වටිනාකම;

(iii) සේවා නියුක්තයාගේ හෝ සේවා නියුක්තයාගේ භාර්යාවගේ නැතහොත් ස්වාමිපුරුෂයාගේ හෝ දරුවාගේ හෝ දෙමව්පියන්ගෙන් කෙනකුගේ ප්‍රතිලාභය සඳහා වෙනත් යම් තැනැත්තකුට කරනු ලබන යම් ගෙවීමක්;

(ආ) යම් සේවානියුක්තයකුට සේවායෝජක විසින් කිසිදු අය කිරීමක් නොමැතිව දෙනු ලැබූ යම් වාහන පහසුකමක වටිනාකම හෝ එවැන්නක් මිල දී ගැනීම සඳහා එලෙස දෙනු ලැබූ යම් මුදලක්;

(ඇ) (i) යම් විශ්‍රාම පාරිතෝෂිකයක් හෝ විශ්‍රාම වැටුප් පරිවර්තනය කිරීමේ දී ලැබුණු යම් මුදලක්;

(ii) කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරනු ලැබූ අර්ථසාධක අරමුදලට යම් සේවා නියුක්තයකු විසින් දායක මුදල් වශයෙන් 1954 අප්‍රේල් මස 1 වන දිනට පසු ගෙවනු ලැබූ කොටස නියෝජනය වන මුදල නොවන විශ්‍රාම ගැනීමේ දී ඒ අරමුදලින් එම සේවා නියුක්තයාට ගෙවනු ලැබූ යම් මුදලක්;

(iii) (අ) යම් පරිපාලිත අර්ථසාධක අරමුදලකට යම් සේවා නියුක්තයකු විසින් ගෙවන ලද දායක මුදල් නියෝජනය කරන යම් කොටසක්; සහ

(ආ) යම් පරිපාලිත අර්ථසාධක අරමුදලකට 1968 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව සේවා යෝජක විසින් ගෙවන ලද දායක මුදල් ද ඒ දායක මුදල් මත උපචිත පොලිය ද සම්බන්ධයෙන් ඒ සේවා යෝජක විසින් සියයට පහළොව බැගින් වූ ප්‍රමාණයක් මත බදු ගෙවන ලද්දේ නම්, සේවා යෝජක විසින් ගෙවන ලද ඒ දායක මුදල හා උපචිත පොලිය නියෝජනය කරන ඒ මුදලෙහි යම් කොටසක් නොවන ඒ පරිපාලිත අර්ථසාධක අරමුදලින් ඒ සේවා නියුක්තයාට ගෙවන ලද යම් මුදලක්;

(iv) යම් ධුරයක් හෝ සේවා නියුක්තියක් අහිමිවීම සඳහා වන්දි වශයෙන් ලැබුණු යම් මුදලක්;

(ඈ) සේවා යෝජක විසින් කුලියක් නොමැතිව සපයනු ලැබූ යම් වාසස්ථානයක කුලී වටිනාකම හෝ සේවා යෝජක විසින් කුලී වටිනාකමට වඩා අඩු කුලියකට වාසස්ථානයක් සපයනු ලබන අවස්ථාවක ඒ කුලිය ඉක්මවා සිටින කුලී වටිනාකමෙහි අතිරික්තය

ඇතුළත් වේ.

මේ ඡේදයෙහි කාර්ය සඳහා යම් වාසස්ථානයක කුලී වටිනාකම, 5 වන වගන්තියෙහි අර්ථකථනය කර ඇති ශුද්ධ වාර්ෂික වටිනාකමට අයිතිකරු විසින් ගෙවනු ලබන වරිපනම් සහ අලුත්වැඩියා කිරීම් සහ වෙනත් වියදම් වෙනුවෙන් ඒ ශුද්ධ වාර්ෂික වටිනාකමෙන් සියයට තිස් තුනයි තුනෙන් එකක් එකතු කළ විට ලැබෙන මුදල් විය යුතු ය:

එසේ වුව ද (අ) සහ (ආ) ඡේදවල විස්තර කර ඇති ලාභවලින් සියයට පහළොවකට වඩා වැඩි, කුලී වටිනාකමෙහි යම් අතිරික්තයක් හෝ රුපියල් පහළොස් දහසක් යන මේ ප්‍රමාණ දෙකින් වඩා අඩු ප්‍රමාණය නොසලකා හැරිය යුතු ය.

ඉඩමක හා එයි ඇති වැඩිදියුණු කිරීම්වල ශුද්ධ වාර්ෂික වටිනාකම්.

5. (1) අලුත්වැඩියා කිරීම් හා වෙනත් වියදම් සඳහා සියයට විසිපහක අඩුකිරීම්වලට යටත්ව, ඉඩමක හා ඒ ඉඩමෙහි ඇති වැඩිදියුණු කිරීම්වල හෝ යම් වාසස්ථානයක හෝ ශුද්ධ වාර්ෂික වටිනාකම (බදුකරු වරිපනම් ද අයිතිකරු අලුත්වැඩියා කිරීම්වල වියදම් ද ගෙවන අවස්ථාවක) අවුරුදුවල වෙනසක් නැතිව බදුකරු විසින් ඉඩමකට හා වැඩිදියුණු කිරීම්වලට හෝ වාසස්ථානයට හෝ ගෙවනු ලබන්නේ යයි යුක්තිසහගතව බලාපොරොත්තු විය හැකි කුලිය අනුව නිශ්චය කරනු ලැබිය යුතු ය.

(2) පළාත් පාලන ආයතනයක් විසින් වරිපනම් නියම කිරීමේ කාර්යය සඳහා යම් ඉඩමක හා ඒ ඉඩමෙහි වැඩිදියුණු කිරීම්වල හෝ වාසස්ථානයක හෝ වාර්ෂික වටිනාකම තක්සේරු කර ඇති අවස්ථාවක ශුද්ධ වාර්ෂික වටිනාකම නිශ්චය කරනු ලැබුවේ යම් වර්ෂයක් සඳහා ද ඒ වර්ෂයෙහි ඒ ඉඩමෙහි හා වැඩිදියුණු කිරීම්වල නැත හොත් වාසස්ථානයෙහි වාර්ෂික වටිනාකම පළාත් පාලන ආයතනය විසින් කරනු ලැබූ තක්සේරුවෙන් නිරවද්‍ය ලෙස පෙන්නුම් කොට නොමැති බව කොමසාරිස් ජනරාල්වරයාගේ මතය වන්නේ නම් මිස, ඒ වාර්ෂික වටිනාකමින් සියයට විසිපහක් අලුත්වැඩියාකිරීම් හා වෙනත් වියදම් වෙනුවෙන් අඩු කළ විට එය ශුද්ධ වාර්ෂික වටිනාකම විය යුතු ය.

ඉඩම් සහ ඒ වායේ වැඩි දියුණු කිරීම් කුලියට දීමෙන් ඇති වන ලාභ හෝ ආදායම්.

6. ඉඩම් සහ ඒ වායේ වැඩිදියුණුකිරීම් බදු දීමෙන් ඇතිවන ආදායම හෝ ලාභ, ලබා ගත හැකි හා අය කර ගත හැකි දළ කුලී මුදලින් අයිතිකරු විසින් දැරිය යුතු වූ වරිපනම් අඩු කර, අලුත් වැඩියා කිරීම්වල වියදම් අයිතිකරු භාර ගෙන ඇති අවස්ථාවක ශේෂයෙන් සියයට විසිපහක් අඩු කළ පසු ඉතිරිවන මුදල විය යුතු නමුත් එය එවැනි ඉඩම් හා ඒ වායේ වැඩි දියුණුකිරීම් සම්බන්ධයෙන් අයකර ගත හැකි කුලිය, තත් කාලයේ බලපවත්නා යම් නීතියක් මගින් සීමාකර නොමැති අවස්ථාවක දී 3 වන වගන්තියේ (ඈ) ඡේදයේ අර්ථානුකූලව පදිංචිකරුගේ ආදායම වන යම් කොටසක් එයින් අඩු කිරීමෙන් පසු ඉතිරිවන ශුද්ධ වාර්ෂික වටිනාකමේ ප්‍රමාණයට අඩු නොවිය යුතු ය.

ප්‍රාග්ධන ලාභ.

7. (1) "ප්‍රාග්ධන ලාභ" යන්නෙන්, 3 වන වගන්තියේ (අ), (ඇ) හෝ (ඒ) ඡේදවල අර්ථානුකූල ව ලාභ හෝ ආදායම නොවන—

(අ) කවර ආකාරයකින් හෝ යම් දේපළක අයිතිය වෙනස් වීමෙන්;

(ආ) යම් දේපළක යම් අයිතිවාසිකමක් පවාරණය කිරීමෙන් හෝ අත් හැරීමෙන්;

(ඇ) යම් දේපළක ඇතැම් අයිතිවාසිකම් පැවරීමෙන්;

(ඈ) කොටස්, ණයකර හෝ වෙනත් බැඳීම් නිදහස් කිරීමෙන්;

(ඉ) සමාගමක් පිහිටුවීමෙන්;

(ඊ) ව්‍යාපාරයක් විසුරුවා හැරීමෙන් හෝ සමාගමක් ඇවර කිරීමෙන්;

(උ) වෙළෙඳ ව්‍යාපාරයක් හෝ සමාගම් දෙකක් හෝ වැඩි ගණනක් ඒකාබද්ධ කිරීමකින් හෝ බන්ධනය කිරීමකින්; හෝ

(ඌ) යම් කටයුත්තක් ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් එම කටයුත්තට පාර්ශ්වකරුවකු නොවන යම් තැනැත්තකුට කොමිස් මුදලක් හෝ තිළිණ මුදලක් ලැබෙන යම් ගණු දෙනුවකින්

ඇතිවන ලාභ හෝ ආදායම අදහස් වේ.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා සහ යම් තැනැත්තකුගේ ප්‍රාග්ධන ලාභය සම්බන්ධයෙන් යොදනු ලැබූ විට—

(අ) දේපළක අයිතිය වෙනස්වීමෙන් ඇතිවන ලාභ හෝ ආදායම යන්නෙන්, (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව, ඒ අයිතිය වෙනස්වීම සිදුවන අවස්ථාවේ දී ඒ දේපළෙහි වටිනාකම, ඒ තැනැත්තා විසින් ඒ දේපළ අත්කර ගත් අවස්ථාවෙහි පැවති වටිනාකමට වඩා වැඩි වූ මුදල් ප්‍රමාණය;

(ආ) යම් දේපළක යම් අයිතිවාසිකමක් පවාරණය කිරීමකින් හෝ අත්හැරීමෙන් හෝ ඇතැම් අයිතිවාසිකම් පැවරීමෙන් ඇතිවන ලාභ හෝ ආදායම යන්නෙන්, (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව, ඒ පවාරණය, අත්හැරීම හෝ පැවරීම සඳහා වූ ප්‍රතිඵලයෙහි වටිනාකම;

(ඇ) යම් කොටස්, ණයකර හෝ වෙනත් බැඳීම් නිදහස් කිරීමෙන් ඇතිවන ලාභ හෝ ආදායම යන්නෙන්, (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව නිදහස් කරනු ලැබූ දෙය ඔහු අත්කර ගන්නා ලද අවස්ථාවෙහි එහි වටිනාකම අඩු කොට නැතහොත් නිදහස් කරනු ලැබූ දෙය (3) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ හෝ (ඊ) ඡේදයේ හෝ (උ) ඡේදයේ හෝ (ඌ) ඡේදයේ සඳහන් කරනු ලැබූ යම් දේපළක් වන අවස්ථාවක, ඒ ඡේදයෙහි සඳහන් කරනු ලැබූ ඒ දේපළෙහි එම වටිනාකම අඩුකොට, ඒ නිදහස් කිරීම නිසා ඔහුට ලැබුණු දේපළ සියල්ලෙහි ම වටිනාකම;

(ඈ) සමාගමක් පිහිටුවීමෙන් යම් තැනැත්තකුට ඇතිවන ලාභ හෝ ආදායම යන්නෙන්, (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, ඒ සමාගම පිහිටුවීම සම්බන්ධයෙන් වූ යම් කටයුත්තක් සඳහා ඔහුට ලැබුණු ප්‍රතිඵලයෙහි වටිනාකම;

(ඉ) ව්‍යාපාරයක් විසුරුවා හැරීමෙන් හෝ සමාගමක් ඇවර කිරීමෙන් යම් තැනැත්තකුට ඇතිවන ලාභ හෝ ආදායම යන්නෙන්, (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, ඒ විසුරුවා හැරීම හෝ ඇවර කිරීම නිසා ඔහුට ලැබුණු සියලු දේපළවල වටිනාකම, ඒ ව්‍යාපාරයෙහි හෝ සමාගමෙහි ප්‍රාග්ධනයෙහි ඔහුගේ කොටස ඔහු විසින් අත්කරගනු ලැබූ අවස්ථාවෙහි එහි වටිනාකම ඉක්ම වන්නේ යම් ප්‍රමාණයකින් ද ඒ ප්‍රමාණය;

(ඊ) සමාගම් දෙකක් හෝ ඊට වැඩි ගණනක් ඒකාබද්ධ කිරීමෙන් හෝ බන්ධනය කිරීමෙන් ඇතිවන ලාභ හෝ ආදායම යන්නෙන් ඒ තැනැත්තා එකී සමාගම්වලින් කිසිවක

කොටස්කරුවකුව සිටි අවස්ථාවක නම් ඒ ඒකාබද්ධ කිරීම හෝ බන්ධනය කිරීම නිසා ඒ කොටස්කරුට ලැබුණු මුදලක් ද ඒ තැනැත්තා එකී සමාගම්වලින් කිසි වක කොටස්කරුවකුව නො සිටි අවස්ථාවක නම් ඒ ඒකා බද්ධ කිරීම හෝ බන්ධනය කිරීම සම්බන්ධයෙන් වූ යම් කටයුත්තක් සඳහා ඒ තැනැත්තාට ලැබුණු ප්‍රතිඵලයෙහි වටිනාකම; සහ

(ඌ) යම් කටයුත්තක් ප්‍රවර්ධනය කිරීමෙන් ඒ කටයුත්තට පාර්ශ්වකරුවකු නොවන යම් තැනැත්තකුට ඇතිවන ලාභ හෝ ආදායම යන්නෙන්, එකී ප්‍රවර්ධනය කිරීම සම්බන්ධ යෙන් ඔහුට ලැබුණු කොමිස් මුදලක් හෝ තිළිණ මුදලක් අදහස් වේ.

(3) "වටිනාකම" යන්න, "ප්‍රාග්ධන ලාභය" යන්නෙහි අර්ථ කථනයෙහි පද සම්බන්ධයෙන් යම් දේපළකට හෝ ප්‍රතිඵලයකට අදාළව යොදනු ලැබූ විට හා ප්‍රාග්ධන ලාභයක් ඇතිවන යම් තැනැත්තකු සම්බන්ධයෙන්, යොදනු ලැබූවිට පහත දැක්වෙන් පරිදි විය යුතුය:—

(අ) එවැනි ලාභයක් ඇතිවන්නේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා විසින් 1957 අප්‍රේල් මස 1 වන දිනට පෙර දේපළ අත්කර ගන්නා ලද අවස්ථාවක, (ඇ) ඡේදයෙහි, (ඈ) ඡේදයෙහි, (ඉ) ඡේදයෙහි, (ඊ) ඡේදයෙහි, (උ) ඡේදයෙහි සහ (ඌ) ඡේදයෙහි විධිවිධානවලට යටත් ව, ඒ තැනැත්තා විසින් ඒ දේපළ අත්කරගන්නා ලද අවස්ථාවේ දී දේපළෙහි වටිනාකම, 1957 අප්‍රේල් මස 1 වන දින ඒ දේපළෙහි වෙළෙඳ අගයට සමාන මුදලක් විය යුතු ය.

(ආ) එවැනි ලාභයක් ඇතිවන්නේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා විසින් 1957 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව දේපළ අත්කර ගන්නා ලද අවස්ථාවක, (ඇ) ඡේදයෙහි, (ඈ) ඡේදයෙහි, (ඉ) ඡේදයෙහි, (ඊ) ඡේදයෙහි, (උ) ඡේදයෙහි සහ (ඌ) ඡේදයෙහි විධිවිධානවලට යටත්ව ඒ තැනැත්තා විසින් ඒ දේපළ අත්කරගත්තා ලද අවස්ථාවෙහි දේපළෙහි වටිනාකම—

(i) ඒ අත්කර ගැනීම මිල දී ගැනීමකින් කරන ලද නම් ඒ මිල දී ගැනීමේ වියදමට සමාන මුදලක් විය යුතු ය; තව ද

(ii) ඒ අත්කර ගැනීම මිල දී ගැනීමකින් නොව අන්‍යාකාර යකින් කරන ලද නම් ඒ අත්කර ගන්නා ලද අවස්ථාවෙහි දේපළෙහි වෙළෙඳ අගයට සමාන මුදලක් විය යුතු ය.

(ඇ) එවැනි ලාභයක් ඇතිවන්නේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා විසින් ඒ දේපළ, භාරයක් යටතේ අර්ථලාභී යකු වශයෙන් හෝ මියගිය තැනැත්තකුගේ අන්තිම

කෑමති පත්‍රයේ සඳහන් වූ හෝ නොඑසේ වූ උරුමක්කාරයකු වශයෙන්, ඒ භාරයේ භාරකරු විසින් හෝ ඒ මියගිය තැනැත්තාගේ බූදලය පාලනය කිරීම සඳහා පත් කරන ලද පොල්මෑකරු විසින් කරන ලද පැවරීමක ප්‍රතිඵලයක් වශයෙන් අත්කර ගන්නා ලද විටක දී ඒ අත්කර ගැනීමේ අවස්ථාවෙහි ඒ දේපළෙහි වටිනාකම—

(i) ඒ භාරකරු හෝ පොල්මෑකරු හෝ විසින් ඒ දේපළ අත්කර ගැනීමේ දිනය 1957 අප්‍රේල් මස 1 වන දිනට පෙර දිනයක් නම්, 1957 අප්‍රේල් මස 1 දින ඒ දේපළෙහි වෙළෙඳ අගයට සමාන මුදලක් විය යුතු ය; තව ද,

(ii) ඒ භාරකරු හෝ පොල්මෑකරු හෝ විසින් ඒ දේපළ අත්කර ගැනීමේ දිනය 1957 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසු දිනයක් නම් ඒ දේපළ ඒ භාරකරු හෝ පොල්මෑකරු සන්තකයට පත් වූ අවස්ථාවේ දී, ඒ දේපළෙහි වෙළෙඳ අගයට සමාන මුදලක් විය යුතු ය.

(ඈ) ඒ ලාභය ඇති වන්නේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තාට ඒ දේපළෙහි සන්තකය, ඒ දේපළ සම්බන්ධයෙන් වෙනත් යම් තැනැත්තකුගේ ජීවිත බුක්තිය අවසන් වූ වහාම හෝ ඒ දේපළ සම්බන්ධයෙන් විශ්වසනීයයාගේ අයිතිවාසිකම් අවසන් වූ පසුව ලැබෙන අවස්ථාවක, පළමු සඳහන් කළ තැනැත්තා ඒ දේපළ අත්කර ගත් අවස්ථාවෙහි ඒ දේපළෙහි වටිනාකම—

(i) ඒ ජීවිත බුක්තිය හෝ විශ්වසනීයයාගේ අයිතිවාසිකම් හෝ අවසන් වූ දිනය 1957 අප්‍රේල් මස 1 වන දිනට පෙර දිනයක් නම් 1957 අප්‍රේල් මස 1 වන දින ඒ දේපළෙහි වෙළෙඳ අගයට සමාන මුදලක් විය යුතු ය; තව ද

(ii) ඒ ජීවිත බුක්තිය හෝ විශ්වසනීයයාගේ අයිතිවාසිකම් හෝ අවසන් වූ දිනය 1957 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසු දිනයක් නම්, ඒ දිනයෙහි ඒ දේපළෙහි වෙළෙඳ අගයට සමාන මුදලක් විය යුතු ය;

(ඉ) ඒ ලාභය ඇතිවන්නේ යම් තැනැත්තකුට ද, ඒ දේපළ ඒ තැනැත්තා වෙත 1957 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු නිකුත් කරන ලද ප්‍රසාද කොටස් වන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් ඒ දේපළ අත්කරගනු ලැබූ අවස්ථාවේ ඒ දේපළෙහි කිසිදු වටිනාකමක් නොමැති ලෙස සැලකිය යුතු ය;

(ඊ) ඒ ලාභය ඇතිවන්නේ යම් තැනැත්තකුට ද, ඒ දේපළ ඒ තැනැත්තා වෙත 1957 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු කොටසෙහි වෙළෙඳ අගයට වඩා අඩු මිලකට නිකුත් කරන

ලද කොටසක් වන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් ඒ දේපළ අත්කර ගනු ලැබූ අවස්ථාවේ ඒ දේපළෙහි වටිනා කම ඒ දේපළ අත්කර ගනු ලැබූ මිලට සමාන මුදලක් විය යුතු ය;

(ඇ) ඒ දේපළ, 1957 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ඒකාබද්ධ කරනු ලැබූ හෝ බන්ධනය කරනු ලැබූ සමාගම් දෙකක් හෝ ඊට වැඩි ගණනක් අතරින් යම් සමාගමක් තමාගේ යම් කොටස් වෙනුවට එකී ලාභය ඇති වූයේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තාට ලැබුණු, යම් කොටස් වලින් සමන්විත වන අවස්ථාවක ඒ දේපළ එසේ ලබා ගත් අවස්ථාවේ දී එහි වටිනාකම—

(i) පසුව සඳහන් කරන ලද කොටස් 1957 අප්‍රේල් මස 1 වන දිනට පෙර ඔහු විසින් අත්කර ගනු ලැබුවේ නම්, පසුව සඳහන් කරන ලද කොටස්වල 1957 අප්‍රේල් මස 1 වන දිනයෙහි වෙළෙඳ අගයට සමාන මුදල් ප්‍රමාණයක් විය යුතු ය; නැතහොත්

(ii) පසුව සඳහන් කරන ලද කොටස් 1957 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ඔහු විසින් අත්කර ගනු ලැබුවේ නම්, මිලට ගැනීමෙන් අත්කර ගන්නා ලද කොටස්වල මිලට ගැනීමේ පිරිවැයට සහ මිල දී ගැනීමෙන් නොව අන්‍යාකාරයකින් අත්කර ගන්නා ලද කොටස්වල අත්කර ගන්නා ලද දිනයෙහි වෙළෙඳ අගයට සමාන මුදල් ප්‍රමාණයක් විය යුතු ය.

(ඈ) ප්‍රාග්ධනයෙහි ආපසු ගෙවීමක් හෝ බෙදා දීමක් සිදුවූයේ යම් කොටස් සම්බන්ධයෙන් ද ඒ කොටස්වලින් දේපළ සමන්විත වන අවස්ථාවක, ඒ කොටස් අත්කර ගනු ලැබූ අවස්ථාවේ දී ඒ දේපළෙහි වටිනාකම—

(i) ඒ ලාභය ලැබූ තැනැත්තා විසින් 1957 අප්‍රේල් මස 1 වන දිනට පෙර ඒ කොටස් අත්කර ගනු ලැබුවේ නම්, එදිනට හෝ එදිනට පසු ආපසු ගෙවන ලද හෝ බෙදා දෙන ලද ප්‍රාග්ධනයේ ප්‍රමාණය මේ පනතේ අර්ථානුකූලව ලාභාංශයක් නොවූව හොත් ප්‍රාග්ධනයෙන් එසේ ආපසු ගෙවන ලද හෝ බෙදා දෙන ලද හෝ ප්‍රමාණය අඛණ්ඩ 1957 අප්‍රේල් මස 1 වන දින ඒ කොටස්වල වෙළෙඳ අගයට සමාන මුදල් ප්‍රමාණයක් විය යුතු ය; තව ද

(ii) ඒ ලාභය ඇති වූ තැනැත්තා විසින් ඒ කොටස් අත්කර ගනු ලැබුවේ 1957 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව නම්, මිල දී ගැනීමෙන් අත්කර ගන්නා ලද කොටස් මිල දී ගත් පිරිවැයට සමාන මුදලකින් ද, ඒ කොටස් අත්කර ගත්තේ මිල දී ගැනීමෙන් නොව, අන්‍යාකාරයකින් නම්, අත්කර ගන්නා ලද දිනයෙහි වෙළෙඳ අගයෙන් ද, ප්‍රාග්ධනයෙන් ආපසු ගෙවන ලද හෝ බෙදා දෙන ලද ප්‍රමාණය මේ පනතේ අර්ථානුකූලව ලාභාංශයක් නොවුවහොත් ඒ ප්‍රමාණය අඛණ්ඩ ලැබෙන මුදල් ප්‍රමාණයට සමාන මුදල් ප්‍රමාණයක් විය යුතු ය.

(ඒ) ඒ ලාභය ඇති වූයේ යම් ගනුදෙනුවකින් ද, ඒ ගනුදෙනුව සිදු වූ අවස්ථාවෙහි දේපලෙහි වටිනාකම—

(i) ඒ ගනුදෙනුව දේපල විකිණීමක් නම්, ඒ දේපල විකුණූ මිලට සමාන මුදලක් විය යුතු ය;

(ii) ඒ ගනුදෙනුව විකිණීමක් හැර අන් කිසිවක් වුවහොත්, ඒ ගනුදෙනුව සිදු වූ අවස්ථාවෙහි ඒ දේපලෙහි වෙළෙඳ අගයට සමාන මුදල් ප්‍රමාණයක් විය යුතු ය;

(ඒ) ඒ ලාභය ඇතිවන්නේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා ලබන කිසියම් ප්‍රතිඵලයක වටිනාකම—

(i) ප්‍රතිඵලය කොටසක් මුදලින් ද කොටසක් මුදල් නොවන වෙනත් දේපලකින් ද සමන්විත වන අවස්ථාවක, ඒ මුදලෙහි හා ඒ ගනුදෙනුව සිදු වූ දිනයෙහි ඒ වෙනත් දේපලෙහි වෙළෙඳ අගයෙහි එකතුවට සමාන මුදල් ප්‍රමාණයක් විය යුතු ය;

(ii) ඒ ප්‍රතිඵලය මුදල් නොවන වෙනත් දේපලකින් මුළුමනින් ම සමන්විත වන අවස්ථාවක, ඒ ගනුදෙනුව සිදු වූ දිනයෙහි ඒ දේපලෙහි වෙළෙඳ අගයට සමාන මුදල් ප්‍රමාණයක් විය යුතු ය; තව ද

(ඔ) යම් තැනැත්තකුගේ දේපලෙහි අයිතිය, විකිණීමක් මගින් වෙනස්වීමක දී, විකුණුම් මිල, විකිණීම සිදුවන අවස්ථාවෙහි දේපලෙහි වෙළෙඳ අගයට වඩා අඩු බව තක්සේරුකරුගේ මතය වන විට, විකුණුම් මිල හා ඒ වෙළෙඳ අගය අතර වෙනස ඇති වීමට යුක්ති සහගත හේතු තිබූ බවට ඒ තැනැත්තා තක්සේරුකරු සෑහීමට පත් කළහොත් මිස විකිණීම සිදුවන අවස්ථාවේ ඒ දේපලෙහි වටිනාකම, ඒ අවස්ථාවේ දේපලෙහි වෙළෙඳ අගයට සමාන වූ මුදල් ප්‍රමාණයක් විය යුතු ය.

(4) (2) වන උපවගන්තියේ කාර්ය සඳහා ප්‍රාග්ධන ලාභයක මුදල් ප්‍රමාණය, පහත දැක්වෙන අඩු කිරීම්වලට ඉඩ හැරීමෙන් පසු ආගණනය කරනු ලැබිය යුතු ය:—

(අ) ඒ ලාභය ලැබුනේ යම් ගනුදෙනුවකින් ද ඒ ගනුදෙනුව සිදු වීමට පෙරාතුව ම ඒ දේපලෙහි අයිතිකරු වූ තැනැත්තා විසින් හුදෙක් ඒ දේපල අත්කර ගැනීම සම්බන්ධයෙන් 1957 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව දරනු ලැබූ (ගැණුම් මිලක් වෙතොත් එය හැර) යම් වියදමක්;

(ආ) මේ පනතේ 23 වන වගන්තිය යටතේ හෝ 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 10 වන වගන්තිය හෝ 53 වන වගන්තිය හෝ 53අ වගන්තිය හෝ 53ආ වගන්තිය හෝ ආදායම් බදු ආඥාපනතේ 11 වන වගන්තිය

හෝ 32 වන වගන්තිය යටතේ ඒ දේපළට යම් වැඩි දියුණු කිරීම්, එකතු කිරීම් හෝ වෙනස් කිරීම් කිරීමේ දී යම දම වෙනුවෙන් කිසිම අඩු කිරීමකට ඉඩ දී නොමැති නම් ඒ දේපළට යම් වැඩි දියුණු කිරීම්, එකතු කිරීම් හෝ වෙනස් කිරීම් කිරීමේ දී, ඒ අයිතිකරු විසින් 1957 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව දරනු ලැබූ යම් වියදමක්;

(ඇ) ඒ ලාභය ලැබුනේ යම් ගනුදෙනුවකින් ද, නුදෙක් ඒ ගනු දෙනුව සම්බන්ධයෙන් ඒ අයිතිකරු විසින් දරනු ලැබූ යම් වියදමක්; සහ

(ඈ) යම් දේපළක අයිතියෙහි වෙනස්වීමක් සිදු වූ විට—

(1) ප්‍රාග්ධන ලාභය ලබන්නේ යම් තැනැත්තෙක් ද ඒ තැනැත්තා විසින් ඒ දේපළ අත්කර ගැනීමෙන් පසු අවුරුදු පහකට අඩු නොවන නමුත් අවුරුදු පහළොවක් නොඉක්මවන කාලයක් තුළ දී අයිතියෙහි වෙනස්වීම සිදුවන අවස්ථාවක, සියයට විසි පහකට සමාන මුදලක්, සහ

(2) ප්‍රාග්ධන ලාභය ලබන්නේ යම් තැනැත්තෙක් ද ඒ තැනැත්තා විසින්, ඒ දේපළ අත්කර ගැනීමෙන් පසු අවුරුදු පහළොවකට වැඩි කාලයක දී අයිතියෙහි වෙනස්වීම සිදුවන අවස්ථාවක—

(i) ඒ තැනැත්තා විසින් ඒ දේපළ අත්කර ගන්නා ලද අවස්ථාවේ දී (3) වන උපවගන්තියේ අර්ථානුකූලව ඒ දේපළෙහි වටිනාකම; සහ

(ii) (අ) ඡේදයෙහි හෝ (ආ) ඡේදයෙහි හෝ (ඇ) ඡේදයෙහි සඳහන් යම් වියදමක් අඩු කිරීමෙන් පසු අයිතියෙහි ඒ වෙනස්වීම සිදුවන අවස්ථාවේ දී ඒ දේපළෙහි අගය

යන දෙක අතර වෙනසින් සියයට පණහකට සමාන මුදල් ප්‍රමාණයක්.

III වන පරිච්ඡේදය

ආදායම් බද්දෙන් නිදහස් කිරීම

ඇතැම් තැනැත්තන් (පුද්ගලයන් හැර) ඔවුන් ලබන ලාභ සහ ආදායම්වල මුළු ප්‍රමාණය හෝ ඉන් යම් කොටසක් මත, ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

8. (අ) (i) සංස්ථාගත නීති අධ්‍යාපන සභාවේ ලාභ සහ ආදායම;

(ii) ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ ලාභ සහ ආදායම;

(iii) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ලාභ සහ ආදායම;

(iv) 1970 අංක 17 දරන ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩල පනත යටතේ පිහිටුවනු ලැබූ ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ ලාභ සහ ආදායම;

(v) 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත යටතේ පිහිටුවනු ලැබූ නැතහොත් පිහිටුවන ලදැයි සලකනු ලබන යම් විශ්ව විද්‍යාලයක ලාභ සහ ආදායම;

(vi) 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතින් හෝ ඒ පනත යටතේ හෝ පිහිටුවනු ලැබූ පොල් සංවර්ධන අධිකාරියේ, පොල් පර්යේෂණ මණ්ඩලයේ සහ පොල් වගා කිරීමේ මණ්ඩලයේ ලාභ සහ ආදායම;

(vii) ශ්‍රී ලංකා රජයේ නිලධරයන්ගේ වැන්දඹු සහ අනත් දරු විශ්‍රාම වැටුප් අරමුදලේ ලාභ සහ ආදායම;

(viii) පළාත් පාලන සේවය සඳහා පිහිටුවනු ලැබූ යම් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලක හෝ යෝජනා ක්‍රමයක ලාභ සහ ආදායම;

(ix) ලෝක සංචාරක සංවිධානයේ ලාභ සහ ආදායම;

(x) හුදෙක් විද්‍යාත්මක පර්යේෂණ කාර්ය සඳහා යම් ලිඛිත නීතියකින් පිහිටුවනු ලැබූ පොදු ස්වභාවයකින් යුත් යම් ආයතනයක හෝ භාරයක ලාභ සහ ආදායම;

(xi) එක්සත් ජාතීන්ගේ සංවිධානයට අයත් වූ හා ඒ සංවිධානය විසින් හෝ එය වෙනුවෙන් පරිහරණය කරනු ලබන්නා වූ ශ්‍රී ලංකාවෙහි පිහිටි යම් ඉඩමක හා ඒ ඉඩමෙහි වැඩි දියුණු කිරීම්වල ශුද්ධ වාර්ෂික වටිනාකම ඇතුළුව ඒ සංවිධානයේ ලාභ සහ ආදායම;

(xii) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 2 දරන එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක අනුස්මරණ ජාතික පදනම පනත යටතේ පිහිටුවනු ලැබූ එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනමේ ලාභ සහ ආදායම;

(xiii) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 36 දරන ශ්‍රී ලංකා ජාතික විද්‍යා සභා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා ජාතික විද්‍යා සභාවේ ලාභ සහ ආදායම;

(xiv) 1955 අංක 15 දරන ලංකා විද්‍යාත්මක සහ කාර්මික පර්යේෂණ පනත යටතේ පිහිටුවනු ලැබූ ලංකා විද්‍යාත්මක සහ කාර්මික පර්යේෂණ ආයතනයේ ලාභ සහ ආදායම;

(xv) ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ ලාභ සහ ආදායම;

(xvi) 1964 අංක 38 දරන ලංකා ප්‍රමිති කාර්යාංශ පනත යටතේ පිහිටුවනු ලැබූ ලංකා ප්‍රමිති කාර්යාංශයේ ලාභ සහ ආදායම;

(xvii) ආසියානු සංවර්ධන බැංකුවේ ලාභ සහ ආදයම;

(xviii) 1966 අංක 37 දරන ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ලාභ සහ ආදයම;

(xix) 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ 57(1) වන වගන්තිය යටතේ සංස්ථාපිත යම් සංචාරක ස්ථාන අධිකාරියක ලාභ සහ ආදයම;

(xx) 1966 අංක 10 දරන ලංකා සංචාරක මණ්ඩල පනත යටතේ පිහිටුවනු ලැබූ ලංකා සංචාරක මණ්ඩලයේ ලාභ සහ ආදයම;

(xxi) ජාත්‍යන්තර මුදල් සංස්ථාවේ ලාභ සහ ආදයම;

(xxii) සංවර්ධන මුදල් සංස්ථාවට ප්‍රදානය කරන ලද යම් ණය මුදලක් මත වූ පොළිය සහ වෙනත් අය කිරීම් වෙනුවෙන් යෙදෙන ලාභ සහ ආදයම වන්නා වූ, ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව හෝ අමාත්‍යවරයා විසින් අනුමත කළ වෙනත් යම් ජාත්‍යන්තර හෝ විදේශ සංවිධානයකු ලාභ සහ ආදයම;

(xxiii) සේවක අර්ථසාධක අරමුදල් සතු යම් මුදල් ආයෝජනයෙන් ලැබූ ලාභ සහ ආදයම වන්නා වූ එකී අරමුදලේ ලාභ සහ ආදයම;

(xxiv) ශ්‍රී ලංකා මහ බැංකුවේ ලාභ සහ ආදායම වන්නා වූ මුදල් මණ්ඩලයේ ලාභ සහ ආදයම;

(xxv) යම් ජාතික ලොතරැයියකින් ලැබූ ලාභ වන්නා වූ ජාතික ලොතරැයි මණ්ඩලයේ ලාභ සහ ආදයම;

(xxvi) සමුපකාර ව්‍යාපාරයට අදාළ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය කෙරෙහි සැලකිලිමත්ව ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දැන්වීමක් මගින් අමාත්‍යවරයා විසින් සඳහන් කරනු ලබන යම් ව්‍යාපාරයකින් සමුපකාර සමිතියක් ලබන ලාභ සහ ආදයම වන්නා වූ ද ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනතේ අර්ථානුකූලව ලියාපදිංචි කරනු ලැබූ සමිතියක් වන්නා වූ ද සාමාජිකයන්ගෙන් බහුතර සංඛ්‍යාව ශ්‍රී ලංකාවේ වාසිකයන් වන්නා වූ ද යම් සමිතියක ලාභ සහ ආදයම.

වෙනත් ලියාපදිංචි කළ සමිතියක් සාමාජිකයකු වන්නේ යම් ලියාපදිංචි කළ සමිතියක ද ඒ සමිතියේ සාමාජිකත්වය නිශ්චය කිරීමේ කාර්යය සඳහා, ඒ වෙනත් ලියාපදිංචි කළ සමිතියේ එක් එක් සාමාජිකයා එකී ලියාපදිංචි කළ සමිතියේ සාමාජිකයකු ලෙස සලකනු ලැබිය යුතු ය;

(ආ) (i) යම් පළාත් පාලන ආයතනයක් හෝ ආණ්ඩුවේ ආයතනයක් සතු වී ඇති හෝ ඒ ආයතනය විසින් පාලනය කරනු ලබන හෝ යම් භාරයක හෝ වෙනත් දෙයක ආදායම වන්නා වූ ද ඒ පළාත් පාලන ආයතනයට හෝ ආණ්ඩුවේ ආයතනයට වැඩදායී හිමිකමක් නොමැති ආදායම වන්නා වූ ද ආදායම හැර; සහ

(ii) 1971 අංක 35 දරන වෙළෙඳ ව්‍යාපාර (අත්කර ගැනීමේ) පනත යටතේ ආණ්ඩුව විසින් අත්කර ගනු ලැබූ හෝ ආණ්ඩුව වෙත සතු කරනු ලැබූ යම් වෙළෙඳ ව්‍යාපාරයක අවස්ථාවෝචිත පරිදි ඒ අත්කර ගැනීමේ හෝ සතුකර ගැනීමේ දින යෙන් ආරම්භ වන යම් කාල පරිච්ඡේදයක් සඳහා ලාභ සහ ආදායම් හැර

ඒ යම් පළාත් පාලන ආයතනයේ හෝ ආණ්ඩුවේ ආයතන යේ ආදායම;

(ඇ) (i) යම් විදේශීය රටක ආණ්ඩුවක් විසින් ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වෙත මුදලින්, බඩුවලින්, සේවාවලින් හෝ වෙනත් යම් ආකාරයකින් දෙනු ලැබූ ආධාර වලින් ඒ විදේශීය රටෙහි ආණ්ඩුව විසින් කෙළින් ම හෝ ඒ ආණ්ඩුවේ නියෝජ්‍යායතනයක් මගින් හෝ ලබා ගත් ලාභ සහ ආදායම වන්නාවූ ඒ විදේශීය රටෙහි ආණ්ඩුවේ;

(ii) චීන මහජන සමූහාණ්ඩුවේ ආණ්ඩුව විසින් හෝ ඒ ආණ්ඩුවේ යම්කිසි නියෝජ්‍යායතනයක් විසින් හෝ නාවි අයිතිකරු නැතහොත් නැව් කුලියට ගන්නා වශයෙන් වූ ව්‍යාපාරයකින් ලැබුවා වූ ද ඒ ආණ්ඩුව හා ශ්‍රී ලංකා ආණ්ඩුව අතර ඇති කර ගන්නා ලද යම් ගිවිසුමක සඳහන් ව ඇත්තා වූ ද ලාභ සහ ආදායම වන්නා වූ ඒ ආණ්ඩුවේ හෝ නියෝජ්‍යායතනයේ;

(iii) ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ජීවිත රක්ෂණ ව්‍යාපාර කටයුතු වෙනුවෙන් වූ ලාභ සහ ආදායම වන්නා වූ ඒ සංස්ථාවේ

ලාභ සහ ආදායම;

(ඈ) (i) පුණ්‍යායතනයක් විසින් කර ගෙන යනු ලබන යම් ව්‍යාපාරයක ලාභ, හුදෙක් ඒ ආයතනයේ පුණ්‍ය කාර්යයක් සඳහා යොදනු ලබන්නේ නම්, හා—

(අ) ඒ ව්‍යාපාරය හා සම්බන්ධ කටයුතු ප්‍රධාන වශයෙන් ඒ ආයතනයේ අර්ථලාභීන් විසින් ඉටු කරනු ලබන්නේ නම්, හෝ

(ආ) ඒ ආයතනය ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් ආධාර ලබන්නේ නම් සහ මේ මේදයේ සඳහන් කාර්ය සඳහා අමාත්‍යවරයා විසින් අනුමත කර ඇත්නම් සහ එහි ව්‍යාපාරය අනියම් ස්වභාවයක ව්‍යාපාරයක් නම්,

ඒ පුණ්‍යායතනය විසින් කර ගෙන යනු ලබන ව්‍යාපාරයක ලාභ වන්නාවූ ලාභ සහ ආදායම්;

(ii) (අ) එවැනි පුණ්‍යායතනයක් විසින් පාලනය කරනු ලබන යම් පොදු පූජනීය ස්ථානයක සහ එහි භූමියෙහි ද,

(ආ) හුදෙක් ඒ පුණ්‍යායතනයේ යම් කාර්යයක් සඳහා ඒ පුණ්‍යායතනය විසින් හිමිකර ගනු ලැබ වාසයට ගෙන ඇති යම් ස්ථානයක හෝ භූමියක ද

ශුද්ධ වාර්ෂික වටිනාකම වන්නාවූ ඒ පුණ්‍යායතනයේ ලාභ සහ ආදායම්;

(iii) ඒ පුණ්‍යායතනය විසින් පාලනය කරනු ලබන යම් පොදු පූජනීය ස්ථානයකට 1815 මාර්තු මස 2 වන දිනට පෙර රාජකීය ප්‍රදානයක් හෝ වෙනත් ප්‍රදානයක් මගින් තෑගි කරනු ලැබූ යම් දේපළකින් ලැබෙන ලාභ සහ ආදායම්, ඒ ප්‍රදානය කරනු ලැබුවේ යම් කාර්ය සඳහා ද ඒ කාර්යයන්හි ලා ඒ ලාභ සහ ආදායම් පාවිච්චි කරනු ලබන තාක් දුරට, ඒ දේපළින් ලැබෙන ලාභ සහ ආදායම වන්නාවූ ඒ පුණ්‍යායතනයේ ලාභ සහ ආදායම

ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

ඇතැම් නිලධරයන්ගේ සහ සේවා නියුක්තයන්ගේ ඇතැම් ලාභ සහ ආදායම්, ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

9. පහත දැක්වෙන පඩිනඩි, විශ්‍රාම වැටුප් සහ වෙනත් ප්‍රතිලාභ ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය:—

(අ) ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපති ධුරයෙන් යම් තැනැත්තකුට ලැබෙන පඩිනඩි, විශ්‍රාම වැටුප් සහ වෙනත් යම් ප්‍රතිලාභයක්;

(ආ) (i) රජයට ඉටුකරන ලද සේවා වෙනුවෙන් වූ පඩිනඩි වන්නාවූ, ජනරජය යටතේ ගෙවීම් ලබන යම් ධුර යක් දරන යම් තැනැත්තකුගේ;

(ii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 170 වන ව්‍යවස්ථාවේ අර්ථානුකූලව අධිකරණ නිලධරයකුගේ;

(iii) පළාත් පාලන ආයතනයක සේවා නියුක්තයකුගේ;

(iv) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 170 වන ව්‍යවස්ථාවේ අර්ථානුකූලව රාජ්‍ය සංස්ථාවක සේවා නියුක්තයකුගේ;

(v) 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත යටතේ පිහිටුවන ලද හෝ පිහිටුවන ලදැයි සලකනු ලබන යම් විශ්ව විද්‍යාලයක යම් සේවා නියුක්තයකුගේ ;

(vi) 1971 අංක 35 දරන වෙළෙඳ ව්‍යාපාර (අත්කර ගැනීමේ) පනත යටතේ ආණ්ඩුව විසින් අත්කර ගන්නා ලද හෝ ආණ්ඩුව වෙත සතු කරන ලද යම් වෙළෙඳ ව්‍යාපාරයක සේවා නියුක්තයකුගේ ;

(vii) සියලුම සාමාජිකයන් ජනාධිපතිවරයා විසින් හෝ අමාත්‍යවරයකු විසින් හෝ පත් කරනු ලබන යම් මණ්ඩලයක් හෝ පරීක්ෂණ කොමිෂන් සභාවක් වන, යම් පනතක් මගින් හෝ යම් පනතක් යටතේ පිහිටුවන ලද යම් මණ්ඩලයක හෝ කොමිෂන් සභාවක සාමාජිකයකුගේ හෝ සේවා නියුක්තයකුගේ

නිල පඩිනඩි සහ යම් තැනැත්තකු විසින් හෝ වෙනත් තැනැත්තකු විසින් (i) වන, (ii) වන, (iii) වන, (iv) වන, (v) වන හෝ (vi) වන් විෂයයන්හි සඳහන් නිලධරයකු හෝ සේවා නියුක්තයකු වශයෙන් මේ පනත ආරම්භවීමට පෙර හෝ පසුව හෝ වුවද ඉටු කරන ලද ඉකුත් සේවා සම්බන්ධයෙන් ඒ තැනැත්තාට ලැබුණු 4 වන වගන්තියෙහි (ඇ) ඡේදයෙහි සඳහන් යම් විශ්‍රාම වැටුපක් හෝ සේවා නියුක්තියෙන් ලැබුණු යම් ලාභ ;

(ඇ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නා වූ ද—

(i) තමා හා ශ්‍රී ලංකාවේ ආණ්ඩුව හා අතර හෝ තමා හා ඒ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබිය හැකි යම් රාජ්‍ය සංස්ථාවක් හෝ ආයතනයක් හා අතර ඇති කරගත් සේවා නියුක්ති ගිවිසුමක් මත ශ්‍රී ලංකාවෙහි සේවයෙහි නියුක්ත කරනු ලැබුවාවූ ද ; නැතහොත්

(ii) (අ) ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් ; හෝ

(ආ) යම් රාජ්‍ය සංස්ථාවක් විසින් ; හෝ

(ඇ) ශ්‍රී ලංකාවේ ආණ්ඩුව හෝ ඒ රාජ්‍ය සංස්ථාව හෝ විසින් ප්‍රාග්ධනයට දායක මුදලක් ගෙවනු ලැබුවා වූ ද, අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබුවා වූ ද, වෙනත් යම් සංස්ථාගත කරන ලද මණ්ඩලයක් විසින්

කර ගෙන යනු ලබන යම් ව්‍යාපෘතියක යම් සේවාවන් ඉටු කිරීමෙහි ලා යෙදී සිටින්නා වූ ද ;

(iii) 16 වන වගන්තිය අදාළ වන්නා වූ ව්‍යවසායක අයිති කරු විසින් හෝ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා පනතේ 17 වන වගන්තිය යටතේ මහා කොළඹ ආර්ථික කොමිෂන් සභාව විසින් ගිවිසුමකට එළඹ ඇති අධිව්‍යවසායක් වන යම් ව්‍යවසායක් විසින් ඒ ව්‍යවසායේ කාර්ය සඳහා ශ්‍රී ලංකාවට ගෙන්වා සේවයෙහි නියුක්ත කරනු ලැබුවා වූ ද ; හෝ

(iv) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දැන්වීමක් මගින් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ හා ඒ අනුමත කිරීම ඒ දැන්වීමෙහි සඳහන් කරනු ලැබිය හැකි යම් කාලයක් සඳහා විය යුතු, එවැනි යම් ව්‍යවසායක අයිතිකරු විසින් ශ්‍රී ලංකාවට ගෙන්වා සේවයෙහි නියුක්ත කරනු ලැබුවා වූ ද

විද්‍යාඥයකු, කාර්මික ශිල්පියකු, විශේෂඥයකු හෝ උපදේශකයකු වන යම් පුද්ගලයකුගේ ශ්‍රී ලංකාවේ දී ඇති වන පඩිනඩි හා ශ්‍රී ලංකාවේ දී ඇති නොවන යම් ආදායමක් :

එසේ වුව ද,

(1) (iii) වන අනුඡේදයේ සඳහන් ව්‍යවසායක සේවයෙහි නියුක්ත කරනු ලැබූ පුද්ගලයකු සම්බන්ධයෙන් වන විට ඒ පුද්ගලයා ඒ ව්‍යවසායේ ස්වකිය සේවා නියුක්තිය නතර කළ දිනය හෝ අවස්ථාවෝචිත පරිදි, 16 වන වගන්තියෙන් හෝ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා පනතේ 17 වන වගන්තිය යටතේ ඇතිකර ගන්නා ලද ගිවිසුමකින් ඒ ව්‍යවසාය සම්බන්ධයෙන් දෙන ලද බදු නිදහස අවසන වන දිනය යන මේ දින දෙකින් කළින් එළඹෙන දිනයෙන් පසු ; සහ

(2) (iv) වන අනුඡේදයේ සඳහන් අනුමත කරන ලද ව්‍යවසායක සේවයේ නියුක්ත කරනු ලැබූ පුද්ගලයකු සම්බන්ධයෙන් වන විට, ඒ පුද්ගලයාගේ ඒ ව්‍යවසායේ ස්වකිය සේවා නියුක්තිය නතර කළ දිනය හෝ ඒ ව්‍යවසාය අනුමත ව්‍යවසායක් වීම අවසන් වන දිනය යන මේ දින දෙකින් කළින් එළඹෙන දිනයෙන් පසු

ඒ පුද්ගලයාගේ පඩිනඩි ආදායම් බද්දෙන් නිදහස් කරනු නොලැබිය යුතු ය.

(ඈ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නා වූ ද 16 වන වගන්තියේ හෝ 23 (1) (ආ) (ii) වන වගන්තියේ සඳහන් එවැනි යම් ව්‍යවසායක අයිතිකරු විසින් ශ්‍රී ලංකාවට ගෙන්වනු ලැබ ලංකා සංචාරක මණ්ඩලයේ නිර්දේශය පිට අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන යම් තත්ත්වයක සේවයෙහි නියුක්ත කරනු ලැබුවා වූ ද, යම් පුද්ගලයකුගේ, ශ්‍රී ලංකාව තුළ වූ සේවා නියුක්තියේ දිනයෙහි සිට ගණන් ඛලනු ලැබූ අවුරුදු තුනක් කාලයක් සඳහා ශ්‍රී ලංකාවේ දී ඇතිවන පඩිනඩි සහ ශ්‍රී ලංකාවේ දී ඇති නොවන යම් ආදායමක් ;

(ඉ) 22 වන වගන්තිය යටතේ ආදායම් බද්දෙන් නිදහස් වන ලාභ ඇත්තා වූ ගිවිසුමක් ඉටුකිරීමෙහි ලා ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නා වූ ද, ශ්‍රී ලංකාවට ගෙන එනු ලැබ සේවයෙහි නියුක්ත කරනු ලැබුවා වූ ද, යම් පුද්ගලයකුගේ ශ්‍රී ලංකාවේ දී ඇතිවන පඩිනඩි හා ශ්‍රී ලංකාවේ දී ඇති නොවන යම් ආදායමක් :

(ඊ) (i) වෙනත් යම් රටක ආණ්ඩුවක (කිනම් නාමයකින් හෝ පදවි නාමයකින් හඳුන්වනු ලැබුව ද) ශ්‍රී ලංකාවේ සිටින රාජ්‍ය තාන්ත්‍රික නියෝජිතයාගේ ;

(ii) (i) වන අනුඡේදයේ සඳහන් කරනු ලැබූ යම් රාජ්‍ය තාන්ත්‍රික නියෝජිතයකු, කොන්සල්වරයකු හෝ වෙළෙඳ කොමසාරිස්වරයකු විසින් නියෝජනය කරනු ලබන ඒ රාජ්‍ය තාන්ත්‍රික නියෝජිතයකුගේ කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයකු, ඒ කොන්සල්වරයා හෝ වෙළෙඳ කොමසාරිස්වරයා සහ එකී කොන්සල් වරයාගේ හෝ වෙළෙඳ කොමසාරිස්වරයාගේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු ඒ තැනැත්තා විසින් නියෝජනය කරන රටේ නේවාසික ශ්‍රී ලංකාවේ අනු රූප නිලධරයකු ඒ රට විසින් ඒ ආකාරයෙන් ම බද්දෙන් නිදහස් කරනු ලබන හෝ ලැබිය හැකි බවට අමාත්‍යවරයා සෑහීමට පත්ව නිදහස් කිරීම ඔවුන් කෙරෙහි අදාළ විය යුතු බව ප්‍රකාශ කරන්නේ නම්, ශ්‍රී ලංකාවේ දී ඔවුන්ගේ ඇතිවන නිල පඩිනඩි හා ශ්‍රී ලංකාවේ දී ඇති නොවන හෝ ශ්‍රී ලංකාවෙන් ලබා නොගත් යම් ආදායමක් :

එසේ වුව ද යම් තැනැත්තෙක් ශ්‍රී ලංකාව තුළ වෙන යම් සේවා නියුක්තියක් හෝ වෙළෙඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් පවත්වා ගෙන යන්නේ නම් හෝ කරගෙන යන්නේ නම් ඒ තැනැත්තා සම්බන්ධයෙන් නිදහස් කිරීම අදාළ නොවිය යුතු ය.

(iii) ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ යම් විශේෂිත නියෝජ්‍යායතනයක් මගින් හෝ ඇමෙරිකා එක්සත් ජනපදයේ සිවි විෂය ආධාර පිළිවෙල යටතේ හෝ (කාර්මික ආධාර අංශය ඇතුළුව) කොළඹ ක්‍රම සංවිධානය මගින් හෝ සමාකාර ස්වභාවයක් ඇති බවට අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ වෙනත් යම් සංවිධානයක් මගින් හෝ ශ්‍රී ලංකාවට ගෙන්වනු ලැබුවාවූ ද ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් වේතන හෝ ප්‍රධාන පඩිනඩි ගෙවනු නොලබන්නාවූ ද, යම් විශේෂඥයකුගේ, උපදේශකයකුගේ, කාර්මික ශිල්පියකුගේ හෝ නිලධරයකුගේ ;

(iv) එක්සත් ජාතීන්ගේ සංවිධානයෙහි හා එහි විශේෂිත නියෝජ්‍යායතන හෝ කොළඹ ක්‍රම සංවිධානයෙහි හෝ සමාකාර ස්වභාවයක් ඇති බවට අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ වෙනත් යම් සංවිධානයක කාර්මික සහයෝගතා වැඩ පිළිවෙලවල් අතුරින් කිසිවක් යටතේ ශ්‍රී ලංකාවට එවනු ලැබූ යම් විදේශීය අභ්‍යාසලාභියකුගේ ;

(v) ශ්‍රී ලංකාවේ වාසය කරන්නා වූ ද ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නා වූ ද, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ යම් නිලධරයකුගේ ;

(vi) ශ්‍රී ලංකා ආණ්ඩුවේ ඉල්ලීම පිට හෝ එකඟත්වය ඇතිව, ශ්‍රී ලංකාවේ සිටින ශ්‍රී ලංකාව නොවන වෙනත් රටක නාවුක, යුද්ධ හෝ ගුවන් හමුදාවක සාමාජිකයකුගේ ; සහ

(vii) සේවා නියුක්තිය ආරම්භවීමේ දිනයට පෙරාතුව ම වූ තුන්මසකට වැඩි වන කාලයක් ශ්‍රී ලංකාවේ පදිංචිව සිටි තැනැත්තන් නොවන, (vi) වන අනුඡේදයෙහි සඳහන් කරනු ලැබූ යම් නාවුක, යුද්ධ හෝ ගුවන් හමුදාවල ශ්‍රී ලංකාවේ සිටින සාමාජිකයන්ගේ යම් කාර්යයක් හා සම්බන්ධයෙන්, ශ්‍රී ලංකාවේ සේවයෙහි නියුක්ත කරනු ලැබූ හෝ ශ්‍රී ලංකාවට පැමිණ, ශ්‍රී ලංකාව නොවන යම් රටක ආණ්ඩුව විසින් යම් සිවිල් තත්ත්වයකින් සේවයෙහි නියුක්ත කරනු ලැබූ තැනැත්තකුගේ,

ශ්‍රී ලංකාවේ දී ඇතිවන නිල පඩිනඩි හා ශ්‍රී ලංකාවේ දී ඇති නොවන හෝ ශ්‍රී ලංකාවෙන් ලබා නොගත් යම් ආදායමක් :

එසේ වුව ද, (i) වන, (ii) වන, (iii) වන, (iv) වන හෝ (v) වන අනුඡේදවල සඳහන් යම් තැනැත්තකුගේ ශ්‍රී ලංකාවේ දී ඇතිවන හෝ ශ්‍රී ලංකාවෙන් ලබාගනු ලබන වෙනත් ආදායම් සම්බන්ධයෙන්, ඒ තැනැත්තා ආදායම් බද්දට යටත්වීම, නිර්වාසික තැනැත්තකු බද්දට යටත් වන්නාක් මෙන් විය යුතු ය ;

(උ) එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් හෝ ඒ සංවිධානයේ විශේෂිත නියෝජ්‍යායතනයක් විසින් විශේෂඥයකු, උපදේශකයකු, කාර්මික ශිල්පියකු හෝ නිලධරයකු වශයෙන් සේවයේ නියුක්ත කරනු ලැබූ යම් ශ්‍රී ලංකා පුර වැසියකුගේ නිල පඩිනඩි ;

(ඌ) ලෝක සංචාරක සංවිධානය විසින් සේවයේ නියුක්ත කරනු ලැබූ යම් පුද්ගලයකුගේ නිල පඩිනඩි ;

(එ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන තැනැත්තකුට, රාජකාරී භාර ගැනීම සඳහා ශ්‍රී ලංකාවට පැමිණීමට හෝ විශ්‍රාම යාමේ දී හෝ අන්‍යාකාරයකින් හෝ වුව ද ස්වකීය සේවය අවසන් කරනු ලැබීමේ දී ශ්‍රී ලංකාවෙන් ආපසු යාමට හැකි වන පරිදි දෙන ලද යම් ගමන් බලපත්‍රයක හෝ යාන පත්‍රයක වටිනාකම, නැතහොත් ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා ඒ තැනැත්තාගේ භාර්යාවට හෝ යම් පුතකුට, දුවකට හෝ ඔහුගේ හෝ ඇගේ පිටරට ඇති නිවසට යාම සඳහා හෝ එම තැනැත්තාගේ සේවය අවසන් කරනු ලැබීමේ දී ශ්‍රී ලංකාවෙන් ආපසු යාමට හෝ දෙන ලද යම් ගමන් බලපත්‍රයක හෝ යාන පත්‍රයක වටිනාකම ;

(ඒ) ශ්‍රී ලංකාවෙන් පිටත ස්වකීය සේවා නියුක්තිය හා සම්බන්ධයෙන් යම් සේවා නියුක්තයකු විසින් කරනු ලබන ගමන් වෙනුවෙන්, සේවායෝජක විසින් ස්වකීය සේවානියුක්ත යාට ගමන්, යැපීම් හා ලැගුම් ගැනීම සඳහා දෙනු ලබන යම් දීමනාවක් ;

(ඔ) ශ්‍රී ලංකාවේ වාසික යම් පුද්ගලයකු විසින් යම් තක්සේරු වර්ෂයක් තුළ ශ්‍රී ලංකාවෙන් පිටත කරගෙන යනු ලබන හෝ පවත්වාගෙන යනු ලබන යම් සේවා නියුක්තියක දී ඔහු විසින් ඒ තක්සේරු වර්ෂය තුළ දී කරන ලද සේවය සම්බන්ධයෙන් විදේශීය ව්‍යවහාර මුදලින් උපයන ලද පඩිනඩි, (සාධාරණ පෞද්ගලික වියදම් යයි කොමසාරිස් ජනරාල්වරයා සලකන, ඒ පුද්ගලයා විසින් ශ්‍රී ලංකාවෙන් පිටත දී වියදම් කරන ලද යම් මුදලක් අඩුකර) ඔහු විසින් ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරනු ලබන්නේ නම්, ඒ පඩිනඩි; සහ

(ඕ) යම් පුද්ගලයකුගේ මුළු ව්‍යවස්ථාපිත ආදායම—

(i) රුපියල් තිස් දහසක් නො ඉක්මවන්නා වූ, සේවා නියුක්තියෙන් ලබන ලාභ හා ආදායමෙන්; සහ

(ii) සේවා නියුක්තිය හැර වෙනත් සියලුම මාර්ගවලින් ලබන ලාභ හා ආදායම රුපියල් එක්දහස් දෙසියක් නො ඉක්මවන්නා වූ ලාභ හා ආදායමෙන්

පමණක් සමන්විත වන්නේ නම්, ඒ පුද්ගලයා විසින් හෝ ඒ පුද්ගලයාගේ ආදායම සමඟ එකතු කරන ලද මුළු ව්‍යවස්ථාපිත ආදායමක් ඇති යම් දරුවකු විසින් හෝ යම් තක්සේරු වර්ෂයක් සඳහා හා සේවා නියුක්තිය හැර වෙනත් සියලු ම මාර්ගවලින් එකතුව රුපියල් එක්දහස් දෙසියයක් නො ඉක්මවන ලාභ හා ආදායම.

ලැබුන ඇතැම් පොලි ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

10. (අ) ඉතිරිකිරීම් සහතික පත්‍ර ආඥාපනත යටතේ නිකුත් කරන ලද්දා වූ යම් ලංකා ඉතිරි කිරීමේ සහතික පත්‍රයක් හෝ 1971 අංක 30 දරන ජාතික ඉතිරි කිරීමේ බැංකු පනත යටතේ නිකුත් කරන ලද්දා වූ ද 1978 නොවැම්බර් මස 15 වන දින හෝ ඉන් පෙර ඒ පුද්ගලයා විසින් මිල දී ගනු ලැබුවා වූ ද, යම් ජාතික ඉතිරි කිරීමේ සහතික පත්‍රයක් වෙනුවෙන් ඒ පුද්ගලයාට ගෙවිය හැකි සමුච්චිත පොලිය;

(ආ) (i) 1978 නොවැම්බර් මස 15 වන දිනට පසු 1971 අංක 30 දරන ජාතික ඉතිරි කිරීමේ බැංකු පනත යටතේ යම් පුද්ගලයකුට නිකුත් කරනු ලැබූ හෝ නිකුත් කරන ලදැයි සලකනු ලබන යම් ජාතික ඉතිරි කිරීමේ සහතික; හා

(ii) ඒ පුද්ගලයාගේ බැරට ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ඇති මුදල්,

වෙනුවෙන් යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ පුද්ගලයාට ලැබිය හැකි පොලියෙන් රුපියල් දෙදහසක් හෝ මුළු පොලියෙන් තුනෙන් එකක් යන මේ ප්‍රමාණ දෙකෙන් වඩා වැඩි ප්‍රමාණය නොඉක්මවන යම් කොටසක්;

(ඇ) ශ්‍රී ලංකාවෙන් පිටත යම් සමාගමක්, හවුල් ව්‍යාපාරයක් හෝ වෙනත් පුද්ගල මණ්ඩලයක් විසින් ශ්‍රී ලංකා ආණ්ඩුවට හෝ යම් රාජ්‍ය සංස්ථාවකට හෝ ආණ්ඩුවේ ආයතනයකට හෝ තත්කාලයෙහි

ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මකව පවතින යම් වාණිජ බැංකුවකට හෝ වෙනත් යම් ව්‍යවසායකට දෙන ලද ණය ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රගතිය සඳහා අත්‍යවශ්‍ය යයි අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ ඇත්නම් එකී ණය වෙනුවෙන් ඒ සමාගමට, හවුල් ව්‍යාපාරයට හෝ පුද්ගල මණ්ඩලයට උපචිත වන පොලිය;

(ඈ) යම් තැනැත්තකුට ශ්‍රී ලංකාවෙන් පිටත අයිතිව තිබූ විදේශීය ව්‍යවහාර මුදල් හුවමාරු කිරීමෙන් ඔහු විසින් ලබාගන්නා ලද මුදල් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවන ලද කොන්දේසිවලට අනුකූලව තැන්පත් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමතය ඇතිව, වාණිජ බැංකුවක ඔහු විසින් හෝ ඔහු වෙනුවෙන් විවෘත කරන ලද විශේෂ ගිණුමක ඔහුගේ බැරට ඇති මුදල් මත උපචිත වන පොලිය;

(ඉ) ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමතය ඇතිව, යම් තැනැත්තකු විසින් හෝ ඒ තැනැත්තා වෙනුවෙන් යම් වාණිජ බැංකුවක විවෘත කරන ලද යම් ගිණුමක විදේශීය ව්‍යවහාර මුදලින් ඔහුගේ බැරට ඇති මුදල් මත, ඒ තැනැත්තාට ශ්‍රී ලංකාවේ වාසික නොවන කාලය තුළ උපචිත වන පොලිය;

(ඊ) යම් බදු සංචිත සහතිකයක පවාරණ අගයෙහි කොටසක් වන යම් පොලියක්

ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

ඇතැම් ලාභාංශ ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

11. (අ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා පනතේ 17 වන වගන්තිය යටතේ මහා කොළඹ ආර්ථික කොමිෂන් සභාව විසින් ගිවිසුමක් ඇති කර ගනු ලැබූ සමාගමක් විසින්—

(i) ඒ ගිවිසුමේ නියම යටතේ ඒ සමාගමේ ලාභ සහ ආදායම, ආදායම් බද්දෙන් නිදහස් කරනු ලබන්නේ යම් කාලයක් සඳහා ද ඒ කාලය තුළ හෝ ඉන් පසු එක් අවුරුද්දක් ඇතුළත ඒ සමාගමේ ආදායම් බද්දෙන් නිදහස් ලාභ සහ ආදායමෙන් යම් තැනැත්තකුට ගෙවනු ලබන යම් ලාභාංශයක්;

(ii) ශ්‍රී ලංකාවේ නේවාසික නොවන යම් තැනැත්තකුට ගෙවනු ලබන යම් ලාභාංශයක්; සහ

(ආ) මේ පනතේ 16 වන, 17 වන, 18 වන, 19 වන, 20 වන හෝ 21 වන වගන්ති යටතේ හෝ 1963 අංක 4 දරන දේශීය ආදායම් පනත යටතේ හෝ ආදායම් බද්දෙන් නිදහස් සහ 1977 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව උද්ගත වන, සමාගමක ලාභ හා ආදායමෙන්, ඒ සමාගමේ එකී ලාභ හා ආදායම ඉහත සඳහන් විධි විධාන අතුරෙන් යම් විධිවිධානයක් යටතේ ආදායම් බද්දෙන් නිදහස් කරන ලද කාලසීමාව ඇතුළත හෝ ඉන්පසුව එක් අවුරුද්දක් ඇතුළත හෝ, ඒ සමාගමේ කොටස්හිමියන්ට ගෙවනු ලබන යම් ලාභාංශයක්

ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

ඉඩම් සහ ඒ මෙයේ වැඩි දියුණු කිරීම් වලින් ලබන ඇතැම් ලාභ සහ ආදායම, ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

12. (1) පහත දැක්වෙන, එනම්—

(අ) පුද්ගලයකුට අයිති වන්නා වූ ද, ඔහු හෝ ඔහු වෙනුවෙන් හෝ පදිංචිව සිටින්නා වූ ද එකකට වැඩි නොවූ වාසස්ථාන යක ශුද්ධ වාර්ෂික වටිනාකම;

(ආ) යම් නිවාසයක් හුදෙක් වාසය කිරීමේ කාර්ය සඳහා පාවිච්චි කරනු ලැබුවේ නම්, සහ

(i) ඒ නිවාසය 1972 අංක 7 දරන ගෙවල් කුලී පනත අදාළ නිවාසයක් නම්, හෝ

(ii) ඒ නිවාසය එහි අයිතිකරු පදිංචිව සිටින්නේ නම්, හෝ

(iii) ඒ නිවාසයෙහි (බිත්තිවල ඝණකම ද ඇතුළුව) වර්ග අඩි දෙදහසක් නොඉක්මවන්නා වූ බිම් ප්‍රමාණයක් ඇත්නම්,

ඒ නිවාසය ඉදිකිරීම සම්පූර්ණ කළ තක්සේරු වර්ෂය සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂ හය සඳහා ඒ නිවාසයෙහි අයිතිකරුට උපචිත ආදායම, ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය:

එසේ වුවද, නිවාසයෙහි බිම් ප්‍රමාණය වර්ග අඩි එක්දහසක් හෝ ඊට අඩු අවස්ථාවක, ඒ නිවාසය ඉදිකිරීම සම්පූර්ණ කළ තක්සේරු වර්ෂය සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂ නවය සඳහා ඒ නිවාසයෙහි අයිතිකරුට උපචිත ආදායම, ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

(ඇ) මේ උපවගන්තියේ (ආ) ඡේදය යටතේ, ආදායම් බද්දෙන් නිදහස් කර නොමැති හෝ නිදහස්කර නොතිබුණු යම් නිවාසයක් වන්නා වූ ද, වරිපනම් කාර්ය සඳහා ඒ එක් එක් වාසස්ථානය වෙන වෙනම තක්සේරු කරනු ලැබූ වාසස්ථාන දෙකකට හෝ ඊට වැඩි ගණනකට පරිවර්තනය කරන ලද නිවාසයක් වන්නා වූ ද, නිවාසයක එක් එක් වාසස්ථානයෙන් ලැබෙන ආදායම වන එසේ නිවාසයක අයිතිකරුට උපචිත වන ආදායම—

(i) ඒ වාසස්ථානයෙහි බිම් ප්‍රමාණය වර්ග අඩි එක් දහසක් නොඉක්මවන්නේ නම්, ඒ පරිවර්තනය කරනු ලැබූ තක්සේරු වර්ෂය සඳහා සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂ පහ සඳහා; හෝ

(ii) ඒ වාසස්ථානයෙහි බිම් ප්‍රමාණය වර්ග අඩි එක් දහසක් ඉක්මවන නමුත් වර්ග අඩි දෙදහසක් නොඉක්මවන්නේ නම්, ඒ පරිවර්තනය කරනු ලැබූ තක්සේරු වර්ෂය සඳහා සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂ තුන සඳහා

ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

(ඇ) පුද්ගල මණ්ඩලයකට අයත් වන්නා වූ ද ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ කාර්ය සඳහා ක්‍රීඩාවක් වශයෙන් පිළිගත් යම් ක්‍රීඩාවක් ප්‍රවර්ධනය කිරීම ප්‍රධාන අරමුණ වන්නා වූ ද ඒ මණ්ඩලය විසින් ඒ අරමුණ සඳහා යොදා ගනු ලබන්නා වූ ද යම් ඉඩමක් සහ එහි වැඩිදියුණු කිරීම්වල ශුද්ධ වාර්ෂික වටිනාකම, ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා—

(අ) යම් නිවාසයක අයිතිකරු විසින් කරන ලද ඉල්ලීමක් මත ජාතික නිවාස කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලබන්නා වූ ද අවස්ථාවෝචිත පරිදි—

(i) ඒ නිවාසය තැනීම අවසාන කළ දින්ය හෝ ඒ නිවාසය වාසස්ථාන එකකට හෝ ඊට වැඩි ගණනකට පරිවර්තනය කරන ලද දිනය, සහ

(ii) ඒ නිවාසයේ (බිත්තිවල ඝණකම ද ඇතුළුව) බිම් ප්‍රමාණය හෝ ඒ නිවාසය පරිවර්තනය කිරීමෙන් ලැබෙන එක් එක් වාසස්ථානයෙහි බිම් ප්‍රමාණය

දැක්වෙන්නා වූ ද සහතිකයක්, ඒ සහතිකයෙහි දැක්වෙන කාරණා සම්බන්ධයෙන් තීරණාත්මක සාක්ෂිය විය යුතු ය.

(ආ) "අයිතිකරු" යන්න, හවුල් අයිතිකරුවෙක් ද ඇතුළත් වේ; තව ද

(ඇ) "ආදායම" යන්නෙන්, එය කුලියට දී ඇති යම් නිවාසයක් සම්බන්ධයෙන් යෙදෙන විට 1972 අංක 7 දරන ගෙවල් කුලී පනතේ අර්ථානුකූලව අනුමත කුලිය ඉන් අදහස් වේ.

ඇතැම් සහනාධාර ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

13. සහනාධාරයක් හෝ ප්‍රදානයක් වශයෙන් යම් තැනැත්තකුට—

(අ) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ප්‍රාග්ධන අරමුදලෙන්,

(ආ) රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනත යටතේ පිහිටුවන ලද රබර් නැවත වගා කිරීමේ සහනාධාර අරමුදලෙන්,

(ඇ) 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනත යටතේ පිහිටුවන ලද පොල් වගා කිරීමේ මණ්ඩලය විසින්,

(ඈ) කොකෝවා වගා කිරීමේ සහනාධාර යෝජනා ක්‍රමය යටතේ,

(ඉ) ධීවර බෝට්ටු, නාවික යන්ත්‍ර, ධීවර ආම්පන්න සහ වෙනත් උපකරණ ඒ තැනැත්තා විසින් මිල දී ගැනීම සඳහා ධීවර අමාත්‍යාංශය විසින්

ගෙවන ලද යම් මුදලක් ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

14. පහත දැක්වෙන, එනම්—

ඇතැම් ප්‍රාග්ධන ලාභ, ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

(අ) (i) යම් පුද්ගලයකු විසින් ඉදි කරනු ලැබ හුදෙක් වාසික කාර්ය සඳහා පවිවිචි කරනු ලැබුවා වූ නිවාසයක් වන්නා වූ ද, ඒ විකිණීම ඒ නිවාසයේ පළමු විකිණීම වන්නා වූ ද, යම් නිවාසයක් ඒ පුද්ගලයා විසින් විකිණීමෙන්;

(ii) යම් පුද්ගලයෙක් (i) වන අනුඡේදයෙහි සඳහන් නිවාස යක් නොවන යම් නිවාසයක් 1978 අප්‍රේල් මස 1 වන දිනට හෝ එදිනට පසු විකුණා නොමැති නම්, ඒ පුද්ගලයාට අයත් වූ ද හුදෙක් වාසික කාර්ය සඳහාම පාවිච්චි කරනු ලැබුවා වූ ද යම් නිවාසයක් විකිණීමෙන්;

(iii) විකුණුම්කරු විසින් ස්වකීය වෙළෙඳාමෙහි හෝ ව්‍යාපාර යෙහි සාමාන්‍ය ක්‍රියා මාර්ගය අනුව, ප්‍රධාන වශයෙන් අනුග්‍රාහකයන්ට විකිණීම සඳහා විකුණුම්කරු විසින් තබා ගන්නා ලද යම් දේපළක් අනුග්‍රාහකයකුට විකිණීමෙන්;

(iv) තමා විසින් පවත්වාගෙන යනු ලැබූ හෝ ක්‍රියාත්මක කරනු ලැබූ යම් වෙළෙඳාමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින්, රක්ෂාවකින් හෝ සේවා නියුක්තියකින් ආදායම් උපදවීම සඳහා යම් තැනැත්තකු විසින් ප්‍රයෝජන ගනු ලැබුවා වූ ද, මේ පනතේ 23 වන වගන්තිය යටතේ හෝ 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 10 වන වගන්තිය යටතේ හෝ ආදායම් බදු ආඥාපනතේ 11 වන වගන්තිය යටතේ හෝ ක්ෂය වීම සඳහා අඩුකිරීමකට ඉඩ දෙනු ලැබුවා වූ ද දේපළක් විකිණීමෙන්;

(v) භාරයකට යටත් යම් දේපළක් භාරකරුගෙන් භාරය යටතේ වූ යම් අර්ථලාභියකුට අයත් වීමෙන්;

(vi) මියගිය තැනැත්තකුගේ බූදලයට අයත් යම් දේපළක් ඔහුගේ පොල්මෑකරුගෙන් මිය ගිය තැනැත්තාගේ අන්තිම කැමති පත්‍රයේ සඳහන් උරුමක්කාරයකුට හෝ අන්තිම කැමති පත්‍රයක් නොතබා මිය ගිය යම් තැනැත්තකුගේ උරුමක්කාරයකුට අයත් වීමෙන්;

(vii) යම් දේපළක් එහි අයිතිකරු මිය ගියවිට ඒ දේපළ යම් තැනැත්තකුට අයත් වීමෙන්;

(viii) යම් දේපළක අයිතිකරු විසින් ඒ දේපළ තෑගි කිරීම නිසා වෙනත් යම් තැනැත්තකුට ඒ දේපළ අයත් වීමෙන්;

(ix) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා පනතේ 17 වන වගන්තිය යටතේ මහා කොළඹ ආර්ථික කොමිෂන් සභාව විසින් ගිවිසුමක් ඇති කර ගනු ලැබුවේ ශ්‍රී ලංකාවේ සංස්ථා ගත කරන ලද යම් සමාගමක් සමඟ ද ඒ සමාගමේ

කොටස් වන යම් දේපළක් විකිණීමෙන්, තෑගි දීමෙන් හෝ අන්‍යාකාරයකින් හෝ ඒ දේපළෙහි අයිතිකරු ගෙන් වෙනත් යම් තැනැත්තකුට අයත් වීමෙන්;

(x) මේ පනතේ 23 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ හෝ 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 10 වන වගන්තිය යටතේ හෝ ආදායම් බදු ආඥාපනතේ 11 වන වගන්තිය යටතේ හෝ ක්ෂය වීම සඳහා අඩු කිරීමකට ඉඩ දෙනු නොලැබූ යම් මෝටර් වාහනයක් හෝ යම් ගෙදර දොරේ බඩුබාහිරු දියෙහි නැතහොත් පෞද්ගලික පරිහරණය සඳහා වූ වෙනත් (ස්වර්ණාභරණ හැර) භාණ්ඩවල හෝ අයිතිය වෙනස් වීමෙන්;

(xi) දේපළකින් ප්‍රයෝජනය ගැනීමේ අයිතිවාසිකමක් පැවරීමෙන් ඇතිවන ඒ අයිතිවාසිකමේ අයිතිය වෙනස් වීමෙන්;

(xii) ජීවිත රක්ෂණ ඔප්පුවක් පවාරණය කිරීමෙන් සහ ජීවිත භුක්තියක් පවාරණය කිරීමෙන්, පැවරීමෙන්, හෝ නැති වී යාමෙන්

පැන නැගෙන යම් ප්‍රාග්ධන ලාභයක්;

(ආ) ස්කන්ධ, කොටස්, ණයකර හෝ ණයකර ස්කන්ධ නොවන චංචල දේපළ සම්බන්ධයෙන් යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකුගේ ප්‍රාග්ධන ලාභයේ මුලු ගණන රුපියල් දෙදහසක් නොඉක්මවන්නේ නම් ඒ මුලු ගණන;

(ඇ) යම් තැනැත්තකුට යම් තක්සේරු වර්ෂයකට ඉහතින්ම වූ තක්සේරු වර්ෂ තුන සඳහා ඔහුගේ බදු අය කළ හැකි ආදායම ගණන් බැලීමෙහි ලා මේ පනතේ 30 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ හෝ 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 21 වන වගන්තිය යටතේ හෝ ඒ තක්සේරු වර්ෂ තුන සඳහා වූ තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කිරීමට නියමිත දීමනාවල එකතුවට අඩුවන්නා වූ මුළු තක්සේරු කළ හැකි ආදායමක් ඒ තක්සේරු කළ හැකි වර්ෂ තුන සඳහා ඇත්තේ නම් ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තාගේ ප්‍රාග්ධන ලාභ යෙහි පළමුවන රුපියල් පන්දහස

ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

ආදායම් බද්දෙන් විවිධ නිදහස් කිරීම්.

15. පහත දැක්වෙන, එනම්—

(අ) රාජ්‍ය මැණික් සංස්ථාවට මැණික් විකිණීමෙන් යම් තැනැත්තකුට ලැබෙන ලාභ සහ ආදායම;

(ආ) 10 වන වගන්තියේ (ඇ) ඡේදයෙහි සඳහන් යම් විශේෂ ගිණුමක යම් තැනැත්තකුගේ බැරට ඇති මුදල් ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමතය ඇතිව සහ ඒ බැංකුව විසින් නියම කරනු ලබන කොන්දේසිවලට අනුකූලව ඔහු විසින් කරන ලද යම් ආයෝජනයකින් ඔහුට උපචිත වන ආදායම;

(ඇ) ශ්‍රී ලංකාවෙහි වාසික යම් පුද්ගලයකු විසින් යම් තක්සේරු වර්ෂයක දී ශ්‍රී ලංකාවෙන් පිටත පවත්වාගෙන ගිය හෝ කරගෙන ගිය යම් වෘත්තියක දී හෝ රක්ෂාවක දී හෝ ඔහු විසින් කරන ලද සේවා වෙනුවෙන් ඒ තක්සේරු වර්ෂයේ දී විදේශ ව්‍යවහාර මුදලින් උපයා ගන්නා ලද පඩිනම්, (සාධාරණ පෞද්ගලික වියදම් යයි කොමසාරිස් ජනරාල් වරයා සලකන, ඒ පුද්ගලයා විසින් ශ්‍රී ලංකාවෙන් පිටත දී වියදම් කරන ලද යම් මුදලක් අඩුකර) ඔහු විසින් ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරනු ලබන්නේ නම්, ඒ පඩිනම්;

(ඈ) යම් විශ්ව විද්‍යාලයක, විද්‍යාලයක, පාඨශාලාවක හෝ වෙනත් අධ්‍යාපනික ආයතනයක ඉගෙනීම ලබන තැනැත්තකුට ශිෂ්‍යත්වයකින්, අනු ශිෂ්‍යත්වයකින්, ආධාර ශිෂ්‍යත්වයකින් හෝ සමාන අධ්‍යාපනික පරිත්‍යාගයකින් උපචිත වන ආදායම;

(ඉ) මරණ පාරිතෝෂිකයක් වශයෙන් හෝ මරණය හේතුවෙන් සිදුවීම සම්බන්ධයෙන් වන්දියක් වශයෙන් ලබා ගත් යම් ප්‍රාග්ධන මුදලක්;

(ඊ) ආණ්ඩුවේ ආයතනයක් විසින් නිළිණ ගෙවීම සඳහා වූ යම් යෝජනා ක්‍රමයක් යටතේ යම් තොරතුරු සපයන්නකු විසින් නිළිණයක් වශයෙන් ලබාගත් යම් මුදලක්;

(උ) එක්සත් රාජධානියේ මහා රාජිනියගේ හමුදාවල සාමාජික යන්ට හෝ හිටපු සාමාජිකයන්ට දෙනු ලබන තුවාල හා අශක්නුතා විශ්‍රාම වැටුප්;

(ඌ) එක්සත් ජනපද ආණ්ඩුවේ අශක්නුතා විශ්‍රාම වැටුප්;

(එ) ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් නිකුත් කරන ලද, ඒ බැංකුව විසින් පොලී ගෙවිය යුතු නොවන බැඳුම්කරයක් දරන්නකු ඒ බැංකුව විසින් පවත්වන ලද ලොතරැසියක දී ලද යම් ත්‍යාග මුදලක්;

(ඒ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා පනතේ 17 වන වගන්තිය යටතේ මහා කොළඹ ආර්ථික කොමිෂන් සභාව විසින් ගිවිසුමක් ඇති කර ගනු ලැබූ සමාගමකින් ඒ ගිවිසුමේ නියම යටතේ ඒ සමාගමේ ලාභ සහ ආදායම් ආදායම් බද්දෙන් නිදහස් කරනු ලබන්නේ යම් කාලයක් සඳහා ද ඒ කාලය සම්බන්ධයෙන් නිර්වාසික තැනැත්තකු ලද යම් රාජ්‍ය භාගයක්

ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

සංචාරක හෝටල් හා සම්බන්ධ ඇතැම් ව්‍යවසායවල ලාභ සහ ආදායම්, ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

16. (අ) 1966 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භ කරන ලද්දා වූද, ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයකින් අමාත්‍යවරයා විසින්, ලංකා සංචාරක මණ්ඩලයේ නිර්දේශය පිට අනුමත කරන ලද්දා වූ ද, සංචාරකයන් සඳහා හෝටල් පවත්වා ගෙන යන යම් ව්‍යවසායකට උපචිත වන ලාභ සහ ආදායම පස් අවුරුදු කාලයක් සඳහා ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය; ඒ පස් අවුරුදු කාලය, ඒ ව්‍යවසාය විසින් ව්‍යාපාර කටයුතු කර ගෙන යාම ආරම්භ කරන ලද දිනයෙහි සිට ආගණනය කරනු ලැබිය යුතු ය; තව ද

(ආ) ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නියමයකින් අමාත්‍ය වරයා විසින්, ලංකා සංචාරක මණ්ඩලයේ නිර්දේශය පිට අනුමත කරන ලද ප්‍රයෝජනයට ගැනීමකට, එසේ ප්‍රයෝජනයට ගැනීමට ගොඩනැගිලි ලබා දෙන යම් ව්‍යවසායක් විසින් (අ) ඡේදයෙහි දැක්වෙන ව්‍යවසායක ප්‍රයෝජනය සඳහා ලබා දෙන යම් ගොඩනැගිල්ලකින් උපචිත වන ලාභ සහ ආදායම පස් අවුරුදු කාලයක් සඳහා ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය; ඒ පස් අවුරුදු කාලය, ඒ ගොඩනැගිල්ල එසේ ප්‍රයෝජනයට ලබා දුන් දිනයෙහි සිට ආගණනය කරනු ලැබිය යුතු ය.

ඩිවර කර්මාන්තයෙහි, සත්ව පාලනයෙහි, පටපණුවන් ඇති කිරීමෙහි සහ කෘෂි කර්මාන්තයෙහි යෙදී සිටින ආයතන සමාගම්වල ලාභ සහ ආදායම, ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

17. (1) (2) වන උපවගන්තියේ සඳහන් යම් ව්‍යවසායකින් ඒ උපවගන්තියේ සඳහන් යම් සමාගමකට, 3(අ) වගන්තියේ අර්ථානුකූලව ලැබෙන (ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබෙන යම් ලාභ සහ ආදායම හැර) ලාභ සහ ආදායම ඒ සමාගම සංස්ථාගත කරන ලද දිනයෙහි සිට 1983 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන කාලය සඳහා ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

(2) 1977 නොවැම්බර් මස 15 වන දින හෝ ඉන් පසුව සංස්ථාගත කරනු ලැබ අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබුවා වූ ද, ඒ දිනයෙහි හෝ ඉන් පසුව මෙහි පහත දැක්වෙන ව්‍යවසායන්ගෙන් එකක් හෝ ඊට වැඩි ගණනාක්, එනම්—

(අ) අක් වෙරළෙහි හෝ ගැඹුරු මුහුදෙහි මසුන් මැරීම සඳහා වූ ව්‍යවසායක්;

(ආ) තේ, රබර්, පොල් හෝ වී හැර, කවර හෝ විස්තරයකට අයත් යම් පැලෑටි, ඉඩම්වල වගා කිරීම සඳහා වූ ව්‍යවසායක්;

(ඇ) සත්ව පාලනය සඳහා වූ ව්‍යවසායක්;

(ඈ) පටපණුවන් ඇති කිරීම සඳහා වූ ව්‍යවසායක්;

(ඉ) ඉහතින් වූ ඡේදවල දැක්වෙන කටයුතු කිසිවක් කරගෙන යාම සඳහා සහ ඒ කටයුත්තේ නිෂ්පාදනය සකස් කිරීම සඳහා වූ ව්‍යවසායක්;

(ඊ) ඩිවර බෝට්ටු තැනීම සඳහා හෝ ඩිවර ආම්පන්න නිෂ්පාදනය කිරීම සඳහා නැතහොත් නාවුක යන්ත්‍ර නිෂ්පාදනය කිරීම හෝ එකලස් කිරීම සඳහා වූ ව්‍යවසායක්;

(උ) අයිස් නිෂ්පාදනය කිරීම සඳහා හෝ ශීත ගබඩා කාමර සැපයීම සඳහා වූ ව්‍යවසායක්

කරගෙන යාම ආරම්භ කොට ඒ එක් ව්‍යවසාය හෝ ඊට වැඩි ගණන පමණක් කරගෙන යාමෙහි ලා යෙදී සිටින්නා වූ ද යම් සමාගමකට (1) වන උපවගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය:

එසේ වුවද, 1977 නොවැම්බර් මස 15 වන දිනට පෙරාතුව පැවතියා වූ ව්‍යවසායක් කරගෙන යන යම් සමාගමකට හෝ 1977 නොවැම්බර් මස 15 වන දිනට පෙරාතුව පැවතියා වූ යම් ව්‍යාපාරයක් කොටස් කිරීමෙන් හෝ ප්‍රතිසංස්කරණය කිරීමෙන් පිහිටුවන ලද යම් සමාගමකට හෝ මේ වගන්තිය අදාළ නොවිය යුතු ය.

18. (1) (3) වන උපවගන්තියේ සහ (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව 3 වන වගන්තියේ (අ) ඡේදයෙහි අර්ථානුකූලව (2) වන උපවගන්තියෙහි සඳහන් ව්‍යවසායක (ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබෙන යම් ලාභ සහ ආදායම හැර) ලාභ සහ ආදායම ඒ ව්‍යවසාය ආරම්භ කරන ලද දිනයෙන් ආරම්භව 1983 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන කාලය සඳහා ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

වෙළෙඳ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම හෝ සැදීම සඳහා වූ ඇතැම් කුඩා පරිමාණ ව්‍යවසායවල ලාභ සහ ආදායම, ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

(2) 1977 නොවැම්බර් මස 15 වන දින හෝ ඉන් පසුව ආරම්භ කරනු ලැබ අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ—

(අ) වී කෙටීම සඳහා වූ ව්‍යවසායක් නොවන්නා වූ ද;

(ආ) කලින් පැවති යම් ව්‍යාපාරයක් කොටස් කිරීමෙන්, ප්‍රතිසංස්කරණය කිරීමෙන් හෝ අත්කර ගැනීමෙන් පිහිටුවනු ලැබූ ව්‍යවසායක් නොවන්නා වූ ද;

(ඇ) මහා නගර සභා ආඥාපනතේ අර්ථානුකූලව මහා නගර සභාවක පරිපාලන සීමාවලින් පිටත ස්වකීය නිෂ්පාදන කටයුතු හෝ සැදීම කරගෙන යන්නා වූ ද

බඩු හෝ වෙළෙඳ ද්‍රව්‍ය ශ්‍රී ලංකාවෙහි නිෂ්පාදනය කිරීම හෝ සැදීම සඳහා වූ යම් ව්‍යවසායකට (1) වන උපවගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

(3) 1978 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව, එහෙත් 1983 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් තුළ යම් වේලාවක එවැනි යම් ව්‍යවසායක ප්‍රාග්ධනය රුපියල් දසලක්ෂය ඉක්මවන අවස්ථාවක, ඒ තක්සේරු වර්ෂයේ දී උද්ගත වන ඒ ව්‍යවසායේ ලාභ සහ ආදායම ආදායම් බද්දෙන් නිදහස් කරනු නොලැබිය යුතු ය.

(4) යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් ව්‍යවසායක ලාභ සහ ආදායම, ආදායම් බද්දෙන් නිදහස් කිරීම, ඒ ලාභ සහ ආදායම රුපියල් දෙලක්ෂය ඉක්මවන්නේ යම් ප්‍රමාණයකින් ද, ඒ ප්‍රමාණයට අදාළ නොවිය යුතු ය.

(5) මේ වගන්තියෙහි "ප්‍රාග්ධනය" යන්නෙන්, එය යම් ව්‍යවසායක් සම්බන්ධයෙන් යෙදෙන විට—

(අ) ඒ ව්‍යවසායේ ප්‍රයෝජනය සඳහා මිලදී ගත් හෝ ඉදිකළ යම් ගොඩනැගිල්ලක, සහ මිලදී ගත් යම් ඉඩමක, පිරියතක, යන්ත්‍රෝපකරණයක සහ සවි කිරීමක පිරිවැයේ; සහ

(ආ) (අ) ඡේදයෙහි ඇතුළත් කරනු නොලැබූ ඒ ව්‍යවසායේ වත්කම්වල වටිනාකමෙහි

එකතුවෙන් ඒ ව්‍යවසායේ ප්‍රයෝජනය සඳහා රඳවා ගන්නා ලද ඒ ව්‍යවසායේ යම් ලාභ අඩු කළ පසු ලැබෙන මුදල අදහස් වේ.

වී කෙරීම සඳහා වූ ඇතැම් ව්‍යවසායවල ලාභ සහ ආදායම, ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

19. වී කෙරීම සඳහා 1977 නොවැම්බර් මස 15 වන දින හෝ ඉන් පසුව ආරම්භ කරනු ලැබ, අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද යම් ව්‍යවසායක (ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලබන යම් ලාභ සහ ආදායම් නොවන) 3 වන වගන්තියේ (අ) ඡේදයෙහි අර්ථානුකූලව ලාභ සහ ආදායම, ඒ ව්‍යවසාය කලින් පැවති යම් ව්‍යාපාරයක් කොටස් කිරීමෙන්, ප්‍රතිසංස්කරණය කිරීමෙන් හෝ අත්කර ගැනීමෙන් පිහිටුවන ලද ව්‍යවසායක් නොවන්නේ නම්, ව්‍යවසාය ආරම්භ කරන ලද දිනයෙන් ආරම්භව 1983 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන කාලය සඳහා ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

ඇතැම් ව්‍යවසායවල අපනයන ලාභ සහ ආදායම, ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

20. (1) යම් සමාගමක ලාභ සහ ආදායමින් යම් කොටසක්, මේ වගන්තිය අදාළ විය යුතු ව්‍යවසායක් බවට ගැසට් පත්‍රයෙහි පළ කරන ලද දැන්වීමකින් අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද්දා වූ යම් ව්‍යවසායක අපනයන ලාභවලින් සහ ආදායමින් සමන්විත වන්නේ ද, ඒ කොටස—

(අ) 1972 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව සංස්ථාගත කරන ලද සහ 1978 නොවැම්බර් මස 15 වන දිනට පෙරාතුව 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 7අ වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද සමාගමක් සම්බන්ධයෙන් වූ විට, ඒ සමාගම සංස්ථාගත කරන ලද දින සිට ගණන් ගනු ලබන අවුරුදු අටක කාලයක් සඳහා ද;

(ආ) යම් වෙළෙඳ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සඳහා හෝ විදේශ විනිමයෙන් ගෙවීම පිණිස සේවා සැපයීම සඳහා 1972 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව සංස්ථාගත කරන ලද සහ 1978 නොවැම්බර් මස 15 වන දිනට පසු අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද යම් සමාගමක් සම්බන්ධයෙන් වූ විට, ඒ සමාගම විසින් එහි ප්‍රථම අපනයනයන් කළ දිනයේ සිට නැතහොත් විදේශ විනිමයෙන් ගෙවීම පිණිස ඒ සමාගම විසින් සේවා සැපයීම ආරම්භ කරනු ලැබුවේ යම් දිනයක සිට ද ඒ දිනයේ සිට ගණන් ගනු ලබන අවුරුදු පහක කාලයක් සඳහා ද,

ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද යම් සමාගමක් විසින් කරගෙන යනු ලබන යම් ව්‍යවසායක්—

(අ) ඒ ව්‍යවසාය කලින් පැවති යම් ව්‍යාපාරයක් කොටස් කිරීමෙන් හෝ ප්‍රතිසංස්කරණය කිරීමෙන් හෝ පිහිටුවනු ලැබූ ව්‍යවසායක් නම්; හෝ

(ආ) ඒ ව්‍යවසායේ අපනයන පිරිවැටුමේ කිසියම් කොටසක් වෙනත් යම් ව්‍යවසායක සම්පූර්ණ වෙළෙඳාම හෝ ව්‍යාපාරය හෝ එහි යම් කොටසක් හෝ ඒ ව්‍යවසායේ වෙළෙඳාම හෝ ව්‍යාපාරය සමඟ ඒකාබද්ධ කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඇති වූවක් නම්; හෝ

ඒ ව්‍යවසාය හා සම්බන්ධ ඒ සමාගමට මේ උපවගන්තිය අදාළ නොවිය යුතු ය.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා—

(අ) "අපනයන ලාභ හා ආදායම" යන්නෙන්, එය සමාගමක් හෝ ව්‍යවසායක් සම්බන්ධයෙන් යොදනු ලැබූ විට, ඒ සමාගමේ හෝ ව්‍යවසායේ අපනයන පිරිවැටුම හා ඒ සමාගමේ හෝ ව්‍යවසායේ මුළු පිරිවැටුම හා අතර අනුපාතය මේ පනතේ විධිවිධාන අනුව නිශ්චය කරනු ලබන ඒ සමාගමේ හෝ ව්‍යවසායේ (3 වන වගන්තියේ (අ) ඡේදයෙහි අර්ථානුකූලව, මැණික් විකිණීමෙන් ලබන යම් ලාභ හා ආදායම හැර) ලාභ සහ ආදායම හා යම් මුදලක් හා අතර ඇති වේද ඒ මුදල අදහස් වේ.

(ආ) "අපනයන පිරිවැටුම" යන්න, යම් සමාගමක් හෝ ව්‍යවසායක් සම්බන්ධයෙන් යොදනු ලැබූ විට—

(i) ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබුණ හෝ ලබාගත හැකි යම් මුදලක්;

(ii) මැණික් විකිණීමෙන් ලැබුණ හෝ ලබාගත හැකි යම් මුදලක්;

(iii) තොග වශයෙන් කළු තේ, ක්‍රේප් රබර්, ෂීට් රබර්, ඔට්ටුපාලු, පොල් තෙල්, කපාපු පොල්, කොප්පරා, අමු පොල්, පොල් කෙඳි හෝ යම් වෙළෙඳ ද්‍රව්‍යයක් අපනයනය කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා පෙළඹවීම් ඇති කිරීමේ අවශ්‍යතාව කෙරෙහි සැලකිලිමත්ව, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින් සඳහන් කරනු ලබන එවැනි වෙනත් යම් වෙළෙඳ ද්‍රව්‍යයක් අපනයනය කිරීමෙන් ලැබුණ හෝ ලබාගත හැකි යම් මුදලක්; සහ

(iv) 3 වන වගන්තියේ (අ) ඡේදයෙහි අර්ථානුකූල වූ ලාභ සහ ආදායම් නොවන යම් ලාභ සහ ආදායම්

හැර, භාණ්ඩ හෝ වෙළෙඳ ද්‍රව්‍ය අපනයනය කිරීමෙන් හෝ විදේශීය ව්‍යවහාර මුදලින් ගෙවීම් සඳහා සේවා සැපයීමෙන් ඒ සමාගමට හෝ ව්‍යවසායට ලැබුණ හෝ ලබාගත හැකි මුළු මුදල ඉන් අදහස් වේ;

(ඇ) "මුළු පිරිවැටුම" යන්න, යම් සමාගමක් හෝ ව්‍යවසායක් සම්බන්ධයෙන් යොදනු ලැබූ විට—

(i) ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබුණ හෝ ලබාගත හැකි යම් මුදලක්;

(ii) මැණික් විකිණීමෙන් ලැබුණ හෝ ලබාගත හැකි යම් මුදලක්;

(iii) 3 වන වගන්තියේ (අ) ඡේදයෙහි අර්ථානුකූල වූ ලාභ සහ ආදායම් නොවන යම් ලාභ සහ ආදායම්

හැර ඒ සමාගම හෝ ව්‍යවසාය විසින් පවත්වා ගෙන යනු ලබන හෝ කරගෙන යනු ලබන යම් වෙළෙඳාමකින් හෝ ව්‍යාපාරයකින් ඒ සමාගමට හෝ ව්‍යවසායට ලැබුණ හෝ ලබාගත හැකි මුළු මුදල ඉන් අදහස් වේ.

ඇතැම් නිවාස ඉදිකිරීමෙන් සහ පළමු වන විකිණීමෙන් ලබන ලාභ, ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

21. නිවාස ඉදිකොට විකිණීම සඳහා, ආණ්ඩුවේ නිවාස ප්‍රතිපත්තිය කෙරෙහි සැලකිලිමත්ව ජාතික නිවාස කොමසාරිස් වරයා විසින් අනුමත කරනු ලැබූ ව්‍යවසායක් වන ව්‍යවසායක් පවත්වා ගෙන යන යම් තැනැත්තකු විසින්, 1977 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසුව ඉදිකිරීම් ආරම්භ කරන ලද යම් නිවාසයක් හෝ තට්ටු නිවාසයක් ඒ තැනැත්තා විසින් විකුණනු ලබන අවස්ථාවක, ඒ විකිණීම ඒ නිවාසයෙහි හෝ තට්ටු නිවාසයෙහි පළමුවන විකිණීම වන විට—

(අ) ඒ නිවාසයෙහි හෝ තට්ටු නිවාසයෙහි බිම් ප්‍රමාණය වර්ග අඩි පන් සියයක් නොඉක්මවන්නේ නම් ඒ විකිණීමෙන් ලැබෙන සම්පූර්ණ ලාභ සහ ආදායම;

(ආ) ඒ නිවාසයෙහි හෝ තට්ටු නිවාසයෙහි බිම් ප්‍රමාණය වර්ග අඩි පන් සියයක් ඉක්මවන නමුත් වර්ග අඩි එක් දහස් දෙසිය පනහක් නොඉක්මවන්නේ නම්, ඒ විකිණීමෙන් ලැබෙන ලාභවලින් සහ ආදායමෙන් සියයට හැත්තෑ පහක්; සහ

(ඇ) ඒ නිවාසයෙහි හෝ තට්ටු නිවාසයෙහි බිම් ප්‍රමාණය වර්ග අඩි එක් දහස් දෙසිය පනහක් ඉක්මවන නමුත් වර්ග අඩි දෙදහසක් නොඉක්මවන්නේ නම්, ඒ විකිණීමෙන් ලැබෙන ලාභවලින් සහ ආදායමෙන් සියයට පනහක්

ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

ඇතැම් නිර්වාසික කොන්ත්‍රාත්කරුවන්ගේ ලාභ සහ ආදායම්, ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

22. යම් තැනැත්තකු—

(අ) ශ්‍රී ලංකා ආණ්ඩුව සමඟ; හෝ

(ආ) 16 වන වගන්තියෙහි සඳහන් යම් ව්‍යවසායක කාර්යය සඳහා වූ යම් ගොඩනැගිල්ලක් ඉදිකිරීම පිළිබඳව, ඒ ව්‍යවසායේ අයිතිකරු සමඟ; හෝ

(ඇ) අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන යම් රාජ්‍ය සංස්ථාවක් හෝ ආයතනයක් සමඟ

යම් ගිවිසුමකට ඇතුළත් වූයේ ද ඒ තැනැත්තා—

(i) ඒ ගිවිසුමට ඇතුළත් වූ අවස්ථාවේ දී ඔහු නිර්වාසිකයකු වූයේ නම් හා ශ්‍රී ලංකාවෙහි ව්‍යාපාරික ස්ථානයක් ඔහුට නොතිබුණේ නම්;

(ii) ඒ ගිවිසුමෙහි නියම කොට ඇති මුදල ආදායම් බද්දට යටත් නොවනු ඇතැයි යන පදනම මත ඔහු ඒ ගිවිසුමට ඇතුළත් වූ බවට කොමසාරිස් ජනරාල්වරයා සැහීමට පත් කරන්නේ නම්; සහ

(iii) ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා ඔහුගේ සේවා අවශ්‍ය වන බවට හා මේ වගන්තිය අදාළ වන තැනැත්තකු බවට ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මඟින් අමාත්‍යවරයා විසින් සඳහන් කරනු ලබන්නේ නම්

ඒ ගිවිසුම ඉටු කිරීමෙන් ඒ තැනැත්තාට උපචිත වන ලාභ සහ ආදායම්, ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

IV වන පරිච්ඡේදය

ලාභ හෝ ආදායම නිශ්චය කිරීම

ලාභ හෝ ආදායම් නිශ්චය කිරීම.

23. (1) (2) වන සහ (4) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, යම් ප්‍රභවයකින් ලැබෙන යම් තැනැත්තකුගේ ලාභ හෝ ආදායම නිශ්චය කිරීමේ කාර්ය සඳහා පහත සඳහන් දෑ ඇතුළුව, ඒ ලාභ හෝ ආදායම ඉපයීමේ දී ඒ තැනැත්තා විසින් දරන ලද සියලු පිටයාම් හා වියදම් අඩු කරනු ලැබිය යුතු ය.—

(අ) ලාභ සහ ආදායම නිශ්චය කරනු ලබන කාලසීමාව තුළ ඔහු විසින් අත්කර ගෙන, ඔහු විසින් පවත්වා ගෙන හෝ කර ගෙන යනු ලබන කිසියම් වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රක්ෂාවක, පාවිච්චි කරන ලද යම් පිරියත, යන්ත්‍ර හෝ සවිකිරීම් සම්බන්ධයෙන් ඒ පිරියත, යන්ත්‍ර හෝ සවිකිරීම් අත්කර ගැනීමේ පිරිවැයට සමාන මුදලක් විය යුතු දීමනාවක් :

එසේ වුව ද 1980 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ඔහු විසින් අත්කරගනු ලැබූ, එවැනි යම් පිරියත, යන්ත්‍ර හා සවිකිරීම් සම්බන්ධයෙන් මේ ඡේදය යටතේ කිසිම අඩු කිරීමකට තැනැත්තකුට ඉඩ දෙනු නොලැබිය යුතු ය ;

(ආ) ලාභ සහ ආදායම නිශ්චය කරනු ලබන කාලය තුළ—

(i) ඒ තැනැත්තා විසින් පවත්වා ගෙන යනු ලබන යම් ව්‍යවසායක ඔහු විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන, විධායක නිලධරයකු හැර, කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයකුගේ වාසස්ථානය වශයෙන් පදිංචි වීම පිණිස, ඒ ව්‍යවසායේ කාර්ය සඳහා ගොඩ නැගිල්ලක් තැනීමේ දී ; හෝ

(ii) 16 වන වගන්තියේ (අ) ඡේදයෙහි සඳහන් කර නොමැති හා මේ ඡේදයේ කාර්ය සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ නිර්දේශය මත ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍ය වරයා විසින් අනුමත කරන ලද සංචාරකයන් සඳහා හෝටල් පවත්වා ගෙන යන යම් ව්‍යවසායක් සඳහා, ඒ තැනැත්තා විසින් යම් පවත්නා ගොඩනැගිල්ලක් අලුත්වැඩියා කිරීමේ දී හෝ පවත්නා ගොඩනැගිල්ලකට කිසියම් එකතු කිරීමක් හෝ එහි වැඩි දියුණු කිරීමක් කිරීමේ දී නැතහොත් කිසියම් ගොඩනැගිල්ලක් තැනීමේ දී

ඔහු විසින් වියදම් කරන ලද මුදලට සමාන දීමනාවක් :

එසේ වුව ද 1980 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව තැනැත්තකු විසින් වියදම් කරන ලද යම් මුදලක් සම්බන්ධයෙන් මේ ඡේදය යටතේ කිසිම අඩු කිරීමකට ඔහුට ඉඩ දෙනු නො ලැබිය යුතු ය ;

(ඇ) වාසස්ථානයක් වශයෙන් පාවිච්චි කිරීම සඳහා හැර ඒ තැනැත්තා විසින් පවත්වා ගෙන යනු ලබන යම් වෙළෙඳාමක හෝ ව්‍යාපාරයක කාර්ය සඳහා යම් ගොඩනැගිල්ලක් ඉදි කිරීම පිණිස ඒ තැනැත්තා විසින් ලාභ හා ආදායම නිශ්චය කරනු ලබන කාලය තුළ, එහෙත් 1980 අප්‍රේල් මස 1 වන දිනට පෙර වියදම් පිණිස කරන ලද මුදලින් සියයට පනහකට සමාන දීමනාවක් ;

(ඈ) (i) (අ) ඒ තැනැත්තා විසින් පවත්වා ගෙන යනු ලබන 16 වන වගන්තියෙහි සඳහන් යම් ව්‍යවසායක් සඳහා ; හෝ

(ආ) (ආ) ඡේදයේ (ii) වන අනුඡේදයෙහි සඳහන් හෝටල් පවත්වා ගෙන යාමේ ව්‍යවසායක් සඳහා

යම් ගෘහ භාණ්ඩ, භාජන හෝ භාණ්ඩ ;

(ii) ඒ තැනැත්තා විසින් කර ගෙන යනු ලබන ගැඹුරු මුහුදේ මසුන් මැරීමේ හෝ අක් වෙරළේ මසුන් මැරීමේ යම් ව්‍යවසායක් සඳහා යම් ආම්පන්නයක් හෝ උපකරණයක්

මිල දී ගැනීමේ ලා ඒ තැනැත්තා විසින් වියදම් කරන ලද යම් මුදලකට සමාන දීමනාවක් ;

(ඉ) ඒ තැනැත්තා විසින් අත්කර ගන්නා ලද පිරියත, යන්ත්‍ර හා සවිකිරීම් හෝ ඒ තැනැත්තා විසින් තනන ලද සුදුසුකම් ලත් ගොඩනැගිලි 1980 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ඒ තැනැත්තා විසින් කර ගෙන යනු ලබන හෝ පවත්වා ගෙන යනු ලබන යම් වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රක්ෂාවක පාවිච්චි කරනු ලැබීමෙන් ඒ පිරියතවල, යන්ත්‍රවල හෝ ගොඩනැගිලිවල වැහැරීම් හා ගෙවී යාම් මගින් ඇතිවන යම් අගය ක්ෂය වීමක් සඳහා යුක්ති සහගත යයි කොමසාරිස් ජනරාල්වරයා සලකන යම් දීමනාවක් ; ඒ දීමනාව අවස්ථාවෝචිත පරිදි, ඒවා අත්කර ගැනීමේ පිරිවැය මත හෝ ඉදිකිරීමේ පිරිවැය මත වර්ෂයකට සියයට නියමිත ප්‍රමාණයක් අනුව, සාමාන්‍යයෙන් ආගණනය කරනු ලැබිය යුතු ය :

එසේ වුව ද මේ ඡේදයෙහි ඉහතින් වූ විධිවිධාන යටතේ—

(i) ඒ තැනැත්තා විසින් 1980 අප්‍රේල් මස 1 වන දිනට පෙර එවැනි යම් පිරියත, යන්ත්‍ර හෝ සවිකිරීම් අත්කර ගන්නා ලද්දේ නම් ඒ පිරියත, යන්ත්‍ර හෝ සවිකිරීම් සම්බන්ධයෙන් හෝ ඔහු විසින් 1980 අප්‍රේල් මස 1 වන දිනට පෙර ඒ ගොඩනැගිල්ල ඉදි කරන ලද්දේ නම් ඒ ගොඩනැගිල්ල සම්බන්ධයෙන් ;

(ii) යම් පිරියත, යන්ත්‍ර, සවිකිරීම් හෝ ගොඩනැගිලි සම්බන්ධයෙන් ඉහතින් වූ තක්සේරු වර්ෂයන්හි අගය ක්ෂයවීම සඳහා දෙන ලද දීමනාවල එකතුව, අවස්ථාවෝචිත පරිදි, ඒ පිරියත, යන්ත්‍ර හෝ සවිකිරීම්වල අත්කර ගැනීමේ පිරිවැයට හෝ ගොඩනැගිල්ල ඉදි කිරීමේ පිරිවැයට හෝ සමාන වන අවස්ථාවක ඒ පිරියත, යන්ත්‍ර, සවිකිරීම් හෝ ගොඩනැගිලි සම්බන්ධයෙන්

තැනැත්තකුට කිසිම අඩු කිරීමකට ඉඩ දෙනු නොලැබිය යුතු ය;

(ඊ) ඒ ලාභ හෝ ආදායම ඉපයීමේ දී ඒ තැනැත්තා විසින් පාවිච්චි කරනු ලබන යම් ප්‍රාග්ධන වත්කමක් සම්බන්ධයෙන් ක්ෂයවීම සඳහා කිසිදු දීමනාවක් අඩු කළ නොහැකි නම් ඒ වත්කම අලුත් කිරීම සඳහා ඒ තැනැත්තා විසින් වියදම් කරන ලද යම් මුදලක්;

(උ) ඒ ලාභ සහ ආදායම ඉපයීමේ දී යොදන ලද යම් පිරියත, යන්ත්‍ර, සවිකිරීම්, ගොඩනැගිලි, ආම්පන්න, භාජන, හෝ භාණ්ඩ අලුත්වැඩියා කිරීම (අලුත් කිරීම නොව) සඳහා ඒ තැනැත්තා විසින් වියදම් කරන ලද යම් මුදලක්:

එසේ වුව ද, වාණිජ කාර්ය සඳහා ස්ථාන කුලියට දීමේ ව්‍යාපාරයක් පවත්වා ගෙන යන සමාගමක් සම්බන්ධයෙන් වන විට, මේ ඡේදය යටතේ අඩු කළ හැකි මුදල, ඒ ස්ථාන සම්බන්ධයෙන් ඒ සමාගම ලැබිය යුතු දළ කුලියෙන් සියයට දහයක් නො ඉක්මවිය යුතු ය;

(ඌ) ලාභ නිශ්චය කරනු ලබන කාලසීමාව ආරම්භ වීමට පෙරාතුව යම් බොල් ණයක් හෝ අඩමාන ණයක් අයවිය යුතුව හා ගෙවිය යුතුව තිබුනේ වුව ද, යම් වෙළෙඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක්, රක්ෂාවක් හෝ සේවා නියුක්තියක් සම්බන්ධයෙන්, ඒ ලාභ නිශ්චය කරනු ලබන කාලසීමාව තුළ ඒ තැනැත්තා විසින් දරා ඇති ඒ බොල් ණයවලට සමාන මුදලක් හා ඒ කාලසීමාව තුළ බොල් බවට පත්ව ඇතැයි ඇස්තමේන්තු කර ඇති ප්‍රමාණයට අඩමාණ ණය වෙනුවෙන් සාධාරණ යයි කොමසාරිස් ජනරාල්වරයා සලකන යම් මුදලක්:

එසේ වුවද, බොල් ණය හෝ අඩමාන ණය වෙනුවෙන් කලින් කපාහරින ලද හෝ ඉඩ දෙන ලද මුදල්වලින් ඒ කාලසීමාව තුළ අයකර ගනු ලැබූ සියලු මුදල් මේ පනතේ කාර්ය සඳහා ඒ කාලසීමාව තුළ ඒ වෙළෙඳාමෙන්, ව්‍යාපාරයෙන්, වෘත්තියෙන්, රක්ෂාවෙන් හෝ සේවා නියුක්තියෙන් ලැබූ ලාභ ලෙස සලකනු ලැබිය යුතු ය;

(එ) ඒ තැනැත්තා විසින් ගෙවන ලද හෝ ගෙවිය යුතු පොලිය;

(ඒ) කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කළ හැකි යම් කොන්දේසිවලට යටත්ව, කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද යම් විශ්‍රාම වැටුප්, අර්ථසාධක හෝ ඉතිරි කිරීමේ අරමුදලට, නැතහොත් අර්ථසාධක හෝ ඉතිරි කිරීමේ සංගමයකට සේවා යෝජකයකු විසින් ගෙවනු ලබන යම් දායක මුදලක්;

(ඔ) යම් තැනැත්තකු විසින් කර ගෙන යනු ලබන හෝ පවත්වා ගෙන යනු ලබන හෝ යම් වෙළෙඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් පිළිබඳව ලාභ සහ ආදායම නිශ්චය කර ඇත්තේ යම් කාලසීමාවක් සම්බන්ධයෙන් ද ඒ කාලසීමාව සම්බන්ධයෙන් ඒ තැනැත්තා ගෙවීමට යටත් ව්‍යාපාර පිරිවැටුම් බද්ද;

(ඕ) යම් තැනැත්තකු විසින් කර ගෙන යනු ලබන වෙළෙඳාමක් හෝ ව්‍යාපාරයක් වැඩිදියුණු කිරීම සඳහා යම් විද්‍යාත්මක, කාර්මික හෝ කෘෂිකාර්මික පර්යේෂණ කර ගෙන යාමෙහි ලා ඒ තැනැත්තා විසින් දරන ලද වියදම;

(ක) ඒ තැනැත්තා විසින්—

(i) වගා කිරීම හෝ සත්ව පාලනය සඳහා යම් ඉඩමක් විවෘත කිරීමෙහි ලා; හෝ

(ii) කවර හෝ විස්තරයකට අයත් පැලෑටි ඒ ඉඩමෙහි වගා කිරීමෙහි ලා; හෝ

(iii) ඒ ඉඩමේ ඇති කිරීම සඳහා එළු, ගව ආදී සතුන් හෝ කුකුළන් මිල දී ගැනීමෙහි ලා; හෝ

(iv) මසුන් ඇති කිරීම සඳහා වැව් හෝ පොකුණු තැනීම හෝ යම් මිරිදිය ජලාශ පිරිසිදු කිරීම හා පිළියෙළ කිරීම සහ අවස්ථාවෝචිත පරිදි ඒ වැව්, පොකුණු හෝ මිරිදිය ජලාශවල ඇතිකිරීම සඳහා මසුන් මිල දී ගැනීමෙහි ලා

දරන ලද යම් වියදම්;

(ග) තමාගේ වෙළෙඳාම, ව්‍යාපාරය, වෘත්තිය හෝ රක්ෂාව සම්බන්ධයෙන් ඒ තැනැත්තා විසින් හෝ ඒ තැනැත්තා ගේ සේවයෙහි නියුක්ත වෙනත් යම් තැනැත්තකු විසින් හෝ ශ්‍රී ලංකාව තුළ ගමන් සඳහා සැබැවින් දරන ලද වියදම්:

එසේ වුව ද—

(i) ඒ තැනැත්තාට අයත් වූ ද ඔහු විසින් නඩත්තු කරනු ලබන්නා වූ ද, ඔහුගේ වෙළෙඳාමේ, ව්‍යාපාරයේ, වෘත්තියේ හෝ රක්ෂාවේ කාර්ය සඳහා මෙන් ම, ඔහුගේ සේවයෙහි නියුක්ත යම් විධායක නිලධරයකුගේ ගෘහ්‍ය හෝ පෞද්ගලික කාර්ය සඳහා පාවිච්චි කරනු ලබන්නා වූ ද වාහනයක්, ඒ විධායක නිලධරයාගේ ගෘහ්‍ය හෝ පෞද්ගලික කාර්ය සඳහා ඒ වාහනය පාවිච්චි කිරීමෙහි ලා ඒ තැනැත්තා විසින් සැබැවින් ම දරන ලද වියදම් නැතහොත් සැබැවින් ම දරන ලද වියදම් නිශ්චය කළ නොහැකි අවස්ථාවක, එසේ දරන ලදැයි තක්සේරුකරු සලකන යම් මුදලක් ඒ විධායක නිලධරයා විසින් ඒ තැනැත්තාට ආපසු ගෙවා ඇත්නම් මිස ඒ වාහනය සම්බන්ධයෙන් දරන ලද වියදම් වෙනුවෙන්; හෝ

(ii) ඒ තැනැත්තාගේ සේවයෙහි නියුක්ත වෙනත් යම් තැනැත්තකු විසින් ඒ වෙනත් යම් තැනැත්තාගේ පදිංචි ස්ථානය සහ ඔහුගේ සේවා ස්ථානයත්, සේවා ස්ථානය සහ තම පදිංචි ස්ථානයත් අතර කරන ලද යම් ගමන් කිරීම් හේතුකොටගෙන ඒ තැනැත්තා විසින් දරන ලද යම් වියදම් වෙනුවෙන්

මේ ඡේදයෙහි ඉහතින් වූ විධිවිධාන යටතේ කිසිම අඩු කිරීමකට ඉඩ දෙනු නොලැබිය යුතු ය;

(ච) සමාගමක් සම්බන්ධයෙන් වූ විට, ඒ සමාගම පිහිටුවීමෙහි ලා දරන ලද වියදම්.

(2) (1) වන උපවගන්තියේ ඡේද දෙකක් හෝ ඊට වැඩි ගණනක් යටතේ යම් තැනැත්තකු යම් පිටයාමක් හෝ වියදමක් සම්බන්ධයෙන් අඩු කිරීමකට හිමිකම් ලබන අවස්ථාවක, යම් ප්‍රභවයකින් ඒ තැනැත්තා ලබන ලාභ හා ආදායම නිශ්චය කිරීමේ දී එවැනි එක් ඡේදයක් යටතේ පමණක් ඒ තැනැත්තාට අඩු කිරීමකට ඉඩ දෙනු ලැබිය යුතු ය.

(3) (අ) යම් වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රක්ෂාවක ලාභ සහ ආදායම ඉපයීමෙහි ලා යම් තැනැත්තකු විසින් පාවිච්චි කරන ලද යම් ප්‍රාග්ධන වත්කම් ඔහු විසින් බැහැර කරන හා අවස්ථාවෝචිත පරිදි, ඒ ප්‍රාග්ධන වත්කම්වල, අත්කර ගැනීමේ පිරිවැයට හෝ ඉදිකිරීමේ පිරිවැයට සමානවන සම්පූර්ණ මුදල් ප්‍රමාණයක් ඒ ප්‍රාග්ධන වත්කම් වෙනුවෙන් ක්ෂයවීම සඳහා දීමනාවක් වශයෙන් ප්‍රදානය කර ඇති අවස්ථාවක ඒ බැහැර කිරීම, වෙළෙඳාම, ව්‍යාපාරය හෝ වෘත්තිය පවත්වා ගෙන යන අතරතුර නැතහොත් එය නතර කරනු ලැබූ විට හෝ නතර කරනු ලැබීමෙන් පසු සිදු වුව ද ඒ බැහැර කිරීමෙන් ලැබුණ සම්පූර්ණ මුදල, 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව ඒ වෙළෙඳාමේ, ව්‍යාපාරයේ, වෘත්තියේ හෝ රක්ෂාවේ ලාභ සහ ආදායම නිශ්චය කිරීමේ දී, ඒ වෙළෙඳාමේ, ව්‍යාපාරයේ, වෘත්තියේ හෝ රක්ෂාවේ ලැබීමක් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

(ආ) යම් තැනැත්තකු විසින් කර ගෙන යනු ලැබූ හෝ පවත්වා ගෙන යනු ලැබූ යම් වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රක්ෂාවක ලාභ හා ආදායම් ඉපයීමෙහි ලා ඔහු විසින් පාවිච්චි කරනු ලැබූ යම් ප්‍රාග්ධන වත්කමක් ඒ තැනැත්තා විසින් බැහැර කරන හා ඒ ප්‍රාග්ධන වත්කම වෙනුවෙන් ක්ෂයවීම සඳහා දීමනාවක් ප්‍රදානය කර ඇති නමුත් ඒ දීමනාවේ සම්පූර්ණ මුදල් ප්‍රමාණය, අවස්ථාවෝචිත පරිදි, ඒ ප්‍රාග්ධන වත්කම අත් කර ගැනීමේ පිරිවැයට හෝ ඉදිකිරීමේ පිරිවැයට අඩුවන අවස්ථාවක, ඒ ප්‍රාග්ධන වත්කම අත්කර ගැනීමේ පිරිවැය හෝ ඉදිකිරීමේ පිරිවැය සහ ඒ ප්‍රාග්ධන වත්කම වෙනුවෙන් ප්‍රදානය කර ඇති ක්ෂයවීම සඳහා වූ මුළු දීමනාව අතර වෙනසට වැඩියෙන් ඒ බැහැර කිරීමෙන් ලැබෙන මුදලෙහි අතිරික්තය, ඒ බැහැර කිරීම ඒ වෙළෙඳාම, ව්‍යාපාරය හෝ වෘත්තිය පවත්වා ගෙන යන අතරතුර හෝ එය නතර කරනු ලැබීමෙන් පසුව හෝ සිදු වුව ද, 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව ඒ වෙළෙ

දාමේ, ව්‍යාපාරයේ, වෘත්තියේ හෝ රක්ෂාවේ ලාභ සහ ආදායම නිශ්චය කිරීමේ දී ඒ වෙළෙඳාමේ, ව්‍යාපාරයේ, වෘත්තියේ හෝ රක්ෂාවේ ලැබීමක් වශයෙන් සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද ඒ වෙනස, ඒ බැහැර කිරීමෙන් ලැබෙන මුදල ඉක්මවන අවස්ථාවක, ඒ අතිරික්තය (1) වන උපවගන්තියේ කාර්ය සඳහා ආදායම ඉපයීමෙහි ලා දරන ලද වියදමක් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

(ඇ) මේ පනත යටතේ මුළුමනින් ම හෝ අර්ධ වශයෙන් ආදායම් බද්දෙන් නිදහස් ලාභ හෝ ආදායම ලබන යම් ව්‍යවසායක් කර ගෙන යන තැනැත්තකු විසින් ඒ ව්‍යවසායේ කාර්ය සඳහා පාවිච්චි කරනු ලබන යම් ප්‍රාග්ධන වත්කමක් ඔහු විසින් බැහැර කරනු ලබන අවස්ථාවක (අ) ඡේදය හෝ (ආ) ඡේදය යටතේ නිශ්චය කරන ලද ප්‍රමාණයට සමාන ප්‍රමාණයක් මත ඒ තැනැත්තා ආදායම් බද්දට යටත් විය යුතු ය.

(ඈ) (අ) ඡේදයෙහි හෝ (ආ) ඡේදයෙහි සඳහන් යම් ප්‍රාග්ධන වත්කමක්, වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රක්ෂාවක අර්ධ වශයෙන් පමණක් පාවිච්චි කරනු ලැබූ අවස්ථාවක, (අ) ඡේදය හෝ (ආ) ඡේදය යටතේ ලැබීමක් වශයෙන් සලකනු ලබන ප්‍රමාණය හෝ (ආ) ඡේදය යටතේ වියදමක් වශයෙන් සලකනු ලබන ප්‍රමාණය හෝ සමානුපාතිකව අඩු කරනු ලැබිය යුතු ය.

(4) මෙහි මින් මතු සලස්වා ඇති විධිවිධානවලට යටත්ව, පොලී වශයෙන් උපදින ආදායම, පිටයාම් හෝ වියදම් සඳහා යම් අඩු කිරීමක් නොමැතිව, ලැබුනේ වුව ද නො වුවද, අයවීමට ඇති පොලියේ මුළු ප්‍රමාණය විය යුතු ය:

එසේ වුව ද—

(අ) යම් පොලියක් ගෙවා නොමැති බව සහ එය අයකර ගත නොහැකි බව යම් තක්සේරුකරුවකුට පෙනී යන අවස්ථාවක, ඒ පොලිය ඇතුළත් යම් තක්සේරුවකින් 123 වන වගන්තියේ විධිවිධාන කෙසේ වුව ද, ගෙවා නොමැති බවට හා අය කර ගත නොහැකි බවට පෙන්වා ඇති ඒ ඇතුළත් කරන ලද පොලී ප්‍රමාණය අඩු කරනු ලැබිය යුතු ය; නැතහොත් ඒ පොලී වෙනුවෙන් ආදායම් බද්ද ගෙවා ඇත්නම්, ඒ බද්ද ගෙවනු ලැබුවේ යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් ද, ඒ තක්සේරු වර්ෂය අවසානයේ සිට අවුරුදු තුනක් ඇතුළත ලිඛිතව කරනු ලබන හිමිකම් පෑමක් මත ඒ බද්ද ආපසු ලැබිය හැකි ය;

(ආ) යම් තක්සේරු වර්ෂයක, ණය මුදල් සම්බන්ධයෙන් අය වීමට ඇති යම් පොලියක් ලැබී නොමැති හා ඒ පොලිය අය කර ගත නොහැකි වීමට ඉඩ ඇති අවස්ථාවක, පොලිය අය වීමට ඇති තැනැත්තා විසින්, ඒ තක්සේරු වර්ෂය සඳහා ආදායම් බද්ද අය කළ හැකි ලාභ හා ආදායමෙන් ඒ පොලිය අත් හරිනු ලැබිය හැකි ය;

(ඇ) (ආ) ඡේදය යටතේ තක්සේරුවකින් අත්හරිනු ලැබූ යම් පොලියක් ඊට පසු ලැබී ඇති බව සහ ඒ පොලිය සම්බන්ධයෙන් ආදායම් බදු ගෙවා නොමැති බව තක්සේරුකරුවකුට පෙනී යන අවස්ථාවක තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් කළ හැකි කාලය සීමා කරමින් 115 (5) වන වගන්තියේ කුමක් සඳහන්ව ඇත ද, ඒ පොලිය ඇතුළත් කොට තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් කරනු ලැබිය හැකි ය.

(5) යම් ප්‍රාග්ධන වත්කමක් වෙනුවෙන් (1)(අ), (1)(ආ), (1) (ඇ), (1) (ඈ), (1) (ඉ) හෝ (1) (ඊ) උපවගන්තිය යටතේ කිසිම අඛණ්ඩීමක්—

(අ) යම් තැනැත්තකු—

(i) 3 වන වගන්තියෙහි (අ) ඡේදයේ අර්ථානුකූලව සම්පූර්ණ ලාභ සහ ආදායම හෝ ලාභවල සහ ආදායමෙහි කොටසක් හෝ ආදායම් බද්දෙන් නිදහස් කර ඇති යම් ව්‍යවසායකට එම ප්‍රාග්ධන වත්කම කුලියට දී ඇත්නම්; නැතහොත්

(ii) එම ප්‍රාග්ධන වත්කම අත්කර ගන්නා ලද්දේ වෙනත් යම් තැනැත්තකුගෙන් ද, ඒ තැනැත්තා විසින් හෝ ඒ තැනැත්තාගේ පවුලේ යම් සාමාජිකයකු විසින් හෝ තමාගේ පවුලේ යම් සාමාජිකයකු විසින් වෙනත් යම් තැනැත්තකු හෝ තැනැත්තන් සමඟ පවත්වාගෙන යනු ලබන යම් ව්‍යවසායක ප්‍රයෝජනය සඳහා එම ප්‍රාග්ධන වත්කම කුලියට දී ඇත්නම්; හෝ

(ආ) යම් තැනැත්තකු ඒ ප්‍රාග්ධන වත්කම අත්කර ගන්නා ලද්දේ වෙනත් යම් තැනැත්තකුගෙන් ද ඒ තැනැත්තා සමඟ හෝ ඒ තැනැත්තාගේ පවුලේ සාමාජිකයකු සමඟ හෝ පළමු කී තැනැත්තා විසින් පවත්වා ගෙන යනු ලබන යම් ව්‍යවසායක ඒ තැනැත්තා ඒ ප්‍රාග්ධන වත්කම යොදවයි නම්

ඒ තැනැත්තාට ලබා නොදිය යුතු ය:

එසේ වුව ද මේ උපවගන්තියේ ඉහත සඳහන් විධිවිධාන කිසිවක් යම් තැනැත්තකු විසින් පවත්වා ගෙන යනු ලබන 16 වන වගන්තියේ (ආ) ඡේදයෙහි සඳහන් ව්‍යවසායක් සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

(6) භාර්යාව සහ පුරුෂයා යන දෙපාර්ශ්වයෙන්,

(අ) එක් පාර්ශ්වයක් විසින්; හෝ

(ආ) ඒ එක් පාර්ශ්වයක් හවුල්කරුවකු වන හවුල් ව්‍යාපාරයක් විසින් හෝ

පවත්වාගෙන යනු ලබන නැතහොත් කරගෙන යනු ලබන යම් වෙළෙඳාමකට, ව්‍යාපාරයකට, වෘත්තියකට හෝ රක්ෂාවකට කරන ලද සේවය සඳහා අනෙක් පාර්ශ්වයට ලැබෙන ලාභ සහ ආදායම පළමු කී පාර්ශ්වයෙහි ලාභ සහ ආදායම ලෙස සැලකිය යුතු ය.

(7) මේ වගන්තියෙහි කාර්යය සඳහා—

(අ) යම් ප්‍රාග්ධන වත්කමකට අදාළව "ක්ෂයවීම සඳහා දීමනාව" යන්නෙන් ඒ වත්කම සම්බන්ධයෙන්—

(i) මේ වගන්තියේ (1) වන උපවගන්තියෙහි (අ) ඡේදය හෝ (ආ) ඡේදය හෝ (ඇ) ඡේදය හෝ (ඈ) ඡේදය හෝ (ඉ) ඡේදය යටතේ හෝ 162 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ; හෝ

(ii) 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 10 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි (අ) ඡේදය හෝ (උ) ඡේදය හෝ (එ) ඡේදය හෝ (ඕ) ඡේදය හෝ (ක) ඡේදය හෝ (ග) ඡේදය හෝ (ච) ඡේදය හෝ (ජ) ඡේදය යටතේ ; හෝ

(iii) ආදායම් බදු ආඥාපනතේ 11 වන වගන්තියෙහි (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ හෝ (ඊආ) වන උපවගන්තිය යටතේ හෝ (ඊඇ) වන උපවගන්තිය යටතේ

අඩු කළ යුතු යම් දීමනාවක් අදහස් වේ ;

(ආ) වෙළෙඳාමකට, ව්‍යාපාරයකට, වෘත්තියකට හෝ රක්ෂාවකට අදාළව "ප්‍රාග්ධන වත්කම" යන්නෙන් ඒ වෙළෙඳාමෙහි, ව්‍යාපාරයෙහි, වෘත්තියෙහි හෝ රක්ෂාවෙහි ආදායම ඇති කිරීමේ කාර්යය සඳහා උපයෝගි කර ගනු ලබන පිරියත්, යන්ත්‍ර, සවිකිරීමේ උවාරණ, මෙවලම්, භාණ්ඩ සහ උපකරණ හෝ එම වෙළෙඳාමෙහි, ව්‍යාපාරයෙහි, වෘත්තියෙහි හෝ රක්ෂාවෙහි කාර්යයන් සඳහා ඉදි කරන ලද ගොඩනැගිල්ලක් හෝ අදහස් වේ ;

(ඇ) යම් ප්‍රාග්ධන වත්කමක් බැහැර කිරීමට අදාළව "ලැබුණ මුදල්" යන්නෙන්—

(i) බැහැර කිරීම විකිණීමක් මගින් වන අවස්ථාවක එම වත්කමෙහි විකුණුම් මිල ; හෝ

(ii) බැහැර කිරීම විකිණීමක් නොවන වෙනත් ආකාරයක බැහැර කිරීමක් වන අවස්ථාවක බැහැර කළ අවස්ථාවේ එම වත්කමෙහි වෙළෙඳ වටිනාකම ; හෝ

අදහස් වේ.

(ඈ) යම් තැනැත්තකු විසින් යම් ප්‍රාග්ධන වත්කමක් බැහැර කිරීමට අදාළව "බැහැර කිරීම" යන්නට—

(i) ඒ තැනැත්තා විසින් ඒ වත්කම විකිණීම, හුවමාරු කිරීම හෝ කවර වූ හෝ වෙනත් ආකාරයකින් පැවරීම ද ;

(ii) එම තැනැත්තා විසින් එම වත්කම ඉවතලීම ද ;

(iii) එම තැනැත්තා විසින් පවත්වා ගෙන යනු ලබන්නා වූ ද, ලාභ සහ ආදායම නිශ්චය කිරීමේ දී ක්ෂය වීම සඳහා දීමනාවක් අඩු කළ හැකි වන්නා වූ ද යම් ව්‍යවසායක, එම වත්කම උපයෝගී කර ගැනීම ඒ තැනැත්තා විසින් නතර කිරීම ද

ඇතුළත් වේ; තවද

(ඉ) "සුදුසුකම් ලැබූ ගොඩනැගිල්ල" යන්නෙන් වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රක්ෂාවක සේවයෙහි නියුක්ත විධායක නිලධරයකු විසින් පදිංචි නිවාසයක් ලෙස ප්‍රයෝජනයට ගනු ලබන්නක් නොවන එම වෙළෙඳාමෙහි, ව්‍යාපාරයෙහි, වෘත්තියෙහි හෝ රක්ෂාවෙහි කාර්යයන් සඳහා ප්‍රයෝජනයට ගැනීම පිණිස ඉදි කරන ලද ගොඩනැගිල්ලක් අදහස් වේ.

ලාභ සහ ආදායම නිශ්චය කිරීමේදී ඉඩ නොදිය යුතු අඩු කිරීම්.

24. (1) යම් ප්‍රභවයකින් යම් තැනැත්තකු ලබන ලාභ හෝ ආදායම නිශ්චය කිරීමේ කාර්ය සඳහා—

(අ) එම තැනැත්තාගේ වාසස්ථානය සහ ඔහුගේ ව්‍යාපාරික හෝ සේවා නියුක්ති ස්ථානය අතර ගමන් කිරීමේ වියදම ඇතුළුව ගෙදරදොර සහ පෞද්ගලික වියදම්;

(ආ) 23 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි (උ) සහ (ඒ) යන ඡේදවල සඳහන් වියදම් නොවන සිය සේවා නියුක්තියට අදාළව දරන ලද වියදම්;

(ඇ) ඒ තැනැත්තා විසින් ශ්‍රී ලංකාවෙහි පවත්වාගෙන යනු ලබන නැතහොත් කරගෙන යනු ලබන යම් වෙළෙඳාමකට, ව්‍යාපාරයකට, වෘත්තියකට, රක්ෂාවකට අදාළව, හුදෙක්ම—

(i) යම් ද්‍රව්‍යයක හෝ බඩුවක අපනයන වෙළෙඳාම නංවා ලීම; හෝ

(ii) විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම් කිරීම සඳහා යම් සේවා වන් සැපයීම

සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවෙන් පිටත ගමන් බිමන්වලදී දරන ලද වියදම් නොවන ශ්‍රී ලංකාවෙන් පිටත ගමන් බිමන් සඳහා දරන ලද වියදම්;

(ඈ) ඒ තැනැත්තා විසින් පවත්වා ගෙන යනු ලබන හෝ කර ගෙන යනු ලබන යම් වෙළෙඳාමකට, ව්‍යාපාරයකට, වෘත්තියකට හෝ රක්ෂාවකට අදාළව ඒ තැනැත්තා විසින් හෝ ඔහුගේ සේවා නියුක්තියකු විසින් හෝ ඔහු වෙනුවෙන් හෝ දරන ලද සංග්‍රහ වියදම්;

(ඉ) ඒ තැනැත්තා විසින් ඔහුගේ විධායක නිලධරයාට ගෙවනු ලබන සංග්‍රහ දීමනාව;

(ඊ) යම් ද්‍රව්‍ය හෝ භාණ්ඩ අපනයන වෙළෙඳාමට නැතහොත් විදේශීය ව්‍යවහාර මුදලින් ගෙවනු ලැබීම පිණිස යම් සේවා වක් සැපයීම සම්බන්ධයෙන් පමණක් ශ්‍රී ලංකාවෙන් පිටත දරන ලද ප්‍රචාරක වියදම් නොවන, එම තැනැත්තා විසින්

පවත්වා ගෙන යනු ලබන නැතහොත් කර ගෙන යනු ලබන යම් වෙළෙඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් සම්බන්ධයෙන් ඔහුගේ ප්‍රචාරක වියදමින් හතරෙන් එකක්;

(ථ) ඒ ලාභ හෝ ආදායම නිපදවීමේ කාර්යය සඳහා වියදම් කරන ලද මුදලක් නොවන ඒ තැනැත්තාගේ විය පැහැදම් හෝ ගෙවීම්;

(ද) ඒ තැනැත්තා විසින් දරන ලද ප්‍රාග්ධනයක ස්වභාවයේ යම් වියදමක් නැතහොත් ප්‍රාග්ධන හානියක්;

(ධ) ඒ තැනැත්තා විසින් කරන ලද යම් වැඩිදියුණු කිරීම්වල වියදම;

(න) රක්ෂණ හෝ හානි රක්ෂණ ගිවිසුමක් යටතේ ලැබුණ මුදල් 89 වන වගන්තිය යටතේ ආදායම ලෙස සලකනු නොලැබේ නම් එවැනි ගිවිසුමක් යටතේ අයකර ගත හැකි යම් මුදලක්;

(ප) ඒ ලාභ සහ ආදායම නිපදවීමේ කාර්යය සඳහා පදිංචියට නො ගන්නා ලද හෝ පරිහරණය නො කරන ලද යම් ස්ථානයක් හෝ ස්ථානයක කොටසක් සම්බන්ධයෙන් වූ කුලිය හෝ වියදම්;

(ඵ) එම තැනැත්තා විසින්—

(i) ද්විත්ව බදු ගෙවීම් වැළැක්වීම පිණිස ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් ඇති කර ගනු ලැබූ ගිවිසුමක් වලංගුව ඇති යම් රටක ආදායම් බද්ද, අති බද්ද, අධි බද්ද හෝ ඒ බදුවලට සමාන ස්වභාවයක යම් බද්දක් 82 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයෙන් ශ්‍රී ලංකාවේ ආදායම් බද්ද සම්බන්ධයෙන් බැර කිරීමට ඉඩ හරිනු ලැබූ උපරිම මුදල ඉක්මවන්නේ යම් ප්‍රමාණයකින්ද, ඒ ප්‍රමාණය හැර එසේ ද්විත්ව බදු ගෙවීම් වැළැක්වීම පිණිස ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් ඇති කරගනු ලැබූ ගිවිසුම් වලංගුව ඇති ඒ රටේ ආදායම් බද්ද හෝ අති බද්ද හෝ අධි බද්ද වශයෙන් හෝ ඒ බදුවලට සමාන ස්වභාවයක බද්දක් වශයෙන්; හෝ

(ii) ශ්‍රී ලංකාවේ ආදායම් බද්ද හෝ 83 වන වගන්තියෙහි අර්ථකථනය කර ඇති පොදුරාජ්‍ය මණ්ඩල බද්ද වශයෙන්; හෝ

(iii) යම් නියමිත බද්දක් හෝ අයකිරීමක් වශයෙන් ගෙවනු ලැබූ හෝ ගෙවිය යුතු යම් මුදල් ප්‍රමාණ.

මේ ඡේදයෙහි කාර්ය සඳහා බද්දක් හෝ අයකිරීමක් නියම කරන යම් නියෝගයක්, එම නියෝගය කරනු ලැබූ දිනයට පූර්වයෙන් වූ දිනයක සිට ක්‍රියාත්මක විය යුතු යයි ප්‍රකාශ කරනු ලැබිය හැකිය.

(ක) එම තැනැත්තා විසින් ගෙවනු ලද යම් වාර්ෂිකයක්, බිම් කුලියක් හෝ රාජ්‍ය භාගයක්; හෝ

(ඛ) 23 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි (ඒ) ඡේදය යටතේ ඉඩ දෙන ලද ගෙවීම් නොවන, යම් විශ්‍රාම වැටුප කට, අර්ථසාධක අරමුදලකට, ඉතිරි කිරීමකට, වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුපකට හෝ වෙනත් සමිතියකට හෝ අරමුදලකට එම තැනැත්තා විසින් කරන ලද ගෙවීම්

සම්බන්ධයෙන් අඩුකිරීම් නොකළ යුතු ය.

(2) යම් වෙළෙඳාමක් හෝ ව්‍යාපාරයක් පවත්වා ගෙන යන්නා වූ හෝ යම් වෘත්තියක් හෝ රක්ෂාවක් කර ගෙන යන්නා වූ කිසිම තැනැත්තෙක්, ඒ තැනැත්තාගේ වෙළෙඳාමෙහි, ව්‍යාපාරයෙහි, වෘත්තියෙහි හෝ රක්ෂාවෙහි කාර්ය සඳහා ඒ තැනැත්තාගේ සේවයෙහි නියුක්ත විධායක නිලධරයකු නොවන යම් නිලධරයකු විසින් පාවිච්චි කරනු ලබන මෝටර් බයිසිකලයක් හෝ බයිසිකලයක් හැර, එම කාර්ය සඳහා එම තැනැත්තා විසින් ගමන් බිමන් සඳහා පාවිච්චි කරනු ලබන යම් වාහනයක වැහැරීම හා ගෙවී යාම නිසා ක්ෂයවීම සඳහා හෝ එය අලුත් කිරීම සඳහා යම් මුදලකට හෝ 23 (1) (අ) හෝ 23 (1) (ඉ) හෝ 23 (1) (ඊ) වගන්තිය යටතේ යම් දීමනාවකට හෝ හිමිකම් නොලැබිය යුතු ය.

(3) ඉඩමක සහ එහි වැඩිදියුණු කිරීම්වල වාර්ෂික වටිනාකමින් හෝ කුලියෙන් ඇති වන ලාභ හෝ ආදායම නිශ්චය කිරීමේ දී වාණිජ ගොඩනැගිලි කුලියට දීමේ ව්‍යාපාරය පවත්වා ගෙන යන සමාගමක් සම්බන්ධයෙන් හැර, අවස්ථාවෝචිත පරිදි 5 වන වගන්තියෙහි හෝ 6 වන වගන්තියෙහි අවසර දී ඇති පිටත යාම් සහ වියදම් සඳහා මිස, පිටත යාම් සහ වියදම් සම්බන්ධයෙන් අඩු කිරීම් නොකළ යුතු ය.

V වන පරිච්ඡේදය

මුළු ව්‍යවස්ථාපිත ආදායම නිශ්චය කිරීම

25. (1) සෑම තැනැත්තකුගේ ම බදු නියම කළ යුතු සෑම ලාභ සහ ආදායම් ප්‍රභවයකින් ම, එක් එක් තක්සේරු වර්ෂය සඳහා එම තැනැත්තාගේ ව්‍යවස්ථාපිත ආදායම, ඒ ලාභ හෝ ආදායම් ප්‍රභවවල සන්තකය ඔහුට නැතිව ගිය ද, නැතහොත් ඒ ප්‍රභව වලින් ආදායම් ලැබීම නතර වුව ද එය නොතකා ඒ තක්සේරු වර්ෂය තුළ දී ඒ ප්‍රභවවලින් ඔහු විසින් ලබන ලද්දා වූ හෝ ඔහුගේ ප්‍රයෝජනයට ඇති වූ නැතහොත් උපචිත වූ ලාභවල හෝ ආදායමෙහි මුළු මුදල විය යුතු ය. ව්‍යවස්ථාපිත ආදායම ආගණනය කිරීමේ පදනම.

(2) යම් වෙළෙඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් පවත්වා ගෙන යන හෝ කරගෙන යන සෑම තැනැත්තකු විසින්ම, (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, එක් එක් වර්ෂයේ මාර්තු මස තිස් එක් වන දිනයෙහි අවසන් වන එක් එක් අනුපූර්ව මාස දොළහේ කාල සීමාව සඳහා ඒ වෙළෙඳාමෙහි, ව්‍යාපාරයෙහි, වෘත්තියෙහි හෝ රක්ෂාවෙහි ගිණුම් පිළියෙල කරනු ලැබිය යුතු ය:

එසේ වුවද—

(අ) යම් තැනැත්තකු වෙළෙඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් පවත්වා ගෙන යාම හෝ කරගෙන යාම යම් තක්සේරු වර්ෂයක් තුළ දී ආරම්භ කරනු ලබන අවස්ථාවක, එම වෙළෙඳාම, ව්‍යාපාරය, වෘත්තිය හෝ රක්ෂාව ආරම්භ කළ දිනයෙන් ආරම්භව එම තක්සේරු වර්ෂයේ මාර්තු මස තිස් එක් වන දිනයෙන් අවසන් වන කාල සීමාව සඳහා එම වෙළෙඳාමෙහි, ව්‍යාපාරයෙහි, වෘත්තියෙහි හෝ රක්ෂාවෙහි ගිණුම් එම තැනැත්තා විසින් පිළියෙල කරනු ලැබිය යුතු ය.

(ආ) යම් තැනැත්තෙක් වෙළෙඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් පවත්වා ගෙන යෑම හෝ කරගෙන යෑම යම් තක්සේරු වර්ෂයක් තුළදී අවසාන කරනු ලබන අවස්ථාවක, එම තක්සේරු වර්ෂයේ අප්‍රේල් මස පළමුවන දිනයෙන් ආරම්භව එසේ අවසාන කරනු ලැබූ දිනයෙන් අවසන් වන කාල සීමාව සඳහා එම වෙළෙඳාමෙහි, ව්‍යාපාරයෙහි, වෘත්තියෙහි හෝ රක්ෂාවෙහි ගිණුම් ඒ තැනැත්තා විසින් පිළියෙල කරනු ලැබිය යුතු ය.

(3) යම් තැනැත්තකු විසින් පවත්වාගෙන යනු ලබන හෝ කරගෙන යනු ලබන යම් වෙළෙඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් සම්බන්ධයෙන් (2) වන උපවගන්තියේ විධිවිධානවලට අනුව කටයුතු කිරීමට එම තැනැත්තාට නොහැකි වන අවස්ථාවක, එම විධිවිධානවලට අනුව කටයුතු කිරීමට තමාට නොහැකිවීම පිළිබඳව හේතු දක්වමින් එම තැනැත්තා විසින් කොමසාරිස් ජනරාල්වරයා වෙත ලියවිල්ලකින් වූ දැන්වීමක් කළ යුතු ය. එම දැන්වීමෙහි දක්වා ඇති හේතු පිළිබඳව කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් වුවහොත් ඔහු විසින් විධානයක් කිරීමෙන්, ඒ විධානයෙහි නිශ්චිත කාල සීමාවන් සඳහා ඒ වෙළෙඳාමෙහි, ව්‍යාපාරයෙහි, වෘත්තියෙහි නැතහොත් රක්ෂාවෙහි ගිණුම් පිළියෙල කරන ලෙස විධාන කළ හැකි අතර ඒ විධානය අනුව කටයුතු කිරීම ඒ තැනැත්තාගේ කාර්යය විය යුතු ය:

එසේ වුව ද මේ උපවගන්තියේ ඉහත දැක්වෙන විධිවිධාන යටතේ, කොමසාරිස් ජනරාල්වරයා විසින් කරන ලද යම් විධානයක්, ඕනෑම අවස්ථාවක දී ඔහු විසින් වෙනස් කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම කරනු ලැබිය හැකි ය.

ලාභ බෙදා වෙන් කිරීම.

26. යම් තක්සේරු වර්ෂයක් හෝ වෙනත් කාල සීමාවක් සඳහා යම් වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක, රක්ෂාවක නැතහොත් සේවා නියුක්තියක ලාභ හෝ අලාභ නිශ්චය කරනු ලැබීම පිණිස ගිණුම් පිළියෙල කරනු ලැබූ යම් කාල සීමාවක් සඳහා ලාභ හෝ අලාභ නිශ්චිත කාලසීමාවලට බෙදීම හෝ බෙදා වෙන් කිරීම නැතහොත් එම ලාභ හෝ අලාභ හෝ ඒ වායේ බෙදා වෙන් කරනු ලැබූ කොටස් හෝ එකතු කිරීම අවශ්‍ය වන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි එලෙස බෙදීම සහ බෙදා වෙන් කිරීම හෝ එකතු කිරීම නීත්‍යනුකූල විය යුතු ය.

ගිණුම් පිළියෙල කරනු ලැබූ යම් කාල සීමාවක් සඳහා ලාභ හෝ අලාභ බෙදා වෙන් කිරීම එම ලාභ හෝ අලාභ එම කාල සීමාව තුළ එක සමානව ලැබුණේ ය යන පදනම මත කළ යුතු ය.

මූළු ව්‍යවස්ථාපිත ආදායම.

27. යම් තක්සේරු වර්ෂයක් සඳහා තැනැත්තකුගේ මූළු ව්‍යවස්ථාපිත ආදායම, බදු අය කරනු ලබන්නේ ඔහුගේ යම් ලාභ සහ ආදායම් සම්බන්ධයෙන් ද ඒ සෑම ලාභ සහ ආදායම් ප්‍රභවය කින් ම, ඒ තක්සේරු වර්ෂය සඳහා වූ ඔහුගේ ව්‍යවස්ථාපිත ආදායමෙහි එකතුව විය යුතු ය.

දරුවකුගේ මූළු ව්‍යවස්ථාපිත ආදායම් ඔහුගේ දෙමව්පියකුගේ ආදායමට එකතු කළ යුතු බව.

28. තක්සේරු වර්ෂයක් සඳහා වාසික පුද්ගලයකුගේ දරුවකුගේ මූළු ව්‍යවස්ථාපිත ආදායම,—

(අ) ඔහුගේ දෙමව්පියන්ගේ විවාහය ඒ තක්සේරු වර්ෂයේ දී පවතී නම් ඔහුගේ පියාගේ ; නැතහොත්

(ආ) ඔහුගේ දෙමව්පියන්ගේ විවාහය ඒ තක්සේරු වර්ෂයේ දී නොපවතී නම් ඔහු නඩත්තු කරන්නා වූ ද, ඔහු ජීවත් වන්නේ මව් පිය දෙදෙනාගෙන් යම් කෙනකු සමඟ ද, ඒ තැනැත්තා වන්නා වූ ද මවගේ හෝ පියාගේ,

මූළු ව්‍යවස්ථාපිත ආදායමට එකතු කළ යුතු අතර, එය මවගේ හෝ පියාගේ මූළු ව්‍යවස්ථාපිත ආදායමෙහි කොටසක් ලෙස සලකනු ලැබිය යුතු ය.

නිසි බලය ඇති අධිකරණයක නීත්‍යනුකූල ප්‍රකාශයක් හෝ යථා පරිදි ලියා අත්සන් කරන ලද වෙන්වීමේ ඔප්පුවක් හෝ යටතේ භාර්යාව ඇයගේ ස්වාමි පුරුෂයාගෙන් වෙන්ව වාසය කරන්නේ නම් හෝ වෙන්වීම ස්ථිර වශයෙන් ම සිදුවිය හැකි අවස්ථානුගත කරුණු සහිතව ස්වාමි පුරුෂයා සහ භාර්යාව ඇත්ත වශයෙන් ම වෙන්ව සිටින් නම් මේ වගන්තියේ කාර්ය සඳහා විවාහය නොපවතින්නේ යයි සලකනු ලැබිය යුතු ය.

VI වන පරිච්ඡේදය

තක්සේරු කළ හැකි ආදායම නිශ්චය කිරීම

තක්සේරු කළ හැකි ආදායම් ගණන් බැලීමේ දී මූළු ව්‍යවස්ථාපිත ආදායමින් කරනු ලබන අඩු කිරීම්.

29. (1) යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකුගේ තක්සේරු කළ හැකි ආදායම, මේ වගන්තියෙහි නියමිත අඩුකිරීම් වලට යටත් ව ඒ වර්ෂය සඳහා ඔහුගේ මූළු ව්‍යවස්ථාපිත ආදායම විය යුතු ය.

(2) යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකුගේ මූළු ව්‍යවස්ථාපිත ආදායමෙන්—

(අ) වාර්ෂිකයක් වශයෙන් හෝ බිම් කුලී වශයෙන් හෝ රාජ්‍ය භාග වශයෙන් හෝ 23 වන වගන්තිය යටතේ අඩු කළ නොහැකි පොලී වශයෙන් ඒ තක්සේරු වර්ෂය සඳහා ඔහු විසින් ගෙවිය යුතු මුදල් අඩු කරනු ලැබිය යුතු ය.

එසේ වුවද—

(i) ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටින තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටින වෙනත් තැනැත්තකුට පොලී, වාර්ෂික බිම් කුලී හෝ රාජ්‍ය භාග ලාභයෙන් ගෙවිය යුතු යම් මුදලක් සම්බන්ධයෙන් කිසිම අඩු කිරීමකට ඉඩ නොදිය යුතු ය;

(ii) යම් තක්සේරු වර්ෂයක් සඳහා එසේ ගෙවිය යුතු යම් මුදල් ප්‍රමාණයකින් ඒ වර්ෂයේ මුළු ව්‍යවස්ථාපිත ආදායමට වඩා වැඩි වන අවස්ථාවක, මේ වගන්තියේ කාර්ය සඳහා, ඒ අතිරික්තය එකී වර්ෂය ඇතුළත වෙළෙඳාමකින් සිදුවූ අලාභයක් මෙන් සලකනු ලැබිය යුතු ය;

(iii) එසේ ගෙවිය යුතු යම් මුදලක් ගෙවා නොමැති බව තක්සේරුවක් කරන යම් අවස්ථාවක තක්සේරු කරුට පෙනී ගියහොත් ඒ මුදල සම්බන්ධයෙන් කිසිම අඩු කිරීමකට ඉඩදීම ඔහු විසින් ප්‍රතික්ෂේප කළ හැකි ය;

(iv) (iii) වන ඡේදය යටතේ අඩු කිරීමක් ප්‍රතික්ෂේප කර ඇත්තේ යම් මුදලක් සම්බන්ධයෙන්ද, ඒ මුදල තදනන්තරව ගෙවා ඇති බව තක්සේරු කරුට පෙනී යන අවස්ථාවක එම ගෙවීම කළ දින සිට මාස දොළහක් ඇතුළත, තක්සේරුකරු නියම කරන ආකාරයක සාක්ෂිවලින් සනාථ කරනු ලැබූ ද, ලියවිල්ලකින් වූ ද ඉල්ලීමක් පිට තක්සේරු කරු විසින් 123 වන වගන්තියෙහි විධිවිධානවලට කුමක් සඳහන්ව ඇත ද එම අඩුකිරීමට ඉඩ දෙමින් සංශෝධිත තක්සේරුවක් කළ හැකිය. වැඩියෙන් ගෙවා ඇතැයි ඒ සංශෝධිත තක්සේරුව අනුව පෙනී යන යම් බද්දක් 149 වන වගන්තියෙහි විධිවිධානවලට කුමක් සඳහන්ව ඇතද ආපසු ගෙවනු ලැබිය යුතු ය: තව ද

(ආ) යම් තක්සේරු වර්ෂයක් තුළ දී යම් වෙළෙඳාමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින් හෝ රක්ෂාවකින් ඔහුට සිදුවන ප්‍රාග්ධන අලාභයක් හෝ (7) වන උපවගන්තියෙහි සඳහන් අලාභයක් හෝ නොවන අලාභයක් වන්නා වූ ද, අලාභයක් නොව ලාභයක් වූයේ නම් මේ පනත හෝ 1963 අංක 4 දරන දේශීය ආදායම් පනත හෝ යටතේ තක්සේරු කළ හැකිව තිබූ ද එම පනත් යටතේ ඉකුත් වර්ෂයක ඔහුගේ ව්‍යවස්ථාපිත ආදායමින් අඩු කරනු නොලැබුවා වූ ද අලාභයක මුදල අඩු කරනු ලැබිය යුතු ය.

එසේ වුවද—

(i) යම් අලාභයක් සම්බන්ධයෙන් ව්‍යවස්ථාපිත ආදායමින් අඩු කරනු ලබන මුළු මුදල, ඒ අලාභයේ ප්‍රමාණයට වඩා කිසිම අවස්ථාවක වැඩි නොවිය යුතු ය;

(ii) මේ ඡේදය යටතේ අඩු කිරීමක් හැකිතාක් දුරට අලාභය සිදු වූ තක්සේරු වර්ෂයේ ව්‍යවස්ථාපිත

ආදායමින් අඩු කළ යුතු අතර එසේ අඩු කළ නොහැකි වූ ප්‍රමාණයක් ඊළඟට යෙදෙන්නා වූ තක්සේරු වර්ෂයෙහි සහ ඊළඟට යෙදෙන්නා වූ තක්සේරු වර්ෂයෙහි යනාදී වශයෙන් පිළිවෙලින් ව්‍යවස්ථාපිත ආදායමින් අඩුකර ගත යුතු ය.

(3) (අ) මේ පනතේ 16 වන වගන්තිය යටතේ හෝ 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 6 වන වගන්තිය යටතේ හෝ යම් ව්‍යවසායක ලාභ සහ ආදායම, නිදහස් කරන ලද කාල සීමාව ලෙස මේ ඡේදයෙහි සඳහන් කරනු ලබන යම් කාල සීමාවක් සඳහා ආදායම් බද්දෙන් නිදහස්ව තිබුණු අවස්ථාවක, එම නිදහස් කිරීම අදාළවීම අවසන් වූ ප්‍රථම තක්සේරු වර්ෂයේ දී ඒ ව්‍යවසාය පවත්වා ගෙන යන තැනැත්තාගේ මුළු ව්‍යවස්ථාපිත ආදායමෙන්, නිදහස් කරන ලද කාල සීමාවේ යම් තක්සේරු වර්ෂයක දී ඒ තැනැත්තා විසින් ඒ ව්‍යවසායේ දී දරන ලද අලාභවල එකතුව, ඒ ව්‍යවසායෙහි ඒ අලාභය සිදුවූයේ යම් තක්සේරු වර්ෂයක දී ද ඒ තක්සේරු වර්ෂයට පසු එළඹෙන නිදහස් කරන ලද කාල සීමාවේ දී යම් තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බද්දෙන් නිදහස් කරන ලද ඒ ව්‍යවසායෙහි ලාභ සහ ආදායම ඉක්මවයි නම්, එම අතිරික්තය අඩු කරනු ලැබිය යුතු ය.

(ආ) (අ) ඡේදයෙහි සඳහන් අලාභ ශේෂයෙහි මුළු ප්‍රමාණය ම හෝ ඉන් යම් කොටසක් ප්‍රථම තක්සේරු වර්ෂය සඳහා වූ ඒ තැනැත්තාගේ ව්‍යවස්ථාපිත ආදායමින් අඩු කළ නොහැකි වන අවස්ථාවක, ඒ මුළු ප්‍රමාණය ම හෝ කොටස ඊළඟට එළඹෙන ඔහුගේ තක්සේරු වර්ෂයේ ව්‍යවස්ථාපිත ආදායමින් අඩු කළ යුතු අතර, එසේ කළ නොහැකි විට ඊළඟට එළඹෙන තක්සේරු වර්ෂයේ ව්‍යවස්ථාපිත ආදායමින් යනා දී පිළිවෙලට අඩු කළ යුතු ය.

(4) (අ) මේ වගන්තියෙහි පටහැනිව කුමක් සඳහන් ව ඇත ද, 18 වන වගන්තියෙහි සඳහන් යම් ව්‍යවසායක් ආරම්භ වූ දින සිට 1983 මාර්තු මස 31 වන දිනය දක්වා වූ යම් තක්සේරු වර්ෂයක දී, ඒ ව්‍යවසාය පවත්වා ගෙන යන යම් තැනැත්තකු විසින් ඒ ව්‍යවසායෙන් දරන ලද යම් අලාභයක්, 1983 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ තැනැත්තාගේ මුළු ව්‍යවස්ථාපිත ආදායමෙහි ඒ ව්‍යවසායෙන් ඒ තැනැත්තාගේ ව්‍යවස්ථාපිත ආදායම වන කොටසින් පමණක් අඩු කර ගත යුතු ය:

එසේ වුව ද මේ ඡේදය යටතේ අඩු කිරීමක් හැකිතාක් දුරට අලාභය සිදු වූ තක්සේරු වර්ෂයට පසුව යෙදෙන ප්‍රථම තක්සේරු වර්ෂය සඳහා එම ව්‍යවසායෙන් ඒ තැනැත්තා ලබන ව්‍යවස්ථාපිත ආදායමින් අඩු කළ යුතු අතර, එසේ අඩු කළ නොහැකි වූ යම් ප්‍රමාණයක් ඊළඟ තක්සේරු වර්ෂය සඳහා එම තැනැත්තාගේ ව්‍යවස්ථාපිත ආදායමින්ද, එසේත් නොහැකිනම් ඊළඟ තක්සේරු වර්ෂයේ ව්‍යවස්ථාපිත ආදායමින් යනා දී වශයෙන් ද අඩු කළ යුතු ය.

(ආ) 17 වන වගන්තියෙහි හෝ 18 වන වගන්තියෙහි හෝ 19 වන වගන්තියෙහි සඳහන් යම් ව්‍යවසායක් පවත්වා ගෙන යන තැනැත්තාගේ 1983 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන

තක්සේරු වර්ෂය සඳහා තක්සේරු කළ හැකි ආදායම ගණන් බැලීමේ දී—

(i) 1983 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ තැනැත්තාගේ ව්‍යවස්ථාපිත ආදායමින් (අ) ඡේදය යටතේ අඩු කරන ලද, ඒ ව්‍යවසායේ දී දරන ලද අලාභ කොටසෙහි; සහ

(ii) ඒ ව්‍යවසායෙහි එම අලාභය සිදුවුන තක්සේරු වර්ෂයට පසුව යෙදෙන යම් තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බද්දෙන් නිදහස් කරන ලද ඒ ව්‍යවසායෙහි ලාභයෙහි සහ ආදායමෙහි,

එකතුව, අඩු කරන ලද ඒ තැනැත්තා ඒ ව්‍යවසාය පවත්වා ගෙන යනු ලැබූ 1983 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වුන යම් තක්සේරු වර්ෂයක දී ඒ ව්‍යවසායෙන් ඇති වූ අලාභවල එකතුව අඩු කළ යුතු ය.

(ඇ) (ආ) ඡේදයෙහි සඳහන් අලාභය හෝ ඉන් කොටසක්, 1983 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා තැනැත්තකුගේ මුලු ව්‍යවස්ථාපිත ආදායමින් අඩු කළ නොහැකි වන අවස්ථාවක, එම අලාභය හෝ අලාභයෙහි කොටස, ඊළඟ තක්සේරු වර්ෂය සඳහා එම තැනැත්තාගේ මුලු ව්‍යවස්ථාපිත ආදායමින් හෝ එසේ කළ නොහැකි විට ඊළඟ තක්සේරු වර්ෂය සඳහා එම තැනැත්තාගේ මුලු ව්‍යවස්ථාපිත ආදායමින් යනාදී වශයෙන් අඩු කර ගත යුතු ය.

(5) යම් තැනැත්තකු යම් තක්සේරු වර්ෂයක දී යම් වෙළෙඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් පවත්වාගෙන යාම නතර කරන අවස්ථාවක, ඉන් ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂ තුනක කාලය ඇතුළත යම් තක්සේරු වර්ෂයක දී ඒ වෙළෙඳාම, ව්‍යාපාරය, වෘත්තිය හෝ රක්ෂාව සම්බන්ධයෙන් ඔහු විසින් දරනු ලැබුවා වූ ද ලාභයක් වූයේ නම් මේ පනත යටතේ තක්සේරු කළ හැකි වූ ද, යම් තක්සේරු වර්ෂයක් සඳහා ඔහුගේ ව්‍යවස්ථාපිත ආදායමෙන් අඩු කරනු නො ලැබුවා වූ ද ප්‍රාග්ධන අලාභයක් හෝ (7) වන උපවගන්තියෙහි සඳහන් අලාභයක් හෝ නොවන අලාභයක මුදල්, ඉහත සඳහන් තක්සේරු වර්ෂ තුන ඇතුළත යම් අවස්ථාවක දී ඒ සඳහා ඉල්ලීමක් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඔහු විසින් කරනු ලැබූ විට ඒ තක්සේරු වර්ෂය සඳහා ව්‍යවස්ථාපිත ආදායමින් අඩු කරවා ගැනීමට ඔහුට හිමිකම් තිබිය යුතු ය. ඒ අඩු කිරීමට ඉඩ දීමේ කාර්යය සඳහා ඒ තක්සේරු වර්ෂයේ ඒ තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායම 123 වන වගන්තියෙහි කුමක් සඳහන්ව ඇත ද ප්‍රතිශෝධනය කළ යුතු ය:

එසේ වුව ද—

(i) ව්‍යවස්ථාපිත ආදායමෙන් යම් අලාභයක් වෙනුවෙන් වූ මුළු අඩු කිරීම කිසිම හේතුවක් නිසාවත් අලාභයෙහි ප්‍රමාණයට වැඩි නොවිය යුතු ය; තව ද

(ii) මේ උපවගන්තිය යටතේ අඩු කිරීමක් හැකිතාක් දුරට අලාභය සිදු වූ තක්සේරු වර්ෂයට පෙරාතුව වූ ප්‍රථම තක්සේරු වර්ෂයේ ව්‍යවස්ථාපිත ආදායමින් අඩු කළ යුතු

අතර එසේ අඩු කළ නොහැකි ප්‍රමාණයක් ඊට පෙර යෙදෙන්නා වූ තක්සේරු වර්ෂයේ ව්‍යවස්ථාපිත ආදායමින් යනාදී වශයෙන් අඩු කළ යුතු ය.

(6) (අ) යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකුගේ මුළු ව්‍යවස්ථාපිත ආදායමට ප්‍රාග්ධන ලාභ ඇතුළත් වෙයි නම්, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තාගේ ප්‍රාග්ධන අලාභයක් වූ ද, ලාභයක් වූයේ නම් මේ පනත යටතේ තක්සේරු කරනු ලැබිය හැකි වූ ද මුදල, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තාගේ මුළු ව්‍යවස්ථාපිත ආදායමින් අඩු කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද—

(i) ඒ අඩු කිරීම කිසිම අවස්ථාවක, ඒ මුළු ව්‍යවස්ථාපිත ආදායමට ඇතුළත්ව ඇති ප්‍රාග්ධන ලාභයෙහි ප්‍රමාණයට වැඩි නොවිය යුතු ය; තව ද

(ii) යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකුගේ ප්‍රාග්ධන අලාභය ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තාගේ ප්‍රාග්ධන ලාභයට වඩා වැඩි වන අවස්ථාවක, ඒ අතිරික්තය ඊළඟට එළඹෙන තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තාගේ ප්‍රාග්ධන අලාභයක් විය යුතු ය.

(ආ) ප්‍රාග්ධන අලාභය යන්නෙන්—

(i) යම් දේපළක අයිතියෙහි වෙනස් වීමකින් උද්ගත වන්නා වූ තැනැත්තකුගේ ප්‍රාග්ධන අලාභයක් සම්බන්ධයෙන් වූ විට 7 වන වගන්තියේ (4) වන උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව, ඒ අයිතියෙහි වෙනස්වීම සිදු වූ අවස්ථාවේ ඒ දේපළෙහි වටිනාකම, ඒ දේපළ ඒ තැනැත්තා විසින් අත්කර ගන්නා ලද අවස්ථාවේ දී එහි වටිනාකමට වඩා අඩු වූයේ යම් ප්‍රමාණයකින් ද එම ප්‍රමාණය;

(ii) යම් කොටස්, ඍණ පත්‍ර හෝ වෙනත් බැඳීම් බේරුම් කිරීමෙන් උද්ගත වන්නා වූ, තැනැත්තකුගේ ප්‍රාග්ධන අලාභයක් සම්බන්ධයෙන් වූ විට, 7 වන වගන්තියේ (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව, එම බේරුම් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඔහුට ලැබුණු සියලු දේපළවල වටිනාකම, බේරුම් කරන ලද දෙය අත්කර ගන්නා ලද අවස්ථාවේ එහි වටිනාකමට වඩා අඩු වූයේ යම් ප්‍රමාණයකින් ද එම ප්‍රමාණය හෝ බේරුම් කරන ලද දෙය 7 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (ඉ) ඡේදයෙහි හෝ (ඊ) ඡේදයෙහි හෝ (උ) ඡේදයෙහි හෝ (ඌ) ඡේදයෙහි සඳහන් යම් දේපළක් වන අවස්ථාවක එහි වටිනාකම ඒ ඡේදයෙහි සඳහන් ඒ දේපළෙහි වටිනාකමින් අඩු වන්නේ යම් ප්‍රමාණයකින් ද ඒ ප්‍රමාණය;

(iii) වෙළෙඳ ව්‍යාපාරයක් විසුරුවා හැරීමකින් හෝ සමාගමක් ඇවර කිරීමකින් උද්ගත වන්නා වූ තැනැත්තකුගේ ප්‍රාග්ධන අලාභයක් සම්බන්ධයෙන් වූ විට, 7 වන වගන්තියේ (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව, ඒ විසුරුවා හැරීමේ හෝ ඇවර කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඔහුට ලැබුණ සියලු දේපළවල වටිනාකම, ඔහු විසින් ඒ

ව්‍යාපාරයෙහි හෝ සමාගමෙහි ප්‍රාග්ධනයෙහි කොටස ලබා ගත් අවස්ථාවේ එම කොටසෙහි වටිනාකමට වඩා අඩු වූයේ යම් ප්‍රමාණයකින් ද එම ප්‍රමාණය

අදහස් වන අතර, ලිඛිත සාක්ෂි මගින් ලැබිය යුතු ලෙස ඔප්පුකර ඇත්තා වූ ද අයකරගත නොහැකි යයි ඔප්පු කර ඇත්තා වූ ද (වෙළෙඳ ණයක් නොවන) යම් ණයක මුදල එයට ඇතුළත් වේ.

(ඇ) ප්‍රාග්ධන අලාභයක මුදල ආගණනය කිරීමේ දී, 7 වන වගන්තියේ (4) වන උපවගන්තියේ (අ), (ආ) හෝ (ඇ) ඡේදවල සඳහන් වර්ගයක යම් වියදමක් ගණන් ගනු ලැබිය යුතු ය.

(ඈ) (i) තැනැත්තකු මිය යන්නා වූ ද, ආදායම් බද්ද සඳහා තක්සේරු කරනු ලැබීමට ඔහු යටත් වූ අවසාන තක්සේරු වර්ෂය සඳහා යම් ප්‍රාග්ධන අලාභයක් ඔහුට ඇත්තා වූ ද අවස්ථාවක, එම ප්‍රාග්ධන අලාභයෙහි මුදල් ප්‍රමාණය හැකිතාක් දුරට, සියලු ප්‍රභවයන්ගෙන් අවසාන තක්සේරු වර්ෂය සඳහා වූ ඔහුගේ ව්‍යවස්ථාපිත ආදායමින් අඩු කරනු ලැබිය යුතුය. තවද එය එසේ අඩු කළ නොහැකි නම් අවසාන තක්සේරු වර්ෂයට පෙරාතුව ම පිළිවෙලින් වූ තක්සේරු වර්ෂ තුනෙන් කිසිවක, සියලු ප්‍රභවයන්ගෙන් වූ ඔහුගේ ව්‍යවස්ථාපිත ආදායමෙන් අඩු කරනු ලැබිය යුතු ය.

(ii) (i) වන අනුඡේදය යටතේ යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකුගේ ව්‍යවස්ථාපිත ආදායමින් අඩු කිරීමක් කරනු ලබන අවස්ථාවක, ඔහු සම්බන්ධයෙන් ඒ තක්සේරු වර්ෂය සඳහා බද්ද, 123 වන වගන්තියෙහි කුමක් සඳහන් ව ඇත ද ඒ අඩු කිරීම සැලකිල්ලට ගෙන ප්‍රතිශෝධනය කළ යුතු ය. තව ද ඒ තක්සේරු වර්ෂය වෙනුවෙන් ඔහු විසින් ගෙවන ලද බද්දෙහි ප්‍රමාණය සහ ඒ තක්සේරු වර්ෂය සඳහා ප්‍රතිශෝධිත බද්දෙහි මුදල අතර වෙනස දැක්වෙන මුදල, මියගිය තැනැත්තාගේ පොල්මඃකරුවකු වේ නම් ඔහුට ආපසු ගෙවිය යුතුය; එවැනි පොල්මඃකරුවකු නොමැති නම්, ඒ ආපසු ගෙවන මුදල් ලබා ගැනීමට කොමසාරිස් ජනරාල්වරයාගේ මතය අනුව හිමිකම් ඇති තැනැත්තාට හෝ තැනැත්තන්ට ඒ මුදල් ආපසු ගෙවනු ලැබිය යුතු ය.

(ඉ) මේ උපවගන්තිය යටතේ තැනැත්තකුගේ ප්‍රාග්ධන අලාභය ආගණනය කිරීමේ දී 7 වන වගන්තියේ (3) වන උපවගන්තියෙහි දැක්වෙන "ප්‍රාග්ධන ලාභය" හෝ "ලාභය" යන යෙදුම් වෙනුවට "ප්‍රාග්ධන අලාභය" හෝ "අලාභය" යන වචන ආදේශ කරනු ලැබුවාක් මෙන් 7 වන වගන්තියේ (3) වන උපවගන්තිය අදාළ විය යුතු ය.

(7) යම් තක්සේරු වර්ෂයක් සඳහා තැනැත්තකුගේ සම්පූර්ණ ව්‍යවස්ථාපිත ආදායමෙහි, අසුන්විහිදුවීමේ ව්‍යාපාරයෙන් ලැබෙන ලාභ සහ ආදායම ඇතුළත් වන අවස්ථාවක, ඒ තැනැත්තාට අයත් අසුන් විහිදුවීමේ ව්‍යාපාරයෙන් එය ලාභයක් වූයේ නම් මේ පනත යටතේ තක්සේරු කරනු ලැබිය හැකි වූ සහ පෙර වර්ෂයක ඔහුගේ සම්පූර්ණ ව්‍යවස්ථාපිත ආදායමෙන් එසේ අඩුකරනු නොලැබූ යම් අලාභ යම් තක්සේරු වර්ෂයක් සඳහා සම්පූර්ණ ව්‍යවස්ථාපිත ආදායමෙන් අඩු කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද ඒ අඩු කිරීම ඒ සම්පූර්ණ ව්‍යවස්ථාපිත ආදායමෙහි ඇතුළත් වූ ඒ ව්‍යාපාරයේ ලාභ සහ ආදායමේ මුදල් ප්‍රමාණය කිසිම අවස්ථාවක දී නොඉක්මවිය යුතු අතර, අලාභය දරනු ලැබූ තක්සේරු වර්ෂයට ඉක්බිතිව එළඹෙන පළමුවන තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තාගේ ව්‍යවස්ථාපිත ආදායමෙන් හැකිතාක් දුරට අඩු කරනු ලැබිය යුතු අතර, එසේ අඩු කරනු ලැබිය නොහැකි නම් ඊළඟ තක්සේරු වර්ෂයේ ව්‍යවස්ථාපිත ආදායමෙන් යනාදී වශයෙන් අඩු කරනු ලැබිය යුතු ය.

(8) යම් තැනැත්තකු නිසි බලය ඇති අධිකරණයක් විසින් බුන්වත් තැනැත්තකු ලෙස ප්‍රකාශ කරනු ලැබූ හෝ විනිශ්චය කරනු ලැබූ අවස්ථාවක, වස්තු භංගත්වයට හෝ බුන්වත් බවට පත් වූ දිනයට පෙර දරනු ලැබූ කිසිම අලාභයක් ඒ දිනයට පසු ඇති වන ආදායමෙන් අඩු කරනු නොලැබිය යුතු ය.

(9) යම් වෙළෙඳාමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින් හෝ රක්ෂාවකින් අත්වන අලාභයක මුදල් ප්‍රමාණය මේ පනතෙහි වෙළෙඳාමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින් හෝ රක්ෂාවකින් අත්වන ලාභ නිශ්චය කිරීම සඳහා සලසා ඇති ආකාරයෙන් නිශ්චය කරනු ලැබිය යුතු ය.

(10) යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් දරුවකුගේ සම්පූර්ණ ව්‍යවස්ථාපිත ආදායම ඒ තක්සේරු වර්ෂය සඳහා ඔහුගේ මවගේ හෝ පියාගේ හෝ සම්පූර්ණ ව්‍යවස්ථාපිත ආදායම සමග එකතු කරනු ලැබ එහි කොටසක් වශයෙන් සලකනු ලැබූ අවස්ථාවක, මේ වගන්තියේ විධිවිධාන යටතේ ඒ දරුවාගේ සම්පූර්ණ ව්‍යවස්ථාපිත ආදායමෙන් අඩු කරනු ලැබිය හැකි යම් මුදලක් වේ නම් එය මවගේ හෝ පියාගේ හෝ සම්පූර්ණ ව්‍යවස්ථාපිත ආදායමෙන් අඩු කරනු ලැබිය යුතු ය.

VII වන පරිච්ඡේදය

බදු අයකළ හැකි ආදායම නිශ්චය කිරීම

බදු අය කළ හැකි ආදායම.

30. (1) යම් තක්සේරු වර්ෂයක දී ශ්‍රී ලංකාවේ වාසික පුද්ගලයකුගේ බදු අය කළ හැකි ආදායම—

(අ) රුපියල් දොළොස් දහසක දීමනාවක, සහ

(ආ) 31 වන වගන්තිය යටතේ ඔහුට හිමිකම ඇති යම් දීමනාවක එකතුව එයින් අඩු කිරීමෙන් පසු ඒ තක්සේරු වර්ෂය සඳහා ඔහුගේ තක්සේරු කළ හැකි ආදායම විය යුතු ය:

එසේ වුව ද භාරකරුවකු, දේපළ භාර ගන්නකු, පොල්මෑකරුවකු, හෝ ඇවරකරුවකු වන යම් පුද්ගලයකුට, ඒ භාරකරු, දේපළ භාර ගන්නකු, පොල්මෑකරු හෝ ඇවරකරු වශයෙන් ඔහුගේ බදු අය කළ හැකි ආදායම නිශ්චය කිරීමේ දී (අ) ඡේදයෙහි සඳහන් දීමනාව අඩු කිරීමට ඔහු හිමිකම් නොලැබිය යුතු ය.

(2) යම් තක්සේරු වර්ෂයක් සඳහා වාසික පුද්ගලයකු නොවන යම් තැනැත්තකුගේ බදු අය කළ හැකි ආදායම, ඒ ආදායමෙන් 31 වන වගන්තිය යටතේ ඔහුට හිමිකම් ඇති යම් දීමනාවක් අඩු කිරීමෙන් පසුව, ඒ තක්සේරු වර්ෂය සඳහා ඔහුගේ තක්සේරු කළ හැකි ආදායම විය යුතු ය:

එසේ වුව ද යම් තක්සේරු වර්ෂයක් සඳහා පුණ්‍යායතනයක තක්සේරු කළ හැකි ආදායම රුපියල් දොළොස් දහසක් නොඉක්ම වන අවස්ථාවක, ඒ ආදායමෙන් බදු අය කරනු නොලැබිය යුතුය.

සුදුසුකම් ලබන ගෙවීම් සම්බන්ධයෙන් දීමනාවක්.

31. (1) යම් තක්සේරු වර්ෂයක් සඳහා තැනැත්තකුගේ තක්සේරු කළ හැකි ආදායමෙන් ඒ තක්සේරු වර්ෂයේ දී ඔහු විසින් කරන ලද සුදුසුකම් ලබන සෑම ගෙවීමක් සම්බන්ධයෙන් ම, ඒ සුදුසුකම් ලබන ගෙවීමට සමාන ප්‍රමාණයක දීමනාවක්, (5) වන උප වගන්තියේ විධිවිධානවලට යටත්ව, 30 වන වගන්තියේ කෘර්ය සඳහා අඩු කරනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තියෙහි "සුදුසුකම් ලබන ගෙවීමක්" යන්නෙන් 1978 අංක 5 දරන බදු සමා පනතේ සඳහන් පරිදි යම් විශේෂ ගිණුමක යම් තැනැත්තකුගේ බැරට ඇති මුදල්වලින් ඒ තැනැත්තා විසින් කරනු ලබන, අවස්ථෝචිත පරිදි යම් ගෙවීමක්, ත්‍යාගයක්, වියදමක් හෝ ආයෝජනයක් නොවන—

(අ) යම් තැනැත්තකු විසින් අනුමත පුණ්‍යායතනයකට මුදලින් කරන ලද ත්‍යාගයක්;

(ආ) ශ්‍රී ලංකා ආණ්ඩුවට, පළාත් පාලන ආයතනයකට, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් පිහිටුවන ලද අරමුදලකට හෝ පළාත් පාලන ආයතනයක් විසින් පිහිටුවනු ලැබ අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද අරමුදලකට මුදලින් හෝ අන්‍යා කාරයකින් කරන ලද ත්‍යාගයක්;

(ඇ) ශ්‍රී ලංකා ආණ්ඩුවේ සංවර්ධන සැලැස්මක ඇතුළත් යම් ව්‍යාපෘතියක් සඳහා යම් තැනැත්තකු විසින් දරන ලද වියදම්—

(i) අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමතය ඇතිව, සහ

(ii) අමාත්‍යවරයා විසින් ඒ අනුමතය දෙන ලද අවස්ථාවේ දී ආණ්ඩුවේ සංවර්ධන ප්‍රමුඛතා කෙරෙහි සැලකිලිමත්ව, ඒ අනුමතය දෙනු ලැබුවේ නම් සහ, ඒ නියම හා කොන්දේසි සඳහන් කරනු ලැබුවේ නම් ඒ අනුමතයට, නියම හා කොන්දේසිවලට අනුකූලව

දරනු ලැබුවේ නම් එසේ දරන ලද වියදම;

(ඈ) අනුමත ව්‍යවසායක පවත්නා කොටස් හැර සාමාන්‍ය කොටස් මිලදී ගැනීමෙහි ලා යම් තැනැත්තකු විසින් ආයෝජනය කරන ලද යම් මුදලක්;

(ඉ) යම් පුද්ගලයකු විසින් ශ්‍රී ලංකා ආණ්ඩුවට හෝ මුදල් නීති පනතේ අර්ථානුකූලව යම් බැංකු ආයතනයකට හෝ යම් පළාත් පාලන ආයතනයකට හෝ නිවාස විෂයය භාර අමාත්‍යවරයා විසින් ආණ්ඩුවේ නිවාස ප්‍රතිපත්තිය කෙරෙහි සැලකිලිමත්ව අනුමත කරන ලද වෙනත් යම් ආයතනයකට හෝ—

(i) නිවාසයක් ඉදි කිරීම සඳහා හෝ, 1973 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව පළමු වන නිවාසය මිල දී ගැනීම සඳහා හෝ නිවාසයක් තැනීම සඳහා පළමු වන බිම් කොටස මිල දී ගැනීම සඳහා හෝ 1973 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ප්‍රදානය කරනු ලැබූ යම් ණයක මුල් මුදල ඒ නිවාසයෙහි හෝ බිම් කොටසෙහි අයිතිකරුව සිටින අතරතුර ඒ පුද්ගලයා විසින් ආපසු ගෙවනු ලැබීමේ දී;

(ii) 1973 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව කුලියට සින්න වීමේ නියම මත කුලියට දෙන ලද නිවාසයක් සම්බන්ධයෙන් මාසික ගෙවීම් වශයෙන්

ගෙවන ලද යම් මුදලක්;

(ඊ) ශ්‍රී ලංකාවේ ආණ්ඩුවෙන් හෝ (ඉ) ඡේදයෙහි සඳහන් යම් ආයතනයකින් හෝ අධිකාරයකින් යම් ණයක් මත ලබා ගන්නා ලද මුදලක් නොවන, නිවාසයක් ඉදිකිරීම සඳහා පුද්ගලයකු විසින් වියදම් කරනු ලැබුවේ යැයි ජාතික නිවාස කොමසාරිස්වරයා විසින් සහතික කරනු ලැබූ යම් මුදලක්;

(උ) ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් හෝ (ඉ) ඡේදයෙහි සඳහන් ආයතනයකින් හෝ අධිකාරයකින් යම් ණයක් මත ලබා ගන්නා ලද මුදලක් නොවන, 1978 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව පළමු වන නිවාසය මිල දී ගැනීම සඳහා හෝ ඒ දිනයෙහි හෝ ඉන් පසුව බහු විසින් මිල දී ගනු ලැබූ නිවාසයක් ඉදිකිරීමට පළමු වන බිම් කොටස මිල දී ගැනීම සඳහා හෝ පුද්ගලයකු විසින් වියදම් කරන ලද යම් මුදලක්;

(ඌ) (i) 1957 ජූලි මස 4 වන දිනට පසු ශ්‍රී ලංකාවෙන් පිටත දී නිකුත් කරන ලද ජීවිත රක්ෂණ ඔප්පුවක් සම්බන්ධයෙන්; හෝ

(ii) 1957 ජූලි මස 4 වන දිනට පසු ශ්‍රී ලංකාවෙන් පිටත දී වාර්ෂිකයක් මිල දී ගැනීම සඳහා

ශ්‍රී ලංකාවෙන් පිටත දී ගෙවන ලද වාර මුදලක් නොවන, ජීවිත රක්ෂණ ඔප්පුවක් මත හෝ සෞඛ්‍ය රක්ෂණ ඔප්පුවක් මත හෝ වාර්ෂිකයක් මිල දී ගැනීම සඳහා හෝ පුද්ගලයකු විසින් ගෙවන ලද යම් වාර මුදලක්;

(එ) කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද යම් අර්ථසාධක අරමුදලකට හෝ විශ්‍රාම වැටුප් අරමුදලකට හෝ පරිපාලිත අර්ථසාධක අරමුදලකට හෝ පුද්ගලයකු විසින් ගෙවන ලද යම් දායක මුදල් ගෙවන ලද්දේ 9 (ආ) වගන්තිය යටතේ ආදායම් බද්දෙන් නිදහස් නොකරන ලද පඩිනඩිවලින් නම්, ඒ දායක මුදල්;

(ඒ) වෘත්තීය සුදුසුකම් ලත් යම් පුද්ගලයකු විසින්—

(i) තමා සාමාජිකයකු වන යම් වෘත්තීය සංගමයකට දායක මුදල් ගෙවීම සඳහා හෝ වෘත්තීය පොත්, සඟරා සහ වාර්තා මිල දී ගැනීම සඳහා ; සහ

(ii) ඒ පුද්ගලයා විසින් කර ගෙන යනු ලබන හෝ පවත්වා ගෙන යනු ලබන වෘත්තියට අදාළ යම් සම්මේලනයකට හෝ සම්මන්ත්‍රණයකට සහභාගි වීමේ කාර්යය සඳහා, ඒ කාර්යය ඒ වෘත්තියට වැඩදායි වන හෝ සාමාන්‍යයෙන් ප්‍රයෝජනවත් වන බවට අමාත්‍ය වරයා විසින් අනුමත කරනු ලැබ ඇත්නම්, විදේශයකට ගමන් කිරීම සඳහා

වියදම් කරන ලද යම් මුදලක්

අදහස් වේ.

(3) යම් පුද්ගලයකු විසින් කරන ලද හෝ යම් පුද්ගලයකු විසින් කරනු ලැබුවේ යයි සලකනු ලබන සුදුසුකම් ලබන ගෙවීමක් (ඊ) ඡේදයෙහි හෝ (උ) ඡේදයෙහි සඳහන් නිවාසයක් මිල දී ගැනීමෙහි ලා හෝ ඉදි කිරීමෙහි ලා හෝ නිවාසයක් ඉදිකිරීම සඳහා බිම් කොටසක් මිල දී ගැනීමෙහි ලා හෝ ඔහු විසින් වියදම් කරන ලද මුදලකින් සමන්විත වන අවස්ථාවක, ඒ පුද්ගලයා විසින් ඒ මුදල වියදම් කරනු ලැබුවේ යම් තක්සේරු වර්ෂයක දී ද ඒ තක්සේරු වර්ෂය සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂ හතරකට වැඩි නොවන්නා වූ තක්සේරු වර්ෂ අතර ඒ මුදල කොටස් කර බෙදිය හැකි ය. තව ද ඒ එක් එක් තක්සේරු වර්ෂයකට එසේ කොටස් කර බෙදනු ලැබූ මුදල (1) වන උපවගන්තියේ කාර්යය සඳහා, ඒ පුද්ගලයා විසින් ඒ තක්සේරු වර්ෂයේ දී කරන ලද සුදුසුකම් ලබන ගෙවීමක් ලෙස සලකනු ලැබිය යුතු ය :

එසේ වුව ද—

(අ) කිසියම් නිවාසයක් මිල දී ගැනීමෙහි ලා හෝ ඉදිකිරීමෙහි ලා හෝ නිවාසයක් ඉදි කිරීම සඳහා යම් බිම් කොටසක් මිල දී ගැනීමෙහි ලා ඒ පුද්ගලයා විසින් වියදම් කරන ලද සම්පූර්ණ මුදල තක්සේරු වර්ෂ පහක් ඉක්මවනා යම් තක්සේරු වර්ෂ ගණනක් අතර කොටස් කර බෙදනු නොලැබිය යුතු ය; තවද

(ආ) ඒ පුද්ගලයා යම් තක්සේරු වර්ෂයක දී එම නිවාසයේ හෝ බිම් කොටසේ අයිතිකරු වූයේ නම් මිස, ඒ සුදුසුකම් ලබන ගෙවීම සම්බන්ධයෙන් ඒ තක්සේරු වර්ෂය සඳහා (1) වන උපවගන්තිය යටතේ කිසිම අඩු කිරීමක් කරනු නොලැබිය යුතු ය.

(4) යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් දරුවකුගේ සම්පූර්ණ ව්‍යවස්ථාපිත ආදායම ඒ තක්සේරු වර්ෂය සඳහා ඔහුගේ මවගේ හෝ පියාගේ සම්පූර්ණ ව්‍යවස්ථාපිත ආදායම සමඟ එකතු කරනු ලැබූ සහ එහි කොටසක් ලෙස සලකනු ලැබූ අවස්ථාවක ඒ තක්සේරු

වර්ෂයේ දී ඒ දරුවා විසින් කරන ලද යම් සුදුසුකම් ලබන ගෙවීමක් ඒ මව හෝ පියා හෝ විසින් කරන ලද සුදුසුකම් ලබන ගෙවීමක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) යම් තක්සේරු වර්ෂයක දී යම් තැනැත්තකු විසින් කරන ලද (2) වන උපවගන්තියේ (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් ගෙවීම් හෝ ඔහු විසින් කරනු ලැබූ ලෙස සලකනු ලබන ගෙවීම් හෝ නොවන සියලු සුදුසුකම් ලබන ගෙවීම්වල එකතුව සම්බන්ධයෙන් ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කිරීම, ඒ තක්සේරු කළ හැකි ආදායමෙන් තුනෙන් එක් පංගුවක් නොඉක්මවිය යුතු ය.

(6) යම් තක්සේරු වර්ෂයක දී යම් තැනැත්තකුගේ තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කරනු ලැබිය නොහැකි වූ ඒ තක්සේරු වර්ෂයේ දී ඒ තැනැත්තා විසින් (2) වන උපවගන්තියේ (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් ඒ තැනැත්තා විසින් කරනු ලැබූ හෝ කරනු ලැබුවේ යයි සලකනු ලබන යම් සුදුසුකම් ලබන ගෙවීමක මුදල ඊළඟට එළඹෙන තක්සේරු වර්ෂයේ දී සහ ඒ ආදී වශයෙන් ඔහුගේ තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කරනු ලැබිය යුතු ය.

(7) (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයෙහි සඳහන් යම් කොටස් මිල දී ගැනීම සඳහා කරන ලද යම් සුදුසුකම් ලබන ගෙවීමක් සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකුගේ තක්සේරු කළ හැකි ආදායමෙන් දීමනාවක් අඩු කරනු ලැබූ අවස්ථාවක, සහ ඒ මිල දී ගැනීමේ දිනයට පසු අවුරුදු පහක කාල යක් ඇතුළත—

(අ) ඒ කොටස් මිල දී ගනු ලැබූ පුද්ගලයාගේ මරණය සිදු වීමෙන් හෝ ඒ කොටස් මිල දී ගත් සමාගම හෝ පුද්ගල මණ්ඩලය විසින් පවත්වා ගෙන යනු ලැබූ ව්‍යාපාරය විසුරුවා හැරීමෙන් හෝ නතර වීමෙන් හෝ හැර අන්‍යාකාරයකින් ඒ කොටස්වල අයිතියෙහි වෙනසක් සිදු වූ අවස්ථාවක; හෝ

(ආ) ඒ කොටස් මිල දී ගත් තැනැත්තා විසින් ඒ කොටස්වලින් යම් මුදල් ප්‍රමාණයක් ආපසු ගනු ලැබූ හෝ උපලබ්ධ කර ගනු ලැබූ හෝ ඔහුට ගෙවනු ලැබූ අවස්ථාවක

ඒ දීමනාව දෙනු ලැබූ තක්සේරු වර්ෂය සම්බන්ධයෙන්, දීමනාව දී ඇති තැනැත්තාට ඒ දීමනාව නොදෙන ලද්දේ නම්, ඔහු යටත් විය හැකි වූ ආදායම් බද්ද සහ ඒ තක්සේරු වර්ෂය සඳහා අය කරගනු ලැබූ බදු මුදල අතර වෙනසින් සමන්විත වන අතිරේක තක්සේරුවක්, මේ පනතෙහි සඳහන් කිසිවක් නොතකා, ඒ තැනැත්තා සම්බන්ධයෙන් කරනු ලැබිය යුතු අතර තක්සේරු දැන්වීමට, ආයාචනයට සහ වෙනත් කටයුතුවලට අදාළ මේ පනතේ විධිවිධාන ඒ අයුරින් අදාළ විය යුතු ය:

එසේ වුව ද ඒ දීමනාව අඩු කරනු ලැබුවේ යම් තැනැත්තකුගේ තක්සේරු කළ හැකි ආදායමෙන් ද ඒ තැනැත්තා විසින් ඒ කොටස් විකුණා ඇත්නම් සහ විකිණීමෙන් ලත් මුදල ඒ විකිණීමේ දින සිට මාස තුනක් ඇතුළත යම් අනුමත ව්‍යාපාරයක (පවත්නා

කොටස් නොවන) සාමාන්‍ය කොටස් මිල දී ගැනීමට පාවිච්චි කරනු ලැබුවේ නම් ඒ තැනැත්තා කෙරෙහි එවැනි අතිරේක තක්සේරුවක් කරනු නොලැබිය යුතු ය.

(8) (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයෙහි සඳහන් යම් කොටස් මිල දී ගැනීම සඳහා සුදුසුකම් ලබන ගෙවීමක් වෙනුවෙන් යම් තැනැත්තකුගේ තක්සේරු කළ හැකි ආදායමෙන් (1) වන උප වගන්තිය යටතේ දීමනාවක් අඩු කරනු ලැබ ඇති අවස්ථාවක සහ ඒ කොටස් වෙන් කිරීම කරන ලද සමාගම විසින් ඒ කොටස් නිකුත් කිරීමෙන් එකතු කරන ලද මුදල්, එකතු කරන ලද දිනයේ සිට වර්ෂ දෙකක් ඇතුළත දී (9) වන උපවගන්තිය යටතේ අමාත්‍ය වරයා විසින් අනුමතය දෙන ලද ඒ සමාගමේ කටයුතුවල කාර්ය සඳහා යොදවා නොමැති බව කොමසාරිස් ජනරාල්වරයා විසින් තීරණය කරනු ලබන අවස්ථාවක, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් ඒ නියමයෙහි සඳහන් දිනයක සිට ක්‍රියාත්මක වන පරිදි ඒ සමාගමට දෙන ලද අනුමතය ඉවත් කරනු ලැබිය හැකි අතර, එසේ අනුමතය ඉවත් කරනු ලැබූ අවස්ථාවක ඒ සුදුසුකම් ලබන ගෙවීම් වෙනුවෙන් ඒ තැනැත්තාට දීමනාවක් දී ඇත්තේ යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් ද ඒ තක්සේරු වර්ෂය සම්බන්ධයෙන්, දීමනාව දී ඇති ඒ තැනැත්තාට ඒ දීමනාව නොදෙන ලද්දේ නම්, ඔහු යටත් විය හැකි වූ ආදායම් බද්ද සහ ඒ තක්සේරු වර්ෂය සඳහා අය කර ගනු ලැබූ බදු මුදල අතර වෙනසින් සමන්විත වන අතිරේක තක්සේරුවක්, මේ පනතෙහි සඳහන් කිසිවක් නොතකා, ඒ තැනැත්තා සම්බන්ධයෙන් කරනු ලැබිය යුතු අතර, ඒ අනුව තක්සේරු දැන්වීමට, ආයාචනයට සහ වෙනත් කටයුතුවලට අදාළ මේ පනතේ විධිවිධාන ඒ අතිරේක තක්සේරුවට අදාළ විය යුතු ය.

මේ උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් කරන ලද නියමයක්, ඒ නියමය කරන ලද දිනයට කලින් වූ දිනයක සිට ක්‍රියාත්මක වන ලෙස ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.

(9) මේ වගන්තියේ කාර්ය සඳහා—

(අ) "අනුමත පුණ්‍යායතනයක්" යන්නෙන්, 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 16අ වගන්තියේ අර්ථානුකූලව අනුමත පුණ්‍යායතනයක් හෝ මේ වගන්තියේ කාර්ය සඳහා අනුමත පුණ්‍යායතනයක් වශයෙන් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ දැන්වීමක් මගින් අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරනු ලැබූ පොදු පුණ්‍යභාරයක් හෝ ආයතනයක් අදහස් වේ;

(ආ) "අනුමත ව්‍යවසාය" යන්නෙන්—

(i) (අ) හුදෙක් භාණ්ඩ හෝ වෙළෙඳ ද්‍රව්‍ය අපනයනය කිරීමේ හෝ විදේශීය ව්‍යවහාර මුදල්වලින් ගෙවීම සඳහා සේවා සැපයීමේ හැකියාව ඇත්තා වූ ව්‍යවසායක් පවත්වා ගෙන යාමෙහි ලා යෙදී සිටින්නා වූ; හෝ

(ආ) හුදෙක් නිවාස ඉදි කිරීමෙහි ලා හා විකිණීමෙහි ලා යෙදී සිටින්නා වූ; හෝ

(ඇ) නිවාස විෂයය භාර අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ යම් යෝජනා ක්‍රමයක් යටතේ හුදෙක් ගොඩනැගිලි ඉදිකිරීමේ කාර්ය සඳහා ඉඩම් සංවර්ධනය කිරීමෙහි ලා හා විකිණීමෙහි ලා යෙදී සිටින්නා වූ; හෝ

(ඈ) නිවාස විෂයය භාර අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ යම් යෝජනා ක්‍රමයක් යටතේ හුදෙක් නිවාස ඉදි කිරීමෙහි ලා හා විකිණීමෙහි ලා යෙදී සිටින්නා වූ සහ ගොඩනැගිලි ඉදි කිරීමෙහි කාර්ය සඳහා ඉඩම් සංවර්ධනය කිරීමෙහි ලා හා විකිණීමෙහි ලා යෙදී සිටින්නා වූ; හෝ

(ඉ) හුදෙක් ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රගතිය සඳහා අත්‍යාවශ්‍ය යයි අමාත්‍යවරයා සලකන ව්‍යවසායක් පවත්වා ගෙන යාමෙහි ලා යෙදී සිටින්නා වූ

සහ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දැන්වීමක් මඟින් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ ඇත්තා වූ නැතහොත්,

(ii) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා පනතේ 17 වන වගන්තිය යටතේ මහා කොළඹ ආර්ථික කොමිෂන් සභාව සමග ගිවිසුමකට එළඹ ඇත්තා වූ

සමාගමක් අදහස් වේ.

(ඇ) මුදලින් හැර අන්‍යාකාරයකින් ආණ්ඩුවට කරනු ලබන ත්‍යාගයක මුදල් ප්‍රමාණය ඒ ත්‍යාගයෙහි වටිනාකම විය යුතු අතර, ඒ වටිනාකම—

(i) තෑගි කරනු ලැබූ දේපළ සඳහා ඒ තක්සේරු වර්ෂය තුළ දී ත්‍යාග දායකයාට දරන්නට සිදු වූ වියදම, හෝ

(ii) ඒ තක්සේරු වර්ෂය තුළ දරන්නට සිදු වූ වියදම නිශ්චය කරනු ලැබිය නොහැකි අවස්ථාවක හෝ ඒ තක්සේරු වර්ෂය තුළ කිසිම වියදමක් දරනු නොලැබූ අවස්ථාවක, ඒ තෑගි කළ දේපළ තෑගි කළ අවස්ථාවේ දී වූ වෙළෙඳ අගය

විය යුතු ය.

VIII වන පරිච්ඡේදය

සමාගම් නොවන තැනැත්තන් සඳහා ආදායම් බදු අනුප්‍රමාණ

ආදායම් බදු අනුප්‍රමාණ. සමාගම් නොවන තැනැත්තන් සඳහා

32. (1) මෙහි මින් මතු සලස්වනු ලබන විධිවිධානවලට යටත්ව, 1979 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන එක් එක් තක්සේරු වර්ෂය සඳහා යම් තැනැත්තකුගේ ඒ තක්සේරු වර්ෂයේ බදු අය කළ හැකි ආදායම මත—

(අ) ඔහු දේපළ භාරගන්නාකුගේ, භාරකරුවකුගේ, පොල්මා කරුවකුගේ හෝ ඇවරකරුවකුගේ තත්ත්වයෙන් ක්‍රියා කරන්නකු නොවන පුද්ගලයකු නම්, මේ පනතේ පළමුවන උපලේඛනයෙහි සඳහන් උචිත අනුප්‍රමාණ අනුව; හෝ

(ආ) ඒ තැනැත්තා සමාගමක් හෝ (අ) ඡේදය අදාළ වන පුද්ගලයකු හෝ නොවන තැනැත්තකු නම්, මේ පනතේ තුන්වන උපලේඛනයෙහි සඳහන් උචිත අනුප්‍රමාණ අනුව

ආදායම් බදු අය කරනු ලැබිය යුතු ය.

(2) යම් තක්සේරු වර්ෂයක් සඳහා පුද්ගලයකුගේ ව්‍යවස්ථාපිත ආදායමට—

(අ) විශ්‍රාම වැටුපක් පරිවර්තනය කිරීමෙන් ලැබුණ මුදලක්, හෝ

(ආ) විශ්‍රාම ගැනීමේ පාරිතෝෂිකයක් වශයෙන් ලැබුණ මුදලක්, හෝ

(ඇ) ධුරය හෝ සේවා නියුක්තිය අහිමිවීම සඳහා වන්දි වශයෙන් ලැබුණ යම් මුදලක්, හෝ

(ඈ) කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරනු ලැබූ යම් අර්ථසාධක අරමුදලකින් 1954 අප්‍රේල් මස 1 වන දිනයෙන් පසු ඒ අර්ථසාධක අරමුදලට ඔහු විසින් ගෙවනු ලැබූ දායක මුදලට සමාන වන කොටස හැර යම් සේවා නියුක්තියකින් ඔහු විශ්‍රාම ගන්නා අවස්ථාවේ දී ඔහුට ගෙවනු ලැබූ යම් මුදලක්, හෝ

(ඉ) පරිපාලිත අර්ථසාධක අරමුදලකින් සේවා නියුක්තයකුට ගෙවන ලද (තම දායක මුදල වශයෙන් සේවායෝජක විසින් 1968 අප්‍රේල් මස 1 වන දිනට පෙර ඒ අරමුදලට ගෙවන ලද කොටස සහ සේවා යෝජක විසින් ගෙවනු ලැබූ දායක මුදල් සම්බන්ධයෙන් ඒ සේවා යෝජක විසින් ගෙවනු ලැබූ දායක මුදල් හා සේවා යෝජකගේ ඒ දායක මුදල් සඳහා එකතු වූ පොලිය සම්බන්ධයෙන් ඒ සේවා යෝජක විසින් සියයට පහළොව බැගින් බදු ගෙවන ලද්දේ නම් සේවා යෝජක විසින් ගෙවන ලද ඒ දායක මුදල් සඳහා එකතු වූ පොලිය හැර) යම් මුදලක්

ඇතුළත් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්, යම් තක්සේරු වර්ෂයක් සඳහා ඔහුගේ බදු අය කළ හැකි ආදායම විය හැකි ඉහත සඳහන් කරනු ලැබූ කිසිම මුදලක් ඔහුගේ ව්‍යවස්ථාපිත ආදායමෙහි ඇතුළත් කරනු නොලැබුවෙහි නම්, ඔහුගේ බදු අය කළ හැකි ආදායම ඉක්මවන අවස්ථාවක මේ පනතේ වෙනත් යම් විධිවිධානයක

කුමක් සඳහන් වුව ද ඒ අතිරික්තය සඳහා ඒ තක්සේරු වර්ෂයට ඉහතින් ම වූ තක්සේරු වර්ෂ තුන සම්බන්ධයෙන් බලපාන ආදායම් බදු අනුප්‍රමාණවල එකතුව තුනෙන් බෙදූ විට ලැබෙන අනුප්‍රමාණයට සමාන අනුප්‍රමාණයක් අනුව බද්දක් අය කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද—

(i) යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ අතිරික්තය මත බදු අය කළ හැකි අනුප්‍රමාණය සියයට පහළොවක් නොඉක්ම විය යුතු ය.

(ii) මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධානවල සඳහන් අතිරික්තය ඒ විධිවිධානවල (ඈ) ඡේදයෙහි සඳහන් යම් මුදලක් ව්‍යවස්ථාපිත ආදායමට ඇතුළත් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඇති වී ඒ මුදල හෝ එහි යම් කොටසක් හෝ සම්බන්ධයෙන් එවකටත් බදු ගෙවා ඇති අවස්ථාවක, ඒ අතිරික්තය සඳහා මේ විධිවිධාන යටතේ අය කළ හැකි බදු මුදලෙන්, මුලින් කී මුදල වෙනුවෙන් එවකටත් ගෙවා ඇති බදු මුදල අඩු කළ යුතු ය. තව ද මුලින් කී මුදල වෙනුවෙන් එවකටත් ගෙවා ඇති බදු මුදල ඒ අතිරික්තය මත එසේ අය කළ හැකි බද්දට වැඩි වේ නම්, ඒ අතිරික්තය සඳහා කිසිම බද්දක් අය කරනු නො ලැබිය යුතු ය.

(iii) සඳහන් කර ඇති අතිරික්තය, මේ විධිවිධානවල (ඊ) ඡේදයෙහි සඳහන් මුදල් ව්‍යවස්ථාපිත ආදායමට ඇතුළත් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඇති වූවක් වූ අවස්ථාවක, ඒ අතිරික්තය සඳහා මේ විධිවිධාන යටතේ අය කළ හැකි බදු මුදලින්—

(අ) ඒ මුදල හෝ එහි යම් කොටසක් හෝ සම්බන්ධයෙන් එවකටත් ගෙවා ඇති යම් බදු මුදලක් වේ නම් ඒ මුදල, සහ

(ආ) 1967 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් බලපාන ඔහු විසින් ගෙවිය යුතු ආදායම් බදු අනුප්‍රමාණය හා සියයට පහළොව යන මේ දෙකෙන් අඩු කුමක් ද ඒ අනුව, පරිපාලිත අර්ථසාධක අරමුදලට 1966 අප්‍රේල් මස 1 වන දිනයට පෙර ඔහු විසින් ගෙවන ලද දායක මුදල් සම්බන්ධයෙන් ආගණනය කරනු ලැබූ බද්දට සමාන මුදලක්

අඩු කළ යුතු අතර, (අ) සහ (ආ) ඡේදයන්හි සඳහන් මුදල්වල සමස්තය ඒ අතිරික්තය සඳහා එසේ අය කළහැකි බද්දට වඩා වැඩිවේ නම් ඒ අතිරික්තය මත කිසිම බද්දක් අය කරනු නො ලැබිය යුතු ය.

මේ උපවගන්තියේ කාර්ය සඳහා යම් තක්සේරු වර්ෂයක් සඳහා බලපාන බදු අනුප්‍රමාණය 38 වන, 81 වන, 82 වන සහ 83 වන වගන්ති යටතේ යම් අඩු කිරීමක් නොමැතිව ඒ වර්ෂය සඳහා ගෙවිය යුතු බදු මුදල ඒ තක්සේරු වර්ෂය සඳහා තක්සේරු කළ හැකි ආදායමට දරන ප්‍රතිශතය විය යුතු ය.

(3) යම් තැනැත්තකුගේ බදු අය කළ හැකි ආදායමට යම් ප්‍රාග්ධනික ලාභයක් ඇතුළත් හා (මින් මතු මේ උපවගන්තියේ "ආදායමෙහි උචිත කොටස" යනුවෙන් සඳහන් කරනු ලබන) ඒ ආදායමෙහි කොටසක් සඳහා ගෙවිය යුතු ආදායම් බදු ප්‍රමාණය සියයට 25 ක් ඉක්මවන අවස්ථාවක, ආදායමෙහි උචිත කොටස සම්බන්ධයෙන් පහත දැක්වෙන පරිදි බද්ද ආගණනය කරනු ලැබිය යුතු ය:—

(අ) ආදායමෙහි උචිත කොටස ඒ ප්‍රාග්ධන ලාභ මුදල ඉක්මවන්නේ නම්—

(i) ඒ ප්‍රාග්ධන ලාභයේ මුදලට සමාන වන ආදායමේ උචිත කොටසෙහි ඒ ප්‍රමාණය සඳහා ගෙවිය යුතු බද්ද සියයට විසිපහේ ප්‍රමාණය අනුව විය යුතු ය; තව ද

(ii) ආදායමෙහි උචිත කොටසෙහි ශේෂය සඳහා ගෙවිය යුතු බද්ද මේ පනත යටතේ අදාළ කළ හැකි සියයට විසිපහකට ඉහළ බදු ප්‍රමාණ අතුරින් යම් බදු ප්‍රමාණයක් අනුව ආගණනය කරනු ලැබිය යුතු ය; තව ද

(ආ) ආදායමෙහි උචිත කොටස ශුද්ධ ප්‍රාග්ධන ලාභයේ මුදල නොඉක්මවන්නේ නම් ආදායමේ උචිත කොටසෙහි සම්පූර්ණ මුදල සඳහා ගෙවිය යුතු බද්ද, මේ පනතෙහි පටහැනිව කුමක් සඳහන් වුව ද සියයට විසිපහක් විය යුතු ය.

(4) ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගල මණ්ඩලයක් විසින් අර්ථ සාධක, ගොඩනැගිලි, ඉතිරිකිරීමේ හෝ සහසුරුවම් සමිතියක් හෝ අරමුදලක් පවත්වා ගෙන යන හෝ ක්‍රියාත්මක කරන අවස්ථාවක—

(අ) ඒ සමිතිය සමන්විත වන තැනැත්තන්ගෙන් වැඩි දෙනකුට හෝ ඒ අරමුදලෙහි දායකයන්ගෙන් වැඩි දෙනකුට බදු අය කළ හැකි ආදායමක් නොමැති බවට හෝ සියයට විස්සක් නොඉක්මවන ප්‍රමාණයක් අනුව සම්පූර්ණයෙන්ම බදු අය කළ හැකි ආදායමක් නොමැති බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන අවස්ථාවක; නැතහොත්

(ආ) කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ සමිතිය හෝ අරමුදල 23 (1) (ඒ) වගන්තිය යටතේ අනුමත කරනු ලැබූ අවස්ථාවක

කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලැබිය හැකි කොන්දේසිවලට යටත්ව විෂය පිළිබඳව සියලු අවස්ථානුගත කරුණු අනුව අඩු කිරීම හෝ ආපසු ගෙවීම සාධාරණ හා යුක්ති සහගත යයි කොමසාරිස් ජනරාල්වරයාට පෙනී යන්නේ නම් අවස්ථාවෝචිත පරිදි ඒ සමිතිය හෝ අරමුදල විසින් ගෙවිය යුතු බද්ද ඔහු විසින් අඩු කිරීම හෝ ආපසු ගෙවීම හෝ කළ හැකි ය.

(5) යම් පුණ්‍යායතනයක් විසින් යම් තක්සේරු වර්ෂයක් සඳහා ගෙවිය යුතු ආදායම් බද්දේ මුදල, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ පුණ්‍යායතනයේ තක්සේරු කළ හැකි ආදායමෙහි මුදලෙන් රුපියල් දොළොස් දහසක් අඩු කොට ලැබෙන මුදල නොඉක්මවිය යුතු ය.

IX වන පරිච්ඡේදය

සමාගම්

වාසික සමාගම් ගෙවීමට යටත් ආදායම් බද්ද.

33. (1) යම් තක්සේරු වර්ෂයක් තුළ ශ්‍රී ලංකාවේ වාසික යම් සමාගමක් ඒ වර්ෂය වෙනුවෙන් ගෙවීමට යටත් ආදායම් බද්ද—

(අ) (i) (ii) වන අනුඡේදයේ හෝ (iii) වන අනුඡේදයේ සඳහන් සමාගමක් නොවන සමාගමක් සම්බන්ධයෙන් වන විට, මේ පනතේ දෙවන උපලේඛනයේ I වන කොටසේ, හෝ

(ii) ඒ තක්සේරු වර්ෂය මුළුල්ලේ ම හෝ ඒ තක්සේරු වර්ෂය තුළ සංස්ථාගත කරනු ලැබූ සමාගමක් වී නම් එය සංස්ථාගත කරනු ලැබූ දිනයේ සිට ඒ වර්ෂයේ අවසානය දක්වා හෝ කුඩා සමාගමක් වූ සමාගමක් සම්බන්ධයෙන් වන විට, මේ පනතේ දෙවන උපලේඛනයේ II වන කොටසේ, හෝ

(iii) ඒ තක්සේරු වර්ෂය මුළුල්ලේ ම ජනතා සමාගමක් වූ සමාගමක් වී නම් නැතහොත් ඒ සමාගම සංස්ථාගත කරනු ලැබුවේ ඒ තක්සේරු වර්ෂය තුළ නම් එය එසේ සංස්ථාගත කරන ලද දිනයේ සිට ඒ වර්ෂයේ අවසානය දක්වා ජනතා සමාගමක් වී නම්, මේ පනතේ දෙවන උපලේඛනයේ III වන කොටසේ, හෝ

දක්වෙන උචිත ප්‍රමාණය හෝ ප්‍රමාණ අනුව, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ සමාගමේ බදු අය කළ හැකි ආදායම මත ගණන් බලනු ලැබූ ප්‍රමාණයකින්, සහ

(ආ) යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ සමාගමේ බදු අය කළ හැකි ආදායම ආගණනය කරනු ලබන්නේ යම් ලාභ මත ද, ඒ ලාභවලින් ඒ තක්සේරු වර්ෂයේ දී ඒ සමාගම විසින් බෙදා දෙන ලද දළ ලාභාංශවල එකතුවෙන් සියයට තිස්තුනයි තුනෙන් එකකට සමාන මුදලකින්

සමන්විත විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා—

(අ) "ජනතා සමාගමක්" යන්නෙන්, ශ්‍රී ලංකාවේ වාසික වූ ද,

(i) සමාගම් ආඥාපනතේ අර්ථානුකූලව පෞද්ගලික සමාගමක් නොවන බවට;

(ii) සමාගමේ කොටස්කරුවන්ගේ සංඛ්‍යාව එක් සිය යක් ඉක්මවන බවට සහ එක් එක් කොටසේ නාම මාත්‍ර වටිනාකම රුපියල් දහයක් නොඉක්ම වන බවට;

(iii) සමාගම විසින් කරනු ලබන කොටස් වෙන් කර දීමක දී හෝ විවෘත වෙළෙඳ පොළේ දී හෝ යම් තැනැත්තකු විසින් සමාගමේ එක් කොටසක හෝ ඊට වැඩි කොටස් ගණනක ආයෝජනය කරනු ලැබිය හැකි බවට;

(iv) කිසිම තැනැත්තකු විසින්, පෞද්ගලිකව හෝ තමාගේ භාර්යාව හෝ බාල වයස්කාර දරුවන් සමග, කෙළින් ම හෝ නම් කරනු ලැබූ තැනැත්තන් මාර්ගයෙන්, නිකුත් කරන ලද කොටස් ප්‍රාග්ධනයෙන් සියයට පහකට වැඩිය අයිතිව නොසිටින බවට;

(v) එක් කෙනකුට කොටස් එකක් හෝ ඊට වැඩි ගණනක් අයිති, අධ්‍යක්ෂවරයන් තුන් දෙනකු හෝ ඊට වැඩි ගණනක් සිටින බවට;

(vi) සමාගමේ කිසිම අධ්‍යක්ෂවරයකු වෙන යම් ජනතා සමාගමක අධ්‍යක්ෂවරයකු ලෙස ධුරයක් නොදරන බවට; සහ

(vii) වෙන යම් සමාගමක්, කෙළින් ම හෝ නම් කරනු ලැබුවන් මාර්ගයෙන් යම් කොටස් අයිතිව නොසිටින බවට,

තක්සේරුකරු සෑහීමට පත්වන්නා වූ ද සමාගමක් අදහස් වේ.

(ඈ) "කුඩා සමාගමක්" යන්නෙන්—

(i) ශ්‍රී ලංකාවේ වාසික වූ;

(ii) නිකුත් කරනු ලැබූ ප්‍රාග්ධනය රුපියල් ලක්ෂ පහකට වැඩි නො වූ;

(iii) නිකුත් කරනු ලැබූ ප්‍රාග්ධනය 1978 නොවැම්බර් මස 15 වන දින හෝ ඊට පසුව අඩු කරනු නොලැබූ, සහ

(iv) පවත්නා සමාගමක් ප්‍රතිසංස්කරණය කිරීමෙන් හෝ පවත්නා සමාගමක යම් පිරියත, යන්ත්‍ර, සවිකිරීම් හෝ ගොඩනැගිලි අත්කර ගැනීමෙන් 1978 නොවැම්බර් මස 15 වන දින හෝ ඊට පසුව පිහිටුවනු නොලැබූ

සමාගමක් අදහස් වේ.

(ඇ) සමාගමක "දළ ලාභාංශ ප්‍රමාණය" යන්නෙන්, ලාභාංශ සම්බන්ධයෙන් සමාගමක් විසින් 38 වන වගන්තිය යටතේ, අඩු කිරීමක් කරනු ලැබූ අවස්ථාවක දී, ඒ අඩු කිරීම කිරීමට පෙර වූ ලාභාංශ ප්‍රමාණය සහ එවැනි අඩු

කිරීමක් කරනු නොලැබූ අවස්ථාවක දී, ඒ ලාභාංශ ප්‍රමාණය සියයට පණහකින් වැඩි කරනු ලැබූ විට ලැබෙන ලාභාංශ ප්‍රමාණය අදහස් වේ.

නිර්වාසික සමාගම් ගෙවීමට යටත් ආදායම් බද්ද.

34. (1) යම් තක්සේරු වර්ෂයක් තුළ ශ්‍රී ලංකාවේ නිර්වාසික සමාගමක් ඒ තක්සේරු වර්ෂය වෙනුවෙන් ගෙවීමට යටත් ආදායම් බද්ද—

(අ) මේ පනතේ දෙවන උපලේඛනයේ IV වන කොටසෙහි දැක්වෙන ප්‍රමාණය අනුව ගණන් බලනු ලැබූ ප්‍රමාණයට සමාන මුදලකින් සහ එම තක්සේරු වර්ෂයක් සඳහා බදු ගෙවිය යුතු ආදායමෙන් සියයට පහක අතිරේක මුදලකින්; සහ

(ආ) ඒ තක්සේරු වර්ෂයෙහි එවැනි සමාගමක ප්‍රේෂණ ඇති අවස්ථාවක දී—

(i) ඒ ප්‍රේෂණ ප්‍රමාණය ඒ බදු අය කළ හැකි ආදායමෙන් තුනෙන් එකකට වඩා අඩු නම්, ඒ සමාගමේ ප්‍රේෂණවල එකතුවේ ප්‍රමාණයෙන් සියයට තිස් තුනයි තුනෙන් එකකට සමාන මුදලකින්; හෝ

(ii) ඒ ප්‍රේෂණවල එකතුවේ ප්‍රමාණය ඒ බදු අය කළ හැකි ආදායමෙන් තුනෙන් එකකට වඩා අඩු නොවේ නම්, ඒ බදු අය කළ හැකි ආදායමෙන් සියයට එකොළහයි නවයෙන් එකකට සමාන මුදලකින්,

සමන්විත විය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි "ප්‍රේෂණ" යන්න නිර්වාසික සමාගමක් සම්බන්ධයෙන් යෙදෙන විට, ඉන්—

(අ) වාසික සමාගමක් විසින් ඒ නිර්වාසික සමාගමට ලාභාංශ ගෙවා ඒ ලාභාංශ සම්බන්ධයෙන් 38 වන වගන්තිය යටතේ ඒ වාසික සමාගම විසින් අඩු කිරීමක් කරනු ලැබුවේ නම්, හෝ එම ලාභාංශ 11 වන වගන්තිය යටතේ ආදායම් බද්දෙන් නිදහස් නම්, ඒ වාසික සමාගම විසින් ඒ නිර්වාසික සමාගමට ගෙවූ ඒ ලාභාංශ හැර, ඒ සමාගමේ ලාභාංශවලින් පිටරටට ප්‍රේෂණය කළ මුදල්;

(ආ) ඒ සමාගම විසින් අපනයනය කළ බඩු පිටරටට විකිණීමෙන් ලැබුණු මුදල්වලින් පිටරට රඳවා තබන කොටස; සහ

(ඇ) ඒ සමාගම විසින් අපනයනය කොට නොග වෙළෙඳ පොළක නොවිකුණනු ලැබූ නැතහොත් කොහෙත්ම නොවිකුණනු ලැබූ යම් නිෂ්පාදන සම්බන්ධයෙන්, ශ්‍රී ලංකාවෙන් ඉපැයුණු බවට 71 වන වගන්තිය යටතේ සැලකෙන ලාභවලින් පිටරට රඳවා ඇති කොටස

අදහස් වේ.

ඇතැම් ලාභාංශ, ලබාගන්නා සමාගමේ තක්සේරු කළ හැකි ආදායමේ කොටසක් නොවන බව.

35. යම් වාසික සමාගමක් විසින් යම් වාසික හෝ නිර්වාසික සමාගමකට ලාභාංශ ගෙවනු ලැබ,—

(අ) ඒ ලාභාංශ සම්බන්ධයෙන් පළමුව සඳහන් කළ වාසික සමාගම විසින් 38 වන වගන්තිය යටතේ අඩුකිරීමක් කරනු ලැබ ඇති; හෝ

(ආ) එම ලාභාංශ 11 වන වගන්තිය යටතේ ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබ ඇති; හෝ

(ඇ) එම ලාභාංශ, පළමුව සඳහන් කළ වාසික සමාගමට වෙනත් නේවාසික සමාගමකින් ලැබුණ ලාභාංශ ප්‍රමාණයක යම් කොටසකින් සමන්විත වන්නා වූ; හෝ

අවස්ථාවක, මේ පනතෙහි වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන්ව ඇතද, ඒ ලාභාංශය දෙවනුව සඳහන් කළ සමාගමේ තක්සේරු කළ හැකි ආදායමේ කොටසක් නොවන ලෙස සලකනු ලැබිය යුතු ය.

තම කොටස් කරුවන් සමග කරන ගණුදෙනු වලින් ලැබෙන සමාගමක ලාභ.

36. සමාගමක කොටස්කරුවන් නොවන තැනැත්තන් සමග කරනු ලැබුවේ නම්, තක්සේරු කළ හැකි වන්නේ යම් ගණුදෙනු වලින් ලැබෙන ලාභ ද තම කොටස්කරුවන් සමග සමාගමක් විසින් කරනු ලබන ගණුදෙනුවලින් සමාගමට ලැබෙන එබඳු ලාභ මේ පනතෙහි අර්ථානුකූලව ලාභ විය යුතු ය.

නිර්වාසික සමාගමකට ගෙවිය යුතු ලාභාංශවලින් සියයට පහක බද්දක් වාසික සමාගම විසින් අඩු කිරීම.

37. යම් තක්සේරු වර්ෂයක් තුළ යම් නිර්වාසික සමාගමකට ගෙවිය යුතු වන, (මේ වගන්තියේ "අදාළ ලාභාංශය" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් ලාභාංශ ප්‍රමාණයකින්, සෑම වාසික සමාගමක් ම විසින්,—

(අ) අදාළ ලාභාංශය, මේ පනත යටතේ ආදායම් බද්දෙන් නිදහස් කරන ලද ලාභාංශ ප්‍රමාණයක කොටසක් නොවන යම් වාසික සමාගමක් විසින් වෙනත් වාසික සමාගමකින් ලැබුවා වූ ලාභාංශ මුදලක යම් කොටසකින් සමන්විත වන්නේ නම්, අදාළ ලාභාංශ ප්‍රමාණය සියයට පනහකින් වැඩි කළ විට ලැබෙන ප්‍රමාණයෙන් සියයට පහකට සමාන ආදායම් බද්දක්;

(ආ) අදාළ ලාභාංශය, මේ පනත යටතේ ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබූ ලාභාංශයක් නොව යම් වාසික සමාගමකට වෙනත් වාසික සමාගමකින් ලැබුණ ලාභාංශ ප්‍රමාණය යම් කොටසකින් සමන්විත නොවන්නේ නම්, ඒ අදාළ ලාභාංශ ප්‍රමාණයෙන් සියයට පහකට සමාන ආදායම් බද්දක්; සහ

(ඇ) අදාළ ලාභාංශය, මේ පනත යටතේ ආදායම් බද්දෙන් නිදහස් කරන ලද ලාභාංශයක් වන්නා වූ, ඒ වාසික සමාගමකින් ලැබුවා වූ ලාභාංශ මුදලකින් ගෙවනු ලැබුවේ නම්, ඒ අදාළ ලාභාංශ මුදලෙන් සියයට පහකට සමාන ආදායම් බද්දක්

අඩු කර ගත යුතු ය. තව ද, වාසික සමාගමකට, මේ වගන්තිය යටතේ අඩු කිරීමකට නියම වූ ආදායම් බද්දේ ප්‍රමාණය වාසික සමාගමෙන් ජනරජයට අය විය යුතු මුදලක් විය යුතු ය. තව ද එය මුදලක් වශයෙන් වහාම අය කර ගත යුතු ය; නැතහොත් ඒ සමාගම විසින් අන් ආකාරයකින් ගෙවිය යුතු යම් ආදායම් බද්දකට අතිරේකව තක්සේරු කොට ඒ සමාගමට වැයබර කරනු ලැබිය හැකි ය.

යම් ලාභාංශයකින් සිය යට තිස් තුනයි තුනෙන් එකක බද්දක් අඩු කර ගැනීමට වාසික සමාගමකට හිමිකම් ඇති බව.

38. (1) සෑම වාසික සමාගමකට ම, යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ සමාගමේ බදු අය කළ හැකි ආදායම ආගණනය කිරීමට පදනම් කර ගන්නා ලාභවලින්, මුදලින් හෝ මුදල් ගෙවීමට කෙරෙන අණක ආකාරයෙන් යම් කොටස්කරුවකුට ගෙවිය යුතු යම් ලාභාංශ ප්‍රමාණයකින් සියයට තිස් තුනයි තුනෙන් එකකට සමාන ආදායම් බද්දක් අඩු කර ගැනීමට හිමිකම තිබිය යුතු ය.

සමාගමක් විසින් යම් කොටස්කරුවකුට ගෙවිය යුතු ලාභාංශයක ප්‍රමාණය, මේ වගන්තියේ කාර්ය සඳහා ආගණනය කිරීමේ දී, ඒ සමාගමට වෙනත් වාසික සමාගමකින් ලැබුණු ලාභාංශයක ප්‍රමාණය යම් කොටසකින් සමන්විත වන්නා වූ ඒ ලාභාංශයේ ඒ කොටස, ගණන් නොගත යුතු ය.

(2) යම් තක්සේරු වර්ෂයක් තුළ දී වාසික සමාගමක් විසින් ගෙවිය යුතු වන යම් ලාභාංශයක් ගෙවීම සඳහා ලියනු ලැබූ හෝ පිළියෙළ කරනු ලැබූ බලපත්‍රයක්, චෙක් පතක් හෝ වෙනත් අණක් නිකුත් කරන සෑම තැනැත්තකු ම විසින්, මෙහි පහත දක්වෙන කරුණු පෙන්නුම් කරන ප්‍රකාශයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කර ඇති ආකාරයට එයට ඇමිණිය යුතු ය.

එනම්:—

(අ) ආදායම් බදු අඩු කිරීමෙන් පසු නියම වශයෙන් ගෙවනු ලැබූ ශුද්ධ ප්‍රමාණයට අනුරූප වන දළ ප්‍රමාණය;

(ආ) ආදායම් බදු වශයෙන් අඩු කරනු ලැබූ මුදල;

(ඇ) නියම වශයෙන් ම ගෙවනු ලැබූ ශුද්ධ ප්‍රමාණය;

(ඈ) එවැනි යම් ලාභාංශයකට, ඒ සමාගමට වෙනත් යම් වාසික සමාගමකින් ලැබුණ ලාභාංශයක ප්‍රමාණය ඇතුළත් වන විට, එසේ ලැබුණු ලාභාංශයේ කොටස සහ එසේ ලබා ගන්නා ලද ලාභාංශයේ සම්පූර්ණ ප්‍රමාණය හෝ ඉන් යම් කොටසක්, මේ පනත යටතේ ආදායම් බද්දෙන් නිදහස් කර තිබේ ද යන වග.

(3) වෙන යම් වාසික සමාගමකින් ලැබුණු යම් ලාභාංශයක ප්‍රමාණය ඇතුළත් වූ ලාභාංශයක් වාසික සමාගමක කොටස්කරුවකුට ලැබුණු බව (2) වන උපවගන්තියේ සඳහන් ප්‍රකාශයෙන් අනාවරණය වන විටක, ඒ කොටස්කරුගේ ව්‍යවස්ථාපිත ආදායම නිශ්චය කිරීමේ කාර්යය සඳහා ඒ ප්‍රමාණය සියයට පනහකින් වැඩි කළ යුතු අතර, එකී සියයට පනහට සමාන මුදලක් ඔහු විසින් ගෙවිය යුතු බද්දෙන් අඩු කිරීමේ හිමිකම ඔහුට ලැබිය යුතු ය:

එසේ වුව ද, මේ වගන්තියේ ඉහත දැක්වුණු විධිවිධාන—

(අ) ඒ කොටස්කරු සමාගමක් වන අවස්ථාවක දී, ඒ කොටස් කරුට සහ කොටස්කරු සම්බන්ධයෙන්; හෝ

(ආ) වෙන යම් සමාගමකින් ලැබුණු ලාභාංශයක ප්‍රමාණය මේ පනත යටතේ ආදායම් බද්දෙන් නිදහස් කර ඇති විටක, ඒ ලාභාංශයට හෝ ඒ සම්බන්ධයෙන්

අදාළ නොවිය යුතු ය.

(4) සමාගමක් නොවන වෙනත් යම් තැනැත්තකුගේ තක්සේරු කළ හැකි ආදායමට මුදල් ස්වරූපයෙන් හෝ මුදල් ගෙවීමේ අණක ස්වරූපයෙන් වාසික සමාගමක ලාභාංශයක් ඇතුළත් වූ විට, ඒ ලාභාංශය සම්බන්ධයෙන් (2) වන උපවගන්තිය ප්‍රකාර සාදනු ලැබූ ප්‍රකාශයක් ඉදිරිපත් කරනු ලැබීමෙන් පසු, ඔහු විසින් ගෙවිය යුතු බද්දෙන් ඒ ප්‍රකාශයෙන් පෙන්වනු ලැබූ බදු ප්‍රමාණය අඩු කර ගැනීමට ඔහුට හිමිකම් තිබිය යුතු ය.

(5) යම් තක්සේරු වර්ෂයක් සඳහා සමාගමක් නොවන යම් තැනැත්තකුගේ තක්සේරු කළ හැකි ආදායමට කොටස් හෝ ඍණ පත්‍ර ස්වරූපයෙන් වූ වාසික සමාගමක ලාභාංශයක් ඇතුළත් වූ විටක ඔහු විසින් ගෙවිය යුතු බද්දෙන් ඒ ලාභාංශය මුදලින් ගෙවන ලද්දේ නම්, ඒ ලාභාංශය වෙනුවෙන් (1) වන උපවගන්තිය යටතේ බද්දක් වශයෙන් අඩුකර ගැනීමට සමාගමට හිමිකම් තිබූ ප්‍රමාණයට සමාන ප්‍රමාණයක් අඩුකර ගැනීමට ඔහුට හිමිකම් තිබිය යුතු ය.

ඇතැම් බෙදා හරිනු නොලැබූ ලාභ බෙදා හරිනු ලැබූ ලෙස සැලකිය යුතු බව.

39. (1) පස්දෙනකුට වැඩි නොවන තැනැත්තන් සංඛ්‍යාවක් විසින් පාලනය කරනු ලබන සමාගමක් සම්බන්ධයෙන් වූ විට, යම් තක්සේරු වර්ෂයක් සඳහා සමාගම තම ලාභවලින් සාධාරණ කොටසක් තම කොටස්කරුවන්ට බෙදා දී නැති බවට තක්සේරු කරු සෑහීමට පත් වූ අවස්ථාවක, (පවත්නා ව්‍යාපාරයක් හෝ කෘෂිකාර්මික ව්‍යාපාරයක් මිලයට ගැනීම සඳහා ගෙවනු ලැබූ මිල හැර) සමාගමෙහි ව්‍යාපාරයේ සංවර්ධනය සඳහා දරනු ලැබූ යම් ව්‍යයදමක් අඩු කිරීමෙන් පසු, සමාගමේ සම්පූර්ණ ලාභ හෝ එයින් කොටසක් තක්සේරුකරු විසින් දන්වනු ලැබූ දිනයක දී, සමාගමේ කොටස්කරුවන්ට ලාභාංශ වශයෙන් බෙදා දුන් ලෙස (2) වන, (3) වන හා (4) වන උපවගන්තිවල විධිවිධානවලට යටත් ව, තක්සේරුකරු විසින් සලකනු ලැබිය හැකි ය.

(2) සමාගමක් විසින් තම කොටස්කරුවන්ට එහි ලාභවලින් සාධාරණ කොටසක් බෙදා දෙන ලද්දේ ද නැද්ද යන්න (1) වන උපවගන්තිය යටතේ නිශ්චය කිරීමේ දී, තක්සේරුකරු විසින්—

(අ) එහි මුළු ලාභ ප්‍රමාණය;

(ආ) සමාගම සම්බන්ධයෙන් යම් අතිරේක තක්සේරුවක් කරනු ලැබ ඇත්නම් එය;

(ඇ) සමාගමෙහි ව්‍යාපාරයෙහි තත්කාලයෙහි පවත්නා වූ අවශ්‍යතාවන්;

(ඈ) සමාගමේ ව්‍යාපාරයෙහි නඩත්තුව සහ සංවර්ධනය සඳහා වුවමනා හෝ ප්‍රඥාගෝචර විය හැකි වෙනත් අවශ්‍යතා සැලකිල්ලට ගත යුතු ය.

(3) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා පහත දැක්වෙන මූදල් වලින් යමක්, සමාගමේ ව්‍යාපාරයේ අවශ්‍යතාවලට හෝ ව්‍යාපාරයේ නඩත්තුව හෝ සංවර්ධනය සඳහා වුවමනා හෝ ප්‍රඥාගෝචර විය හැකි වෙනත් අවශ්‍යතාවලට හෝ යොදා ගනු නොලැබූ හෝ යොදාගත නොහැකි සමාගමේ කොටස්කරුවන් අතර බෙදා දීම සඳහා ඇති ලාභ ලෙස සලකනු ලැබිය යුතු ය :—

(අ) ප්‍රමාණවත් ප්‍රතිෂ්ඨාවක් සඳහා නොව, අන් ලෙසකින් නිකුත් කරනු ලැබූ හෝ ඇති කර ගත් යම් කොටසක් යම් ණය ප්‍රාග්ධනයක් හෝ ණයක්, (ඒ කොටස ණය ප්‍රාග්ධනය හෝ ණය වෙනුවෙන් ගෙවිය යුතු යම් අධි මූදලක් වේ නම් එය ද ඇතුළුව) නිදහස් කර ගැනීමෙහි හෝ නැවත ගෙවීමෙහි ලා සමාගමේ ලාභවලින් වියදම් කරනු ලැබූ හෝ යොදා ගනු ලැබූ හෝ නැතහොත් වියදම් කිරීමට හෝ යොදා ගැනීමට අදහස් කරනු ලැබූ යම් මූදලක් ;

(ආ) සමාගමේ අධ්‍යක්ෂවරයකුට හෝ කොටස් හිමියකුට ණයට දෙනු ලැබූ යම් මූදලක් ; හා

(ඇ) යම් ව්‍යාජ හෝ කෘත්‍රිම ගණුදෙනු අනුව හෝ ඒවායේ ප්‍රතිඵලයක් වශයෙන් වියදම් කරනු ලැබූ හෝ යොදා ගනු ලැබූ හෝ වියදම් කිරීමට හෝ යොදා ගැනීමට අදහස් කරනු ලැබූ යම් මූදලක්.

(4) (අ) (යම් අධි මූදලක් ඇතුළුව) ප්‍රාග්ධනයේ හෝ ණයේ ප්‍රමාණයට බොහෝ සෙයින් ම අඩු වටිනාකමක් සමාගමට ඇති වන ආකාරයේ ප්‍රතිෂ්ඨාවක් සඳහා යම් කොටසක් හෝ ණය ප්‍රාග්ධනය හෝ ණය හෝ නිකුත් කරන ලද්දේ නම් හෝ ඇති කර ගන්නා ලද්දේ නම්, හෝ

(ආ) මේ උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් කරනු ලැබූ ආකාරයේ ප්‍රතිෂ්ඨාවක් සඳහා නිකුත් කරනු ලැබූ හෝ ඇති කර ගනු ලැබූ නැතහොත් එබඳු ප්‍රතිෂ්ඨාවක් සඳහා නිකුත් කරනු ලැබූ හෝ දරනු ලැබූ යම් කොටසක් හෝ යම් ණය ප්‍රාග්ධනයක් හෝ ණයක් හෝ එබඳු ප්‍රතිෂ්ඨාවක් සඳහා නිකුත් කළ හෝ ඇති කර ගත් යම් කොටසක්, ණය ප්‍රාග්ධනයක් හෝ ණයක් නියම ලෙස හෝ අනියම් ලෙස නියෝජනය වන යම් කොටසක් හෝ ණය ප්‍රාග්ධනයක් හෝ ණයක්, නිදහස් කිරීමට හෝ නැවත ගෙවීමට හෝ එසේ නිදහස් කිරීමෙන් හෝ නැවත ගෙවීමෙහි ලා හෝ ඒ සඳහා යොදා ගත් හෝ යොදා ගැනීමට අදහස් කරන ලද මූදල් සොයා ගැනීමෙහි කාර්ය සඳහා හෝ නිකුත් කරන ලද්දේ නම් හෝ ඇති කර ගන්නා ලද්දේ නම්,

ඒ කොටස හෝ ණය ප්‍රාග්ධනය හෝ ණය හෝ (3) වන උපවගන්තියේ කාර්ය සඳහා ප්‍රමාණවත් ප්‍රතිෂ්ඨාවක් සඳහා නොව අන් ලෙසකින් නිකුත් කරනු ලැබූ ලෙස හෝ ඇති කර ගනු ලැබූ ලෙස සැලකිය යුතු ය. තව ද, මේ උපවගන්තියේ හා (3) වන උපවගන්තියේ යම් කාර්යයක් සඳහා යොදා ගනු ලැබූ හෝ යොදා ගැනීමට ඇති මුදලක් ගැන සඳහන් කිරීමක් වෙතොත් ඒ නිදහස් කිරීමට ඒ මුදල ආපසු ගෙවීමෙහි ලා හෝ ඒ සඳහා යොදා ගනු ලැබූ හෝ යොදා ගැනීමට ඇති මුදල පිළිබඳ වූ සඳහන් කිරීම් ඇතුළත් වන ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) යම් තක්සේරු වර්ෂයක් වෙනුවෙන් සමාගමේ සම්පූර්ණ ලාභ හෝ ඉන් කොටසක් සමාගමේ කොටස්කරුවන්ට ලාභාංශ වශයෙන් බෙදා දුන් ලෙස (1) වන උපවගන්තිය යටතේ තක්සේරුකරු විසින් සලකනු ලබන අවස්ථාවක, එසේ බෙදා දුන් ලෙස සලකනු ලැබූ ලාභ සම්බන්ධයෙන් ඒ වර්ෂය වෙනුවෙන් පුද්ගලයකුගේ බදු අය කළ හැකි ආදායම මත ආදායම් බද්ද අය කළ හැකි ඉහළ ම අනුප්‍රමාණය අනුව ආදායම් බද්දක් ඒ සමාගම විසින් ගෙවිය යුතු වන අතර, ඒ බද්ද—

(අ) මේ පනතේ වෙනත් යම් විධිවිධානයක් යටතේ ඒ සමාගම විසින් ගෙවිය යුතු ආදායම් බද්ද වෙනුවෙන් නොව ඊට අමතර වශයෙන් විය යුතු ය, තව ද

(ආ) තක්සේරුකරුවකු විසින් එම සමාගම විෂයයෙහි තක්සේරු කර අයකර ගත හැකි අතර, එය ගෙවීම සහ අයකර ගැනීම පිළිබඳ විධිවිධාන එලෙසට ම අදාළ විය යුතු ය.

(6) (1) වන උපවගන්තියේ සඳහන් සමාගමක්, අධිකරණයක් විසින් කළ ආඥාවක් අනුව හෝ සමාගමේ කොටස්කරුවන් විසින් ඒ වෙනුවෙන් සම්මත කරනු ලබන යෝජනාවක් අනුව හෝ ගණන් බේරා වසා දමනු ලබන අවස්ථාවක, ඒ ගණන් බේරා වසා දැමීම ආරම්භ වන තක්සේරු වර්ෂයේ දී හා ඒ අවසන් කිරීම සම්පූර්ණ වන තෙක් හෝ ඊට පසුව එළඹෙන එක් එක් තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බදු ගෙවීමෙන් පසු ආදායම් ශේෂය, ලාභාංශය වශයෙන් ඒ කොටස්කරුවන්ට බෙදා දුන් ආදායම ලෙස සලකනු ලැබිය යුතු ය.

(7) මේ වගන්තියේ "පස් දෙනකුට වැඩි නොවන තැනැත්තන් සංඛ්‍යාවක් විසින් පාලනය කරනු ලබන සමාගමක්" යන්නෙන්, නිකුත් කරනු ලැබූ මුළු කොටස් සංඛ්‍යාවෙන් අඩකට වැඩි ගණනක්, පස් දෙනකුට වැඩි නොවන තැනැත්තන් සංඛ්‍යාවක් විසින්, ඔවුන්ගේ භාර්යාවන් විසින් හෝ බාල වයස්කාර දරුවන් විසින් කෙළින් ම හෝ නම් කරනු ලැබූ තැනැත්තන්ගේ මාර්ගයෙන් අත් කර ගෙන සිටින සමාගමක් අදහස් වේ.

සමාගමක ලාභ සහ ආදායම සමාගමේ අධ්‍යක්ෂවරයකු විසින් නතු කර ගත් අවස්ථාවක අදාළ වන විධිවිධාන.

40. යම් තක්සේරු වර්ෂයක් වෙනුවෙන් සමාගමක ලාභ සහ ආදායම හෝ එවැනි ලාභවල සහ ආදායමෙහි යම් කොටසක් ඒ සමාගමේ යම් අධ්‍යක්ෂවරයකු, කළමනාකරුවකු, කොටස්කරුවකු හෝ විධායක නිලධරයකු විසින් නතුකර ගන්නා ලද අවස්ථාවක, ඒ ලාභ සහ ආදායම හෝ ඒ ලාභවල සහ ආදායමෙහි යම් කොටසක්, එම තක්සේරු වර්ෂය වෙනුවෙන් ඒ ලාභ හෝ ආදායම හෝ එහි කොටස නතු කරගත් තැනැත්තාගේ ලාභවල සහ ආදායමෙහි කොටසක් විය යුතු අතර, ඒ අනුව තක්සේරු කළ හැකිය. තව ද සියලු අවස්ථාගත කරුණු ගැන සැලකිලිමත් ව කොමසාරිස් ජනරාල් වරයා විසින්, ඒ තක්සේරු වර්ෂය වෙනුවෙන් ඒ සමාගමේ ලාභ සහ ආදායම නිශ්චය කිරීමේ කාර්ය සඳහා එම ලාභ සහ ආදායම් හෝ එහි කොටස 23 (1) වන වගන්තිය යටතේ අඩු කළ හැකිය.

X වන පරිච්ඡේදය

ඛන බද්ද නියම කිරීම

ඛන බද්ද අය කිරීම.

41. මේ පරිච්ඡේදයේ අනෙක් විධිවිධානවලට යටත්ව, සෑම තැනැත්තකුගේ, තක්සේරු වර්ෂයේ පළමුවන දිනයේ දී බදු අය කළ හැකි ඛනය සම්බන්ධයෙන්, මේ පනතේ හතරවන උප ලේඛනයෙහි දැක්වෙන උචිත අනුප්‍රමාණ අනුව, (මෙහි මින් මතු "ඛන බද්ද" යනුවෙන් හඳුන්වනු ලබන) බද්දක්, 1979 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන, සෑම තක්සේරු වර්ෂයක් සඳහා අය කළ යුතුය.

මේ පරිච්ඡේදය අදළ නොවිය යුතු තැනැත්තෝ.

42. මේ පරිච්ඡේදයේ කිසිවක්—

(අ) යම් රාජ්‍ය සංස්ථාවකට;

(ආ) යම් පළාත් පාලන ආයතනයකට;

(ඇ) ශ්‍රී ලංකාවේ නිශ්චල දේපළ ඇත්තා වූ යම් නිර්වාසික සමාගමක් හැර, යම් සමාගමකට;

(ඈ) 9 වන වගන්තියේ (ඇ), (ඇ), (ඉ) හෝ (ඊ) ඡේදවල සඳහන් කරනු ලැබූ යම් පුද්ගලයකු ඒ වගන්තිය යටතේ ආදායම් බද්දෙන් නිදහස්ව සිටිනා තැක් කල් ඒ පුද්ගලයාට;

(ඉ) 90 වන වගන්තිය අදාළ වන යම් පුද්ගල මණ්ඩලයකට;

(ඊ) හුදෙක් විද්‍යාත්මක පර්යේෂණ සඳහා ලිඛිත නීතියකින් පිහිටුවනු ලැබූ පොදු ස්වභාවයකින් යුත් යම් ආයතනයකට හෝ භාරයකට;

(උ) සමුපකාර සමිති ලියා පදිංචි කිරීමට අදාළ තත් කාලයේ බල පවත්නා යම් නීතියක් යටතේ ලියාපදිංචි කරනු ලැබූ හෝ ලියාපදිංචි කරන ලදැයි සලකනු ලබන යම් සමුපකාර සමිතියකට;

(ඌ) ස්වකීය මූලික කාර්යය බැංකුවක ව්‍යාපාර කටයුතු වන යම් ආයතනයකට;

(එ) සංස්ථාගත නීති අධ්‍යාපන සභාවට;

(ඒ) වැන්දඹු සහ අනත් දරු විශ්‍රාම වැටුප් ආඥාපනත්න් පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකාවේ රජයේ නිලධරයන්ගේ වැන්දඹු සහ අනත් දරු විශ්‍රාම වැටුප් අරමුදලට;

(ඔ) පළාත් පාලන සේවය සඳහා පිහිටුවනු ලැබූ වැන්දඹු සහ අනත් දරු විශ්‍රාම වැටුප් අරමුදලට හෝ යෝජනා ක්‍රමයට;

(ඕ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතින් පිහිටුවනු ලැබූ සේවක අර්ථසාධක අරමුදලට;

(ක) ලෝහෝර් ආර්යා ණය අරමුදල් (හාරකාර මණ්ඩල) පනත යටතේ සංස්ථාපිත ලෝහෝර් ආර්යා ණය අරමුදලට;

(ග) රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථසාධක සමිති පනත යටතේ පිහිටුවනු ලැබූ රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථසාධක සමිතියට;

(ච) ලංකා දුම්රිය යහසාධක සංගම් ආඥාපනත යටතේ පිහිටුවනු ලැබූ ලංකා දුම්රිය යහසාධක සංගමයට;

(ජ) රජයේ නිලධරයන්ගේ යහසාධක සංගමයට;

(ට) එක්සත් ජාතීන්ගේ සංවිධානයට;

(ඩ) ලෝක සංචාරක සංවිධානයට;

(ණ) ආණ්ඩුවේ මිනින්දෝරු සංගම් ආඥාපනත යටතේ සංස්ථාපිත රජයේ මිනින්දෝරුවරයන්ගේ සංගමයට;

(ත) 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 28 වන වගන්තියේ (අ) ඡේදය යටතේ කරනු ලැබූ නියමයකට මඟින් ධන බද්දෙන් නිදහස් වූ යම් තැනැත්තකුට; සහ

(ද) මේ වගන්තියේ ඉහතින් වූ ඡේදවල සඳහන් යම් තැනැත්තකුට සමාන ස්වභාවයේ වූ නිශ්චය කරනු ලැබූ වෙනත් යම් තැනැත්තකුට

අදාළ නොවිය යුතු ය.

ධනය යන්නෙහි අර්ථ කථනය.

43. ධනය යන්නෙන්, කවර හෝ ආකාරයක චංචල හෝ නිශ්චල දේපළ අදහස් වන අතර, 44 වන වගන්තියෙහි දැක්වෙන යම් දේපළක් ඇතුළත් වේ; තව ද 45 වන වගන්තියෙහි සඳහන් යම් දේපළක් ඊට ඇතුළත් නොවේ.

ඇතැම් දේපළ ධනයට ඇතුළත් විය නුතු බව.

44. (1) යම් තැනැත්තකුගේ ධනයට පහත සඳහන් දේපළ ඇතුළත් විය යුතු ය:—

(අ) ඔහුට ප්‍රාණ භුක්තිය පමණක් ඇති, රජයට අයත් දේපළක් නොවන යම් දේපළක්;

(ආ) ඔහු සන්තකය දරන යම් මෝටර් වාහනයක්;

මේ ඡේදයේ "සන්තකය දරන" යන්නෙන්, (කූලි සින්නක්කර ගිවිසුමක් හැර) මෝටර් වාහනයක් සම්බන්ධයෙන් තමා විසින් ඇතුළත් වූ යම් ගිවිසුමක් අනුව එකී වාහනයේ සන්තකය දරන තැනැත්තෙක් අදහස් වේ;

(ඇ) භාරයක් යටතේ එකම අර්ථලාභියා ඔහු වන විට ඒ භාරයට අයත් දේපළක්;

(ඈ) ඔහු, අර්ථලාභීන්ට අත්වන අර්ථලාභ වර්ෂයෙන් වර්ෂයට දැනගත හැකි භාරයක් යටතේ වූ අර්ථලාභීන් කීප දෙනකුගෙන් එක් කෙනකු නම්, භාරයට යටත් දේපළෙන්, භාරයෙන් අත්වන අර්ථලාභයෙන් ඔහුගේ කොටසට අනුපාතික වන ප්‍රමාණයේ කොටසක්;

(ඉ) ඔහු, භාරය යටතේ වූ අර්ථලාභීන් සියල්ලන්ට හෝ ඔවුන්ගෙන් කිසිවකුට අත්වන අර්ථලාභය වර්ෂයෙන් වර්ෂයට දැනගත නොහැකි භාරයක භාරකරුවකු නම් ඒ භාරයට යටත් දේපළ;

(ඊ) ඔහු, පොදු ස්වහාවයකින් යුතු භාරයක භාරකරුවෙක් නම්, ඒ භාරයට යටත් දේපළ;

(උ) ඔහු, ව්‍යාපාර ආයතනයක හවුල්කරුවෙක් නම්, නියමිත ආකාරයෙන් නිශ්චය කරනු ලබන පරිදි ඒ ව්‍යාපාර ආයතනයට ඔහුගේ ඇති සම්බන්ධතාවේ වටිනාකම:

එසේ වුවද, මේ උපවගන්තියේ ඉහත සඳහන් විධිවිධානවල කිසිවක් කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරනු ලැබූ විශ්‍රාම වැටුපක හෝ අර්ථසාධක අරමුදලක භාරකරුවකුට හෝ එයින් යම් ප්‍රතිලාභ කිසිවක් සඳහා හිමිකම් ඇති තැනැත්තකුට අදාළ නොවිය යුතු ය.

(2) මියගිය තැනැත්තකුගේ බූදලය, පොල්මෑකරුවකු විසින් පාලනය කරනු ලබන අවස්ථාවක දී, (1) වන උපවගන්තියේ කාර්ය සඳහා, පොල්මෑකරු බූදලයේ භාරකරු ලෙස ද, සම්පූර්ණ බූදලයේ හෝ ඉන් යම් කොටසක සෑම උරුමක්කාරයකුම අර්ථලාභියකු ලෙස ද බූදලය භාරයට යටත් දේපළ වශයෙන් ද සලකනු ලැබිය යුතු ය.

ඇතැම් දේපළ ධනයෙන් බැහැර කළ යුතු බව.

45. යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකුගේ ධනයෙන් පහත සඳහන් දේපළ බැහැර කළ යුතු ය:—

(අ) ශ්‍රී ලංකාවෙන් පිටත ඔහුගේ නිශ්චල දේපළ;

(ආ) ඔහු, ඒ තක්සේරු වර්ෂයෙහි, ශ්‍රී ලංකාවේ වාසික නොවන හෝ ශ්‍රී ලංකාවෙහි වාසික භාවය නතර කරනු ලැබූ තැනැත්තෙක් නම්, ශ්‍රී ලංකාවෙන් පිටත ඔහුගේ චංචල දේපළ;

(ඇ) ඔහු, ඒකාබද්ධ හින්දු පවුලක සාමාජිකයෙක් නම්, ඒ පවුලට හවුලේ උරුම වන දේපළට ඔහුගේ ඇති සම්බන්ධතාව;

(ඈ) 44 (1) (ආ) වගන්තියේ අර්ථානුකූලව තමා අයිතිකරු හෝ සන්තකය දරන තමාගේ පෞද්ගලික පාවිච්චිය සඳහා තබාගන්නා එක් මෝටර් රථයක්; එසේ වුව ද, දරුවකුගේ ධනයක් තිබේ නම්, ඒ ධනය එම තැනැත්තාගේ ධනය සමඟ එකතු කරනු ලැබීමට 46 වන වගන්තිය යටතේ නියම කරනු ලබන අවස්ථාවක දී,

දෙමව්පියන්ගෙන් කෙනකුට හෝ යම් දරුවකුට අයිති එවැනි එක් මෝටර් රථයක් සම්බන්ධයෙන් පමණක් එම අත්හැරීම අදාළ විය යුතු ය;

(ඉ) ඔහුට අයිති, ගෙදර දොරේ බඩු බාහිරාදිය හා ඔහුගේ පෞද්ගලික පාවිච්චිය සඳහා වන (ස්වර්ණාභරණ හැර) වෙනත් භාණ්ඩ;

(ඊ) ඒ තැනැත්තා විසින් වාසස්ථානයක් ලෙස පාවිච්චි කරන එක් නිවාසයක්; එසේ වුව ද, දරුවකුගේ ධනයක් තිබේ නම්, ඒ ධනය, ඒ තැනැත්තාගේ ධනය සමග එකතු කරනු ලැබීමට 46 වන වගන්තිය යටතේ නියම කරනු ලබන අවස්ථාවක දී, දෙමව්පියන්ගෙන් කෙනකුට හෝ යම් දරුවකුට අයිති එවැනි එක් නිවාසයක් සම්බන්ධයෙන් පමණක් එම අත්හැරීම අදාළ විය යුතු ය;

(උ) යම් දේපළක සම්බන්ධතාවක් අත්කරගත් දිනෙන් ආරම්භ ව අවුරුදු හයකට නොවැඩි කාලයකට ඔහුට ලැබී ඇති ඒ දේපළෙහි සම්බන්ධතාව;

(ඌ) 10 වන වගන්තියේ (ඇ) ඡේදයෙහි සඳහන් යම් විශේෂ හිණුමක ඔහුගේ බැරට ඇති මුදල් සහ 15 වන වගන්තියේ (ආ) ඡේදයෙහි සඳහන් පරිදි ඔහු විසින් කරනු ලබන එවැනි යම් ආයෝජනවල වටිනාකම;

(එ) වෙළෙඳ ව්‍යාපාරයක, වෘත්තියක හෝ රක්ෂාවක වත්කම් වශයෙන් ඔහු විසින් සලකනු ලබන්නේ නම් මිස, යම් පේටන්ට් බලපත්‍රයක්, ප්‍රකාශන අයිතියක්, වෙළෙඳ ලකුණක් හෝ තමාට අයිති ලෙස ලියාපදිංචි කරනු ලැබූ මෝස්තරයක් යටතේ ඔහු සතු අයිතිවාසිකම්;

(ඒ) යම් ජීවිත රක්ෂණ ඔප්පුවක් යටතේ ගෙවිය යුතු මුදල් අය විය යුතු හා ගෙවිය යුතු වීමට පෙර, ඒ ඔප්පුව පිළිබඳව ඔහුගේ අයිතිවාසිකම් හෝ සම්බන්ධතාව;

(ඔ) විශ්‍රාම වැටුපක් හෝ යාවජීව වාර්ෂිකයක් ලැබීමට ඔහුට ඇති අයිතිවාසිකම;

(ඕ) උපරිම වටිනාකම වශයෙන් රුපියල් පණස් දහසකට යටත් ව, ස්වකීය වෘත්තිය හෝ රැකියාව කරගෙන යාමට ඔහුට අවශ්‍ය යම් ආවුද හෝ මෙවලම්;

(ක) විද්‍යාත්මක පර්යේෂණ සඳහා ඔහු විසින් පාවිච්චි කරනු ලබන යම් මෙවලම් සහ වෙනත් උපකරණ;

(ග) ඔහුට අයිති වූ ද, විකිණීමට අදහස් නොකරනු ලබන්නා වූ ද යම් කලා කෘතියක්, පුරා විද්‍යාත්මක, විද්‍යාත්මක හෝ කලාත්මක කෘති එකතුවක්, පොත් හෝ අත් පිටපත්;

(ච) ඔහුට අයිති වූ ද, විකිණීමට අදහස් නොකරනු ලබන්නා වූ ද, යම් චිත්‍ර, සිතුවම්, ඡායාරූප සහ මුද්‍රිත දේවල්;

(ජ) ඔහුට අයිති වූ ද, විකිණීමට අදහස් නොකරනු ලබන්නා වූ ද (ස්වර්ණාභරණ හැර) පරම්පරාගතව උරුම වන යම් භාණ්ඩ;

(ට) උපරිම වටිනාකම වශයෙන් රුපියල් පණස් දහසකට යටත් ව, ඒ තැනැත්තාට අයිති යම් ස්වර්ණාභරණ; එසේ වුව ද, දරුවකුගේ ධනයක් තිබේ නම්, ඒ ධනය ඒ තැනැත්තාගේ ධනය සමඟ එකතු කරනු ලැබීමට 46 වන වගන්තිය යටතේ නියම කරනු ලබන අවස්ථාවක දී, මේ ඡේදය යටතේ වූ මුළු අත්හැරීම් රුපියල් පණස් දහසක් වූ මුදලකට සීමා විය යුතු ය;

(ඩ) කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරනු ලබූ යම් අර්ථසාධක අරමුදලක ඔහුගේ බැරට ඇති මුදල් ප්‍රමාණය;

(ණ) ඔහු අයිතිකරුව සිටින නමුත්, ප්‍රාණ භුක්තිය වෙනත් යම් තැනැත්තකුට ඇති යම් දේපළක්;

(ත) 1966 ඔක්තෝබර් මස 1 වන දින හෝ ඉන් පසුව සම්පූර්ණ කරනු ලැබූ ලෙස, සහ වර්ග අඩි පන සියයක් නොඉක්ම වන්නා වූ භූමි ප්‍රමාණයක් ඇති ලෙස, මේ පනතේ 12 වන වගන්තිය යටතේ හෝ ජාතික නිවාස පනතේ 90අ වගන්තිය යටතේ ජාතික නිවාස කොමසාරිස්වරයා විසින් සහතික කරනු ලැබූ ද නිවාසයක් වන, ඒ තක්සේරු වර්ෂය නිවාසය සම්පූර්ණ කරන ලද තක්සේරු වර්ෂය හෝ තදනන්තර තක්සේරු වර්ෂ හයෙන් එකක් වන්නා වූ ද, යම් නිවාසයක්;

(ද) පුණ්‍යායතනයක් නම්, ආදායම හෝ වාර්ෂික වටිනාකම ආදායම් බද්දෙන් නිදහස් කරනු ලබන එහි යම් දේපළක්;

(න) ඔහු, ශ්‍රී ලංකාවේ වාසිකව නොසිටි යම් තක්සේරු වර්ෂයක් හෝ ඉහතින් ම වූ තදනන්තර තක්සේරු වර්ෂ තුනෙන් එකක් වන්නා වූ එවැනි තක්සේරු වර්ෂයක් තුළ 10 වන වගන්තියේ (ඉ) ඡේදයේ සඳහන් කරනු ලැබූ පරිදි යම් ගිණුමක විදේශීය මුදලින් ඒ තැනැත්තාගේ බැරට ඇති මුදල්.

දරුවකුගේ ධනය ඔහුගේ දෙමව්පියන්ගෙන් කෙනකුගේ ධනය සමඟ එකතු කිරීම

46. වාසික පුද්ගලයකුගේ දරුවකුගේ යම් තක්සේරු වර්ෂයක් සඳහා වූ ධනය—

(අ) ඒ තක්සේරු වර්ෂයේ දී, ඔහුගේ දෙමව්පියන්ගේ විවාහය පැවැතියේ නම්, ඔහුගේ පියාගේ, හෝ

(ආ) ඒ තක්සේරු වර්ෂයේ දී, ඔහුගේ දෙමව්පියන්ගේ විවාහය නොපැවැතියේ නම්, එම තක්සේරු වර්ෂයේ දී ඔහු නඩත්තු කරන සහ ඔහු ජීවත් වන්නේ දෙමව්පියන්ගෙන් යම් කෙනකු සමඟ ද ඔහුගේ හෝ ඇගේ

ධනය සමඟ එකතු කළ යුතු අතර, ඒ ධනයෙන් කොටසක් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

ශුද්ධ ධනය

47. (1) "ශුද්ධ ධනය" යන්නෙන්—

(අ) මුදලින් හෝ මුදල්වල වටිනාකමින් වූ ප්‍රතිඵලයක් නොමැතිව හෝ අසම්පූර්ණ ප්‍රතිඵලයක් සඳහා හෝ ඇති කර ගත් යම් ණයක් නොවන;

(ආ) තමා විසින් ඇති කරගත් සම්පූර්ණයෙන් තමාගේ ම ප්‍රයෝජනය සඳහා නොවූ යම් ණයක් නොවන;

(ඇ) වෙනත් යම් තැනැත්තකුගෙන් ප්‍රතිපූරණයක් ලබා ගත නොහැකි වන්නේ නම් මිස, ප්‍රතිපූරණයක් ලබා ගැනීමට තමාට අයිතිවාසිකමක් ඇති යම් ණයක් නොවන;

(ඈ) යම් ණයවීමකින් ලබා ගන්නා ලද මුදලක්, ඔහුගේ ධනයට ඇතුළත් කරනු ලැබූ යම් දේපළක් මිල දී ගැනීමට, වැඩි දියුණු කිරීමට හෝ නඩත්තු කිරීමට ඔහු විසින් උපයෝගී කරනු ලැබුවේ නම් මිස, මේ පරිච්ඡේදය යටතේ ධනයෙන් බැහැර කරනු ලැබූ යම් දේපළකට වැය බරක් වූ හෝ එවැනි දේපළක ඇපය පිට ඇති කරගත් හෝ ඒ දේපළ සම්බන්ධයෙන් ඇති කරගත් යම් ණයක් නොවන; හා

(ඉ) ශ්‍රී ලංකාවේ දී ගෙවීමට ගිවිස ගත් හෝ ශ්‍රී ලංකාවේ දේපළකට වැයබරක් වූ හෝ එවැනි දේපළක ඇපය පිට ඇති කර ගත් යම් ණයක් නොවන, ඔහු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත ඇති කරගත් යම් ණයක් නොවන

යම් තක්සේරු වර්ෂයක පළමුවන දිනයෙහි දී යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු සියලුම ණයවල සමස්ත වටිනාකමට වඩා ඒ දින යෙහි ධනය සම්බන්ධයෙන් මේ පරිච්ඡේදයේ විධිවිධාන අනුව ආගණනය කරනු ලැබූ සමස්ත වටිනාකමෙහි ගණන ඉක්මවන ප්‍රමාණය අදහස් වන අතර දේපළෙහි වෙන් වෙන් කොටස්වලට වැය බරක් වූ එකම ණය එක් වරකට වඩා ගණන් නොගත යුතු ය.

(2) යම් තක්සේරු වර්ෂයක් සඳහා දරුවකුගේ ධනය, ඔහුගේ දෙමව්පියන්ගෙන් කෙනකුගේ ධනයට එකතු කරනු ලැබූ විට සහ එහි කොටසකින් සමන්විත යැයි සලකනු ලබන විට, (1) වන උප වගන්තිය යටතේ ඒ දරුවාට හිමිකම් ඇති ධනයෙන් කරනු ලබන යම් අඩු කිරීම් ඒ දෙමව්පියන්ගෙන් කෙනකුගේ ධනයෙන් අඩු කරනු ලැබිය යුතු ය.

බදු අය කළ හැකි ධනය.

48. (1) නිර්වාසික සමාගමක් නොවන යම් තැනැත්තකුගේ ශුද්ධ ධනය, යම් තක්සේරු වර්ෂයක රුපියල් දෙලක්ෂයක් ඉක්ම වන අවස්ථාවක දී, එසේ රුපියල් දෙලක්ෂයට වැඩි වන ඔහුගේ ශුද්ධ ධනයේ කොටස, ඒ තක්සේරු වර්ෂය සඳහා ඔහුගේ බදු අය කළ හැකි ධනය වන අතර, ඔහු ඒ කොටස සම්බන්ධයෙන් ධන බද්ද ගෙවීමට යටත් විය යුතු ය.

(2) ඉහතින් වූ විධිවිධානවල කිසිවක් නොතකා ශ්‍රී ලංකාවේ නිශ්චල දේපළ ඇති නිර්වාසික සමාගමක යම් තක්සේරු වර්ෂයක් සඳහා වූ බදු අය කළ හැකි ධනය ශ්‍රී ලංකාවේ නිශ්චල දේපළවලින් ලැබුන ලාභ සහ ආදායම ආරෝපණය කළ හැකි එකී තක්සේරු වර්ෂය සඳහා එහි බදු අය කළ හැකි ආදායමෙන් යම් කොටසක පස් ගුණයකට සමාන වන මුදලක් විය යුතු ය.

ධනය සමන්විත වන දේපළෙහි වටිනාකම්.

49. (1) යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් නිශ්චල දේපළක වටිනාකම එම තක්සේරු වර්ෂයේ පළමුවන දිනයේ දී පැවැති එහි වෙළෙඳ අගය විය යුතු ය.

(2) මුදල් හැරුණු විට, ධනය සමන්විත වන යම් චංචල දේපළක වටිනාකම, පහත සඳහන් විධිවිධාන අනුව ආගණනය කළ යුතු ය :—

(අ) යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් චංචල දේපළක වටිනාකම, ඒ තක්සේරු වර්ෂයේ පළමුවන දිනයේ දී පැවැති එහි වෙළෙඳ අගය විය යුතු ය;

(ආ) ස්වකීය ව්‍යවස්ථා අනුව කොටස් විකිණීමේ අයිතිවාසිකම සීමා කරන්නා වූ හෝ නිකුත් කළ සම්පූර්ණ කොටස් ගණනින් භාගයකට වැඩි ගණනක් පස් දෙනකුට වැඩි නොවන පුද්ගලයන් සංඛ්‍යාවක් විසින්, ඔවුන්ගේ භාර්යාවන් විසින් හෝ බාලවයසේ දරුවන් විසින්, කෙළින් ම හෝ නම් කරනු ලැබූ නෑනැත්තන්ගේ මාර්ගයෙන් අයිති කර ගෙන සිටින්නා වූ යම් සමාගමක (වරණීය කොටස් නොවන) කොටස්වලින් යම් චංචල දේපළක් සමන්විත වන අවස්ථාවක දී හෝ මේ ඡේදයේ කාර්ය සඳහා පිළිගත් ව්‍යාපාර වස්තු හුවමාරු ස්ථානයකට අයත් නිල ලේඛනයක හෝ භාණ්ඩාගාරයේ ලේකම් විසින් අනුමත කරනු ලැබූ යම් නෑරවිකාරයන්ගේ සංගමයක් විසින් ශ්‍රී ලංකාවෙහි නිකුත් කරනු ලබන එබඳු ස්වභාවයකින් යුත් ලේඛනයක හෝ තක්සේරු වර්ෂය තුළ ඕනෑම අවස්ථාවක, මේ කොටස ගැන සඳහන් වී නැතැයි කොමසාරිස් ජනරාල් වරයා සැහීමට පත්ව සිටින කල, ඒ කොටස්වල වටිනාකම නිශ්චය කිරීම, කොමසාරිස් ජනරාල්වරයා නියම කළහොත්, මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන මගින් සලස්වා ඇති ආකාරයෙන් නොව, කීර්තිනාමය ද ඇතුළුව ක්‍රියාකාරී ව්‍යාපාරයක් වශයෙන් තක්සේරු වර්ෂයේ පළමුවන දිනයෙහි සමාගමේ සම්පූර්ණ වත්කමේ වෙළෙඳ අගයෙන් පහත දැක්වෙන මිළ ගණන් අඩුකොට, ඒ වෙළෙඳ අගයට යොමු කිරීමෙන් කළ යුතු ය :—

(i) සමාගමේ ඍණ පත්‍රවල, ඍණ පත්‍ර ව්‍යාපාර වස්තුවල හා වරණීය කොටස්වල සම මිල හා නිදහස් කිරීමේ වටිනාකම යන මේ දෙකින් වැඩි වන්නේ යමක් ද එය;

(ii) මුදලින් හෝ මුදලේ වටිනාකම අනුව වූ ප්‍රතිඵල සඳහා සමාගම විසින් සද්භාවයෙන් දරනු ලැබූ හෝ ඇති කරගනු ලැබූ සියලු ණය;

(iii) යුක්තිසහගත වූ ද, සාධාරණ වූ ද ආගණනයක් අනුව සමාගමේ අනාගත හෝ සම්භාව්‍ය ණය හෝ ප්‍රමාණය නිශ්චිත නොවූ යම් ණය මුදලක්; හා

(iv) වෙනම ආයෝජනයක් ඇත්තා වූ ද සේවකයන්ට විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා හෝ අන් ලෙසකින් ඔවුන්ගේ හෝ ඔවුන්ගේ යැපෙන්නන්ගේ හෝ

ඥාතීන්ගේ යහපත සඳහා යොදනු ලැබීමට නිර්ව්‍යාජව අදහස් කරනු ලබන්නා වූ ද යම් සංචිත අරමුදලක ප්‍රමාණය.

(3) ජීවිත භුක්තියකට යටත් වූ යම් දේපළක වටිනාකම ඒ ජීවිත භුක්තිය නොපවතින ලෙස සලකා නිශ්චය කළ යුතු ය.

(4) තමා විසින් නිතිපතා ගිණුම් තබනු ලබන ව්‍යාපාරයක්, යම් තැනැත්තකු විසින් පවත්වාගෙන යන අවස්ථාවක දී, ඒ ව්‍යාපාරයෙහි ඒ තැනැත්තා විසින් යොදවා ඇති එක් එක් දේපළ සහ කීර්තිනාමයේ වටිනාකම වෙන් වශයෙන් නිශ්චය කිරීම වෙනුවට, ඒ තැනැත්තා විසින් ඒ ව්‍යාපාරයෙහි යොදවා ඇති දේපළ හා එකී කීර්තිනාමය සමස්තයක් වශයෙන් ගෙන එහි වටිනාකම කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චය කළ හැකි ය.

(5) යම් දේපළක වටිනාකම, මේ වගන්තියේ ඉහත සඳහන් විධි විධාන අනුව, එහි වෙළෙඳ අගයට සමාන මුදල් ප්‍රමාණයක් වන අවස්ථාවකදී, ඒ දේපළ විවෘත වෙළඳ පොළෙහි විකිණිය නොහැකි වීමේ හේතුවෙන් එහි වෙළෙඳ මිල දැන ගත නොහැකි විට ඒ දේපළේ වටිනාකම නියමිත ආකාරයෙන් නිශ්චය කළ යුතු ය.

ගෙවිය යුතු ඛන බද්ද එක්තරා ප්‍රමාණයක් නොඉක්ම විය යුතු බව.

50. යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු ඛන බද්ද, ඒ තක්සේරු වර්ෂය සඳහා, ඒ තැනැත්තා ගේ තක්සේරු කළ හැකි ආදායමෙන් සහ මේ පනතේ හෝ වෙනත් යම් ප්‍රඥප්තියක් යටතේ ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබූ ලාභ සහ ආදායම වන්නා වූ ද, ඒ නිදහස් කිරීම නිසා නොවේ නම් ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායම ආගණනය කිරීමේ දී ගණන් ගනු ලබන්නා වූ ද ලාභ සහ ආදායම්වල (මේ පනත යටතේ ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබූ වාසස්ථානයක ශුද්ධ වාර්ෂික වටිනාකම සහ යම් සහනාධාරයක් හැර) එකතුවෙන් සියයට අසූවක් නොඉක්මවිය යුතු ය.

XI වන පරිච්ඡේදය

ත්‍යාග බද්ද පැනවීම

ත්‍යාග බද්ද අය කිරීම.

51. මේ පරිච්ඡේදයේ වෙනත් විධිවිධානවලට යටත් ව, 1979 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා 42 වන වගන්තියෙහි සඳහන් පුද්ගලයකු හැර සෑම පුද්ගලයකුගෙන් ම, සහ සෑම සමාගමකින් ම ඒ පුද්ගලයා හෝ සමාගම විසින් දෙනු ලැබූ බදු අය කළ හැකි ත්‍යාග සම්බන්ධයෙන් මේ පනතේ මෙහි මින් මතු "ත්‍යාග බද්ද" යනුවෙන් හඳුන්වනු ලබන බද්දක්, මේ පනතේ පස්වන උපලේඛනයේ සඳහන් උචිත අනුප්‍රමාණ අනුව අය කළ යුතු ය.

ත්‍යාගය යන්නෙහි අර්ථය.

52. මේ පනතේ කාර්ය සඳහා, "ත්‍යාගය" යන්නෙන්, මුදලින් හෝ මුදල්වල වටිනාකමින් වූ ප්‍රතිඵලයක් නොඇතිව පවතින යම් චංචල හෝ නිශ්චල දේපළක් යම් තැනැත්තකු විසින් වෙන යම් තැනැත්තකුට ස්වේච්ඡාවෙන් පවරා දීමක් අදහස් වන අතර, 53 වන වගන්තිය යටතේ ත්‍යාගයක් ලෙස සලකනු ලබන යම් දේපළ පවරා දීමක් ද එයට ඇතුළත් වේ.

53. මේ පරිච්ඡේදයේ කාර්ය සඳහා—

ඇතැම් පැවැරීම් ත්‍යාගවලට ඇතුළත් විය යුතු බව.

(අ) යම් දේපළක් පවරනු ලැබ සහ ඒ පැවරීම ප්‍රමාණවත් නොවන ප්‍රතිඵලයක් සඳහා කර ඇතැයි අවස්ථානුගත කරුණු අනුව තක්සේරුකරු විසින් අදහස් කරනු ලැබ, තක්සේරුකරු විසින් ලියවිල්ලකින් වූ ඉල්ලීමක් මගින් ඉල්ලීමේ සඳහන් කාලය තුළ දී ඒ අදහසට විරුද්ධව හේතු දක්වන ලෙස ඒ පැවැරීම් හා සම්බන්ධ පාර්ශ්වකරුවන්ගෙන් ඉල්ලා සිටි අවස්ථාවක, ඔවුන් ඒ කාලය තුළ හේතු නොදැක්වුවහොත් හෝ ප්‍රමාණවත් යයි තක්සේරුකරු විසින් සලකනු ලබන අන්දමේ හේතු නොදැක්වුව හොත් පැවැරීමෙහි දිනයේ ඒ දේපළෙහි වෙළෙඳ මිල ප්‍රතිඵලයේ වටිනාකමට වඩා යම් ප්‍රමාණයකින් වැඩිවේ ද ඒ ප්‍රමාණය පැවරුම්කරු විසින් පැවරුම්ලාභියාට පිරිනමනු ලැබූ ත්‍යාගයක් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ආ) යම් දේපළක් පවරනු ලැබ සහ පැවරීම සඳහා වූ ප්‍රතිඵලය පැවරුම්ලාභියාගෙන් පැවරුම්කරුට ලැබී නැතැයි හෝ ඒ ප්‍රතිඵලය සම්පූර්ණයෙන් ම හෝ එහි කොටසක් දීමට අදහස් නොකරනු ලැබේ යයි අවස්ථානුගත කරුණු අනුව තක්සේරුකරුවකු විසින් අදහස් කරනු ලැබ, තක්සේරුකරු විසින් ලියවිල්ලකින් කරන ඉල්ලීමක් මගින් ඉල්ලීමේ සඳහන් කාලය තුළ ඒ අදහසට විරුද්ධව හේතු දක්වන ලෙස ඒ පැවරීම හා සම්බන්ධ පාර්ශ්වකරුවන්ගෙන් ඉල්ලා සිටි අවස්ථාවක, ඔවුන් ඒ කාලය තුළ හේතු නොදැක්වුව හොත් හෝ තක්සේරුකරු විසින් ප්‍රමාණවත් යයි සලකනු ලබන අන්දමේ හේතු නොදැක්වුව හොත්, තක්සේරුකරුගේ අදහස පරිදි, ලැබී නැති හෝ දීමට අදහස් නොකරනු ලබන ප්‍රතිඵලයේ වටිනාකම පැවරුම්කරු විසින් පිරිනමනු ලැබූ ත්‍යාගයක් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඇ) යම් දේපළකට පූර්ණ හිමිකම් ඇති තැනැත්තකු විසින් ප්‍රමාණවත් ප්‍රතිඵලයක් නොමැතිව ඒ දේපළ කවර ආකාරයකින් වුව ද තමා වෙත හෝ අන්කිසි තැනැත්තකු වෙත හවුලේ සතු කරනු ලැබීමට කටයුතු සලස්වන අතර හෝ කටයුතු සලස්වා ඇති අතර, ඒ අන්‍ය තැනැත්තා ඒ දේපළෙන් යම් නතු කිරීමක් කර ගන්නා අවස්ථාවක දී, ඒ නතු කරන්නා හැර, යම් තැනැත්තකුගේ ප්‍රතිලාභය සඳහා භාවිත කරනු ලැබූ නතු කරගත් ප්‍රමාණය, නතු කරන්නා විසින් ඒ නතු කිරීම කරනු ලැබුවේ යම් තැනැත්තකු වෙත ද ඒ තැනත්තා වෙත කරන ලද ත්‍යාගයක් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඈ) (නොලැබෙන ණයක් වශයෙන් සලකනු ලැබ, මේ පනත යටතේ ලාභ සහ ආදායම නිශ්චය කිරීමේ කාර්යය සඳහා අඩු කිරීමක් වශයෙන් ඉඩ දෙනු ලැබ ඇති ණයක් නොවන) යම් ණයක් හෝ ගිවිසුමක් හෝ යම් දේපළක් පිළිබඳ යම් සම්බන්ධතාවක් යම් තැනැත්තකු විසින් මුදා හරින ලද, නිදහස් කරන ලද, පවාරණය කරන ලද හෝ

අන්හරින ලද අවස්ථාවක එසේ මුදාහැරීමේ, නිදහස් කිරීමේ, පවාරණය කිරීමේ හෝ අත් හැරීමේ වටිනාකම ඒ තැනැත්තා විසින් දෙන ලද ත්‍යාගයක් වශයෙන් සලකනු ලැබිය යුතු ය;

(ඉ) ත්‍යාගදායකගේ හෝ වෙනත් යම් තැනැත්තකුගේ වාසියට හේතු වන පරිද්දෙන් කරන ලද වෙන් කිරීමකට යටත්ව, යම් දේපළක් ත්‍යාග කරනු ලබන්නේ ද, ඒ වෙන් කිරීම නිසා ඇති වන සම්බන්ධතාව අහෝසි වන අවස්ථාවේ නොව, ත්‍යාග් කිරීම කරනු ලැබූ අවස්ථාවේ ඒ ත්‍යාග කිරීම ක්‍රියාත්මක වූවාක් සේ සලකනු ලැබිය යුතු ය.

සමහර පැවරීම්වලට ත්‍යාග ඇතුළත් නොවන බව.

54. (1) යම් පුද්ගලයකු විසින්—

(අ) ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටි නිශ්චල දේපළවලින් දෙනු ලැබූ ත්‍යාගයකට;

(ආ) ඔහු ශ්‍රී ලංකාවේ පුරවැසියකු වුවහොත් ද ත්‍යාග පිරිනමන්නා වූ තක්සේරු වර්ෂය තුළ දී ඔහු ශ්‍රී ලංකාවේ වාසිකව සිටියහොත් ද මිස, ශ්‍රී ලංකාවෙන් බැහැර පිහිටි චංචල දේපළවලින් දෙනු ලැබූ ත්‍යාගයකට;

(ඇ) වටිනාකමින් රුපියල් විසිපන් දහසක උපරිමයකට යටත්ව, යම් දරුවකුගේ වයස අවුරුදු දහ අටකට වඩා වැඩි වුව ද, අඩු වුව ද, ඒ පුද්ගලයාගේ යම් දරුවකුට ඒ දරුවාගේ විවාහය නිමිති කර ගෙන දෙනු ලැබූ ත්‍යාගයකට;

(ඈ) 1958 ජූලි මස 18 වන දින හෝ ඊට පසු යම් පුද්ගලයකුගේ ජීවිත කාලය සඳහා වටිනාකමින් රුපියල් ලක්ෂ තුනක උපරිමයකට යටත්ව, මේ පනතේ 31 (9) වන වගන්තියේ හෝ 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 16අ වගන්තියේ හෝ අර්ථානුකූලව අනුමත පුණ්‍ය කාර්යයක් වන පුණ්‍ය කාර්යයකට, ඒ එක් එක් ත්‍යාගයේ වටිනාකම රුපියල් එක් දහසකට අධිකව දෙනු ලැබූ ත්‍යාගයකට;

(ඉ) ආණ්ඩුවට හෝ යම් පළාත් පාලන ආයතනයකට දෙනු ලැබූ ත්‍යාගයකට;

(ඊ) තක්සේරු වර්ෂයක දී දෙනු ලැබුවා වූ ද, වටිනාකම හෝ ඒ වර්ෂය තුළ එකකට වඩා ත්‍යාග පිරිනැමුවේ නම් ඒ ත්‍යාගවල වටිනාකමේ එකතුව රුපියල් දෙදහසකට වඩා වැඩි නොවන්නා වූ ද ත්‍යාගයකට;

(උ) අන්තිම කැමති පත්‍රයකින් දෙනු ලැබූ ත්‍යාගයකට; හෝ

(ඌ) මරණය බලාපොරොත්තුවෙන් දෙනු ලැබූ ත්‍යාගයකට;

මේ පරිච්ඡේදය අදාළ නොවිය යුතු ය.

(2) යම් සමාගමක් විසින් ආණ්ඩුවට හෝ පළාත් පාලන ආයතනයකට හෝ මේ පනතේ 31(9) වන වගන්තියේ හෝ 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 16අ වගන්තියේ

අර්ථානුකූලව අනුමත ප්‍රණාමායතනයක් වන ප්‍රණාමායතනය කට හෝ දෙන ලද ත්‍යාගවලට මේ පරිච්ඡේදය අදාළ නොවිය යුතු ය.

(3) යම් පුද්ගලයකු රෝගීව, තම රෝගය නිසා මරණයට පත් වීමට බලාපොරොත්තු වෙමින් ත්‍යාගදායකවන ඔහු තම රෝගය නිසා මිය ගියහොත්, යම් තැනැත්තනුට ත්‍යාගයක් විය යුතු වූද, ත්‍යාගදායක විසින් අවලංගු කළ හැකි වූද, ත්‍යාගදායක තම රෝගයෙන් සුවය ලැබුවහොත් හෝ ත්‍යාගලාභියාට වඩා කාලයක් ඔහු ජීවත්ව සිටියහොත් වලංගු නොවන්නා වූද, ත්‍යාගයක් වශයෙන් යම් දේපළක සත්තකය ඒ තැනැත්තාට පවරාදුන හොත්, (1) වන උපවගන්තියෙහි කාර්ය සඳහා, ඒ පුද්ගලයා විසින් තම මරණය බලාපොරොත්තුවෙන් දේපළක් ත්‍යාග දුන් ලෙස සලකනු ලැබිය යුතු ය.

බදු ගෙවිය යුතු ත්‍යාග සහ ගෙවිය යුතු ත්‍යාග බද්ද ආගණනය කිරීම.

55. (1) 54 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි හෝ (2) වන උපවගන්තියෙහි සඳහන් ත්‍යාග හැර, යම් පුද්ගලයකු විසින් හෝ සමාගමක් විසින් දෙනු ලැබූ ත්‍යාග, අවස්ථානුකූලව ඒ පුද්ගලයාගේ හෝ ඒ සමාගමෙහි බදු අය කළ හැකි ත්‍යාග විය යුතු ය. තව ද, 137 වන වගන්තියේ විධිවිධානවලට යටත් ව, බදු අය කළ හැකි ඒ ත්‍යාග සම්බන්ධයෙන් ත්‍යාග බද්ද ගෙවීමට ඔහු යටත් විය යුතු ය.

(2) පුද්ගලයකුගේ බදු අය කළ හැකි ත්‍යාග සම්බන්ධයෙන් ඔහු විසින් යම් තක්සේරු වර්ෂයක් සඳහා ගෙවිය යුතු ත්‍යාග බද්ද—

1958 ජූලි මස 18 වන දින හෝ ඊට පසුව, එහෙත් එකී තක්සේරු වර්ෂයේ අවසානයට පෙර ඒ තැනැත්තා විසින් දෙන ලද සහ මේ පනතේ හෝ 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ හෝ 1959 අංක 14 දරන පෞද්ගලික බදු පනතේ හෝ අර්ථානුකූල වූ සියලුම බදු අය කළ හැකි ත්‍යාග පිළිබඳ විවිනාකම්වල සමස්තය මත මේ පනතේ පස්වන උපලේඛනයේ සඳහන් ත්‍යාග බද්ද පිළිබඳ නියමිත අනුප්‍රමාණ අනුව ආගණනය කරනු ලබන මුදල්, මේ පනත යටතේ හෝ 1963 අංක 4 දරන දේශීය ආදායම් පනත යටතේ හෝ ත්‍යාග බද්ද වශයෙන් හෝ බදු අය කළ හැකි ත්‍යාග සම්බන්ධයෙන්, 1959 අංක 14 දරන පෞද්ගලික බදු පනත යටතේ අය කරනු ලබන පෞද්ගලික බද්දට ගෙවනු ලබන දායක මුදලක් වශයෙන් හෝ යම් පූර්ව තක්සේරු වර්ෂයක් සඳහා ඔහු විසින් ගෙවන ලද මුදල්වල සමස්තය ඉක්මවන්නේ යම් ප්‍රමාණයකින් ද, ඒ ප්‍රමාණය විය යුතු ය.

(3) යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් පුද්ගලයකු විසින් ගෙවිය යුතු ත්‍යාග බද්ද ආගණනය කරනු ලැබීමේ දී, ඒ තක්සේරු වර්ෂය තුළ දී දෙන ලද ත්‍යාග සම්බන්ධයෙන් අදාළ විය යුතු ත්‍යාග බද්ද පිළිබඳ අනුප්‍රමාණය හෝ අනුප්‍රමාණ, ඒ ත්‍යාග සහ ඒ පුද්ගලයා විසින් කලින් දෙන ලද බදු අය කළ හැකි ත්‍යාග ඒ තක්සේරු වර්ෂය සඳහා සමස්තයක් ලෙස සලකනු ලැබුවේ නම් අදාළ විය හැකි අනුප්‍රමාණය හෝ අනුප්‍රමාණ විය යුතු ය.

(4) සමාගමක බදු අය කළ හැකි ත්‍යාග සම්බන්ධයෙන් යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ සමාගම විසින් ගෙවිය යුතු ත්‍යාග බද්ද, මේ පනතේ පස්වන උපලේඛනයේ සඳහන් කර ඇති සහ සමාගමකට අදාළවන අනුප්‍රමාණ අණුව ඒ බදු අය කළ හැකි ත්‍යාග මත ගණන් බැලූ මුදල් විය යුතු ය.

ත්‍යාගවල වටිනාකම් නිශ්චය කිරීම.

56. (1) ත්‍යාගයක් සංයුක්ත වන යම් (මුදල් නොවන) දේපළක වටිනාකම, මෙහි මින් මතු සලස්වා ඇති විධිවිධානවලට යටත්ව, ත්‍යාගය දෙනු ලැබූ දිනයෙහි එහි වෙළෙඳ අගය විය යුතු ය.

(2) යම් තක්සේරු වර්ෂයක් තුළ දෙන ලද ත්‍යාග 49 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදය අදාළ වන කොටස්වලින් සංයුක්ත වන අවස්ථාවක, ඒ කොටස්වල වටිනාකම, ඒ වගන්තියේ විධිවිධානවලට අනුකූලව නිශ්චය කරන ලද, ඒ තක්සේරු වර්ෂයේ අප්‍රේල් මස 1 වන දින ඒ කොටස්වල පැවති වටිනාකම විය යුතු ය.

(3) ත්‍යාගයක් සංයුක්ත වන සහ ත්‍යාගදායකයාගේ හෝ වෙනත් යම් තැනැත්තකුගේ වාසියට වූ යම් වෙන් කර තැබීමකට යටත් යම් දේපළක්, එසේ වෙන් කර තැබීමක් නොකර, ඒ දේපළ ත්‍යාගලාභියාට අත් වූ ලෙස සලකා අගය කරනු ලැබිය යුතු ය.

(4) ((2) වන උපවගන්තිය අදාළ වන දේපළක් නොවන) යම් දේපළක වටිනාකම, විවෘත වෙළෙඳ පොළෙහි ඒ දේපළ විකිණිය නොහැකි වන නිසා, (1) වන උපවගන්තිය යටතේ නිශ්චය වශයෙන් දැන ගත නොහැකි වන අවස්ථාවක, එහි වටිනාකම නියම කර ඇති ආකාරයෙන් නිශ්චය කරනු ලැබිය යුතු ය.

ගෙවිය යුතු ත්‍යාග බද්දෙන් මුද්දර ශාස්තුව අඩු කිරීම.

57. බදු අය කළ හැකි යම් ත්‍යාගයක් දෙනු ලැබුවේ යම් සාධන පත්‍රයක් මගින් ද, ඒ සාධන පත්‍රය සම්බන්ධයෙන් මුද්දර ශාස්තු ගෙවා ඇති අවස්ථාවක, ඒ බදු අය කළ හැකි ත්‍යාග සම්බන්ධයෙන් ගෙවිය යුතු ත්‍යාග බද්දෙන් ඒ මුද්දර ශාස්තු අඩු කළ හැකි ප්‍රමාණයකට, අඩු කරනු ලැබිය යුතු ය.

ඇතැම් අවස්ථාවල දී, ත්‍යාග බද්ද ගෙවීමට ත්‍යාගලාභියා යටත් වන බව.

58. බදු අය කළ හැකි ත්‍යාග සම්බන්ධයෙන් ත්‍යාග බද්ද අය කරනු ලැබිය හැකි පුද්ගලයා ත්‍යාගදායකයා නමුත් ත්‍යාග බද්ද ගෙවීමට ත්‍යාගදායකයා යටත් වන ආකාරයට ම හා ත්‍යාග දායකයා විසින් ත්‍යාග බද්ද ගෙවිය යුතුවන ප්‍රමාණයටම ත්‍යාග බද්ද ගෙවීමට—

(අ) ත්‍යාගදායකයා මිය ගියේ නම් සහ එසේ මිය යන විට ඔහුගේ කිසිම දේපළක් ශ්‍රී ලංකාවේ නොතිබුණේ නම් හෝ එසේ මිය යන විට ශ්‍රී ලංකාව තුළ තිබුණු ඔහුගේ දේපළ තක්සේරුකරුගේ මතය අනුව, ත්‍යාග බද්ද අය කර ගනු ලැබීමට තරම් ප්‍රමාණවත් නොවේ නම්; හෝ

(ආ) ත්‍යාගදායකයා ශ්‍රී ලංකාව තුළ වාසිකව සිටීම අවසන වී නම්, හෝ ශ්‍රී ලංකාව තුළ තිබෙන ඔහුගේ දේපළ, තක්සේරු කරුගේ මතය අනුව ත්‍යාග බද්ද අය කර ගනු ලැබීමට තරම් ප්‍රමාණවත් නොවේ නම්; හෝ

(ඇ) ත්‍යාගදායකයා පිළිබඳව තක්සේරුවක් කිරීම ප්‍රායෝගික නොවන බව අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගැනීමෙන් පසුව, තක්සේරුකරුගේ මතය වන්නේ නම්

ත්‍යාගලාභියා යටත් විය යුතු ය:

එසේ වුවද, ත්‍යාගලාභියාගේ බැඳීම, ත්‍යාගය දෙන ලද තක්සේරු වර්ෂය සඳහා ත්‍යාගදායකයා විසින් ගෙවිය යුතුව තිබූ ත්‍යාග බද්දේ ප්‍රමාණය හා ඒ තක්සේරු වර්ෂය සඳහා ත්‍යාගදායකයා විසින් දෙන ලද බදු අය කළ හැකි ත්‍යාගවල වටිනාකම අතර යම් අනුපාතයක් වේද ඒ අනුපාතයම ත්‍යාගලාභියාට දෙන ලද ඒ ත්‍යාගය ලැබුණු දිනයේ දී ඒ ත්‍යාගය සංයුක්ත වූ දේපළෙහි වටිනාකම ම දරන විට ලැබෙන මුදලට සීමා විය යුතු ය.

XII වන පරිච්ඡේදය

විශේෂ අවස්ථා

අ. දරුවෝ

දරුවකුගේ ආදායම සහ ධනය තක්සේරු කිරීම.

59. (1) දරුවකු වන පුද්ගලයකු යම් තක්සේරු වර්ෂයක් තුළ දී අවුරුදු දහ අටට එළඹුණු විට හෝ ඔහු විවාහ වූ විට, ඒ තක්සේරු වර්ෂය සඳහා—

(අ) ඒ පුද්ගලයාගේ මුළු ව්‍යවස්ථාපිත ආදායම ඔහුගේ දෙමව්පියන්ගෙන් කෙනකුගේ ව්‍යවස්ථාපිත ආදායමට එකතු කරනු නොලැබිය යුතු අතර, එය ඔහුගේ දෙමව්පියන්ගෙන් කෙනකුගේ මුළු ව්‍යවස්ථාපිත ආදායමේ කොටසක් ලෙස ද සලකනු නොලැබිය යුතු ය;

(ආ) ඒ පුද්ගලයාගේ මුළු ව්‍යවස්ථාපිත ආදායමෙන් 29 වන වගන්තිය යටතේ අඩු කළ හැකි යම් මුදලක් ඔහුගේ දෙමව්පියන්ගෙන් කෙනකුගේ මුළු ව්‍යවස්ථාපිත ආදායමෙන් අඩු කරනු නොලැබිය යුතු ය;

(ඇ) ඒ පුද්ගලයා විසින් කරන ලද, 31 වන වගන්තියේ අර්ථානුකූල යම් සුදුසුකම් ලබන ගෙවීමක් ඔහුගේ දෙමව්පියන්ගෙන් කෙනකු විසින් කරන ලද සුදුසුකම් ලබන ගෙවීමක් ලෙස සලකනු නොලැබිය යුතු ය;

(ඈ) ඒ දරුවාගේ ධනය ඔහුගේ දෙමව්පියන්ගෙන් කෙනකුගේ ධනයට එකතු කරනු නොලැබිය යුතු අතර එය ඔහුගේ දෙමව්පියන්ගෙන් කෙනකුගේ ධනයේ කොටසක් ලෙස ද සලකනු නොලැබිය යුතු ය; තව ද

(ඉ) ඒ දරුවාගේ ධනයෙන්, 47 වන වගන්තිය යටතේ අඩු කරනු ලැබීමට හිමිකම් ලැබෙන කිසිම මුදලක් ඔහුගේ දෙමව්පියන් ගෙන් කෙනකුගේ ධනයෙන් අඩු කරනු නොලැබිය යුතු ය.

තව ද, ඒ දරුවා ඒ සම්පූර්ණ තක්සේරු වර්ෂය තුළ ම දරුවකු නොවන පුද්ගලයකු වූවාක් මෙන් සලකා, ගණන් බලන ලද ආදායම් බද්දක් හා ධන බද්දක් ඒ තක්සේරු වර්ෂය සඳහා ගෙවීමට ඒ දරුවා යටත් විය යුතු ය.

(2) යම් තක්සේරු වර්ෂයක් තුළ, දරුවකුගේ දෙමව්පියන්ගේ විවාහයේ පැවතීම අවසාන වූ හෝ නො පැවති ලෙස සලකනු ලැබූ හෝ අවස්ථාවක—

(අ) ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ දරුවාගේ මුළු ව්‍යවස්ථාපිත ආදායම් ඔහුගේ පියාගේ මුළු ව්‍යවස්ථාපිත ආදායමට එකතු කරනු ලැබිය යුතු අතර එය ඔහුගේ පියාගේ මුළු ව්‍යවස්ථාපිත ආදායමේ කොටසක් ලෙස ද සලකනු ලැබිය යුතු ය;

(ආ) ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ දරුවාගේ මුළු ව්‍යවස්ථාපිත ආදායමෙන් 29 වන වගන්තිය යටතේ අඩු කරනු ලැබිය හැකි යම් මුදලක්, ඔහුගේ පියාගේ මුළු ව්‍යවස්ථාපිත ආදායමෙන් අඩු කරනු ලැබිය යුතු ය;

(ඇ) ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ දරුවා විසින් කරන ලද, 31 වන වගන්තියේ අර්ථානුකූල සුදුසුකම් ලබන ගෙවීමක් ඔහුගේ පියා විසින් කරන ලද සුදුසුකම් ලබන ගෙවීමක් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඈ) ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ දරුවාගේ ධනය ඔහුගේ පියාගේ ධනයට එකතු කරනු ලැබිය යුතු අතර එය පියාගේ ධනයේ කොටසක් ලෙස ද සලකනු ලැබිය යුතු ය; තව ද

(ඉ) ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ දරුවාගේ ධනයෙන් 47 වන වගන්තිය යටතේ අඩු කරනු ලැබීමට හිමිකම් ලැබෙන යම් මුදලක් ඔහුගේ පියාගේ ධනයෙන් අඩු කරනු ලැබිය යුතු ය.

(3) නිසි බලය ඇති අධිකරණයක නීත්‍යනුකූල ප්‍රකාශයක් යටතේ හෝ නිසි පරිදි ලියා අත්සන් කරන ලද වෙන්වීමේ ඔප්පුවක් යටතේ, භාර්යාව ඇගේ ස්වාමි පුරුෂයාගෙන් වෙන් වී ජීවත් වේ නම් හෝ වෙන්වීම ස්ථිර වෙන්වීමක් බවට පෙනී යන අවස්ථානුගත කරුණු යටතේ ස්වාමිපුරුෂයා හා භාර්යාව ඇත්ත වශයෙන් ම වෙන් වී සිටින් නම්, (2) වන උපවගන්තියේ කාර්ය සඳහා, විවාහය පවතින ලෙස නොසැලකිය යුතු ය.

ආ. භාරගැනුම්කරුවෝ, භාරකරුවෝ හා පොල්මෑකරුවෝ යනාදිහු

භාර ගැනුම් කරුවන් සහ භාරකරුවන් විසින් වාර්තා සැපයිය යුතු බව සහ බදු ගෙවීමට ඔවුන් යටත් වන බව.

60. (1) දැන්වීමෙහි සඳහන් කාලසීමාව ඇතුළත පහත සඳහන් වාර්තා ආදිය සපයන ලෙස යම් භාරගැනුම්කරුවකුට හෝ භාරකරුවකුට හෝ නියම කරමින් තක්සේරුකරුවකු විසින් ඒ භාරගැනුම් කරු හෝ භාරකරු හෝ වෙත ලියවිල්ලකින් වූ දැන්වීමක් දෙනු ලැබිය හැකි ය:—

(අ) භාරගැනුම්කරුවකු සම්බන්ධයෙන් වන විට—

(i) ආදායම් බද්ද පිළිබඳ කාර්ය සඳහා, ඔහුගේ පාලනය යටතේ ඇති දේපළවලින් ලැබෙන ආදායම පිළිබඳ වාර්තාවක්;

(ii) ධන බද්ද පිළිබඳ කාර්ය සඳහා, ඒ දේපළ පිළිබඳ සහ ඔහු විසින් යම් දේපළ යම් තැනැත්තන් අතර බෙදා දෙනු ලැබ තිබේ නම්, එසේ බෙදා දෙන ලද දේපළ පිළිබඳ විස්තරයක් හා ඒ තැනැත්තන්ගේ නම් සහ ලිපිනයන් සඳහන් වාර්තාවක්;

(ආ) භාරකරුවකු සම්බන්ධයෙන් වන විට—

(i) ආදායම් බද්ද පිළිබඳ කාර්ය සඳහා, භාරයට යටත් දේපළවලින් ලැබෙන ආදායම පිළිබඳ වාර්තාවක්;

(ii) ධන බද්ද පිළිබඳ කාර්ය සඳහා, ඒ දේපළ පිළිබඳ වාර්තාවක් සහ භාරය යටතේ වූ අර්ථලාභීන්ගේ නම් හා ලිපිනයන් සහ භාරය යටතේ ඔවුන් හිමිකම් ලබන අර්ථලාභ.

තව ද පහත දැක්වෙන ආකාරයෙන් භාරගැනුම්කරුවකුගෙන් හෝ භාරකරුවකුගෙන් ආදායම් බද්ද හෝ ධන බද්ද අය කරනු ලැබිය යුතු ය:—

(i) භාරගැනුම්කරුවකු සම්බන්ධයෙන් වන විට, ඔහුගේ පාලන යට යටත් දේපළවල ආදායම හෝ ධනය හෝ මත; සහ

(ii) භාරකරුවකු සම්බන්ධයෙන් වන විට, මේ වගන්තියේ (2) වන උපවගන්තියේ සහ 44 වන වගන්තියේ (1) වන උප වගන්තියේ විධිවිධානවලට යටත්ව, ඒ භාරයේ දේපළවල ආදායම හෝ ධනය හෝ මත.

(2) (1) වන උපවගන්තිය යටතේ ආදායම් බද්දට යටත් වන ආදායමක් සහිත භාරයක් සඳහා අර්ථලාභීන් සිටින අවස්ථාවක, ඒ අර්ථලාභීන්ට හිමිකම් ඇති, ඒ ආදායමේ කොටස, (1) වන උපවගන්තිය යටතේ බද්දට යටත් ආදායම් ප්‍රමාණයෙන් අඩු කරනු ලැබිය යුතු අතර, මේ පනතේ කාර්ය සඳහා, ඒ ආදායමේ කොටස ඒ අර්ථලාභීන්ගේ ආදායම ලෙස සලකනු ලැබිය යුතු ය; තව ද, ඒ අනුව, ඒ එක් එක් අර්ථලාභියාගෙන් ඒ ආදායමේ ඔහුගේ කොටස සම්බන්ධයෙන් ආදායම් බද්ද අය කර ගනු ලැබිය යුතු ය.

(3) යම් තක්සේරු වර්ෂයක් සඳහා, යම් භාරයක සම්පූර්ණ ආදායම හෝ ඉන් කොටසක් හෝ අර්ථලාභියකුගේ ආදායම ලෙස (2) වන උපවගන්තිය යටතේ සලකනු ලබන හෝ භාරයකට යටස්

දේපළක් සම්පූර්ණයෙන් ම හෝ ඒ දේපළෙන් කොටසක් හෝ 44 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ හෝ (ඇ) ඡේදයේ හෝ විධිවිධාන යටතේ ඒ භාරය යටතේ වූ අර්ථලාභියකුගේ ධනයට ඇතුළත් වන අවස්ථාවක, කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලැබිය හැකි ආකාරයක් අනුව වූ ද ඒ ආදායමේ හෝ ධනයේ හෝ ප්‍රමාණය සඳහන් වන්නා වූ ද දැන්වීමක් භාරකරු විසින් ඒ තක්සේරු වර්ෂයේ පිළිවෙලින් ජූලි, ඔක්තෝබර් සහ ජනවාරි යන මාසවල තිස්වන දින හෝ ඊට පෙර, සහ ඊළඟම තක්සේරු වර්ෂයේ අප්‍රේල් මස තිස් වන දින හෝ ඊට පෙර ඒ අර්ථලාභියාට දිය යුතු ය.

(4) යම් තක්සේරු වර්ෂයක් සඳහා භාරගැනුම්කරුවකුගෙන් හෝ භාරකරුවකුගෙන් අයකර ගනු ලැබිය යුතු ආදායම් බද්ද සහ ධන බද්ද, ඔහු පිළිබඳව තක්සේරුවක් කරනු නොමැති වුව ද, 97 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ඔහු විසින් ගෙවිය යුතු ය.

අබලතාව කට පත් තැනැත්තකුගේ භාරකරුවකු ආදායම් බද්ද ගෙවීමට යටත් බව.

61. අබලතාවකට පත් තැනැත්තකුගේ භාරකරුගෙන්, ඒ තැනැත්තාගෙන් මේ පනත යටතේ ආදායම් බද්ද අයකර ගනු ලබන ආකාරයට ම හා අය කර ගනු ලබන ප්‍රමාණයට ම, ආදායම් බද්ද අය කර ගනු ලැබිය යුතු ය:

එසේ වුව ද, මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවල කිසිවක්, ඒ තැනැත්තා කෙළින් ම ඔහුගේ නමින් තක්සේරු කරනු ලැබීම වළක්වන්නක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

මියගිය තැනැත්තකු විසින් ගෙවිය යුතු බදු ගෙවීමට පොල්මඃ කරුවකු යටත් වන බව.

62. මියගිය තැනැත්තා ජීවත් ව සිටියේ නම්, මේ පනත යටතේ කිරීමට ඔහු යටත් වන සියලු ක්‍රියා, කරුණු හා දේවල් කිරීමට ඒ මියගිය තැනැත්තාගේ පොල්මඃකරු යටත් විය යුතු අතර මියගිය තැනැත්තා මියගිය දිනයට පෙර වූ සියලු කාලසීමාවන් සම්බන්ධයෙන්, ඔහු ජීවත්ව සිටියේ නම් ඔහුගෙන් අය කර ගනු ලැබිය හැකිව තිබූ ආදායම් බද්ද, ධන බද්ද හෝ තෑගි බද්ද ඒ පොල්මඃකරුගෙන් අයකර ගනු ලැබිය යුතු ය:

එසේ වුව ද—

(i) මියගිය තැනැත්තාගේ යම් ක්‍රියාවක් හෝ පැහැර හැරීමක් සම්බන්ධයෙන්, මේ පනතේ XXIV වන පරිච්ඡේදයේ විධිවිධාන යටතේ පොල්මඃකරුට විරුද්ධව කිසිම නඩු කට යුත්තක් පවරනු නොලැබිය යුතු ය;

(ii) ඒ තැනැත්තා විසින් වංචාවක් කිරීමේ හෝ ඕනෑකමින් ම වැළකීමේ හේතුව නිසා හෝ ඒ තැනැත්තාගේ බුදලයේ පොල්මඃකරු විසින් වැරදි ප්‍රකාශයක් කිරීමේ හේතුව නිසා තක්සේරු කිරීමක් නොකර ඇති හෝ අඩුවෙන් තක්සේරු කිරීමක් කර ඇති හෝ අවස්ථාවක දී හැර, ඒ තැනැත්තාගේ බුදලය සම්බන්ධයෙන් අවස්ථාවෝචිත පරිදි, අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය හෝ ප්‍රොබේට් බලපත්‍රය පොල්මඃකරු වෙත නිකුත් කරන ලද තක්සේරු වර්ෂයට පසුව එළඹෙන තුන්වන තක්සේරු වර්ෂය ඉකුත් වීමෙන් පසුව, ඒ තැනැත්තා මියගිය දිනයට පෙරාතුව වූ කාලසීමාවක් සම්බන්ධයෙන් කිසිම තක්සේරු කිරීමක්

හෝ අතිරේක තක්සේරු කිරීමක් හෝ නොකළ යුතු නමුත් ඒ තැනැත්තා විසින් වංචාවක් කිරීමේ හෝ ඕනෑකමින් ම වැළකීමේ හේතුව නිසා හෝ ඒ තැනැත්තාගේ පොල්මෑ කරු විසින් වැරදි ප්‍රකාශයක් කිරීමේ හේතුව නිසා, තක්සේරු කිරීමක් නොකර ඇති හෝ අඩුවෙන් තක්සේරු කිරීමක් කර ඇති අවස්ථාවක දී, ඉහත කී තුන්වන තක්සේරු වර්ෂය ඉකුත් වීමෙන් පසුව ඕනෑම වේලාවක දී තක්සේරු කිරීමක් හෝ අතිරේක තක්සේරු කිරීමක් කරනු ලැබිය හැකි ය; තව ද

(iii) මේ වගන්තිය යටතේ පොල්මෑකරුවකුගේ බැඳීම—

(අ) මියගිය තැනැත්තාට මේ වගන්තිය යටතේ බද්ද ගෙවීමට බැඳීමක් ඇති වන බවට දැන්වීමක් කරන ලද දිනයේ දී ඔහුගේ සන්තකයේ හෝ පාලනය යටතේ තිබුණු ඔහුගේ බූදලයේ; සහ

(ආ) උරුමක්කාරයකුට හෝ ඒ බූදලය පිළිබඳ යම් සම් බන්ධතාවක් ඇති වෙනත් තැනැත්තකුට අයත් වී තිබිය හැකි, ඒ බූදලයේ යම් කොටසක

එකතුවට සීමා විය යුතු ය.

පොල්මෑ කරුවන් විසින් සැපයිය යුතු වාර්තා හා පොල්මෑ කරුවන් හා අර්ථලාභීන් බද්ද අය කරගනු ලැබීමට යටත් බව.

63. (1) දැන්වීමේ සඳහන් කාලසීමාව ඇතුළත—

(අ) ආදායම් බද්ද පිළිබඳ කාර්ය සඳහා මිය ගිය තැනැත්තකුගේ පොල්මෑකරු විසින් අද්මිනිස්ත්‍රාසි කරනු ලබන බූදලයෙන් ලැබෙන ආදායමත්, එක් එක් උරුමක්කාරයකුගේ නම හා ලිපිනයත් මියගිය තැනැත්තාගේ බූදලයට සම්බන්ධතාවක් ඇති වෙනත් තැනැත්තකුගේ නම හා ලිපිනයත්, (ඒ උරුමක්කරු හෝ වෙනත් තැනැත්තා මින් මතු "අර්ථලාභී" වශයෙන් මෙහි හඳුන්වනු ලැබේ) ඒ බූදලයට ඔහුට ඇති සම්බන්ධතාවත් සඳහන් වන වාර්තාවක්; සහ

(ආ) ධන බද්ද පිළිබඳ කාර්ය සඳහා පොල්මෑකරු විසින් අද්මිනිස්ත්‍රාසි කරනු ලබන බූදලයෙහි වත්කම් හා බැරකම් පිළිබඳ සහ ඒ බූදලයේ අර්ථලාභීන්ගේ නම් හා ලිපිනයන් ද, ඒ බූදලයට ඔවුන්ට ඇති සම්බන්ධතාව ද දක්වන වාර්තාවක්

තමාට සැපයිය යුතු බවට නියම කරමින් තක්සේරුකරුවකු විසින් මියගිය තැනැත්තාගේ පොල්මෑකරුට ලියවිල්ලකින් දැන්වීමක් කළ හැකි ය.

(2) මියගිය තැනැත්තාගේ බූදලයෙන් අර්ථලාභියකුට ලැබීමට හිමිකම ඇති ආදායමේ හෝ ශුද්ධ ධනයේ කොටස සම්බන්ධයෙන් ආදායම් බද්ද හෝ ධන බද්ද (4) වන උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව, ඒ අර්ථලාභියාගෙන් අය කර ගනු ලැබිය යුතු ය.

(3) මියගිය තැනැත්තකුගේ බූදලයෙන් අර්ථලාභියකුට ලැබීමට හිමිකම ඇති ආදායමේ හෝ ශුද්ධ ධනයේ කොටස සම්බන්ධයෙන් ඒ අර්ථලාභියාගෙන් යම් තක්සේරු වර්ෂයක් සඳහා, (2) වන උප වගන්තිය යටතේ, ආදායම් බද්දක් හෝ ධන බද්දක් අය කර ගනු ලබන අවස්ථාවක දී, කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලැබිය හැකි ආකෘතිය අනුව වූ ද ඒ ආදායමේ හෝ ශුද්ධ ධනයේ

ප්‍රමාණය සඳහන් කර ඇත්තා වූ ද දැන්වීමක් ඒ බූදලයේ පොල්මෑකරු විසින් ඒ තක්සේරු වර්ෂයේ ජූලි, ඔක්තෝබර් සහ ජනවාරි මාසවල තිස් වන දින හෝ ඊට පෙර සහ ඊළඟම තක්සේරු වර්ෂයේ අප්‍රේල් මස තිස්වන දින හෝ ඊට පෙර අර්ථලාභියාට දිය යුතු අතර, සඳහන් කරන ලෙස ඒ ආකෘතියේ නියම කර ඇති විස්තර ඒ දැන්වීමෙහි ඇතුළත් විය යුතු ය.

(4) මිය ගිය තැනැත්තකුගේ බූදලයෙන් අර්ථලාභියකුට ලැබීමට හිමිකම ඇති ආදායම හෝ ශුද්ධ ධනය හෝ නිශ්චය වශයෙන් දැන ගත නොහැකි අවස්ථාවක දී ඒ ආදායම හෝ ශුද්ධ ධනය හෝ සම්බන්ධයෙන් පොල්මෑකරුගෙන් ආදායම් බද්ද හෝ ධන බද්ද අය කර ගනු ලැබිය යුතු ය.

(5) යම් තක්සේරු වර්ෂයක් සඳහා මේ පනත යටතේ පොල්මෑ කරුවකුගෙන් අය කරගත යුතු ආදායම් බද්ද සහ ධන බද්ද, ඔහු පිළිබඳව තක්සේරුවක් කරනු ලැබ නොමැති වුව ද, ඔහු විසින් 97 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ගෙවිය යුතු ය.

භවුල් භාර කරුවෝ සහ පොල්මෑ කරුවෝ.

64. භාරයක භාරකරුවන්ගේ තත්ත්වයෙන් හෝ මියගිය තැනැත්තකුගේ බූදලයක පොල්මෑකරුවන්ගේ තත්ත්වයෙන් හෝ දෙදෙනකු හෝ ඊට වැඩි දෙනකු ක්‍රියා කරන අවස්ථාවක, ඒ භාරකරුවන්ගේ හෝ පොල්මෑකරුවන්ගේ තත්ත්වයෙන් ඔවුන්ගෙන් මේ පනත යටතේ අය කරනු ලැබිය යුතු ආදායම් බද්ද, ධන බද්ද හෝ ත්‍යාග බද්ද හවුලේ හෝ වෙන් වෙන් වශයෙන් හෝ ඔවුන්ගෙන් අයකරගනු ලැබිය යුතු අතර ඒ බදු ගෙවීමට ඔවුන් හවුලේ සහ වෙන් වෙන් වශයෙන් යටත් විය යුතු ය.

ඇ. හවුල් ව්‍යාපාර

හවුල් ව්‍යාපාරයක ආදායම තක්සේරු කිරීම.

65. (1) දෙදෙනකු විසින් හෝ ඊට වැඩි දෙනකු විසින් හෝ හවුල් ව්‍යාපාරයක් වශයෙන් වෙළෙඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් කර ගෙන යනු ලබන අවස්ථාවක, පහත දැක්වෙන උපවගන්තිවල විධිවිධාන අදාළ විය යුතු ය.

(2) යම් හවුල් ව්‍යාපාරයක යම් තක්සේරු වර්ෂයක් සඳහා බෙදිය හැකි ලාභය හෝ අලාභය, ඒ හවුල් ව්‍යාපාරය විසින් ඒ තක්සේරු වර්ෂය තුළ කර ගෙන ගිය යම් වෙළෙඳාමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින් හෝ රක්ෂාවකින් ලැබුණු සහ යම් තැනැත්තකුගේ ලාභ සහ ආදායම නිශ්චය කර ගැනීම සම්බන්ධයෙන් අදාළ වන, මේ පනතේ විධිවිධානවලට අනුකූලව නිශ්චය කර ගනු ලැබූ, ඒ හවුල් ව්‍යාපාරයේ මුළු ලාභයට, හවුල් ව්‍යාපාරය විසින් ගෙවිය යුතු යම් පොලියක, වාර්ෂිකයක, බිම් කුලියක හෝ නිෂ්පාදන භාගයක ප්‍රමාණය අඩු කිරීමෙන් පසු හෝ ඒ හවුල් ව්‍යාපාරයේ මුළු අලාභයට, හවුල් ව්‍යාපාරය විසින් ගෙවිය යුතු යම් පොලියක, වාර්ෂිකයක, බිම් කුලියක හෝ නිෂ්පාදන භාගයක ප්‍රමාණය එකතු කිරීමෙන් පසු (එය ශ්‍රී ලංකාවෙන් පිටත යම්

තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත යම් තැනැත්තකු වෙත ගෙවිය යුතු අවස්ථාවක දී හැර) ඒ හවුල් ව්‍යාපාරයේ ලාභය හෝ අලාභය විය යුතු ය:

එසේ වුවද, හවුල් ව්‍යාපාරයේ ලාභ හෝ අලාභ නිශ්චය කර ගැනීමේ දී, හවුල්කරුවන්ගේ වැටුප් හෝ වෙනත් පාරිශ්‍රමික සඳහා හෝ හවුල්කරුවන්ගේ ප්‍රාග්ධනය වෙනුවෙන් වූ පොලිය සඳහා හෝ කිසිම අඩු කිරීමක් නොකළ යුතු නමුත් බෙදිය හැකි ලාභය හෝ අලාභය හවුල්කරුවන් අතර බෙදීමේ දී එකී වැටුප්, පාරිශ්‍රමික සහ පොලී සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

(3) දැන්වීමෙහි සඳහන් කාලය ඇතුළත පහත සඳහන් විස්තර දැක්වෙන වාර්තාවක් සපයන ලෙස නියම කරමින් තක්සේරුකරු වකු විසින් දැන්වීමක් හවුල් ව්‍යාපාරයක ප්‍රමුඛ හවුල්කරුට දෙනු ලැබිය හැකි ය:—

(අ) ඒ හවුල් ව්‍යාපාරය විසින් යම් තක්සේරු වර්ෂයක් තුළ කර ගෙන ගිය යම් වෙළඳාමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින් හෝ රක්ෂාවකින් ලැබුණ සහ යම් තැනැත්තකුගේ ලාභ හා ආදායම නිශ්චය කර ගැනීම සම්බන්ධයෙන් අදාළ වන, මේ පනතේ විධිවිධානවලට අනුකූලව නිශ්චය කර ගනු ලැබූ, ඒ හවුල් ව්‍යාපාරයේ ලාභය හෝ අලාභය සහ ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ වෙළෙඳාම, ව්‍යාපාරය, වෘත්තිය හෝ රක්ෂාව සම්බන්ධයෙන් ඒ හවුල් ව්‍යාපාරය විසින් ගෙවිය යුතු වූ යම් පොලියක්, වාර්ෂිකයක්, බිම් කුලියක් හෝ නිෂ්පාදන භාගයක්;

(ආ) ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ හවුල් ව්‍යාපාරයේ වෙනත් යම් ආදායමක්; සහ

(ඇ) සියලුම හවුල්කරුවන්ගේ නම් හා ලිපින සහ හවුල්කරුවන්ගේ යම් වැටුප් හෝ වෙනත් පාරිශ්‍රමික ද හවුල්කරුවන්ගේ ප්‍රාග්ධනය වෙනුවෙන් වූ පොලිය ද සැලකිල්ලට ගෙන, බෙදිය හැකි ලාභ හෝ අලාභ සහ වෙනත් ආදායම්, ඒ ලාභ හෝ අලාභ සහ වෙනත් ආදායම් ඇති වූ කාලය ඇතුළත හවුල්කරුවන්ගේ හවුල් ව්‍යාපාරයේ කොටස් අනුව හවුල්කරුවන් අතර බෙදා දුන් පිළිවෙළ.

කිසිම සක්‍රිය හවුල්කරුවකු ශ්‍රී ලංකාවේ වාසිකව නොසිටින්නා අවස්ථාවක, ඒ හවුල් ව්‍යාපාරයේ ශ්‍රී ලංකාවේ අනුයෝජිතයා විසින් ඒ වාර්තාව සැපයිය යුතු ය.

(4) කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලබන ආකෘතියක වූ සහ එක් එක් හවුල්කරුවාගේ යම් වැටුප් හෝ වෙනත් පාරිශ්‍රමික ද එක් එක් හවුල්කරුවාගේ ප්‍රාග්ධනය වෙනුවෙන් වූ පොලියක් ද සැලකිල්ලට ගෙන, යම් තක්සේරු වර්ෂයක් සඳහා හවුල් ව්‍යාපාරයේ බෙදිය හැකි ලාභයේ හෝ අලාභයේ හෝ සහ වෙනත් ආදායමේ ඒ එක් එක් හවුල්කරුවාගේ කොටස දැක්වෙන දැන්වීමක්, ඒ තක්සේරු වර්ෂයේ ජූලි, ඔක්තෝබර් සහ ජනවාරි මාසවල තිස් වන දින හෝ ඊට පෙර සහ ඵලඟම තක්සේරු වර්ෂයේ සැප්තැම්බර් මස තිස් වන දින හෝ ඊට පෙර හවුල් ව්‍යාපාරයේ ප්‍රමුඛ හවුල්කරු විසින් හෝ සක්‍රිය හවුල්කරුවකු ශ්‍රී ලංකාවේ

වාසිකව නොසිටින අවස්ථාවක, ඒ හවුල් ව්‍යාපාරයේ ශ්‍රී ලංකාවේ අනුයෝජිතයා විසින් හෝ ඒ හවුල් ව්‍යාපාරයේ ඒ එක් එක් හවුල්කරුට ඒ තක්සේරු වර්ෂය සඳහා දිය යුතු ය:

එසේ වුවද, ඒ හවුල් ව්‍යාපාරයේ ප්‍රමුඛ හවුල්කරු විසින් ඒ හවුල් ව්‍යාපාරයේ යම් හවුල්කරුවකුට මේ උපවගන්තිය යටතේ දැන්වීමක් නොදීමේ හේතුව නිසා, මේ පනතේ විධිවිධාන අනුව වූ හෝ ඒ යටතේ වූ හෝ ඒ හවුල්කරුවාගේ යම් බැඳීමක් හෝ ඒ විධිවිධාන අනුව හෝ ඒ යටතේ හෝ ඔහු වෙත පැවරී ඇති කාර්යයක් කෙරෙහි හෝ බලපෑමක් ඇති නොවිය යුතු ය.

(5) හවුල් ව්‍යාපාරයකින් යම් හවුල්කරුවකුට ලැබුණු ආදායම, හවුල් ව්‍යාපාරයේ බෙදිය හැකි ලාභයේ ඔහුගේ කොටස ඔහු විසින් කරගෙන ගිය යම් වෙළෙඳාමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින් හෝ රක්ෂාවකින් ලැබුනු ලාභය ලෙස සලකා සහ වෙනත් ආදායමේ ඔහුගේ කොටස ඔහුට තනිව උපචිත ආදායමක් ලෙස සලකා 25 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ආගණනය කරනු ලැබිය යුතු අතර බෙදිය හැකි අලාභයේ යම් හවුල්කරුවකුගේ කොටස 29 වන වගන්තියේ අර්ථානුකූලව ඔහුට සිදු වූ අලාභයක් ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද (3) වන උපවගන්තියෙන් නියම කර ඇති පරිදි වාර්තාවක් සපයා නොමැති හෝ ඒ උපවගන්තිය යටතේ සැපයූ වාර්තාවක් පිළිගෙන නොමැති අවස්ථාවක, තක්සේරුකරුවකු විසින් ඔහුගේ උපරිම නිගමනය අනුව, යම් හවුල්කරුවකුගේ හවුල් ව්‍යාපාරයේ ව්‍යවස්ථාපිත ආදායම හෝ හවුල් ව්‍යාපාරයේ බෙදිය හැකි අලාභයේ යම් හවුල්කරුවකුගේ කොටස හෝ ඇස්තමේන්තු කරනු ලැබිය හැකි ය:

එසේම තවදුරටත්, හවුල් ව්‍යාපාරයේ බෙදිය හැකි ලාභය සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් හෝ හවුල්කරුවකු විසින් නතු කොටගෙන ඇතිබව තක්සේරුකරුගේ මතය වන අවස්ථාවක, ඒ හවුල්කරු විසින් නතු කොට ගෙන ඇති ප්‍රමාණය හවුල් ව්‍යාපාරයේ බෙදිය හැකි ලාභයේ ඒ හවුල්කරුගේ කොටසට තක්සේරුකරු විසින් ඇතුළත් කරනු ලැබිය හැකි අතර ඒ හවුල්කරුගේ ව්‍යවස්ථාපිත ආදායම ඒ අනුව ආගණනය කරනු ලැබිය යුතු ය.

(6) යම් නිර්වාසික හවුල්කරුවකුගේ හෝ හවුල්කරුවන්ගේ හවුල් ව්‍යාපාරයේ ආදායම හවුල් ව්‍යාපාරයේ නාමයෙන් හෝ යම් වාසික හවුල්කරුවකුගේ නාමයෙන් හෝ නිර්වාසික හවුල්කරුගේ හෝ හවුල් ව්‍යාපාරයේ ශ්‍රී ලංකාවේ අනුයෝජිතයකුගේ නාමයෙන් හෝ තක්සේරු කරනු ලැබිය යුතු අතර, තක්සේරුව මත අය කරනු ලබන ආදායම් බද්ද හවුල් ව්‍යාපාරයේ වත්කම්වලින් හෝ එහි යම් හවුල්කරුවකුගෙන් හෝ එවැනි යම් අනුයෝජිතයකුගෙන් හෝ XXI වන පරිච්ඡේදයේ විධිවිධානවල සලස්වා ඇති ආකාරයෙන් ලබා ගත යුතු ය.

ඇතැම් අවස්ථාවල දී හවුල් ව්‍යාපාරයේ නාමයෙන් තක්සේරු වක් කළ යුතු බව.

66. (1) 65 වන වගන්තියේ (3) වන උපවගන්තියට අනුකූලව මාර්තාවක් සපයා නොමැති හෝ ලාභවල ප්‍රමාණය සම්බන්ධයෙන් හෝ ආදායමේ ප්‍රමාණය සම්බන්ධයෙන් හෝ හවුල්කරුවන් අතර ඒ ලාභ හෝ ආදායම බෙදා දීම සම්බන්ධයෙන් එකඟ විය නොහැකි හෙයින් තක්සේරුකරු විසින් මාර්තාව පිළිගෙන නොමැති අවස්ථාවක, යම් තැනැත්තකුගේ තක්සේරු කළ හැකි ආදායම නිශ්චය කිරීම සම්බන්ධයෙන් අදාළ වන, මේ පනතේ විධිවිධාන වලට අනුකූලව නිශ්චය කරන ලද, හවුල් ව්‍යාපාරයේ ලාභවල හා ආදායමෙහි ඇස්තමේන්තු ප්‍රමාණය මත හවුල් ව්‍යාපාරයේ නාමයෙන් තක්සේරුවක් කිරීම නිත්‍යනුකූල විය යුතු අතර ඒ තක්සේරුව අනුව වූ ආදායම් බදු, මේ පනතේ තුන්වන උපලේඛනයේ තත් කාර්ය සඳහා දක්වා ඇති අනුප්‍රමාණය හෝ අනුප්‍රමාණයන් අනුව අය කරනු ලැබිය යුතු අතර ඒ ආදායම් බදු හවුල් ව්‍යාපාරයේ වත්කම්වලින් හෝ යම් හවුල්කරුවකුගෙන් හෝ හවුල් ව්‍යාපාරයේ යම් අනුයෝජිතයකුගෙන් හෝ ලබාගත යුතු ය. එකී තක්සේරුවෙන් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් XVIII වන පරිච්ඡේදයේ විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන් ඊට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකිය. එවැනි අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබූ විට, අවස්ථෝචිත පරිදි, කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ සමීක්ෂණ මණ්ඩලය විසින් හෝ හවුල් ව්‍යාපාරයේ බෙදිය හැකි ලාභ හා වෙනත් ආදායම් නිශ්චය කරනු ලැබිය හැකි අතර එය හවුල්කරුවන් අතර බෙදා දෙනු ලැබිය හැකි ය. තව ද 65 වන වගන්තියේ (5) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව හවුල් ව්‍යාපාරයෙන් එක් එක් හවුල්කරුගේ ව්‍යවස්ථාපිත ආදායම ද, ඒ වෙනුවෙන් ගෙවිය යුතු ආදායම් බද්ද ද කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ සමීක්ෂණ මණ්ඩලය විසින් හෝ ආගණනය කරනු ලැබිය හැකි ය. අඵත් තක්සේරුවක් නොකර; අභියාචනයට විෂයය වූ තක්සේරුව අනුව වූ බද්දක් ලෙස ඒ ආදායම් බද්ද ලබා ගත හැකි ය.

(2) හවුල් ව්‍යාපාරයක නාමයෙන් (1) වන උපවගන්තිය යටතේ තක්සේරුවක් කරනු ලැබීමෙන් පසු හෝ හවුල්කරුවකු විශ්‍රාම ගැනීමෙන් හෝ මිය යාමෙන් හෝ හවුල්කරුවන් එක් කෙනකු හෝ වැඩි දෙනකු සම්බන්ධයෙන් හවුල් ව්‍යාපාරය විසුරුවා හැරීමෙන් හෝ අලුත් හවුල්කරුවකු ඇතුළත් කර ගැනීමෙන් හෝ ඒ හවුල් ව්‍යාපාරයෙහි වෙනසක් ඇති වූ සහ ඒ වෙනස නිසා, ඒ තක්සේරුවට පෙර ඒ හවුල් ව්‍යාපාරයේ වත්කම්වල හවුල් අයිතිකරුවන් වූ තැනැත්තන් අතුරෙන් එක් කෙනකු හෝ ඊට වැඩි දෙනකු, ඒ වත්කම්වල අයිතිකරු ලෙස හෝ හවුල් අයිතිකරුවන් ලෙස දිගට ම සිටින අවස්ථාවක, ඒ වෙනස හේතු කොට ගෙන, වත්කම්වල අයිතිකරු වන තැනැත්තාගෙන් හෝ හවුල් ව්‍යාපාරයෙහි ඒ තක්සේරුව අනුව වූ ආදායම් බදු හෝ නොගෙවා තිබෙන ආදායම් බදු කොටස හෝ අය කර ගනු ලැබිය යුතු අතර ඒ අනුව, XXI වන පරිච්ඡේදයේ විධිවිධාන ඒ තැනැත්තාට හෝ හවුල් ව්‍යාපාරයට අදාළ විය යුතු ය.

ඇ. වාසිකභාවය

වාසිකභාවය යන්නෙන් අදහස් වන්නේ කුමක් ද යන්න

67. (1) සමාගමක හෝ පුද්ගල මණ්ඩලයක ලියාපදිංචි කාර්යාලය හෝ ප්‍රධාන කාර්යාලය ශ්‍රී ලංකාවෙහි පිහිටි අවස්ථාවක හෝ එහි ව්‍යාපාර කටයුතු පාලනය කිරීම හා කළමනාකරණය කිරීම ශ්‍රී ලංකාව තුළ කරනු ලබන අවස්ථාවක, ඒ සමාගම හෝ පුද්ගල මණ්ඩලය මේ පනතේ කාර්යයන් සඳහා, ශ්‍රී ලංකාව තුළ වාසික ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) යම් පුද්ගලයකු ශ්‍රී ලංකාවට පැමිණි සහ තමා එසේ පැමිණි දිනයෙන් ආරම්භ වූ වර්ෂය ඇතුළත හය මාසයකට වැඩි කාල සීමා වක් හෝ සමස්තයක් ලෙස ගත් කල හය මාසයකට වැඩි වන කාල සීමා කිහිපයක් ශ්‍රී ලංකාව තුළ සිටි පුද්ගලයකු, ඒ වර්ෂය අවසානයේ දී ඔහු ශ්‍රී ලංකාව තුළ සිටියේ නම්, ඒ වර්ෂය මුළුල්ලේ ම වාසික වූ ලෙස සලකනු ලැබිය යුතු ය; එහෙත් ඒ වර්ෂය අවසානයේ දී ඔහු ශ්‍රී ලංකාවේ නොසිටියේ නම්, ඔහු පැමිණි දිනයෙහි සිට, ඒ වර්ෂය ඇතුළත ඔහු අන්තිමට බැහැරට ගිය දිනය දක්වා ඔහු වාසික වූ ලෙස සැලකිය යුතු ය. තව ද අනුප්‍රාප්තික උපවගන්තිවල විධිවිධාන වලට යටත්ව, එසේ අන්තිමට බැහැරව ගිය දිනයෙහි සිට ඒ වර්ෂය අවසානය දක්වා ඔහු නිර්වාසික වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) අනුක්‍රමික මාස විසිහතරක කාලසීමාවක් මුළුල්ලේ වාසිකව සිටි ලෙස මේ වගන්තියේ විධිවිධාන යටතේ හෝ 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 54 වන වගන්තිය යටතේ හෝ සලකනු ලැබූ යම් පුද්ගලයකු, දොළොස් මාසයක අඛණ්ඩ කාල සීමාවක් ඔහු ශ්‍රී ලංකාවෙන් දිගට ම බැහැරව සිටි අවස්ථාව වන තෙක්, වාසික වූ ලෙස සලකනු ලැබිය යුතු ය. ඒ තැනැත්තා එසේ බැහැරව සිටි විට, එසේ බැහැරව සිටීම ආරම්භ වූ දිනයෙහි සිට ඔහු නිර්වාසික වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) ඉහත දැක්වුණු උපවගන්ති අතුරින් යම් උපවගන්තියක විධිවිධානවලට අනුකූලව යම් පුද්ගලයකු යම් කාලසීමාවක් සඳහා වාසික වූ ලෙස සලකනු ලබන සහ ඒ කාලසීමාව අවසානයේ දී, තුන් මසකට අඩු කාලයක් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටි අවස්ථාවක ඔහු එසේ බැහැර ව සිටි කාලසීමාව ශ්‍රී ලංකාව තුළ ගත කළ කාල සීමාවක් ලෙස මේ වගන්තියේ සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(5) ශ්‍රී ලංකාවේ ආණ්ඩුවේ සේවයේ නියුක්ත වූ ද, ඒ සේවා නියුක්තිය පිළිබඳ කාර්ය සඳහා යම් කාලසීමාවක් තුළ වෙනත් යම් රටක වාසික වූ ද පුද්ගලයකු සහ ඒ පුද්ගලයාගේ ස්වාමිපුරුෂයා/භාර්යාව, ඒ කාලසීමාව වෙනුවෙන් ඔහුට ගෙවිය යුතු නිල පඩි නඩි සම්බන්ධයෙන් ඒ රටෙහි ආදායම් බද්දක් හෝ ඊට සමාන සුභාවයක වූ වෙනත් බදු ඔහු විසින් නොගෙවිය යුතු නම්, ඒ කාලසීමාව ඇතුළත ශ්‍රී ලංකාවෙහි වාසික වූ ලෙස මේ පනතෙහි කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද, ශ්‍රී ලංකාව නොවන වෙනත් යම් රටක පුරවැසියකු වූ හෝ යටත් වැසියකු වූ එවැනි යම් පුද්ගලයකුගේ නිල පඩි නඩි හෝ ශ්‍රී ලංකාව තුළ උද්ගත වූ හෝ ශ්‍රී ලංකාවෙන් ව්‍යුත්පන්න වූ වෙනත් ආදායම් හෝ නොවන, යම් ආදායමක් සම්බන්ධයෙන්,

වාසිකයකු ලෙස ආදායම් බද්ද ගෙවීමට ඔහු එසේ ශ්‍රී ලංකාව තුළ වාසික වූ ලෙස සලකනු ලැබීමේ හේතුව නිසා ඔහු යටත් නොවිය යුතු ය.

(6) 1971 අංක 52 දරන වෙළෙඳ නාවී පනතේ අර්ථානුකූලව වූ ලංකාවේ නැවක සේවයේ නියුක්ත කරනු ලැබ සිටින පුද්ගලයෙක්, ඔහු එසේ සේවයේ නියුක්ත කරනු ලැබ සිටින කාල සීමාව තුළ ශ්‍රී ලංකාවේ වාසික වූ ලෙස, මේ පනතේ කාර්ය සඳහා, සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද, එවැනි යම් පුද්ගලයකු ශ්‍රී ලංකාව නොවන, වෙනත් යම් රටක පුරවැසියකු වූ හෝ යටත් වැසියකු වූ හෝ අවස්ථාවක, ඔහු ඒ නැවේ සේවා නියුක්තියෙන් ලබන ආදායම් නොවන යම් ආදායමක් සම්බන්ධයෙන්, වාසිකයකු ලෙස ආදායම් බදු ගෙවීමට, ඔහු එසේ ශ්‍රී ලංකාවේ වාසිකයකු වශයෙන් සලකනු ලැබීමේ හේතුව නිසා, ඔහු යටත් නොවිය යුතු ය.

ඉ. නිර්වාසික තැනැත්තන්ගේ බැදීම්

නිර්වාසික තැනැත්තකු වෙනුවෙන් නක්සේරු කරනු ලැබිය හැකි තැනැත්තෝ.

68. ශ්‍රී ලංකාව තුළ ඇතිවන හෝ ශ්‍රී ලංකාවෙන් ලැබෙන නිර්වාසික තැනැත්තකුගේ සියලු ලාභ හා ආදායම් සම්බන්ධයෙන්, ඒ නිර්වාසික තැනැත්තා කෙළින් ම හෝ ඔහුගේ අනුයෝජිතයා ඒ ලාභ හෝ ආදායම ලැබුව ද, නොලැබුව ද, ඒ අනුයෝජිතයාගේ නාමයෙන් හෝ නක්සේරු කරනු ලැබිය යුතු අතර එසේ කෙළින් ම හෝ අනුයෝජිතයාගේ නාමයෙන් නක්සේරු කරනු ලැබූ ආදායම් බද්ද නිර්වාසික තැනැත්තාගේ වත්කමෙන් හෝ අනුයෝජිතයා ගෙන් හෝ මේ පනතේ විධිවිධාන සලස්වනු ලැබූ ආකාරයෙන් ලබා ගත යුතු ය. අනුයෝජිතයන් එක් කෙනකුට වැඩි ගණනක් සිටින් නම්, නිර්වාසික තැනැත්තාගේ ලාභ සහ ආදායම් සම්බන්ධයෙන් ඔවුන් එක්ව හෝ වෙන් වෙන් වශයෙන් නක්සේරු කරනු ලැබිය හැකි අතර ඒ නක්සේරුව අනුව, ආදායම් බද්දට ඔවුන් එක්ව හා වෙන් වෙන් වශයෙන් යටත් විය යුතු ය.

ඇතැම් නිර්වාසික තැනැත්තන්ගේ බැදීම්.

69. (1) මේ වගන්තියේ කාර්ය සඳහා—

(අ) එක් තැනැත්තකු සහ සෙසු තැනැත්තකු අතර සැලකිය යුතු තරම් අනන්‍යතාවක් තිබෙන බවට හෝ ඒ එක් එක් තැනැත්තකුගේ පරම පාලක සම්බන්ධතාව ඒ එක් එක් තැනැත්තකුට හෝ ඒ තැනැත්තන්ට අයත් බවට හෝ මේ වගන්තිය යටතේ අයත් ලෙස සැලකෙන බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්ව සිටින අවස්ථාවක ඒ එක් එක් තැනැත්තාට සෙසු තැනැත්තා සමඟ කිට්ටු සම්බන්ධයක් ඇත්තේ ය;

(ආ) සමාගමක පාලක සම්බන්ධතාව, කෙළින්ම හෝ නාමිකයන්ගේ මාර්ගයෙන් ඒ සමාගමේ කොටස් සහ, ඒවායේ අර්ථලාභී හිමිකරුවන්ට අයත් ලෙස සලකනු ලැබිය යුතු ය. තව ද එක් සමාගමක කොටස්, වෙනත් සමාගමක් විසින් හෝ වෙනත් සමාගමක් වෙනුවෙන්

දරනු ලබන අවස්ථාවක, ඒ කොටස් ඒ වෙනත් සමාගමේ කොටස් හිමියන් විසින් දරනු ලබන ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) තමා සමඟ කිට්ටු සම්බන්ධයක් ඇති වාසික තැනැත්තකු සමඟ නිර්වාසික තැනැත්තකු ව්‍යාපාරයක් කර ගෙන යන්නා වූ ද, වාසික වූ තැනැත්තාට ව්‍යාපාරයෙන් කිසිම ලාභයක් නොලැබෙන පරිදි හෝ ඒ ව්‍යාපාරයෙන් උද්ගත වේ යයි බලාපොරොත්තු විය හැකි සාමාන්‍ය ලාභවලට අඩුවෙන් ලාභ ලැබෙන පරිදි හෝ ඒ ව්‍යාපාරයේ ක්‍රියා පටිපාටිය සකස් කොට ඇත්තා වූ ද අවස්ථාවක, වාසික තැනැත්තා සමඟ ඇති තම සම්බන්ධය අනුව නිර්වාසික තැනැත්තා විසින් කර ගෙන යනු ලබන ව්‍යාපාරය ශ්‍රී ලංකාව තුළ කරගෙන යනු ලබන ව්‍යාපාරයක් ලෙස සලකනු ලැබිය යුතු ය. තව ද වාසික තැනැත්තා ඒ නිර්වාසික තැනැත්තාගේ අනුයෝජිතයා වූවාක් මෙන් ඒ නිර්වාසික තැනැත්තා තක්සේරු කරනු ලැබිය යුතු අතර වාසික තැනැත්තාගේ නාමයෙන් ලැබෙන ඒ ව්‍යාපාරයේ ලාභ සම්බන්ධයෙන් ඒ නිර්වාසික තැනැත්තාගේ ආදායම් බද්ද අය කරනු ලැබිය යුතු ය. තව ද මේ පනතේ සියලු විධිවිධාන ඒ අනුව අදාළ විය යුතු ය.

(3) ශ්‍රී ලංකාවෙන් පිට සාදනු ලැබූ හෝ නිපදවනු ලැබූ භාණ්ඩ හෝ නිෂ්පාදන, නිර්වාසික තැනැත්තකු විසින් හෝ ඔහුට කිට්ටු සම්බන්ධයක් ඇති තැනැත්තකු හෝ තැනැත්තන් විසින් හෝ විකිණීමෙන්, උද්ගත වන ලාභ සම්බන්ධයෙන් ආදායම් බද්ද අය කරනු ලැබිය යුතු වූ අවස්ථාවක, ඒ භාණ්ඩ හෝ නිෂ්පාදන හෝ විකිණීමෙන්, මේ පනතේ කාර්ය සඳහා, ඒ නිර්වාසික තැනැත්තාට ලැබෙන ලාභ වෙළෙන්දකුට ලැබේ යයි යුක්ති සහගතව බලාපොරොත්තු විය හැකි ලාභවලට නොඅඩු ලාභ ලෙස සලකනු ලැබිය යුතු අතර තමාගේ සම්බන්ධයක් නොමැති, සෘදු තැනැත්තාගෙන් හෝ නිෂ්පාදකයාගෙන් කෙළින් ම ඒ භාණ්ඩ හෝ නිෂ්පාදන ලබා ගත් නිර්වාසික තැනැත්තා විසින් හෝ ඔහු වෙනුවෙන් භාණ්ඩ හෝ නිෂ්පාදන සිල්ලරට විකුණනු ලැබූ අවස්ථාවක, භාණ්ඩ හෝ නිපදවන ලද ද්‍රව්‍ය තමාගේ සම්බන්ධයක් නොමැති, සෘදු තැනැත්තා ගෙන් හෝ නිෂ්පාදකයාගෙන් කෙළින් ම ඒ භාණ්ඩ හෝ නිෂ්පාදන ලබාගත්, සිල්ලරට විකුණන්නකුට යුක්ති සහගතව බලාපොරොත්තු විය හැකි ලාභවලට නොඅඩු ලාභ ලෙස සලකනු ලැබිය යුතු ය.

ඒ භාණ්ඩ හෝ නිෂ්පාදන වෙනුවෙන් රේගු ආඥාපනත යටතේ වටිනාකම අනුව ගෙවනු ලැබූ ආනයන ශාස්තු ශ්‍රී ලංකාවේ දී ගෙවනු ලැබූ අවස්ථාවක, ඒ භාණ්ඩ හෝ නිෂ්පාදන ශ්‍රී ලංකාවට ගෙන ආ විට, එහි වියදම් වශයෙන් අඩු කළ යුතු මුදල්, ශ්‍රී ලංකාව තුළ උද්ගත වන ලාභ ආගණනය කිරීමේ කාර්යය සඳහා ඒ ආනයන ශාස්තු එසේ ගෙවනු ලැබුවේ යම් වටිනාකමක් මත ද, ඒ වටිනාකමට වැඩි නොවිය යුතු ය.

ඇතැම් ව්‍යාපාරවල ලාභ, පිරිවැටුමේ ප්‍රතිශතය මත ආගණනය කළ යුතු බව.

70. නිර්වාසික තැනැත්තකුට වෙළෙඳාමකින් හෝ ව්‍යාපාරයකින්, ශ්‍රී ලංකාව තුළ ඇතිවන හෝ ශ්‍රී ලංකාවෙන් ලැබෙන ලාභවල නියම ප්‍රමාණය පහසුවෙන් ම නිශ්චය කළ නොහැකි බව කොමසාරිස් ජනරාල්වරයාගේ මතය වන අවස්ථාවක, ශ්‍රී ලංකාවෙහි ඒ වෙළෙඳාමේ හෝ ව්‍යාපාරයේ පිරිවැටුමේ සාධාරණ ප්‍රතිශතයක් මත ඒ ලාභ ආගණනය කිරීමට කොමසාරිස් ජනරාල්වරයා විසින් තක්සේරුකරුවකුට විධාන කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද ඒ ප්‍රතිශතය, XVIII වන පරිච්ඡේදයේ විධිවිධාන වලට අනුකූල තක්සේරුවකට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන අභියාචනයක දී ප්‍රශ්න කරනු ලැබිය හැකි ය.

අපනයන නිෂ්පාදන විකිණීමෙන් නිර්වාසික තැනැත්තකුට ලැබෙන ලාභ.

71. නිර්වාසික තැනැත්තකු ශ්‍රී ලංකාවෙහි කෘෂිකාර්මික හෝ නිෂ්පාදන කිරීමේ ව්‍යවසායක් හෝ වෙනත් නිෂ්පාදන ව්‍යවසායක් පවත්වාගෙන යන්නා වූ ද ඒ ව්‍යාපාරයේ යම් නිෂ්පාදිතයක් ශ්‍රී ලංකාවෙන් පිටත හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී භාර දීම සඳහා හෝ විකුණනු ලබන්නා වූ ද අවස්ථාවක, ගිවිසුම ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත දී කරනු ලැබුව ද, නොඟ වෙළෙඳ පොළක දී විකිණීමෙන් උද්ගත වන සම්පූර්ණ ලාභය, 2 වන වගන්තියේ අර්ථානුකූලව ශ්‍රී ලංකාව තුළ උද්ගත වූ හෝ ශ්‍රී ලංකාවෙන් ලැබෙන ආදායම ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේ වුවි ද, පැටවීම හා බෑම, කලවම් කිරීම, තේරීම, ඇසුරුම් කිරීම හෝ බැහැර කිරීම නොවන්නා වූ යම් සැකසීමක් ශ්‍රී ලංකාවෙන් පිටත දී නිෂ්පාදනය සම්බන්ධයෙන් කරනු ලැබීම නිසා ලාභය වැඩි වූ බව පෙන්වනු ලැබිණි නම්, ඒ වැඩි ලාභය ශ්‍රී ලංකාව තුළ ඇතිවන හෝ ශ්‍රී ලංකාවෙන් ලැබෙන ආදායමක් ලෙස නොසැලකිය යුතු ය.

එවැනි යම් නිෂ්පාදිතයක් තොග වෙළෙඳ පොළෙහි විකුණනු නොලැබූ හෝ කිසිසේත් ම විකුණනු නොලැබූ හෝ යම් අවස්ථාවක එකී තැනැත්තාට 2 වන වගන්තියේ අර්ථානුකූලව ශ්‍රී ලංකාවෙන් ලාභය ව්‍යුත්පන්න වූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ ලාභය උපරිම වාසි ලැබෙන පරිදි ඒ තැනැත්තා විසින් ඒ නිෂ්පාදිතය තොග වශයෙන් විකුණනු ලැබුවේ නම්, ඉන් ලැබිය හැකි ලාභවලට වඩා අඩු නොවිය යුතු ය.

නිර්වාසික තැනැත්තන්ගේ ඇතැම් ලාභ ආදායම් බද්දට යටත් වීම.

72. වාසික තැනැත්තකු විසින් සේවයේ නියුක්ත කර ගනු ලැබීමෙන් නිර්වාසික තැනැත්තකුට ලැබෙන ලාභ වෙනුවෙන්, ඒ ලාභ ශ්‍රී ලංකාවෙහි දී කරනු ලැබූ සේවාවන්ගෙන් හෝ අතීත සේවාවන්ගෙන් උද්ගත වූ ලාභ වන තාක් ප්‍රමාණයට, ආදායම් බද්ද අය කරනු ලැබිය යුතු ය.

ඇතැම් අවස්ථාවල දී නිවාසික තැනැත්තන්ගේ ආදායම් නිදහස් කිරීම සහ ඇතැම් නිවාසික තැනැත්තන් අඩු කළ අනුප්‍රමාණ අනුව ආදායම් බදු ගෙවීමට යටත් වීම.

73. (1) ශ්‍රී ලංකාව තුළ වාසික නොවන පුද්ගලයකුගේ යම් තක්සේරු වර්ෂයක් සඳහා තක්සේරුකළ හැකි ආදායම, ශ්‍රී ලංකාව තුළ කරනු ලැබූ සේවාවන්ගෙන් ලැබූ හෝ ශ්‍රී ලංකාව තුළ කරන ලද ව්‍යාපාරවලින් ලැබූ ලාභවලින් හෝ ආදායමෙන් පමණක් සමන්විත වූ ද රුපියල් එක් දහසක් නොඉක්මවන්නා වූ ද අවස්ථාවක, ඒ ලාභ හෝ ආදායම වෙනුවෙන් බදු අය කරනු නොලැබිය යුතු ය.

(2) නිවාසික සමාගමකින් ලාභාංශයක් වශයෙන් හෝ 29(2)(අ) වගන්තියේ අතුරු වගන්තිය යටතේ හෝ 65 (2) වන වගන්තිය යටතේ හෝ අවසර දෙනු නොලැබූ හෝ ව්‍යතිරේක කරන ලද හෝ පොලියක්, වාර්ෂිකයක්, බිම් කුලියක් හෝ නිෂ්පාදන භාගයක් වශයෙන් හෝ යම් මුදලක්, (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව නිවාසික තැනැත්තකු විසින් ලබන අවස්ථාවක, ඒ මුදල් ඒ නිවාසික තැනැත්තාගේ ශ්‍රී ලංකාව තුළ උද්ගත වන හෝ ශ්‍රී ලංකාවෙන් ව්‍යුත්පන්න වන ආදායම් වශයෙන් සලකනු නොලැබිය යුතු ය. තව ද ඒ සම්බන්ධයෙන් ඔහුගෙන් ආදායම් බද්දක් අය කරනු නොලැබිය යුතු. අතර ඒ සම්බන්ධයෙන් යම් බද්දක් ආපසු ගෙවීමකට ඔහු හිමිකම් නොලැබිය යුතු ය.

(3) (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, දේශීය භාණ්ඩාගාර බිල් පත්‍ර ආඥාපනත යටතේ නිකුත් කරන ලද යම් භාණ්ඩාගාර බිල් පත්‍රයකින් තමාට උද්ගත වූ ලාභ හෝ ආදායම වශයෙන් නිවාසික තැනැත්තකුට ලැබෙන යම් මුදල් ආදායම් බද්දෙන් නිදහස් විය යුතු ය.

(4) (2) වන හා (3) වන උපවගන්ති අතුරින් යම් උපවගන්තියක සඳහන් යම් මුදලක් ශ්‍රී ලංකාව තුළ කර ගෙන යන යම් වෙළෙඳාමක හෝ ව්‍යාපාරයක ලැබීම්වල කොටසක් ලෙස සමන්විත වන අවස්ථාවක, ඒ වෙළෙඳාමේ හෝ ව්‍යාපාරයේ ලාභ ආගණනය කිරීමේලා ඒ මුදල බැහැර කරන ආකාරයෙන් ඒ උපවගන්ති අතුරෙන් යම් උපවගන්තියක විධිවිධානවල ඇති කිසිවක් ක්‍රියාත්මක නොවිය යුතු ය.

(5) මේ පනතේ වෙනත් යම් විධිවිධානවල කුමක් සඳහන් ව තිබුණ ද, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා පනතේ 17 වන වගන්තිය යටතේ, මහා කොළඹ ආර්ථික කොමිෂන් සභාව සමග එකඟවීමකට ඇතුළත් වූ සමාගමකින් යම් නිවාසික තැනැත්තකුට ලැබුණු නිෂ්පාදන භාගයක් වෙනුවෙන් ඒ තැනැත්තා විසින් ආදායම් බද්ද ගෙවිය යුතු වන අනුප්‍රමාණය, ඒ නිෂ්පාදන භාගය වෙනුවෙන් ආදායම් බදු අඩු කළ යුතු වන අනුප්‍රමාණය ලෙස යම් අනුප්‍රමාණයක් ඒ එකඟවීමේ සඳහන් වේ නම් ඒ අනුප්‍රමාණය නොඉක්මවිය යුතු ය.

ඊ. නැව් කටයුතු සහ ගුවන් යානා කටයුතු

නිවාසික නැව් හිමියන්ගේ හෝ නැව් කුලියට ගන්නන්ගේ ලාභ.

74. (1) නිවාසික තැනැත්තකු විසින් නැව් හිමියකුගේ හෝ නැව් කුලියට ගන්නකුගේ ව්‍යාපාරය කර ගෙන යනු ලබන අවස්ථාවක සහ ඔහුට අයත් වූ හෝ ඔහු විසින් කුලියට ගනු ලැබූ හෝ යම් නැවක් ශ්‍රී ලංකාවේ නැව් තොටකට පැමිණි අවස්ථාවක, (හුදෙක් නැවකින් නැවකට මාරු කිරීම සඳහා ශ්‍රී ලංකාවට ගෙන

ආ බඩු හැර) ශ්‍රී ලංකාවේ නැව් ගත කරනු ලබන මගින්, තැපැල්, ඇති කරන සතුන් සහ භාණ්ඩ ගෙන යාම වෙනුවෙන් ලැබිය යුතු මුළු මුදලෙන් සියයට හයකට සමාන ප්‍රමාණයක්, මේ පනතේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වී තිබුණ ද, ඒ මගින්, තැපැල්, ඇති කරන සතුන් හෝ භාණ්ඩ ගෙනයාමෙන් **ඔහුට ඇතිවන සම්පූර්ණ ලාභය වශයෙන් සලකනු ලැබිය යුතු අතර** ඒ ලාභ ශ්‍රී ලංකාව තුළ උද්ගත වූ ලාභ ලෙස ද සලකනු ලැබිය යුතු ය.

(2) **යම් නිර්වාසික තැනැත්තකුට අයත් වූ හෝ ඔහු විසින්** කුලියට ගනු ලැබූ නැවක් ශ්‍රී ලංකාවේ නැව් තොටකට පැමිණීම අනියම් පැමිණීමක් වන සහ ඒ නැව හෝ ඒ තැනැත්තාට අයිති හෝ ඔහු විසින් කුලියට ගනු ලැබූ වෙනත් නැව් හෝ තවදුරටත් එසේ පැමිණීමට ඉඩ නැති අවස්ථාවක, ඒ නැවේ ලාභ සම්බන්ධයෙන් මේ වගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු අතර ඒ සම්බන්ධයෙන් ආදායම් බද්දක් ද අය කරනු නොලැබිය යුතු ය.

75. 74 වන වගන්තියේ විධිවිධාන යටතේ ආදායම් බද්ද ගෙවීමට යටත් යම් නිර්වාසික තැනැත්තකුට අයිති හෝ ඔහු විසින් කුලියට ගත් නැවක ප්‍රධානයා මේ පනතේ සියලු කාර්ය සඳහා ඒ නිර්වාසික තැනැත්තාගේ අනුයෝජිතයා ලෙස සලකනු ලැබිය යුතු ය. (වෙනත් යම් අනුයෝජිතයෙක් සිටී නම් ඔහු බැහැර කළ යුතු බව මින් අදහස් නොවිය යුතු ය). නැවක ප්‍රධානයා අනුයෝජිතයකු බව.

76. (1) නැව් හිමියකුගේ හෝ නැව් කුලියට ගන්නකුගේ **ව්‍යාපාරය කර ගෙන ගිය තැනැත්තකුගේ ආදායම අනුව අය කළ** යුතු ආදායම් බද්ද (ඒ තැනැත්තා කෙළින් ම හෝ වෙනත් තැනැත්තකුගේ නාමයෙන් තක්සේරු කරනු ලැබුවද) තුන් මසකට වැඩි කාලයක් නොගෙවා පැහැර හැර ඇති අවස්ථාවක, ප්‍රධාන රේගු අයකැමිට හෝ නැවට ආපසු යාත්‍රා කිරීමට අවසර දිය හැකි වෙනත් බලධරයකුට හෝ ඒ තැනැත්තාගේ නමද පැහැර හැර ඇති ආදායම් බද්දේ විස්තර ද ඇතුළත් වූ සහතිකයක් කොමසාරිස් ජනරාල් **වරයා විසින්, මේ පනතින් විධිවිධාන සලස්වනු ලැබ ඇති එකතු කර** ගැනීමේ හා අය කර ගැනීමේ වෙනත් යම් බලතල ක්‍රියාත්මක කිරීමට අතිරේක ව, නිකුත් කළ හැකි ය. ඒ සහතිකය ලැබුණු විට ඒ තැනැත්තාට සම්පූර්ණයෙන් ම අයත් වූ හෝ කොටසක් අයත් වූ හෝ ඔහු විසින් කුලියට ගනු ලැබූ හෝ නැවකට ශ්‍රී ලංකාවේ යම් නැව් තොටකින් ආපසු යාත්‍රා කිරීමට අවසර දීම, එකී ආදායම් බද්ද ගෙවන තෙක්, ප්‍රතික්ෂේප කිරීමට ප්‍රධාන රේගු අයකැමිට හෝ වෙනත් බලධරයාට මෙයින් බලය පැවරෙන අතර එසේ කිරීමට ඔහුට මෙයින් නියම කරනු ලැබේ. ආදායම් බද්ද ගෙවීම් සහතික ඇති විට ආපසු යාත්‍රා කිරීමට අවසර දීම ප්‍රතික්ෂේප කිරීම.

(2) මේ වගන්තිය යටතේ ආපසු යාත්‍රා කිරීමට ඉඩදීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් ප්‍රධාන රේගු අයකැමිට හෝ වෙනත් බලධරයකුට විරුද්ධ ව කිසිම සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක් නොපැවරිය යුතු ය. නැතහොත් පවත්වාගෙන නොයා යුතු ය. එසේ ම මේ වගන්තිය යටතේ නැවක් රඳවා ගැනීමේ කාරණය, රඳවා ගනු ලැබීමේ කාලය සඳහා වරායට අය විය යුතු මුදලක් හෝ ගාස්තුවක් ගෙවීමට අයිතිකරුට හෝ නැව කුලියට ගත් තැනැත්තාට හෝ අනුයෝජිතයාට ඇති වගකීම කෙරෙහි බල නොපැ යුතු ය.

නිර්වාසික ගුවන් යාත්‍රා අයිතිකරුවන්ගේ සහ ගුවන් යාත්‍රා කුලියට ගන්නකුගේ ලාභ.

77. (1) නිර්වාසික තැනැත්තකු ගුවන් යානා හිමියකුගේ හෝ නැව් කුලියට ගන්නකුගේ ව්‍යාපාරය කර ගෙන යන අවස්ථාවක, ඔහුට අයත් වූ හෝ ඔහු විසින් කුලියට ගනු ලැබූ යම් ගුවන් යානයක් ශ්‍රී ලංකාව තුළ යම් රේගු ගුවන් තොටුපළකට පැමිණි විට, **ශ්‍රී ලංකාවේ දී ඒ ගුවන් යානයට පැට වූ මගීන්, තැපැල්, ඇති කරන** සතුන් හෝ බඩු ගෙන යාමෙන් ඔහුට ලැබෙන සම්පූර්ණ ලාභය ශ්‍රී ලංකාව තුළදී ඇතිවන ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද එක් ගුවන් යානයකින් තවත් ගුවන් යානයකට හෝ ගුවන් යානයකින් නැවකට හෝ නැවකින් ගුවන් යානයකට හෝ මාරු කිරීමේ කාර්යය සඳහා ම පමණක් ශ්‍රී ලංකාවට ගෙනෙනු ලබන බඩුවලට මේ වගන්තිය අදාළ නොවිය යුතු ය.

(2) ගුවන් යානයක අයිතිකරු වශයෙන් හෝ ගුවන් යානයක් කුලියට ගන්නකු වශයෙන් ව්‍යාපාරය කරගෙන යන තැනැත්තකු යම් ගණන් දිමේ කාල පරිච්ඡේදයක් සඳහා (3) වන උපවගන්තියේ සඳහන් සහතිකය ඉදිරිපත් කරන අවස්ථාවක, මගීන්, තැපැල්, ඇති කරන සතුන් හෝ බඩු ගෙන යාමේ ඔහුගේ ව්‍යාපාරයෙන් අගය ක්ෂය වීම සඳහා යම් දිමනාවක් අඩු කිරීමට පෙර ඔහුට ශ්‍රී ලංකාව තුළ ඇතිවන ලාභය, එකී කාල සිමාව සඳහා එකී සහතිකයෙන් පෙන්වනු ලබන මුළු ලාභ හා මගීන්, තැපැල්, ඇති කරන සතුන් හා බඩු ගෙන යාම වෙනුවෙන් ඔහුට ලැබෙන මුළු මුදල අතර ඇති අනුපාතය ම ශ්‍රී ලංකාවෙහි දී පටවනු ලැබූ මගීන්, තැපැල්, ඇති කරන සතුන් හා බඩුගෙන යාම වෙනුවෙන් ලැබෙන මුදලට දරන මුදලක් විය යුතු ය:

එසේ වුව ද මේ පනතෙහි මීට ඉහතින් ම වූ විධිවිධානවල නියමිත ක්‍රමයට වඩා සැලකිය යුතු අන්දමකින් වෙනස් වන ක්‍රමයකින් එකී මුළු ලාභ ආගණනය කර ඇති අවස්ථාවක, ලාභවල අනුපාතය එකී විධිවිධාන ප්‍රකාර ලාභ ආගණනය කරන ලද නම් ලැබෙන අනුපාතයට හැකි තරමින් අනුරූප වන ලෙස ගලපා ගත යුතු ය.

(3) සහතිකය, ගුවන් යානා අයිතිකරුවකු වශයෙන් හෝ ගුවන් **යානා කුලියට ගන්නකු වශයෙන් වූ නිර්වාසික තැනැත්තාගේ** ව්‍යාපාරයෙන් ඔහුට ලැබෙන මුළු ලාභය තක්සේරු කරන යම් ආදායම් බදු නිලධරයකු විසින් හෝ ඔහු වෙනුවෙන් හෝ නිකුත් කරනු ලැබූවක් විය යුතු ය. තව ද ව්‍යාපාරය සම්බන්ධයෙන් යම් ගණන් දීමේ කාලයක් සඳහා පහත දැක්වෙන කරුණු ඉන් සහතික කළ යුතු ය:—

(අ) ක්ෂය වීම වශයෙන් යම් දිමනාවක් නොකොට, ඒ බලධරයා විසින් ආදායම් බද්දෙහි කාර්යය සඳහා ආගණනය කරනු ලැබූ ලාභ හෝ ලාභ නොමැති වූ විටක නම් අලාභ සහ මගීන්, තැපැල්, ඇති කරන සතුන් හෝ බඩු ගෙනයාම වෙනුවෙන් ලැබෙන මුළු මුදල අතර ඇති අනුපාතය; සහ

(ආ) ඒ බලධරයා විසින් ආගණනය කරනු ලැබූ ක්ෂයවීම් සඳහා වූ දිමනාව සහ මගීන්, තැපැල්, ඇති කරන සතුන් හා බඩු ගෙන යාම වෙනුවෙන් ලැබෙන මුළු මුදල අතර ඇති අනුපාතය.

(4) තක්සේරු කරනු ලබන වේලෙහි (2) වන උපවගන්තියේ විධිවිධාන යම් කරුණක් නිසා සතුටුදායක ලෙස අදාළ කිරීමට නොහැකි වූ විට, ශ්‍රී ලංකාවෙහි දී උපදින ලාභ, ශ්‍රී ලංකාවේ දී ගුවන් යානා වකට පටවනු ලැබූ මගින්, තැපැල්, ඇති කරන සතුන් හා බඩුගෙන යාම වෙනුවෙන් ලැබෙන මුළු මුදලෙහි සාධාරණ ප්‍රතිශතයක් ලෙස සලකා ආගණනය කළ හැකි ය:

එසේ වුවද ඒ ප්‍රතිශතය අනුව යම් තැනැත්තකු යම් තක්සේරු වර්ෂයක් සඳහා තක්සේරු කරනු ලැබූ අවස්ථාවක, ඒ වර්ෂය සඳහා ඔහු ගෙවීමට යටත්වන ආදායම් බද්ද (2) වන උපවගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති ක්‍රමය පදනම් කොට ගෙන නැවත ආගණනය කරන ලෙස තක්සේරු වර්ෂයේ අවසානයෙන් පසු තුන් වර්ෂයක් ඇතුළත කවර වූ හෝ වේලාවක ඉල්ලීමක් කිරීමට ඔහුට හිමිකම නිබිය යුතු ය.

නිර්වාසික ගුවන් යානා අයිතිකරුවන්ගේ සහ කුලියට ගන්නන්ගේ ලාභවලට 74 (2) වන, 75 වන සහ 76 වන වගන්ති අදාළ වීම.

78. (1) 74 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන සහ 75 වන වගන්තියේ සහ 76 වන වගන්තියේ විධිවිධාන නැව් හිමියකුගේ හෝ නැව් කුලියට ගන්නකුගේ ව්‍යාපාරය කර ගෙන යන නිර්වාසික තැනැත්තකු සම්බන්ධයෙන් අදාළ වන ආකාරයට ම, ඒ විධිවිධාන ගුවන් යානා අයිතිකරුවකුගේ හෝ ගුවන් යානා කුලියට ගන්නකුගේ ව්‍යාපාරය කර ගෙන යන සෑම නිර්වාසික තැනැත්තකුට ම අදාළ විය යුතු ය.

(2) ගුවන් යානා අයිතිකරුවකුගේ හෝ ගුවන් යානා කුලියට ගන්නකුගේ ව්‍යාපාරය කර ගෙන යන නිර්වාසික තැනැත්තකු සම්බන්ධයෙන් 74 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සහ 75 වන සහ 76 වන වගන්තිවල විධිවිධාන අදාළ කිරීමේ දී—

(අ) "නැව" යන්නට ගුවන් යානාව ද ඇතුළත් වන ලෙස සැලකිය යුතු අතර "නැව් හිමියා" යන්න ද ඒ අනුව කියවා තේරුම් ගත යුතු ය;

(ආ) "නැව් තොට" යන්නට රේගු ගුවන් තොටුපළක් ඇතුළත් වන ලෙස සැලකිය යුතු ය;

(ඇ) නැවක ප්‍රධානයා පිළිබඳ ව කරනු ලබන යම් සඳහන් කිරීමකට ගුවන් යානාවක තත් කාලයේ පාලනය හෝ භාරය ඇතිව සිටින තැනැත්තා පිළිබඳ ව කරනු ලබන සඳහන් කිරීමක් ද ඇතුළත් වන ලෙස සැලකිය යුතු ය;

(ඈ) යම් නැවකට ආපසු යාත්‍රා කිරීමට ඉඩදීම පිළිබඳ ව කරනු ලබන යම් සඳහන් කිරීමකට, රේගු ආඥාපනතේ 63 වන වගන්තිය යටතේ ආපසු යාත්‍රා කිරීමේ සහතිකයක් දීම වෙනුවට ගුවන් යානාවක් සම්බන්ධයෙන් යම් ලිඛිත නීතියක විධිවිධාන යටතේ නියමිත හෝ බලය දෙනු ලැබූ යම් ක්‍රියාවක් ගැන සඳහන් කිරීමක් ඇතුළත් වූ ලෙස සැලකිය යුතු අතර ආපසු යාත්‍රා කිරීමට ඉඩදීම ප්‍රතික්ෂේප කිරීමක් පිළිබඳව කරනු ලබන සඳහන් කිරීමක් ද ඒ අනුව කියවා තේරුම් ගත යුතු ය;

(ඉ) "වරායට අය විය යුතු මුදල් හා ගාස්තු" යන්නට ශ්‍රී ලංකාවට පැමිණෙන හා ශ්‍රී ලංකාවෙන් පිටව යන යම් ගුවන් යානා වක් රේගු ගුවන් තොටුපළකට ගොඩ බැස්සවීම, නතර කර තැබීම හෝ යානා ගෘහයක තැබීම වෙනුවෙන් ශ්‍රී ලංකා ආණ්ඩුවට හෝ වෙනත් තැනැත්තකුට ගෙවිය යුතු යම් ගාස්තුවක් ඇතුළත් වන ලෙස සැලකිය යුතු ය.

උ. රක්ෂණය

රක්ෂණ සමාගම්වල ලාභ බදු විය කිරීම.

79. (1) අන්‍යොන්‍ය හෝ හිමිකාර සමාගමක ජීවිත රක්ෂණ ව්‍යාපාරයෙන් ලැබෙන ලාභ, (කොමිස් මුදල් ඇතුළුව) ඒ ව්‍යාපාරයට ආරෝපණය කළ හැකි කළමනාකරණ වියදම් හැර, ජීවිත රක්ෂණ අරමුදලෙහි ආයෝජන ආදායම විය යුතු ය:

එසේ වුව ද ශ්‍රී ලංකාවේ නිර්වාසික එවැනි සමාගමක් කෙලින් ම හෝ අනුයෝජිතයකුගේ මාර්ගයෙන් ශ්‍රී ලංකාවේ ජීවිත රක්ෂණ ව්‍යාපාර කටයුතු කරන අවස්ථාවක, එසින් ලැබෙන ලාභ නිශ්චය කළ යුතු වන්නේ, සමාගමේ ශ්‍රී ලංකාවේ ජීවිත රක්ෂණ ව්‍යාපාරයේ වාර මුදල් සමාගම විසින් ලබාගත් මුළු ජීවිත රක්ෂණ වාරමුදලට යම් අනුපාතයක් දරයි ද, සමාගමේ ජීවිත රක්ෂණ අරමුදලේ මුළු ආයෝජන ආදායමට එම අනුපාතයම එම ලාභ දරන පරිදිය. එහෙත් ඒ ලාභ නිශ්චය කිරීමේ දී ජීවිත රක්ෂණ වාර මුදල් හෝ ආයෝජන ආදායම හෝ නොවන යම් ආදායම් හෝ ලාභ, පහත දැක්වෙන එක් එක් අවස්ථාවේ සඳහන් කර ඇති වියදම්වලට හිලව්කර ගණන් බලා මුළු ජීවිත රක්ෂණ වාර මුදලින් අඩු කළ යුතු ය:—

(අ) (කොමිස් ඇතුළුව) ශ්‍රී ලංකාව තුළ අනුයෝජන වියදම්; සහ

(ආ) සමාගමේ ප්‍රධාන කාර්යාලයේ වියදම්වලින් සාධාරණ අනුපාතයක්.

(2) අන්‍යොන්‍ය හෝ හිමිකාර නිර්වාසික සමාගමක (ජීවිත රක්ෂණය හැර) රක්ෂණ ව්‍යාපාරයෙන් ලැබෙන ලාභ ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාපාරයේ දළ වාර මුදල් (රක්ෂිතයන්ට ආපසු දෙනු ලැබූ වාර මුදල් ද අඩු කොට) ගෙන, කාල සීමාව අවසානයේ දී ලාභ නිශ්චය කරන කාලසීමාවේ දී දුරු වී නොතිබූ අවදානම් සඳහා සංචිතයක්, සමාගම එකක් වශයෙන් ගත් කල එහි කටයුතුවල දී එබඳු අවදානම් සඳහා යොදා ගන්නා ප්‍රතිශතය අනුව එසින් අඩු කොට, ඒ කාල සීමාව ආරම්භයේ දී ඉතිරිව තිබූ අවදානම් සඳහා එසේම ගණන් බලනු ලැබූ සංචිතයක් ඊට එකතු කොට, ඉන් ලැබෙන ශුද්ධ ප්‍රමාණයෙන් (නැවත රක්ෂණය යටතේ අලාභ සම්බන්ධයෙන් ලබාගත් මුදල් හැර) ඇත්ත වශයෙන් ම වූ අලාභය ද ශ්‍රී ලංකාවෙහි අනුයෝජන වියදම් ද සමාගමෙහි ප්‍රධාන කාර්යාලයෙහි වියදම්වල යුක්ති සහගත ප්‍රමාණයක් ද අඩු කිරීමෙනි; එකී අලාභ සහ වියදම් ගණන් බැලීමේදී වාර මුදල් නොවන යම් ආදායම් හෝ ලාභ ඒ වියදම්වලට නිසි පරිදි හිලව් කර ගණන් බැලිය යුතු ය.

(3) නිර්වාසික රක්ෂණ සමාගමක් විසින් ශ්‍රී ලංකාවෙහි දී කරනු ලැබූ ව්‍යාපාර කටයුතු සීමිත ප්‍රමාණයක වීම නිසා (1) වන හා (2) වන උපවගන්ති අදාළ කිරීම සඳහා අවශ්‍ය විස්තර සපයන ලෙස නියම කිරීම අසාධාරණ බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් වූ අවස්ථාවක, ඒ උපවගන්තිවල විධිවිධාන කුමක් වුව ද ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාපාරයෙන් ලැබෙන වාර මුදල් සහ එහි වාර මුදල් මුළු ගණන අතර ඇති අනුපාතය අනුව සමාගමෙහි ලාභ හා ආදායමෙහි මුළු ගණන ආශ්‍රයෙන් හෝ සියලු අවස්ථාගත කරුණු සම්බන්ධයෙන් සාධාරණ යයි කොමසාරිස් ජනරාල්වරයාට හැඟෙන අන් කිසි ක්‍රමයකින් හෝ සමාගමෙහි ලාභ නිශ්චය කිරීමට ඔහු විසින් අවසර දිය හැකි ය.

(4) මේ වගන්තියෙහි "ජීවිත රක්ෂණ අරමුදලෙහි ආයෝජන ආදායම" යන යෙදුමෙන් (5) වන උපවගන්තියේ සඳහන් යම් ලාභාංශයක මුදල හැර—

(අ) තම එකම ව්‍යාපාරය ජීවිත රක්ෂණය වූ සමාගමක් සම්බන්ධයෙන් නම්, එහි ආයෝජනවලින් ලැබෙන සම්පූර්ණ ආදායම; සහ

(ආ) වෙනත් සමාගමක් සම්බන්ධයෙන් නම්, එහි ආයෝජන ආදායමෙන් රක්ෂණ ව්‍යාපාරයට ආරෝපණය කිරීම සාධාරණ වන යම් කොටසක්

අදහස් වේ.

(5) යම් වාසික සමාගමක් විසින්, ජීවිත රක්ෂණ ව්‍යාපාරය කරගෙන යන යම් සමාගමකට ලාභාංශයක් ගෙවනු ලැබ—

(අ) ඒ ලාභාංශය වෙනුවෙන් 38 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ අඩු කිරීමක් කර ඇති; හෝ

(ආ) ඒ ලාභාංශය ඒ වාසික සමාගම වෙත වෙනත් වාසික සමාගම කින් ලැබුණු ලාභාංශ මුදලක යම් කොටසකින් සමන්විත වන

අවස්ථාවක, ඒ ලාභාංශය, ජීවිත රක්ෂණ ව්‍යාපාරය කරගෙන යන සමාගමේ ජීවිත රක්ෂණ අරමුදලේ ආයෝජන ආදායමේ කොටසක් නොවිය යුතු ය.

ජීවිත රක්ෂණ ව්‍යාපාරයෙන් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ලබන ලාභ නිශ්චය කිරීම.

80. (1) 8 වන වගන්තියේ (ඇ) ඡේදයේ කාර්ය සඳහා ජීවිත රක්ෂණ ව්‍යාපාරයට ආරෝපණය කළ හැකි (කොමිස් මුදල් ඇතුළුව) පාලන වියදම් අඩු කළ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ජීවිත රක්ෂණ අරමුදලෙහි ආයෝජන ආදායම, ජීවිත රක්ෂණ ව්‍යාපාරයෙන් එම සංස්ථාව ලබන ලාභ විය යුතු ය.

(2) මේ වගන්තියෙහි "ජීවිත රක්ෂණ අරමුදලෙහි ආයෝජන ආදායම" යන යෙදුමෙන් (3) වන උපවගන්තියේ සඳහන් යම් ලාභාංශයක ප්‍රමාණය හැර ආයෝජන මගින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ලබන ආදායමෙන්, ඒ සංස්ථාවෙහි ජීවිත රක්ෂණ ව්‍යාපාරයට ආරෝපණය කිරීම සාධාරණ යයි පෙනී යන කොටස අදහස් වේ.

(3) යම් වාසික සමාගමක් විසින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට ලාභාංශයක් ගෙවනු ලැබූ, සහ—

(අ) ඒ වාසික සමාගම විසින් ගෙවනු ලැබූ ඒ ලාභාංශය වෙනුවෙන් 38 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ අඩු කිරීමක් කරනු ලැබූ; හෝ

(ආ) ඒ වාසික සමාගම වෙත වෙනත් වාසික සමාගමකින් ලැබුණු ලාභාංශයක ප්‍රමාණයෙන් යම් කොටසකින් ඒ ලාභාංශය සමන්විත වන

අවස්ථාවක, ඒ ලාභාංශය ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ජීවිත රක්ෂණ අරමුදලේ ආයෝජන ආදායමේ කොටසක් නොවිය යුතු ය.

ඌ. ශ්‍රී ලංකාවෙන් පිට තැනැත්තන්ට ගෙවිය යුතු පොලී ආදියෙන් ආදායම් බදු අඩු කිරීම.

ශ්‍රී ලංකාවෙන් පිට තැනැත්තන්ට ගෙවිය යුතු පොලියෙන් ආදායම් බදු අඩු කර ගැනීම.

81. (1) ශ්‍රී ලංකාවේ යම් තැනැත්තකු විසින් හෝ වෙනත් තැනැත්තකු විසින් හෝ හවුල් ව්‍යාපාරයක් විසින් ගෙවිය යුතු වුව ද—

(අ) ඍණපත්‍රවල, උගස්කරවල, ණයවල, තැන්පත් මුදල්වල හෝ අත්තිකාරම් මුදල්වල පොලී වශයෙන්; හෝ

(ආ) ශ්‍රී ලංකාවෙහි දේපළ සම්බන්ධයෙන් හෝ ශ්‍රී ලංකාවෙහි උපදින ආදායමෙන් හෝ ගෙවිය යුතු කුලියක්, බිම් කුලියක්, නිෂ්පාදන භාගයක් හෝ වාර්ෂිකයක් වශයෙන් හෝ

ගෙවිය යුතු වන යම් මුදලක් ශ්‍රී ලංකාවෙහි තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවෙන් පිට යම් තැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයකට ගෙවනු ලැබූ හෝ බැර කරනු ලැබූ අවස්ථාවක, පටහැනිව යම් එකඟවීමක් තිබුණද මේ පනතේ හයවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් අනුප්‍රමාණය අනුව, ආදායම් බදු අඩු කර ගැනීමට ඒ තැනැත්තාට හිමිකම් තිබිය යුතු ය. එසේ අඩු කළ යුතු බදු ප්‍රමාණය ඒ තැනැත්තා ගෙන් ජනරජයට අය විය යුතු ණයක් වන්නේ ය. එය එබඳු ණයක් වශයෙන් වහාම අය කර ගත යුතු අතර මේ පනත යටතේ වෙනත් ආකාරවලින් ගෙවිය යුතු යම් ආදායම් බද්දකට අතිරේකව ඒ තැනැත්තා වෙනුවෙන් තක්සේරු කර ඔහුගෙන් එය අයකර ගැනීම කළ හැකි ය:

එසේ වුව ද—

(අ) ශ්‍රී ලංකාවෙන් පිට යම් තැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයකට, ශ්‍රී ලංකාවේ යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු හෝ බැර කළ යුතු යම් මුදලකින්, මේ පනතේ හයවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් අනුප්‍රමාණය නොවන අනුප්‍රමාණයන් අනුව යම් තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බදු අඩු කරන ලෙස, ශ්‍රී ලංකාවෙන් පිට ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් මේ පනත යටතේ ගෙවිය යුතු මුළු බද්ද සැලකිල්ලට ගෙන කොමසාරිස් ජනරාල්වරයා විසින් ලියවිල්ලක් වූ දැන්වීමක් මගින් ශ්‍රී

ලංකාවේ යම් තැනැත්තකුට නියම කළ හැකි අතර එසේ අඩු කර ගත හැකි බද්ද ඉහත කී ආකාරයට අය කර ගත යුතු හෝ ගෙවිය යුතු වන්නේ ය.

(ආ) ශ්‍රී ලංකාවෙහි ඇති නොවන ආදායමෙන් ගෙවනු ලැබූ පොලිය කට හෝ බැංකුකරුවකු විසින් දෙනු ලැබූ යම් ණයක හෝ අත්තිකාරමක පොලියකට මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(2) ශ්‍රී ලංකාවෙන් පිට යම් තැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරය කට ගෙවනු ලැබූ හෝ බැර කරනු ලැබූ යම් මුදලකින්, (1) වන උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර ආදායම් බදු අඩු කර ගන්නා තැනැත්තකු විසින් ඒ අවස්ථාවෙහි දී ඒ තැනැත්තාට හෝ හවුල් ව්‍යාපාරයට—

(අ) ඒ ගෙවීමේ හෝ බැර කිරීමේ දළ ප්‍රමාණය ද,

(ආ) එසේ අඩු කරනු ලැබූ ආදායම් බද්දෙහි අනුප්‍රමාණය හා ප්‍රමාණය ද,

(ඇ) ඇත්ත වශයෙන් ම ගෙවනු ලැබූ හෝ බැර කරනු ලැබූ ශුද්ධ ප්‍රමාණය ද,

දැක්වෙන ලිඛිත ප්‍රකාශයක් නිකුත් කළ යුතු ය.

(3) යම් තැනැත්තකුගේ තක්සේරු කළ හැකි ආදායමට (1) වන උපවගන්තිය ප්‍රකාර ආදායම් බදු අඩු කිරීමට පාත්‍ර වූ මුදලක් ඇතුළත් වන අවස්ථාවක, ඒ මුදල පිළිබඳව (2) වන උපවගන්තිය ප්‍රකාර නිකුත් කරනු ලැබූ ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමෙන් පසු, අඩුකරගත් ආදායම් බදු මුදල වශයෙන් ඒ ප්‍රකාශයෙහි දැක්වුණු මුදල ආදායම් බදු මුදලෙන් හිලව් කිරීමට ඔහුට හිමිකම් ලැබිය යුතු ය.

එ. ද්විත්ව බදු අය කිරීම්වල දී සහන

ද්විත්ව බදු සහන සඳහා වන ගිවිසුම්වල බලපෑම්.

82. (1) (අ) ශ්‍රී ලංකාවේ නීති යටතේ වූ ආදායම් බද්ද හා ධන බද්ද සහ වෙනත් දේශයක නීති මගින් පැනවූ ඒ ස්වභාවයේ යම් බදු සම්බන්ධයෙන් ද්විත්ව බදු අය කිරීම්වලින් සහනයක් සැලැස්වීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවේ ආණ්ඩුව හා ඒ වෙනත් යම් දේශයක ආණ්ඩුවක් අතර ඇතිකරගත් ගිවිසුමක් පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයෙන් අනුමත කෙරෙන අවස්ථාවක, වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුවද, ඒ ගිවිසුම මගින්—

(i) ආදායම් බද්දෙන් හෝ ධන බද්දෙන් සහන දීම සඳහා; හෝ

(ii) ශ්‍රී ලංකාවේ යම්කිසි ප්‍රභවයකින් ඇතිවන ලාභ හෝ ආදායම ශ්‍රී ලංකාවේ නිර්වාසික තැනැත්තන්ගේ ලාභ හෝ ආදායම ලෙස සැලකීම හෝ ඒ තැනැත්තන්ට සහ ශ්‍රී ලංකාවේ ඔවුන්ගේ නියෝජිත ආයතන, ශාඛා හා ආයතන වෙනුවෙන් යෙදෙන ලාභ හෝ ආදායම් නිශ්චය කිරීම් සඳහා; හෝ

(iii) ශ්‍රී ලංකාවේ නිර්වාසික තැනැත්තන් සමඟ විශේෂ සම්බන්ධකම් ඇති ශ්‍රී ලංකාවේ වාසික තැනැත්තන් වෙනුවෙන් යෙදෙන ලාභ හෝ ආදායම නිශ්චය කිරීම සඳහා

විධිවිධාන සලසන තාක් දුරට ඒ ගිවිසුමට ශ්‍රී ලංකාවේ නෛතික බලය ඇතිවිය යුතු ය.

(ආ) (අ) ඡේදය යටතේ යෝජනා සම්මතයෙන් අනුමත කරනු ලැබූ සෑම ගිවිසුමක්ම එය අනුමත කළ බවට වූ දැන්වීමකුත් සමඟ ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

(ඇ) ශ්‍රී ලංකාවෙන් පිටත වූ යම් දේශයක නිති යටතේ ගෙවිය යුතු බද්ද, ශ්‍රී ලංකාවේ ගෙවිය යුතු යම් බද්දකට බැර වශයෙන් ඉඩ හරිනු ලැබිය යුතු බවට (අ) ඡේදයේ සඳහන් යම් ගිවිසුමකින් විධි විධාන සැලසෙන යම්කිසි අවස්ථාවක යම් ප්‍රභවයකින් ඇතිවන ලාභ හෝ ආදායම මත වූ ශ්‍රී ලංකා බද්ද සම්බන්ධයෙන් එසේ ඉඩ හරිනු ලබන බැර කිසි විටෙක ඒ ලාභ හෝ ආදායම සම්බන්ධයෙන් ගෙවිය යුතු ශ්‍රී ලංකාවේ බදු මුදලට වඩා වැඩි නොවිය යුතු ය.

(2) (අ) මේ වගන්තියේ සහ 83 වන වගන්තියේ කාර්ය සඳහා—

(i) "ආදායම" ගණන් බැලීම, තක්සේරු කළ හැකි ආදායම නිශ්චය කිරීම සම්බන්ධයෙන් මේ පනතෙහි වූ විධිවිධාන ප්‍රකාර හැකිතාක් දුරට කළ යුතු නමුත්, පොලී, වාර්ෂිකයන්, බිම් කුලී හෝ නිෂ්පාදන භාග වශයෙන් ඒ ආදායමෙන් ගෙවිය යුතු යම් මුදලක් එයට ඇතුළත් නොවිය යුතු ය.

(ii) "ශ්‍රී ලංකාවේ බද්ද" යන්නෙන්, මේ වගන්තිය සහ 83 වන වගන්තිය යටතේ යම් සහන සඳහා අඩු කිරීමක් සිදු කිරීමට පෙර මේ පනත යටතේ ගෙවිය යුතු ආදායම් බද්ද අදහස් වන නමුත් ඒ බද්ද අයකර ගනු ලබන ආදායමෙන් පොලී, වාර්ෂිකයන්, බිම් කුලී හෝ නිෂ්පාදන භාග වශයෙන් ගෙවිය යුතු යම් මුදලකින් අය කෙරෙන යම් බද්දක් එයට ඇතුළත් නොවේ.

: (ආ) ශ්‍රී ලංකාවේ ආදායම් බදු අනුප්‍රමාණය මේ උපවගන්තියේ (අ) ඡේදය ප්‍රකාර ගණන් බැලූ බදු ගෙවූ හෝ බදු ගෙවිය යුතු ආදායමෙන් ශ්‍රී ලංකා ආදායම් බද්ද බෙදීමෙන් නිශ්චය කළ යුතු ය.

(3) ශ්‍රී ලංකාවේ ආණ්ඩුව හා වෙනත් යම් දේශයක ආණ්ඩුවක් අතර ඇති කරගනු ලැබ, 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 70 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට ඉහතින්ම වූ දිනයෙහි ශ්‍රී ලංකාවේ නෛතික බලය ඇති සෑම ගිවිසුමක්ම මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මුතියකින් අනුමත කරනු ලැබූ ගිවිසුමක් ලෙස සියලු කාර්ය සඳහා සැලකිය යුතු ය.

පොදුරාජ්‍ය මණ්ඩල ආදායම් බද්ද සම්බන්ධයෙන් සහන.

83. (1) මේ පනතේ 82 වන වගන්තියේ (1) වන උපවගන්තියේ හෝ 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 70 වන වගන්තියේ (1) වන උපවගන්තියේ හෝ ද්විත්ව බදු අයකිරීම් (සහන) පනතේ හෝ විධිවිධාන යටතේ ද්විත්ව බදු අය කිරීම වැළැක්වීම සඳහා කටයුතු සලසා ඇත්තේ හෝ සලසා තිබුණේ යම් රටක් සමඟ ද එවැනි රටක වාසික යම් තැනැත්තකු සම්බන්ධයෙන් මේ වගන්තියේ මීළඟට ඇති විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(2) යම් ප්‍රභවයකින් ඇතිවන තමාගේ ආදායම අනුව යම් තක්සේරු වර්ෂයක් සඳහා ශ්‍රී ලංකාවේ ආදායම් බද්ද අනුරූප වර්ෂය සඳහා පොදුරාජ්‍ය මණ්ඩල බද්ද යම් තැනැත්තකු විසින්, අඩු කිරීමක මාර්ගයෙන් හෝ අන්‍යාකාරයකින් හෝ ගෙවූ බව නැතහොත් ගෙවීමට යටත් බව කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි ඔහු විසින් ඔප්පු කරනු ලැබුවහොත් ඒ ප්‍රභවයෙන් ලැබුණු ඔහුගේ ආදායම සම්බන්ධයෙන් ගෙවනු ලැබූ හෝ ගෙවිය යුතු ශ්‍රී ලංකාවේ ආදායම් බද්දෙන් දෙකෙන් එක් කොටසකට හෝ පොදුරාජ්‍ය මණ්ඩල ආදායම් බද්දෙන් දෙකෙන් එක් කොටසකට යන මෙසින් අඩු මුදල් ගණනට සමාන සහනයකට ඔහුට හිමිකම් ලැබිය යුතු ය:

එසේ වුව ද මේ උපවගන්තිය යටතේ දෙනු ලැබූ සහනය, 82 වන වගන්තියේ විධිවිධාන යටතේ දෙනු ලැබූ සහන අඩු කිරීමෙන් පසු ශ්‍රී ලංකාවේ ආදායම් බද්දෙන් දෙකෙන් එක් කොටසකට වඩා වැඩි නොවිය යුතු ය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා—

(අ) "පොදුරාජ්‍ය මණ්ඩල බද්ද" යන්නෙන් පොදුරාජ්‍ය මණ්ඩලයේ සාමාජිකයකුවූ ද ඒ දේශයෙහි ව්‍යවස්ථාදායකය විසින්, ඒ දේශයෙහි ආදායම සහ ශ්‍රී ලංකාවේ ආදායම යන දෙකම අනුව අය කරනු ලබන බද්ද සම්බන්ධයෙන්, මේ වගන්තියෙන් දෙනු ලැබූ සහනවලට අනුරූපයැයි කොමසාරිස් ජනරාල්වරයාට පෙනී යන අන්දමේ සහන සලස්වා ඇත්තාවූ ද යම් දේශයක් විසින් ඒ දේශයේ බලපවත්නා යම් නීතියක් යටතේ අයකරනු ලබන යම් ආදායම් බද්දක් සහ අධි බද්දක් අදහස් වන අතර, පොදුරාජ්‍ය මණ්ඩල බද්දේ මුදල, දෙවනු සඳහන් කරනු ලැබූ සහන අඩු කිරීමට පෙර වූ ඒ බද්දේ මුදල විය යුතු ය;

(ආ) යම් ප්‍රභවයකින් ලැබෙන ආදායම් සම්බන්ධයෙන් ගෙවනු ලැබූ හෝ ගෙවිය යුතු ශ්‍රී ලංකාවේ බද්ද ඒ ආදායමෙන් පොලී, වාර්ෂිකයන්, බිම් කුලී හෝ නිෂ්පාදන භාග වශයෙන් ගෙවිය යුතු යම් මුදලක් අඩු කිරීමෙන් පසු ඒ ප්‍රභවයෙන් ලැබෙන තක්සේරු කරන ලද ආදායමට ශ්‍රී ලංකාවේ බදු අනුප්‍රමාණය යෙදීමෙන් නිශ්චය කර ගත යුතු ය. තව ද යම් ප්‍රභවයකින් ලැබෙන ආදායම වෙනුවෙන් ගෙවනු ලැබූ හෝ ගෙවිය යුතු පොදුරාජ්‍ය මණ්ඩල බද්ද, හැකිතාක් දුරට එයට අනුරූප ආකාරයකට නිශ්චය කරගත යුතු ය.

(ඇ) පොදුරාජ්‍ය මණ්ඩල බදු පාලනය කරනු ලබන බලධරයා විසින් හෝ ඒ බලධරයා වෙනුවෙන් හෝ නිකුත් කරනු ලැබූ සහතිකයක්, යම් ප්‍රභවයකින් ලැබෙන ආදායම වෙනුවෙන් ගෙවනු ලැබූ හෝ ගෙවිය යුතු පොදුරාජ්‍ය මණ්ඩල බද්දේ මුදල දැක්වීම සඳහා සාක්ෂියක් ලෙස පිළිගත යුතු ය.

(ඈ) මේ පනත යටතේ තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් "අනුරූප වර්ෂය" යන්නෙන් පොදුරාජ්‍ය මණ්ඩල බදු කාර්ය සඳහා වර්ෂයක් වන්නාවූ ද කොමසාරිස් ජනරාල් වරයාගේ මතය අනුව ඒ තක්සේරු වර්ෂයට අනුරූප වන්නා වූද වර්ෂය අදහස් වේ.

ශ්‍රී ලංකාවේ ඛන බද්ද සම්බන්ධයෙන් දෙනු ලබන සහන.

84. (1) ශ්‍රී ලංකාව නොවන වෙනත් රටක ඇති දේපළවලින් සමන්විතවන තමාගේ ධනය වෙනුවෙන් යම් තක්සේරු වර්ෂයක් සඳහා තමා විසින් ශ්‍රී ලංකාවේ ධන බද්ද ද, 82 වන වගන්තිය යටතේ ද්විත්ව බදු අය කිරීම් සම්බන්ධයෙන් සහන දීම සඳහා කටයුතු සලසනු ලැබ නොමැති එකී වෙනත් රටෙහි ඊට අනුරූප වර්ෂය සඳහා ධන බද්ද ද ගෙවූ බව නෑතහොත් ගෙවීමට සිදුවන බව යම් නෑනැත්තකු විසින් කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි ඔප්පු කරනු ලැබුවහොත් එබඳු අවස්ථාවකදී ඒ ධනය වෙනුවෙන් ඔහු විසින් ශ්‍රී ලංකාවේ ගෙවිය යුතු ධන බද්දෙන්, ශ්‍රී ලංකාවේදී ඒ ධනය වෙනුවෙන් ගෙවිය යුතු ධන බද්ද හෝ එකී වෙනත් රටෙහිදී ගෙවිය යුතු ධන බද්ද යන මේ දෙකින් වඩා අඩු ගණනට සමාන මුදලක සහනයක් ලැබීමට සිහුට හිමිකම ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා වෙනත් රටක ඇති දේපළවලින් සමන්විත ධනය වෙනුවෙන් යම් නෑනැත්තකු විසින් ශ්‍රී ලංකාවේදී හෝ ඒ වෙනත් රටේදී ගෙවිය යුතු ධන බද්ද ගණන් බැලීමේදී බදු අය කළ හැකි ඔහුගේ මුළු ධනය සම්බන්ධයෙන් ගෙවිය යුතු වන බද්ද, බදු අය කළ හැකි ඔහුගේ මුළු ධනයේ වටිනාකමින් බෙදීමෙන් ලැබෙනු ඵලයට සමාන ප්‍රමාණයක් අනුව ගණන් බැලිය යුතු ය.

ඒ. සංචාරක ව්‍යාපාර හා සම්බන්ධ සමාගම්වල ඇතැම් ලාභ සහ ආදායම සම්බන්ධ සහන

සංචාරක හෝටල් හා සම්බන්ධ සමාගම්වල ඇතැම් ලාභ හා ආදායම වෙනුවෙන් ආදායම් බදු සහන.

85. යම් සමාගමක් මේ පනතේ 16 වන වගන්තියේ සඳහන් වන්නා වූ හෝ 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 6 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (v) වන ඡේදයේ නෑතහොත් (vi) වන ඡේදයේ සඳහන් වන්නාවූ ද ඒ යටතේ 1976 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව අමාත්‍යවරයා විසින් අනුමත කර ඇත්තා වූ ද යම් ව්‍යාපාර කටයුත්තක් කරගෙන යන අවස්ථාවක, ඉහත කී විධිවිධාන යටතේ එම ව්‍යාපාරයේ ලාභ හා ආදායම, ආදායම් බද්දෙන් නිදහස් වන පස් අවුරුදු කාලසීමාවට ඉක්බිතිව ම එළඹෙන අවුරුදු පහළොවේ කාලසීමාව සඳහා එම ව්‍යාපාරයෙන් ලැබෙන ලාභ සහ ආදායම වෙනුවෙන් ඒ සමාගම විසින් ගෙවිය යුතු ආදායම් බද්ද, නිශ්චිත මුදලින් සියයට පණහකට සමාන මුදලකින් අඩු කරනු ලැබීමට ඒ සමාගම හිමිකම් ලැබිය යුතු ය.

මේ වගන්තියෙහි කාර්ය සඳහා ඒ නිශ්චිත මුදල—

(අ) වාසික සමාගමක් සම්බන්ධයෙන් වූ විට, 82 වන වගන්තිය හෝ 83 වන වගන්තිය යටතේ දෙනු ලැබූ යම් සහනයක් අඩු කිරීමෙන් පසු 33 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ඡේදය යටතේ යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ සමාගම විසින් ගෙවිය යුතු ආදායම් බද්දට, ඒ තක්සේරු වර්ෂය සඳහා, ඒ ව්‍යාපාරයේ ලාභ හා ආදායමත් ඒ සමාගමේ ලාභ හා ආදායමත් අතර ඇති අනුපාතයට සමාන අනුපාතයක් දරන මුදලක්; සහ

(ආ) නිර්වාසික සමාගමක් සම්බන්ධයෙන් වූ විට 82 වන වගන්තිය හෝ 83 වන වගන්තිය යටතේ දෙනු ලැබූ යම් සහනයක් අඩු කිරීමෙන් පසු (34 වන වගන්තිය යටතේ

සියයට පහ බැගින් වූ අතිරේක අනුප්‍රමාණය අනුව ගණන් බලන ලද ආදායම් බද්දේ කොටස ඇතුළුව)34 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ සමාගම විසින් ගෙවිය යුතු ආදායම් බද්දට, ඒ ව්‍යාපාරයේ ලාභ හා ආදායම සහ සමාගමේ ලාභ හා ආදායම අතර අනුපාතයට සමාන අනුපාතයක් දරන මුදලක්

විය යුතු ය.

ඔ. ඇතැම් අවස්ථාවල දී ඛන බද්ද අඩු කිරීම

ආදායම් බද්දෙහි හා ඛන බද්දෙහි මුළු ගණන ඇතැම් සීමාවන් ඉක්ම වන විට ඛන බද්ද අඩු කිරීම.

86. (අ) 1979 අප්‍රේල් මස 1 වන දින දී හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු ගෙවීමට යටත් වන ඛන බද්දෙහි, සහ

(ආ) ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තා ගෙවීමට යටත්වන ආදායම් බද්දෙහි

එකතුව, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායමෙන් සහ මේ පනත යටතේ හෝ වෙනත් යම් ප්‍රඥප්තියක් යටතේ හෝ ආදායම් බද්දෙන් නිදහස් කර ඇත්තා වූ ද ඒ නිදහස් කිරීම නිසා නොවේ නම් ඒ තක්සේරු වර්ෂය සඳහා එම තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායම ගණන් බැලීමේ දී ගණන් ගනු ලැබිය හැකිව තිබුණා වූ ද ලාභ හා ආදායම වන (නිවාසයක ශුද්ධ වාර්ෂික වටිනාකම සහ මේ පනත යටතේ ආදායම් බද්දෙන් නිදහස් යම් සහනාධාරයක් හැර) යම් ලාභ හා ආදායම්වලින් සියයට අසූවක් ඉක්මවන්නේ නම් එසේ ඉක්මවන මුදල ඔහු ඒ වර්ෂය සඳහා ගෙවීමට යටත් ඛන බද්දට හිලව් කළ යුතු ය.

ඕ. විවිධ කරුණු

විශේෂ ලාභ හෝ ආදායම් මාර්ග සම්බන්ධයෙන් විධි විධාන අදාළ කිරීම.

87. මේ පනතෙහි යම් විධිවිධානයක් 3 වන වගන්තියේ සඳහන් යම් විශේෂ ලාභ හෝ ආදායම් මාර්ගයකට ප්‍රකාශිතවම අදාළ වන අවස්ථාවක ඒ විධිවිධානය, ඒ වගන්තියෙහි සඳහන් කරනු ලැබූ වෙනත් මාර්ගයකින් ලැබෙන ලාභ හෝ ආදායම් නිශ්චය කිරීමෙහිලා අදාළ කර නොගත යුතු ය.

ඇතැම් ලාභාංශවලින් ලැබෙන ආදායමෙහි ඒ පිළිබඳ වූ අයබදු ද ඇතුළත් විය යුතු බව.

88. 83 වන වගන්තියේ අර්ථානුකූල ව පෞද්ගලික සමාගමක් විසින් ගෙවනු ලැබූ. ලාභාංශවලින් යම් තැනැත්තකුට ලැබෙන ආදායම, ඒ ලාභාංශවලින් එවැනි යම් බද්දක් අඩු කරගනු ලැබූ අවස්ථාවක, එකී අඩු කිරීම කරනු ලැබීමට පෙර වූ දළ මුදල විය යුතු ය. එලෙස අඩු කිරීමක් කර නොමැති අවස්ථාවක, ඒ ලාභාංශයෙන් ලැබෙන ආදායම, ඒ ලාභාංශ ගෙවනු ලැබූයේ යම් ලාභයකින් ද ඒ ලාභ එකී බද්දට යටත් කරනු ලැබූ ප්‍රමාණයට අනුරූප යම් බදු වෙනුවෙන් වූ මුදල එක් කිරීමෙන් වැඩි කරනු ලැබූ ලාභාංශයේ මුදල විය යුතු ය.

රක්ෂණයෙන් ලැබෙන ඇතැම් ලැබීම් කෙසේ සලකනු ලැබිය යුතු ද යන වග.

89. රක්ෂණ වාරිකයක් වශයෙන් ගෙවන ලද යම් මුදලක් යම් ප්‍රභවයකින් ලාභ හෝ ආදායම් ඉපැයීමෙහි ලා දරන්නට සිදු වූ වියදමක් වශයෙන් අඩු කිරීමට ඉඩ දී ඇති අවස්ථාවක, ඒ රක්ෂණ ගිවිසුම යටතේ ලබාගත් යම් මුදලක්, ඒ මුදල ලබාගත් තක්සේරු වර්ෂය සඳහා එකී ප්‍රභවයෙන් ලැබුණු ලාභවල හෝ ආදායම්වල කොටසක් ලෙස සැලකිය යුතු ය.

සමාජ ශාලාවල හා වෙළෙඳ සමිති ආදියෙහි ආදායම් නිශ්චය කිරීම.

90. (1) සංස්ථාගත කළ හෝ නොකළ යම් පුද්ගල මණ්ඩලයක් විසින් සමාජ ශාලාවක් හෝ ඒ හා සමාන ආයතනයක් පවත්වා ගෙන යන්නා වූ ද (ඇතුළුවීමේ ගාස්තු හා දායක මුදල් ඇතුළු ව) එකී අයහාර ගිණුමට ලැබෙන දළ ලැබීම්වලින් හතරෙන් තුන් කොටසකට අඩු නොවන මුදල් ප්‍රමාණයක් එහි සාමාජිකයන්ගෙන් ලැබෙන්නාවූ ද අවස්ථාවක, එම පුද්ගල මණ්ඩලය විසින් වෙළෙඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යන ලෙස නොසැලකිය යුතු ය; එහෙත් එකී දළ ලැබීම්වලින් හතරෙන් තුන් කොටසකට අඩු මුදලක් (ඇතුළුවීමේ ගාස්තු හා දායක මුදල් ඇතුළුව) සාමාජිකයන්ගෙන් ලැබෙන අවස්ථාවක සාමාජිකයන් සමඟ හා අන් අය සමඟ කරනු ලැබූ ගනුදෙනුවලින් ලැබෙන සම්පූර්ණ ආදායම වෙළෙඳ ව්‍යාපාරයකින් ලැබෙන ලැබීම් ලෙස සැලකිය යුතු ය. එසින් ලැබෙන ලාභ ද ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාරයක් පවත්වාගෙන යන ලෙස නොසැලකුවහොත් එහි තක්සේරු කළ හැකි ආදායම ද සම්බන්ධයෙන් ඒ පුද්ගල මණ්ඩලය ආදායම් බදු අය කරනු ලැබීමට යටත් විය යුතු ය.

(2) සංස්ථාගත කළ හෝ නොකළ යම් පුද්ගල මණ්ඩලයක් විසින් වෙළෙඳ සංගමයක් හෝ වෙළෙඳ මණ්ඩලයක් හෝ ඒ හා සමාන ආයතනයක් පවත්වාගෙන යන විට එහි ඇතුළුවීමේ ගාස්තු හා දායක මුදල වශයෙන් වූ ලැබීම්වලින් දෙකෙන් එක් කොටසකට වැඩි ප්‍රමාණයක් ඒ ඇතුළුවීමේ ගාස්තු සහ දායක මුදල් 23 වන වගන්තියේ කාර්ය සඳහා ඉඩ හැරිය හැකි අඩු කිරීම් බව කියා සිටින හෝ එසේ කියා සිටීමට හිමිකම් ඇති තැනැත්තන්ගෙන් ලැබෙන අන්දමේ තත්ත්වයක් පවත්නා වූ අවස්ථාවක ඒ පුද්ගල මණ්ඩලය විසින් වෙළෙඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යන ලෙස සැලකිය යුතු ය. තව ද සාමාජිකයන් සමඟ සහ අන් තැනැත්තන් සමඟ කරනු ලබන ගනුදෙනුවලින් ලැබෙන (ඇතුළුවීමේ ගාස්තු හා දායක මුදල් ඇතුළු) එහි මුළු ආදායම වෙළෙඳ ව්‍යාපාරයකින් ලැබෙන ලැබීම් ලෙස සැලකිය යුතු ය. තව ද එහි ලාභය හෝ පුද්ගල මණ්ඩලය ව්‍යාපාරයක් පවත්වාගෙන යන ලෙස නොසැලකුවහොත් එහි තක්සේරු කරනු ලැබිය හැකි ආදායම යන දෙකෙන් වැඩි ගණන සම්බන්ධයෙන් ඒ පුද්ගල මණ්ඩලය ආදායම් බදු අය කරනු ලැබීමට යටත් විය යුතු ය.

(3) මේ වගන්තියෙහි "සාමාජිකයෝ" යන්න පුද්ගල මණ්ඩලයක් සම්බන්ධයෙන් යෙදුනු විට මණ්ඩලයේ කටයුතු පිළිබඳව සක්‍රිය පාලනයක් ක්‍රියාත්මක කෙරෙන එහි මහා සභා රැස්වීමක දී ඡන්දය දීමට හිමිකම් ඇති තැනැත්තෝ එසින් අදහස් වෙති.

(4) මේ වගන්තියේ ඇතුළත් කිසිවක්, III වන පරිච්ඡේදය යටතේ ප්‍රදානය කරන ලද යම් නිදහස් කිරීමකට බලපාන සේ කියවා නොගත යුතු ය.

ඇතැම් ගනුදෙනු හා බැහැර කිරීම් සැලකිල්ලට නොගත යුතු බව.

91. යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු බදු මුදල අඩුකරවන හෝ අඩු කිරීමේ ප්‍රතිඵලය ඇති යම් ගනුදෙනුවක් කෘත්‍රිම බව හෝ ව්‍යාජ බව හෝ යම් බැහැර කිරීමක් ඇත්ත වශයෙන් ම ක්‍රියාත්මක කරනු නොලැබූ බව තක්සේරුකරුවකුගේ මතය වන අවස්ථාවක ඔහු විසින්, එම ගනුදෙනුව හෝ බැහැර කිරීම සැලකිල්ලට නොගෙන සිටිය හැකි අතර, ඒ ගනුදෙනුවේ හෝ බැහැර කිරීමේ පාර්ශ්වකරු වන් ඒ අනුව තක්සේරු කරනු ලැබිය හැකි විය යුතු ය.

මේ වගන්තියේ "බැහැර කිරීම" යන්නට යම් භාරයක්, ප්‍රදාන යක්, ප්‍රතිඥප්තියක්, එකඟවීමක් හෝ වැඩ පිළිවෙලක් ඇතුළත් වේ.

XIII වන පරිච්ඡේදය

වාර්තා යනාදිය

වාර්තා හා තොරතුරු සැපයිය යුතු බව.

92. (1) යම් තක්සේරු වර්ෂයක් සඳහා මේ පනත යටතේ ආදායම් බදු, ධන බදු හෝ ත්‍යාග බදු ගෙවීමට යටත් සෑම තැනැත්තකු විසින් ම, ඒ තක්සේරු වර්ෂයේ අවසානයට පසුව එන නොවැම්බර් මාසයේ නිස්වන දින හෝ ඊට පෙර, තමාගේ ආදායම, ධනය හෝ තමා විසින් දෙන ලද ත්‍යාග පිළිබඳව ද තමාට දරුවකු සිටී නම් ඒ දරුවාගේ ආදායම හා ධනය පිළිබඳව ද කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව නියම කරනු ලැබිය හැකි යම් ආකෘතියක හා එසේ නියමිත තොරතුරු ඇතුළත් වාර්තාවක් තක්සේරුකරුවකුට සැපයිය යුතු ය.

(2) තක්සේරුකරුවකු විසින්, ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින්, ඒ දැන්වීමේ නිශ්චය කොට දැක්වෙන කාලසීමාව ඇතුළත, කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව නියම කරනු ලැබිය හැකි ආකෘතියක හා එසේ නියම කරනු ලැබිය හැකි තොරතුරු ඇතුළත් වාර්තාවක් තමාගේ ආදායම, ධනය හෝ ත්‍යාග පිළිබඳව සහ තමාට දරුවකු සිටිනම් ඒ දරුවාගේ ආදායම හෝ ධනය පිළිබඳව සපයන ලෙස, නියම කරමින් කවර වූ හෝ පුද්ගලයකුට දැනුම් දිය හැකි ය.

(3) අවශ්‍යයැයි තක්සේරුකරුවකු අදහස් කරන අවස්ථාවක හෝ එසේ අදහස් කරන සෑම විටකම, දැන්වීමේ නියමිත කාලය අතුළත—

(අ) වඩා සම්පූර්ණ හෝ වැඩිදුර වාර්තා; හෝ

(ආ) ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු ආදායම් බදු, ධන බදු හෝ ත්‍යාග බදු තක්සේරු කිරීම සඳහා තක්සේරුකරුගේ මතය අනුව අවශ්‍ය හෝ අදාළ විය හැකි යම් කරුණකට අදාළ වඩා සම්පූර්ණ සහ වැඩිදුර තොරතුරු

තමා වෙත සපයන ලෙස නියම කරන ලිඛිත දැන්වීමක්, තක්සේරු කරු විසින් යම් තැනැත්තකුට භාර දිය හැකි ය.

(4) යම් තැනැත්තකුගේ ආදායම, ධනය හෝ ත්‍යාග පිළිබඳව සම්පූර්ණ තොරතුරු ලබා ගැනීමේ කාර්යය සඳහා ඒ තැනැත්තාට—

(අ) දැන්වීමෙහි සඳහන් වූ ද ඔහුගේ සන්තකයෙහි ඇත්තා වූ ද යම් ඔප්පු, පිංචිරු, සාධන පත්‍ර, පොත්, ගිණුම්, වෙළෙඳ ලැයිස්තු, බඩු තොග ලැයිස්තු, ලේඛන, චෙක්පත්, බැරපත්,

විගණක වාර්තා හෝ වෙනත් යම් ලියකියවිලි පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කරන ලෙස හෝ තක්සේරුකරු වෙත ප්‍රේෂණය කරන ලෙස නියම කෙරෙන; සහ

(ආ) ඔහුගේ ආදායම, ධනය හෝ ත්‍යාග පිළිබඳ විමසීමේ කාර්ය සඳහා දැන්වීමෙහි නියමිත ස්ථානයකදී එහි නියමිත වේලාවේදී හා දිනයෙහි දී පෞද්ගලිකව ම හෝ ඔහු විසින් බලය දෙන ලද නියෝජිතයකුගේ මාර්ගයෙන් හෝ පෙනී සිටින ලෙස නියම කෙරෙන

ලිඛිත දැන්වීමක් තක්සේරුකරුවකු විසින් කළ හැකි ය.

(5) මේ පනතේ කාර්ය සඳහා නියෝජ්‍ය කොමසාරිස්වරයකු විසින් යම් තැනැත්තකුට—

(අ) දැන්වීමෙහි සඳහන් කරනු ලැබිය හැකි යම් කරුණක් සම්බන්ධයෙන් විමසනු ලැබීම සඳහා දැන්වීමෙහි සඳහන් වේලාවේදී එහි සඳහන් දිනයේ දී හා ස්ථානයේ දී පෞද්ගලිකව ම හෝ ඔහු විසින් බලය දෙන ලද නියෝජිතයකු මඟින් හෝ පෙනී සිටින ලෙස නියම කෙරෙන; හෝ

(ආ) දැන්වීමෙහි සඳහන් වූ ද ඔහුගේ සන්තකයෙහි ඇත්තා වූ ද යම් ඔප්පු, පිඹුරු, සාධන පත්‍ර, පොත්, ගිණුම්, වෙළෙඳ ලැයිස්තු, බඩු තොග ලැයිස්තු, ලේඛන, චෙක්පත්, බැරපත්, විගණක වාර්තා හෝ වෙනත් යම් ලේඛන එකී නියෝජ්‍ය කොමසාරිස්වරයාට ඉදිරිපත් කරන ලෙස හෝ ප්‍රේෂණය කරන ලෙස නියම කෙරෙන

ලිඛිත දැන්වීමක් කළ හැකි ය.

(6) (5) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ දැන්වීමක් අනුව පෙනී සිටින යම් තැනැත්තකුට, එසේ පෙනී සිටීමෙහි ලා දරන්නට සිදුවූ යුක්ති සහගත වියදම්වලට කොමසාරිස් ජනරාල්වරයා විසින් ඉඩ දෙනු ලැබිය හැකි ය.

(7) (5) වන උපවගන්තිය යටතේ නියෝජ්‍ය කොමසාරිස්වරයකු වෙත හෝ තක්සේරුකරුවකු වෙත ඉදිරිපත් කරන හෝ ඉදිරිපත් කරනු ලැබූ හෝ ඔහු වෙත ප්‍රේෂණය කරනු ලැබූ හෝ (4) වන උපවගන්තිය යටතේ තක්සේරුකරුවකු වෙත ඉදිරිපත් කරනු ලැබූ නැතහොත් ප්‍රේෂණය කරනු ලැබූ එසේ නැතහොත් වෙනත් මාර්ගයකින් ඔහුගේ සන්තකයට පත්වන නැතහොත් පත්වී ඇති යම් ඔප්පු, පිඹුරු, සාධන පත්‍ර, පොත්, ලේඛන, වෙළෙඳ ලැයිස්තු, චෙක්පත්, බැරපත්, විගණක වාර්තා හෝ වෙනත් ලේඛන, මේ පනතේ කාර්ය සඳහා රඳවා ගැනීමට අවශ්‍ය තැක් කල් නියෝජ්‍ය කොමසාරිස්වරයකු විසින් හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයකුගේ අනුමතිය ඇතිව තක්සේරුකරුවකු විසින් හෝ තමාගේ භාරයෙහි රඳවා ගත හැකි ය.

(8) යම් තැනැත්තකු විසින් හෝ යම් තැනැත්තකු වෙනුවෙන් හෝ මේ පනත යටතේ සපයනු ලැබූ ලෙස සැලකෙන යම් වාර්තාවක්, ප්‍රකාශයක් හෝ සහතිකයක්, පටහැනි තත්ත්වය ඔප්පු කරනු

ලැබුවහොත් මිස, අවස්ථාවෝචිත පරිදි ඒ තැනැත්තා විසින් හෝ ඔහුගේ බලය පිට හෝ සපයනු ලැබූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය. ඒ වාර්තාවේ, ප්‍රකාශයේ හෝ සහතිකයේ අත්සන් තබන යම් තැනැත්තකු එහි ඇතුළත් සියලු කරුණු දන්නා ලෙස සලකනු ලැබිය යුතු ය.

වෙනත් තැනැත්තන් ගේ ගණකට ලබාගත් හෝ වෙනත් තැනැත්තන් ම ගෙවනු ලැබූ ආදායම් පිළිබඳව වාර්තා සැපයිය යුතු බව.

93. කිනම් තත්ත්වයකින් වුවද යම් තැනැත්තකු—

(අ) වෙනත් යම් තැනැත්තකුට උපචිත වූ හෝ උද්ගතවූ ද මේ පනතේ අර්ථානුකූලව බද්දට යටත් වූ ද යම් ලාභ හෝ ආදායමක් ලැබූ අවස්ථාවක හෝ

(ආ) එබඳු ලාභ හෝ ආදායම් වෙනත් යම් තැනැත්තකුට හෝ වෙනත් යම් තැනැත්තකුගේ අණට ගෙවූ අවස්ථාවක

දැන්වීමෙහි නියමිත කාලය ඇතුළත පහත දැක්වෙන කරුණු එනම් :—

(i) එබඳු සියලු ම ලාභ හා ආදායම් පිළිබඳව සත්‍ය වූත් නිවැරදි වූත් ප්‍රකාශයක්, හා

(ii) ඒ ලාභ හා ආදායම් උපචිත වූයේ හෝ උද්ගත වූයේ යම් තැනැත්තකුට ද ඒ සෑම තැනැත්තකුගේම නම සහ ලිපිනය ඇතුළත් වාර්තාවක් සපයන ලෙස නියම කැරෙන දැන්වීමක් තක්සේරුකරු විසින් පළමු කී තැනැත්තාට දිය හැකි ය.

ගෙවිය යුතු කුලී පිළිබඳ වාර්තා පදිංචිකරු විසින් සැපයිය යුතු බව.

94. දැන්වීමෙහි නියමිත කාලය ඇතුළත පහත සඳහන් කරුණු ඇතුළත් වාර්තාවක් සපයන ලෙස නියම කැරෙන ලිඛිත දැන්වීමක්, යම් ඉඩමක හෝ ගොඩනැගිල්ලක පදිංචිකරුවකු වන යම් තැනැත්තකුට, තක්සේරුකරුවකු විසින් දිය හැකි ය.

(අ) ඒ ඉඩමේ හෝ ගොඩනැගිල්ලේ අයිතිකරුගේ නම හා ලිපිනය;

(ආ) ඒ ඉඩම හෝ ගොඩනැගිල්ල සම්බන්ධයෙන් කරනු ලැබූ යම් වැඩ දියුණු කිරීම් හා

(ඇ) ගෙවිය යුතු කුලිය හා ඒ කුලියට සම්බන්ධ අනමාරු වූ වෙනත් යම් ප්‍රතිඥාවක් පිළිබඳ සත්‍යවූත් නිවැරදිවූත් ප්‍රකාශයක්.

නවාතැන්කරුවන් හා නේවාසිකයන් පිළිබඳ වාර්තා.

95. දැන්වීමේ දිනයේ දී තම් නිවාසයෙහි, හෝටලයෙහි හෝ ආයතනයෙහි පදිංචි ව සිටින්නා වූ ද තාවකාලික බැහැර යෑම් අත්හැර, ඒ දිනයට පෙරාතුව වූ තුන් මාසය මුළුල්ලේ ම එසේ පදිංචි ව සිටියා වූ ද සෑම නවාතැන්කරුවකුගේ හෝ නේවාසිකයකුගේ නම ඇතුළත් වාර්තාවක්, දැන්වීමෙහි නියමිත කාලසීමාව ඇතුළත සැපයිය යුතු යැයි නියම කැරෙන ලිඛිත දැන්වීමක්, තක්සේරුකරුවකු විසින් යම් තැනැත්තකුට දිය හැකි ය.

වාර්තා සැපයීම පැහැර හැරීම සම්බන්ධයෙන් දණ්ඩනයක් නියම කිරීමට කොමසාරිස් ජනරාල් වරයාට ඇති බලය.

96. (1) තමාගේ ආදායම, ධනය හෝ ත්‍යාග පිළිබඳව ද තමාට දරුවකු සිටි නම් ඒ දරුවාගේ ආදායම හෝ ධනය පිළිබඳව ද වාර්තාවක් සපයන ලෙස නියම කරමින් තක්සේරුකරුවකු විසින් 92 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ දෙනු ලැබූ ලිඛිත දැන්වීමක් අනුව ක්‍රියා කිරීම යම් තැනැත්තකු විසින් පැහැර හරින ලද්දේ හෝ 92 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සැපයීමට නියමිත වාර්තාවක් සැපයීම යම් තැනැත්තකු විසින් පැහැර හරින ලද්දේ හෝ අවස්ථාවක, කොමසාරිස් ජනරාල්වරයා විසින්, ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින්—

(අ) ඒ තැනැත්තා විෂයෙහි රුපියල් එක් දහසක් නොඉක්මවන මුදලක දණ්ඩනයක් නියම කළ හැකි ය;

(ආ) ඒ දැන්වීමෙහි නිශ්චය කොට, දක්වනු ලැබිය හැකි කාල සීමාවක් ඇතුළත

(i) ඒ දණ්ඩන මුදල ගෙවන ලෙස; සහ

(ii) ඒ වාර්තාව සපයන ලෙස,

නියම කළ හැකි ය.

(2) යම් තැනැත්තකුට වාර්තාව සැපයීමට නොහැකිවූයේ තමාගේ පාලනයෙන් බැහැර වූ කරුණක් හේතුවෙන් බවත්, දණ්ඩනය නියම කිරීමෙන් පසුව වාර්තාව සපයා ඇති බවත් කොමසාරිස් ජනරාල් වරයා සෑහීමට පත්වන පරිදි ඒ තැනැත්තා ඔප්පු කළොත් මේ වගන්තිය යටතේ ඒ තැනැත්තාට නියම කරන ලද දණ්ඩනය කොමසාරිස් ජනරාල්වරයා විසින් අඩු කළ හෝ ඉවත් කළ හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකුට දණ්ඩනයක් නියම කරනු ලැබූ අවස්ථාවක, ඒ දැන්වීම හෝ නියමය සම්බන්ධයෙන් 151 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය හෝ (ඇ) ඡේදය යටතේ වූ වරදක් සඳහා නඩු පැවරීමකට ඔහු යටත් නොවිය යුතු ය.

XIV වන පරිච්ඡේදය
ස්වයං තක්සේරු කිරීමෙන් බද්ද ගෙවීම

ස්වයං තක්සේරු කිරීමෙන් බද්ද ගෙවීම.

97. (1) යම් තක්සේරු වර්ෂයක් සඳහා මේ පනත යටතේ යම් තැනැත්තකු ගෙවීමට යටත් යම් ආදායම් බද්දක්, ධන බද්දක් හෝ ත්‍යාග බද්දක්, තක්සේරුකරුවකු විසින් තමා සම්බන්ධයෙන් කිසිම තක්සේරුවක් කරනු ලැබ නොතිබුණ ද, පිළිවෙළින් ඒ තක්සේරු වර්ෂයේ අගෝස්තු, නොවැම්බර් සහ පෙබරවාරි මාසවල පහළොස්වන දින හෝ ඊට පෙර ද ඊළඟට එළඹෙන තක්සේරු වර්ෂයේ මැයි මස පහළොස්වන දින හෝ ඊට පෙර ද වාර කොටස් හතරකින් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඒ තැනැත්තා විසින් ගෙවනු ලැබිය යුතු ය. ඒ එක් එක් වාර කොටස මෙහි මින් මතු "ත්‍රෛමාසික වාරිකයක්" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

(2) යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු බද්දක ත්‍රෛමාසික වාරිකය, ඒ තක්සේරු වර්ෂය සඳහා ඔහු විසින් ගෙවනු ලැබිය යුතු බද්දෙන් එක් හතරෙන් කොටසක් විය යුතු ය.

XV වන පරිච්ඡේදය

සේවායෝජකයන් විසින් සේවානියුක්තයන්ගේ පාරිශ්‍රමිකයෙන් ආදායම් බද්ද අඩු කිරීම

සේවා යෝජකයන් විසින් ආදායම් බද්ද අඩු කළ යුතු බව.

98. (1) එක් එක් වැටුප් කාලසීමාව සඳහා පාරිශ්‍රමික ගෙවන අවස්ථාවේ දී සෑම සේවායෝජකයකු විසින් තම සේවානියුක්තයන්ගේ පාරිශ්‍රමිකවලින් ආදායම් බද්ද මේ පරිච්ඡේදයෙහි විධිවිධානවලට අනුකූලව අඩු කරනු ලැබිය යුතු ය.

(2) සේවානියුක්තයකුගේ පාරිශ්‍රමිකයෙන් (1) වන උපවගන්තිය යටතේ අඩු කරන ලද ආදායම් බද්ද ඒ සේවානියුක්තයා විසින් ඒ අඩු කිරීම කරන ලද දින කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

සේවා යෝජකයන් විසින් කොමසාරිස් ජනරාල් වරයා වෙත දැන්වීමක් කළ යුතු බව.

99. (1) (අ) මාසයකට රුපියල් එක් දහසකට හෝ වර්ෂයකට රුපියල් දොළොස් දහසකට වැඩි පාරිශ්‍රමිකයක් ලබන යම් පුද්ගලයකු; හෝ

(ආ) ශ්‍රී ලංකාවෙහි කරනු ලබන සේවය වෙනුවෙන් මාසයකට රුපියල් අසූපහකට හෝ වර්ෂයකට රුපියල් එක් දහසකට වැඩි පාරිශ්‍රමිකයක් ලබන යම් නිර්වාසික තැනැත්තකු

සේවයෙහි යොදවන්නා වූ ද, 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 107ඇ(1) වන වගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම්දීමක් කර නොමැත්තා වූද සෑම සේවායෝජකයකු විසින් ම, (මේ පරිච්ඡේදයෙහි මින්මතු "නිශ්චිත සේවානියුක්තයා" යනුවෙන් සඳහන් කරනු ලබන) එවැනි තැනැත්තකු තම සේවයෙහි නියුක්තව සිටින බව 1979 ජූනි මස 15 වන දින පසු නොවී කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම් දිය යුතු ය.

(2) සේවායෝජකයකු විසින් යම් නිශ්චිත සේවානියුක්තයකු සේවයෙහි නියුක්ත කරවීම හෝ යම් නිශ්චිත සේවානියුක්තයකුට පාරිශ්‍රමික ගෙවීම ආරම්භ කරනු ලබන අවස්ථාවක, ඒ සේවායෝජකයා විසින්, ඒ සේවානියුක්තයා තම සේවානියුක්තියෙහි සිටින බව, අවස්ථාවෝචිත පරිදි, ඒ සේවානියුක්තිය හෝ ඒ ගෙවීම ආරම්භ කිරීමෙන් දින හතක් ඇතුළත කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම් දිය යුතු ය:

එසේ වුව ද මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධාන, (1) වන උපවගන්තිය යටතේ දැනුම් දීමක් කළ සේවායෝජකයකු සම්බන්ධයෙන්, අදාළ නොවිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ සේවායෝජකයකු විසින් කරන ලද යම් දැනුම් දීමක් කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලබන යම් ආකෘතියකින් විය යුතු අතර එසේ ම නියම කරනු ලබන යම් විස්තර එහි ඇතුළත් විය යුතු ය.

(4) සේවායෝජකයකු විසින් (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ දැනුම්දීමක් කිරීම පැහැර හරිනු ලැබුව ද එය නොතකා ඒ සේවා යෝජකයා විසින් මේ පරිච්ඡේදයේ විධිවිධානවලට අනුකූලව තම නිශ්චිත සේවානියුක්තයන් එක් එක් කෙනාගේ පාරිශ්‍රමිකයෙන් ආදායම් බද්ද අඩු කළ යුතු ය.

ආදායම් බදු චක්‍ර අදාළ කිරීම.

100. (1) 98 වන වගන්තිය ප්‍රකාර යම් තක්සේරු වර්ෂයක් සඳහා සේවායෝජකයකු විසින් අඩු කළ යුතු ආදායම් බදු ප්‍රමාණය, කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිත, ඒ තක්සේරු වර්ෂයට අදාළ ආදායම් බදු චක්‍රවලට අනුකූලව විය යුතු ය.

(2) සේවානියුක්තියෙන් ලබන නිත්‍ය ලාභ සම්බන්ධයෙන්, සෑම සේවානියුක්තයකුගේ ම ගෙවීම් කාලසීමාවක් සඳහා වූ පාරිශ්‍රමික වලින්, සේවානියුක්තියෙන් ලබන නිත්‍ය ලාභ සඳහා අදාළ වන බදු චක්‍රයට අනුකූලව, ඒ ගෙවීම් කාලසීමාව වෙනුවෙන් ආදායම් බද්ද අය කරගනු ලැබිය යුතු ය. තව ද ගෙවීම් කාලසීමාවක් සම්බන්ධයෙන් ඒ සියලු ලාභ එකතු කළ යුතු අතර, ආදායම් බදු චක්‍රය අදාළ කිරීමේ කාර්ය සඳහා ඒ ලාභ එක් ගෙවීමක් ලෙස සලකනු ලැබිය යුතු ය.

යම් ගෙවීම් කාලසීමාවක් වෙනුවෙන් සේවානියුක්තියෙන් ලබන නිත්‍ය ලාභවලට—

(අ) ඒ ගෙවීම් කාලසීමාව වෙනුවෙන් ගෙවිය යුතු වේතන, වැටුප්, දීමනා හෝ විශ්‍රාම වැටුප්, හෝ ඒ ගෙවීම් කාල සීමාව වෙනුවෙන් උපදින්නා වූ හෝ විධිමත් ලෙස උපචිත වන්නා වූ ද ගෙවිය යුතු වූ ද ඒ සේවානියුක්තියෙන් ලබන වෙන යම් ලාභ;

(ආ) 4 (ඈ) වන වගන්තියෙහි සඳහන් සේවානියුක්තියෙන් ලබන යම් ලාභ හා, ඒ ගෙවීම් කාලසීමාව වෙනුවෙන් උපදින හෝ උපචිත වන (3) වන සහ (4) වන උපවගන්තිවල සඳහන් අතිරේක ආදායම් හෝ අර්ථ ලාභ නොවන වෙනත් අතිරේක ආදායම් හෝ අර්ථ ලාභ වශයෙන් සේවානියුක්තියෙන් ලබන යම් ලාභ; සහ

(ඇ) (අ) ඡේදයෙහි හෝ (ආ) ඡේදයෙහි හෝ 4 (ඇ) වන වගන්තියෙහි ඇතුළත් කරනු නොලැබූ සේවානියුක්තියෙන් ලබන ලාභවල මුළු එකතුව ඒ ගෙවීම් කාලසීමාව සඳහා රුපියල් පන්සියයක් නොඉක්මවන අවස්ථාවක, ඒ ලාභ

ඇතුළත් විය යුතු ය.

(3) 4 (ඈ) වන වගන්තියෙහි සඳහන් සේවානියුක්තියෙන් ලබන ලාභවලට අදාළ ආදායම් බදු චක්‍රය අනුව ඒ ලාභ සම්බන්ධයෙන් ආදායම් බද්ද අඩු කරනු ලැබිය යුතු ය.

(4) ප්‍රසාද මුදල්, කොමිස් මුදල් හෝ ඒ හා සමාන ස්වභාවයෙන් යුත් වෙන යම් අර්ථ ලාභ වශයෙන් සේවානියුක්තයකු සේවානියුක්තියෙන් ලබන යම් ලාභ සම්බන්ධයෙන් ඒ ලාභවලට අදාළ ආදායම් බදු චක්‍රය අනුව ආදායම් බද්ද අඩුකරනු ලැබිය යුතු ය.

(5) ආදායම් බදු චක්‍ර වෙනස් කරනු ලැබූ අවස්ථාවක, වෙනස් කරන ලද ඒ ආදායම් බදු චක්‍ර ක්‍රියාත්මක වන දිනට පසුව එළඹෙන ගෙවීම් කාලසීමාවේ සිට ඒ වෙනස් කරනු ලැබූ ආදායම් බදු චක්‍ර අදාළ විය යුතු ය.

(6) සේවානියුක්තියෙන් ලබන යම් ලාභ ගෙවනු නොලබන නමුදු සේවානියුක්තයකුගේ ගිණුමට හෝ ඔහුගේ අර්ථ ලාභය සඳහා හෝ සේවානියුක්තයකු වෙනුවෙන් වෙන යම් තැනැත්තකුගේ ගිණුමට හෝ ඔහුගේ අර්ථ ලාභය සඳහා බැර කරනු ලබන හෝ යොදනු ලබන අවස්ථාවක, ඒ ලාභ එසේ බැර කරනු ලැබූ හෝ යොදනු ලැබූ අවස්ථාවේ. ඒ ලාභ එකී සේවානියුක්තයාට ගෙවනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(7) සේවානියුක්තයකුගේ පාරිශ්‍රමික මාස්පතා නොගෙවනු ලබන අවස්ථාවක, එක් එක් ලිත් මාසයක් තුළ කරනු ලැබූ ගෙවීම් වල එකතුව මාසික ගෙවීමක් ලෙස සැලකිය යුතු අතර, පාරිශ්‍රමික මාස්පතා ගෙවනු ලබන සේවානියුක්තයකු ලෙස ඒ සේවානියුක්තයා සලකනු ලැබිය යුතු ය. තව ද ඒ ගෙවීම්වලට උචිත ආදායම් බද්ද ඒ මාසය තුළ කරන ලද ගෙවීම් එකකින් හෝ වැඩි ගණනකින් අඩුකරනු ලැබිය හැකි ය:

එසේ වුව ද සේවායෝජකයකු හෝ සේවානියුක්තයකු විසින් ඉල්ලුම් කරනු ලැබූ විට, කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ අඩු කිරීම කළ යුතු වෙන යම් ක්‍රමයක් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ය.

(8) මේ පරිච්ඡේදයේ කාර්ය සඳහා, යම් සේවානියුක්තයකුට ගෙවනු ලබන යම් කොමිස් මුදලක් ඒ ගෙවීම කරන දින සේවානියුක්තියෙන් උපදින ලාභ ලෙස සලකනු ලැබිය යුතු ය.

(9) යම් ගෙවීම් කාලසීමාවක් සඳහා අනික් නිත්‍ය පාරිශ්‍රමික ගෙවන අවස්ථාවේ දී ම ඒ ගෙවීම් කාලසීමාව තුළ කරන ලද අතිකාල වැඩ සඳහා ගෙවීම් කිරීම සේවායෝජකයකු වීසින් කළ නොහැකි බවට ඒ සේවායෝජකයා කරුණු ඉදිරිපත් කරමින් කළ ඉල්ලීමක් අනුව කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත් වූ අවස්ථාවක, ආදායම් බද්ද අඩුකිරීමේ ප්‍රමාණය නිශ්චය කිරීමේ කාර්යය සඳහා ඒ අතිකාල වැඩ සම්බන්ධයෙන් ඒ සේවානියුක්තයාට කරනු ලැබූ ගෙවීම් ඊළඟට එළඹෙන ගෙවීම් කාලසීමාව තුළ ඒ සේවානියුක්තයාගේ නිත්‍ය පාරිශ්‍රමික සමග එකතු කරනු ලැබිය යුතු ය.

(10) සේවායෝජකයකු විසින් සේවානියුක්තයකු සේවයෙහි නියුක්තකරවීම සම්බන්ධයෙන් ඒ සේවානියුක්තයා මිය යාමෙන් පසු ඒ සේවායෝජකයා විසින් යම් පාරිශ්‍රමිකයක් ගෙවනු ලැබුව හොත්, ඒ සේවායෝජකයා විසින් ඒ ගෙවීම කිරීමේ දී, මියගිය සේවානියුක්තයා තමා විසින් එතෙක් සේවයෙහි නියුක්ත කරවනු ලැබ සිටියාක් මෙන්, ආදායම් බද්ද අඩු කළ යුතු ය.

සේවා සේවායෝජකයන් ට විධාන.

101. (1) තම සේවායෝජකයා විසින් මේ පරිච්ඡේදයේ විධි විධානවලට අනුකූලව තම පාරිශ්‍රමිකයෙන් ආදායම් බද්ද අඩු කරනු ලැබූ යම් සේවානියුක්තයකු විසින්, යම් තක්සේරු වර්ෂ යක් සඳහා තමා විසින් ගෙවනු ලැබිය යුතු ආදායම් බදු ප්‍රමාණය මේ පරිච්ඡේදය යටතේ අඩු කළ හැකි ආදායම් බද්දට වඩා අඩු නම්, හෝ තමාගේ පාරිශ්‍රමිකයෙන් අඩු කළ යුතුව තිබූ ප්‍රමාණයට වඩා ආදායම් බද්ද අඩු කරනු ලැබ ඇත්නම්, ඒ තක්සේරු වර්ෂය සඳහා ආදායම් බද්ද අඩු කිරීමෙහි ලා අවශ්‍ය අනුකූලනය කිරීම් කළ යුතු බවට ඔහුගේ සේවායෝජකයාට විධානයක් නිකුත් කරන ලෙස, කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලබන ආකෘතියක වූ හා එසේ නියම කරනු ලබන විස්තර ඇතුළත් ඉල්ලීමක්, කොමසා රිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ හැකි ය.

(2) සේවානියුක්තයකු විසින් (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් කරනු ලැබූ කල්හි, (සේවානියුක්තයාට පිටපතක් නිකුත් කරනු ලැබිය යුතු) ලියවිල්ලකින් වූ අවශ්‍ය විධානය ඒ සේවානියුක් තයාගේ සේවායෝජකයාට නිකුත් කිරීම කොමසාරිස් ජනරාල් වරයා විසින් හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු විසින් කළ හැකි අතර ඒ සේවායෝජකයා විසින් එකී විධානයට අනුකූලව එකී සේවානියුක්තයාගේ පාරිශ්‍රමිකයෙන් ආදායම් බද්ද අඩු කළ යුතු ය:

එසේ වුව ද නිකුත් කරන ලද එවැනි යම් විධානයක් කවර වූ හෝ අවස්ථාවක දී වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) මේ පනත යටතේ යම් සේවානියුක්තයකුගෙන් ආදායම් බද්ද අය කර ගනු ලැබිය හැකි ද ඒ සේවානියුක්තයා සම්බන්ධ යෙන් කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු විසින් හෝ ඒ සේවානියුක්තයාගේ සේවායෝජක වන තැනැත්තා වෙත ලියවිල්ලකින් කරනු ලබන (පිටපතක් ඒ සේවානියුක්තයා වෙත නිකුත් කළ යුතු) විධානය කින් මේ පනත යටතේ ගෙවිය යුතු ආදායම් බද්ද එම සේවානියුක් තයාගේ පාරිශ්‍රමිකයෙන් ඒ විධානයට අනුකූලව අඩු කරන ලෙස නියම කරමින් විධානයක් නිකුත් කරනු ලැබිය හැකි අතර එම විධානයට අනුකූලව ඒ තැනැත්තා විසින් ඒ සේවානියුක්තයාගේ පාරිශ්‍රමිකයෙන් ඒ ආදායම් බද්ද අඩු කළ යුතු ය:

එසේ වුව ද එවැනි යම් විධානයක් කවර වූ හෝ අවස්ථාවක දී වෙනස් කරනු ලැබිය හැකි ය.

මේ පරිච්ඡේදයේ කාර්ය සඳහා මේ වගන්තිය යටතේ විධානයක් නිකුත් කරනු ලැබුවේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තා "නිශ්චිත සේවානියුක්තයකු" ලෙස සැලකිය යුතු ය.

(4) (2) වන උපවගන්තිය යටතේ හෝ (3) වන උපවගන්තිය යටතේ යම් තක්සේරු වර්ෂයක් සඳහා නිකුත් කරන ලද විධානය කින් අතෘප්තියට පත් යම් සේවානියුක්තයකු විසින්, ඒ විධානය නිකුත් කළ දිනට ඉක්බිතිව දින තිහක කාලයක් ඇතුළත, අභියා චනයෙහි හේතු සැකෙවින් දක්වමින් කොමසාරිස් ජනරාල්වරයා වෙත ලියවිල්ලකින් අභියාවන කළ හැකි ය. එවැනි අභියාවනයක්

සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල්වරයාගේ තීරණය අවසානාන්තික හා තීරණාත්මක විය යුතු ය:

එසේ වුව ද ඒ සේවානියුක්තයා විසින් කරනු ලබන ලියවිල්ලකින් වූ ඉල්ලීමක් මත, ඒ තක්සේරු කිරීමට විරුද්ධව 117 වන වගන්තිය යටතේ ඒ සේවානියුක්තයා විසින් අභියාචනයක් ඉදිරිපත් කළ හැකි විම සඳහා, කොමසාරිස් ජනරාල්වරයා විසින් 115 වන වගන්තිය යටතේ ඒ සේවානියුක්තයා සම්බන්ධයෙන් ඒ තක්සේරු වර්ෂය සඳහා තක්සේරුවක් කිරීමට සලස්වනු ලැබිය යුතු ය.

සේවා යෝජකයන් විසින් නිසි වාර්තා තබා ගත යුතු බව.

102. යම් නිශ්චිත සේවානියුක්තයකුට යම් පාරිශ්‍රමිකයක් ගෙවන සෑම සේවායෝජකයකු විසින් ම—

(අ) කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන පඬි පතක සහ එසේ සඳහන් කරනු ලබන ආකාරයෙන්, ඒ පාරිශ්‍රමිකය ගෙවීම පිළිබඳ නිසි වාර්තාවක් තබා ගත යුතු ය;

(ආ) සියලු ම සේවානියුක්තයන්ගේ ප්‍රකාශවලත්, පඬි පත්වලත්, සේවානියුක්තයන්ට පාරිශ්‍රමික ගෙවීම සම්බන්ධයෙන් වූ ලදුපත් සහ සේවානියුක්තයන්ගේ පාරිශ්‍රමික සම්බන්ධයෙන් සහ එම පාරිශ්‍රමිකවලින් අඩු කරන ලදුව කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවනු ලබන ආදායම් බද්ද සම්බන්ධයෙන් වූ වෙනත් සියලු ගිණුම් වාර්තාවලත් සුරක්ෂිත භාවය සඳහා සියලු සාධාරණ ආරක්ෂා මාර්ග ගනු ලැබිය යුතු අතර, ඒ වාර්තා අදාළ වන තක්සේරු වර්ෂය අවසාන වීමෙන් පසු අවුරුදු පහකට නොඅඩු කාලසීමාවක් ඒ සියලු වාර්තා තබා ගත යුතු ය; නමුදු

(ඇ) තමා විසින් පවත්වාගෙන යනු ලබන (අ) සහ (ආ) ඡේදවල සඳහන් යම් වාර්තාවක් පරීක්ෂා කිරීමට, කොමසාරිස් ජනරාල්වරයා විසින් ලියවිල්ලකින් බලය දෙන ලද යම් නිලධරයකුට, අවසර දිය යුතු ය.

ආදායම් බද්ද අඩු කිරීමෙන් පසු සේවා යෝජකයන් පනු කාර්ය.

103. මේ පරිච්ඡේදයේ විධිවිධාන යටතේ ස්වකීය සේවා නියුක්තයන්ට ගෙවනු ලබන පාරිශ්‍රමිකයෙන් ආදායම් බද්ද අඩු කිරීමට නියම කරනු ලැබ සිටින සෑම සේවායෝජකයකු ම විසින්—

(අ) එවැනි යම් අඩු කිරීමක් කළ මාසයට ඉක්බිතිව එළඹෙන මාසයේ පහළොස්වන දින ඉකුත්වීමට පෙර ඒ අඩුකිරීම් වල මුදල කොමසාරිස් ජනරාල්වරයාට ගෙවිය යුතු අතර, කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන ආකෘතියක සහ එසේ නිශ්චිතව සඳහන් කරනු ලබන ආකාරයෙන් වූ මාසික ප්‍රකාශනයක් ඒ අවස්ථාවේදී ම කොමසාරිස් ජනරාල්වරයා වෙත ඇපයිය යුතු ය;

(ආ) මේ පරිච්ඡේදයේ විධිවිධාන යටතේ යම් සේවානියුක්තයකුගේ පාරිශ්‍රමිකයෙන් ආදායම් බද්ද අඩුකර තිබේද ඒ එක් එක් සේවා නියුක්තයා වෙත ඉහතින් වූ තක්සේරු වර්ෂ

යෙහි එසේ කරන ලද අඩු කිරීම් සම්බන්ධයෙන් වූ ද කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන ආකෘතියක සහ එසේ නියම කරනු ලබන විස්තර ඇතුළත් වූ ද සහතිකයක් එක් එක් වර්ෂයේ අප්‍රේල් මස තිස් වන දින ඉකුත් වීමට පෙර දිය යුතු ය;

(ඇ) යම් සේවානියුක්තයකුගේ සේවානියුක්තිය අවසන් වීම සිදු වූ තක්සේරු වර්ෂයේ පළමුවන දිනයෙන් ආරම්භව ඒ සේවය අවසන් වන දිනයෙන් අවසාන වන කාලසීමාව සම්බන්ධයෙන් අඩුකරන ලද ආදායම් බදු මුදල් නිශ්චිතව සඳහන් වන්නා වූ ද කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිත ව සඳහන් කරනු ලබන ආකෘතියක වූ ද, සහතිකයක් ඒ සේවානියුක්තයාගේ සේවය අවසන්වීමෙන් පසු දින තිහක් ඇතුළත ඒ සේවානියුක්තයාට දිය යුතු ය;

(ඈ) එක් එක් වර්ෂයේ අප්‍රේල් මස තිස් වන දින ඉකුත්වීමට පෙර කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන ආකෘතියක සහ එසේ නිශ්චය කරනු ලබන විස්තර ඇතුළත් ඉහතින් වූ තක්සේරු වර්ෂය සම්බන්ධ යෙන් වූ වාර්ෂික ප්‍රකාශයක්, ඒ වාර්ෂික ප්‍රකාශය අදාළවන තක්සේරු වර්ෂය තුළ දී මේ පරිච්ඡේදයේ විධිවිධාන යටතේ යම් සේවානියුක්තයකුගේ පාරිශ්‍රමිකයෙන් ආදායම් බදු අඩුකරන ලද්දේ ද ඒ එක් එක් සේවානියුක්තයා සම්බන්ධයෙන්, කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිත ව සඳහන් කරනු ලබන ආකෘතියක වූ ආදායම් බදු අඩු කිරීම් පත්‍රයක් සමග කොමසාරිස් ජනරාල්වරයා වෙත සැපයිය යුතු ය; තවද

(ඉ) යම් වෙළෙඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් පවත්වාගෙන යාම හෝ ක්‍රියාත්මක කිරීම සේවායෝජකයා විසින් යම් තක්සේරු වර්ෂයක දී අවසන් කළේ ද ඒ තක්සේරු වර්ෂයේ පළමුවන දින සිට එසේ අවසන් වූ දිනය තෙක් වූ කාලසීමාව, (ඇ) ඡේදයේ සඳහන් කර ඇති ඊට ඉහතින් ම වූ තක්සේරු වර්ෂය වූවාක් මෙන්, එසේ පවත්වා ගෙන යාම හෝ ක්‍රියාත්මක කිරීම් නම් අවසන් කරන ඒ වෙළෙඳාම, ව්‍යාපාරය, වෘත්තිය හෝ රක්ෂාව පිළිබඳ වූ එකී ඡේදයේ විධිවිධානවලට අනුකූලව, එකී තක්සේරු වර්ෂයේ එසේ අවසන් කළ මාසයට ඉක් බිතිව එළඹෙන මාසයේ අන්තිම දිනය ඉකුත්වීමට පෙර, ක්‍රියා කළ යුතු ය.

නොගෙවන ලද හෝ වැඩියෙන් ගෙවන ලද ආදායම් බදු මුදල් විසිමත් කිරීම.

104. (1) යම් සේවානියුක්තයකුට ගෙවනු ලබන පාරිශ්‍රමිකයෙන් මේ පරිච්ඡේදයේ විධිවිධාන යටතේ අඩුකළ යුතුව ඇති ආදායම් බදු මුදල් හෝ එහි කොටස අඩුකිරීම සේවායෝජකයකු විසින් පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ගැන ඔහුට දැනගන්නට ලැබුණු විට, 103 වන වගන්තියේ (අ) ඡේදය යටතේ නියමිත ආකෘතියෙහි වූ ප්‍රකාශයක් කොමසාරිස් ජනරාල්වරයා වෙත සැපයිය යුතු අතර අඩු නොකරන ලද ආදායම් බදු මුදල් 110 වන වගන්තිය යටතේ අයවීමට ඇති මුදල් සමග කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවිය යුතු ය.

(2) යම් ගෙවීම් කාලසීමාවක් සම්බන්ධයෙන් අඩුකරන ලද මුදලට වැඩියෙන් සේවායෝජකයකු විසින් යම් මුදලක් යම් තක් සේරු වර්ෂයක් තුළ දී කොමසාරිස් ජනරාල්වරයාට යවා ඇති අවස්ථාවක, ඒ තක්සේරු වර්ෂයෙහි පසුව එළඹෙන යම් ගෙවීම් කාලසීමාවක් සම්බන්ධයෙන් යවන මුදලින්, වැඩියෙන් ගෙවූ ඒ මුදල සේවායෝජකයා විසින් අඩුකළ හැකි අතර, ඒ බව කොමසාරිස් ජනරාල්වරයා වෙත ඒ වූ පරිදි දැනුම් දිය යුතු ය.

අවශ්‍ය අඩු කිරීම් නොකරනු ලබන විට, සේවා නියුක්තයා විසින් දන්වීමක් කළ යුතු බව.

105. (1) සේවානියුක්තයකුට පාරිශ්‍රමිකය ගෙවන විට යම් හේතුවක් නිසා යම් ආදායම් බද්දක් සම්පූර්ණයෙන් අඩු කරනු ලැබ නැති අවස්ථාවක, ඒ පාරිශ්‍රමිකය ආදායම් බද්ද අයකිරීමට යටත් වේ නම්, ඒ අඩුකිරීම නොකර ඒ පාරිශ්‍රමිකය තමාට ලැබී ඇති බවට ඒ පාරිශ්‍රමිකය ලැබී දින පහළොවක් ඇතුළත ඒ සේවානියුක්තයා විසින් කොමසාරිස් ජනරාල්වරයා වෙත ලිඛිත දැන්වීමක් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමක ඒ දැන්වීම කරන තැනැත්තාගේ සම්පූර්ණ නම හා ලිපිනය ද ඔහුගේ සේවා යෝජකගේ සම්පූර්ණ නම හා ලිපිනය ද ස්වකීය පාරිශ්‍රමිකය පිළිබඳ සම්පූර්ණ විස්තර ද ඇතුළත් විය යුතු ය.

අඩුකරන ලද ආදායම් බද්ද සේවා යෝජකයන් ගේ වත්කම් වල කොටසක් නොවිය යුතු බව.

106. වෙන යම් නීතියක කුමක් සඳහන්ව ඇතද මේ පරිච්ඡේදයේ විධිවිධාන යටතේ අඩුකර කොමසාරිස් ජනරාල්වරයා වෙත යැවීම සඳහා සේවා යෝජක විසින් තබාගෙන ඇති සෑම බදු අඩුකිරීමකම මුදල්, ඒ සේවා යෝජක වස්තු භංග්වයට පත්වුවහොත්, ඔහුගේ ව්‍යාපාරය ඈවර කරනු ලැබුවහොත් හෝ විසුරුවා හරිනු ලැබුවහොත් හෝ ඔහු මියගිය හොත් පොල්මෑකරුවකු විසින් කටයුතු කරනු ලැබීමට යටත් වන හෝ අද්මිනිස්ත්‍රාසිකරණයට යටත් වන නැතහොත් ණය හිමියන්ගේ අර්ථලාභය සඳහා පවරා දීමට යටත්වන, ඒ සේවා යෝජකගේ දේපළක් නොවිය යුතු ය. තව ද ඒ මුදල, ඒ සේවා යෝජකගේ වස්තු භංගත්වයට පත් වූ, ඈවර කරනු ලැබූ හෝ පවරා දෙනු ලැබූ බූදලයෙන් හෝ ඒ මියගිය සේවා යෝජකගේ බූදලයෙන් හෝ වෙන්ව පැවතිය යුතු අතර එහි කොටසක් නොවිය යුතු ය.

ආදායම් බද්ද අඩු කිරීම හෝ ගෙවීම පැහැර හැරීම.

107. (1) මේ පරිච්ඡේදයේ විධිවිධානවලට අනුකූලව යම් සේවා නියුක්තයකුගේ පාරිශ්‍රමිකයෙන් ආදායම් බද්ද අඩු කිරීම යම් සේවායෝජකයකු විසින් පැහැර හරින අවස්ථාවක, නැතහොත් සේවානියුක්තයකුගේ පාරිශ්‍රමිකයෙන් යම් ගෙවීම් කාලසීමාවක් සඳහා වූ ආදායම් බද්ද යම් සේවායෝජකයකු විසින් අඩුකර, අඩුකළ සම්පූර්ණ මුදල ඊළඟ මාසයෙහි පහළොස්වන දින හෝ ඉන් පෙර කොමසාරිස් ජනරාල්වරයා වෙත නොයවා ඇති අවස්ථාවක, මේ පරිච්ඡේදයේ විධිවිධාන යටතේ අඩුකිරීමට ඔහුට නියම කරන ලද මුත් ඔහු විසින් එසේ අඩු නොකරන ලද සම්පූර්ණ බද්දේ ප්‍රමාණයට නැතහොත් අවස්ථෝචිත පරිදි, කොමසාරිස් ජනරාල්වරයා වෙත නොයවනු ලැබූ අඩුකරන ලද සම්පූර්ණ බද්දේ ප්‍රමාණයට හෝ එහි කොටසට ඒ සේවායෝජකයා පෞද්ගලිකව වගකිව යුතු අතර ඒ මුදල කොමසාරිස් ජනරාල්වරයා වෙත යැවිය යුතු වූයේ යම් දිනයක හෝ ඉන් පෙර ද ඒ දිනයට ඉක්බිති දිනයෙහි සිට ඒ මුදල

ගෙවීම පැහැර හැර තිබූ බව සලකනු ලැබිය යුතු ය. තව ද ඒ සේවා යෝජකයා පැහැර හරින්නකු වශයෙන් සලකනු ලැබිය යුතු අතර මේ පනතේ විධිවිධාන සලස්වනු ලබන ආකාරයකින් ඒ මුදල ඒ සේවායෝජකයාගෙන් අයකරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන කුමක් වුව ද සේවා නියුක්තයාගේ පාරිශ්‍රමිකයෙන් අඩුකිරීමට සේවායෝජකයා විසින් පැහැර හරින ලද බද්දේ ප්‍රමාණය හෝ එහි යම් කොටසක් කොමසාරිස් ජනරාල්වරයා විසින් සේවානියුක්තයාගෙන් අය කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් ආදායම් බදු මුදල සේවා යෝජකගෙන් හා සේවානියුක්තයාගෙන් අයකර ගැනීම පිණිස සුදුසු යයි තමා අදහස් කරන පියවරවල් ගැනීමෙන්, නැතහොත් ඒ මුදල සම්පූර්ණයෙන් සේවායෝජකගෙන් හෝ සම්පූර්ණයෙන් සේවානියුක්තයාගෙන්, නැතහොත් ඉන් කොටසක් සේවායෝජක ගෙන් සහ කොටසක් සේවානියුක්තයාගෙන් අයකර ගැනීමෙන් කොමසාරිස් ජනරාල්වරයා වළක්වන ලෙස මේ වගන්තියේ සඳහන් කිසිවක් කියවා තේරුම් නොගත යුතු ය.

සේවා යෝජකයන් වෙත තක්සේරු කිරීම් නිකුත් කිරීම්.

108. (1) ස්වකීය සේවානියුක්තයන්ට ගෙවනු ලබන පාරිශ්‍රමික යෙන් ආදායම් බද්ද අඩුකිරීමට මේ පරිච්ඡේදයේ විධිවිධාන යටතේ නියම කරනු ලැබ සිටින යම් සේවායෝජකයකු,—

(අ) යම් ගෙවීම් කාලසීමාවක් සඳහා වූ සම්පූර්ණ ආදායම් බද්ද හෝ එහි යම් කොටසක් අඩුකිරීම පැහැර හරින අවස්ථාවක;

(ආ) යම් ගෙවීම් කාලසීමාවක් සඳහා අඩුකරන ලද සම්පූර්ණ ආදායම් බද්ද හෝ එහි යම් කොටසක් කොමසාරිස් ජනරාල් වරයා වෙත යැවීම පැහැර හරින අවස්ථාවක;

හෝ

(ඇ) 103 වන වගන්තිය යටතේ යම් මාසික හෝ වාර්ෂික ප්‍රකාශ යක් සැපයීම පැහැර හරින අවස්ථාවක

එකී ගෙවීම් කාලසීමාව සඳහා, තක්සේරුකරුගේ මතය පරිදි, ඒ සේවායෝජක විසින් අඩුකර, කොමසාරිස් ජනරාල්වරයාට ගෙවිය යුතු වූ ආදායම් බදු මුදල හෝ අතිරේක ආදායම් බදු මුදල, ඒ ගෙවීම් කාලසීමාව ඇතුළත්වන වර්ෂයෙහි යම් අවස්ථාවක නැතහොත් ඒ තක්සේරු වර්ෂයේ අවසානයේ සිට අවුරුදු තුනක් ඇතුළත තක්සේරුකරුවකු විසින් තක්සේරු කරනු ලැබිය හැකි අතර, 110 වන වගන්තිය යටතේ අයවීමට නිබිය හැකි මුදල සමග ඒ මුදල් වහාම ගෙවන ලෙස ඒ තක්සේරුකරු විසින් ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් ඒ සේවායෝජකට නියම කළ යුතු ය.

(2) යම් තක්සේරු වර්ෂයක දී යම් ගෙවීම් කාලසීමාවක් සඳහා සේවායෝජක විසින් අඩු කරනු ලැබ කොමසාරිස් ජනරාල්වරයාට ගෙවිය යුතු වූ නිසි ආදායම් බදු මුදලට අඩුවෙන් (1) වන උපවගන්තිය යටතේ යම් සේවායෝජකයකු තක්සේරු කරනු ලැබ ඇති බව තක්සේරුකරුවකුට පෙනී යන අවස්ථාවක, තක්සේරුකරුගේ

මිනය පරිදි, ඒ සේවායෝජකයා තක්සේරු කරනු ලැබිය යුතු වූ අතිරේක ආදායම් බද්දේ ප්‍රමාණය අනුව ඒ සේවායෝජකයා තක්සේරු කිරීම, ඒ තක්සේරු වර්ෂයේ යම් අවස්ථාවක දී හෝ ඒ තක්සේරු වර්ෂය අවසානයේ සිට අවුරුදු තුනක් ඇතුළත දී තක්සේරුකරුවකු විසින් කරනු ලැබිය හැකි අතර, 110 වන වගන්තිය යටතේ අයවීමට තිබිය හැකි මුදල සමග ඒ මුදල වහාම ගෙවා ලෙස ඒ තක්සේරුකරු විසින් ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් ඒ සේවායෝජකට නියම කළ යුතු ය.

අභියාචනා.

109. (1) මේ පරිච්ඡේදයේ විධිවිධාන යටතේ කරන ලද යම් තක්සේරුවක ප්‍රමාණය ගැන අතෘප්තියට පත් වූ යම් සේවායෝජකයකු විසින් ඒ තක්සේරු කිරීමේ දැන්වීමෙහි දිනයෙන් පසු දින තිහක කාලසීමාවක් ඇතුළත ඒ තක්සේරු කිරීමට විරුද්ධව කොමසාරිස් ජනරාල්වරයා වෙත ලියවිල්ලකින් අභියාචනා කළ හැකි ය:

එසේ වුව ද ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම, අසනීපවීම හෝ වෙනත් සාධාරණ හේතුවක් නිසා ඒ කාලසීමාව තුළ අභියාචනා කිරීමෙන් අභියාචක වළක්වනු ලැබූ බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් කරනු ලැබූ විට, අභියාචනය ඉදිරිපත් කිරීම සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් කාලය දීර්ඝ කිරීමක් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ අභියාචනය 103 වන වගන්තිය යටතේ සපයනු ලැබීමට නියමිත, අවස්ථාවෝචිත පරිදි, මාසික ප්‍රකාශනයක් හෝ වාර්ෂික ප්‍රකාශනයක් නොමැතිව කරන ලද තක්සේරු කිරීමට විරුද්ධව ඉදිරිපත් කර ඇති අවස්ථාවක අභියාචනා පෙත්සම ඒ ප්‍රකාශනය සමග ඉදිරිපත් කළ යුතු ය.

(3) 108 වන වගන්තිය යටතේ කරන ලද තක්සේරු කිරීමක් මගින් අය කර ඇති ආදායම් බදු මුදල, ඒ තක්සේරු කිරීමට විරුද්ධව (1) වන උපවගන්තිය යටතේ අභියාචනයක් ඉදිරිපත් කර තිබුණ ද සේවායෝජකයා විසින් ගෙවනු ලැබිය යුතු ය.

(4) 117 වන වගන්තියේ (5) වන උපවගන්තියේ සිට 122 වන වගන්තිය තෙක් වූ වගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස්කිරීම් සහිතව, (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන යම් අභියාචනයකට අදාළ විය යුතු ය.

(5) මේ පරිච්ඡේදයේ විධිවිධානවලට අනුකූලව කරන ලද තක්සේරු කිරීමකට විරුද්ධව (1) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කාලසීමාවක් ඇතුළත වලංගු අභියාචනයක් ඉදිරිපත් කර නොමැති අවස්ථාවක, නැතහොත් තක්සේරු කිරීමක් සම්බන්ධයෙන් 117 වන වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ නිවැසුමකට එළඹෙන අවස්ථාවක, නැතහොත් අභියාචනයක දී තක්සේරු කිරීමක් නිශ්චය කර ඇති අවස්ථාවක, අවස්ථාවෝචිත විය හැකි පරිදි, කරන ලද හෝ නිවැස ගනු ලැබූ හෝ නිශ්චය කර ඇති තක්සේරු කිරීම මේ පනතේ සියලු කාර්ය සඳහා අවසානාත්මක හා තීරණාත්මක විය යුතු ය:

එසේ වුව ද අභියාචනයක දී නිශ්චය කර ඇති යම් කරුණක් නැවත සලකා බැලීම ඇතුළත් නොවන්නා වූ ද යම් තක්සේරු වර්ෂයක යම් ගෙවීම් කාලසීමාවක් සඳහා වූ ද තක්සේරුවක් හෝ

අතිරේක තක්සේරුවක්, 108 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, කිරීමෙන්, තක්සේරුකරුවකු වළක්වන ලෙස මේ උප වගන්තියෙහි සඳහන් කිසිවක් කියවා තේරුම් නොගත යුතු ය.

පැහැර හැරීම සම්බන්ධයෙන් දණ්ඩනය.

110. මේ පරිච්ඡේදයෙහි විධිවිධාන යටතේ සේවායෝජකයකු විසින් ගෙවිය යුතු ආදායම් බද්ද ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ බද්දට අතිරේකව—

(අ) ඒ බද්දෙන් සියයට දහයකට සමාන දණ්ඩන මුදලක්; සහ

(ආ) ඒ බද්ද ගෙවීම පැහැර හැරීම ආරම්භ වූ පසු මාස හයක් ඉකුත්වීමට පෙර ඒ බද්ද නොගෙවනු ලබන අවස්ථාවක, ඒ බද්දෙන් සියයට පහළොවකට සමාන අතිරේක දණ්ඩන මුදලක්

ඒ සේවායෝජක විසින් ගෙවනු ලැබිය යුතු ය:

එසේ වුව ද ගෙවීම පැහැර හැරීම තමාට පාලනය කළ නොහැකි කරුණු නිසා සිදුවී යයි ද ගෙවීම පැහැර හැර ඇති බදු මුදල තමා විසින් ගෙවනු ලැබ ඇතැයි ද ඒ ගෙවීම කරන අවස්ථාවේ සැපයීමට නියමිත ප්‍රකාශනයක් තමා විසින් සපයනු ලැබ ඇතැයි ද කොමසාරිස් ජනරාල් වරයා සෑහීමට පත්වන පරිදි ඒ පැහැර හරින්නා ඔප්පු කරතහොත් පැහැර හරින්නා විසින් ගෙවිය යුතු යම් දණ්ඩනයක මුදල් අත්හැරීම හෝ අඩුකිරීම කොමසාරිස් ජනරාල්වරයා විසින් කරනු ලැබිය හැකි ය.

ගෙවන ලද බද්ද අඩු කිරීම.

111. සේවානියුක්තයකුගේ යම් තක්සේරු වර්ෂයක් සඳහා වූ තක්සේරු කළහැකි ආදායමට, මේ පරිච්ඡේදයේ විධිවිධානවලට අනුකූලව ආදායම් බදු අඩුකර ගනු ලැබූ යම් පාරිශ්‍රමිකයක් ඇතුළත් වන අවස්ථාවක, 103 වන වගන්තියේ (ආ) ඡේදයේ හෝ (ඇ) ඡේදයේ විධිවිධානවලට අනුකූලව ඒ පාරිශ්‍රමිකය පිළිබඳව නිකුත් කරනු ලද බදු අඩුකර ගැනීමේ සහතිකයක් ඉදිරිපත් කරනු ලැබූ විට, අඩුකර ගන්නා ලදැයි ඒ සහතිකයේ දැක්වෙන බදු මුදල් ඒ තක්සේරු වර්ෂය සඳහා තමා විසින් ගෙවිය යුතු බද්දෙන් අඩු කරනු ලැබීමට ඒ සේවානියුක්තයාට හිමිකම් තිබිය යුතු ය.

ආකෘති සම්බන්ධයෙන් මේ පරිච්ඡේදයේ විධිවිධාන වලට අනුව ක්‍රියා කිරීම.

112. කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලබන ආකෘතියෙහි සහ එසේ නිශ්චය කරනු ලබන ආකාරයකට විස්තර සටහන් කිරීමට සහ සැපයීමට මේ පරිච්ඡේදයේ විධිවිධාන යටතේ සේවා යෝජකයකුට නියම කරනු ලබන අවස්ථාවක, සේවා යෝජක විසින් ඒ සඳහා කරනු ලබන ඉල්ලීමක් මත, කොමසාරිස් ජනරාල් වරයා විසින් ලියවිල්ලකින් අනුමත කරන ලද ආකෘතියක සහ එසේ අනුමත කරන ලද ආකාරයකට සේවා යෝජක විසින් විස්තර සටහන් කිරීම හෝ සැපයීම කරනු ලැබුවහොත් එය මේ විධිවිධානවලට ප්‍රමාණවත් ලෙස අනුකූලව ක්‍රියා කිරීමක් විය යුතු ය.

අර්ථ නිරූපණය.

113. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පරිච්ඡේදයෙහි—

"සේවා නියුක්තයා" යන්නට—

(අ) සමාගමක හෝ සංස්ථාවක යම් අධ්‍යක්ෂවරයකු;

(ආ) හවුල් ව්‍යාපාරයක යම් ක්‍රියාකාරී හවුල්කරුවකු;

(ඇ) තමා විසින් ඉටු කරන ලද හෝ වෙනත් තැනැත්තකු විසින් ඉටු කරන ලද පූර්ව සේවාවක් සඳහා විශ්‍රාම වැටුප් හෝ වෙනත් පාරිශ්‍රමික ලබන තැනැත්තකු

ඇතුළත් වේ; තවද

"සේවා යෝජක" යන්නෙන්,—

(අ) සේවා නියුක්තයකු ලෙස යම් පුද්ගලයකු සේවා ඉටු කරන්නේ යම් තැනැත්තකු, යම් හවුල් ව්‍යාපාරයක්, යම් පුද්ගල මණ්ඩලයක් හෝ යම් සංවිධානයක් සඳහාද ඒ තැනැත්තා, ඒ හවුල් ව්‍යාපාරය, ඒ පුද්ගල මණ්ඩලය හෝ ඒ සංවිධානය ද;

(ආ) 4 වන වගන්තියේ අර්ථානුකූලව සේවා නියුක්තියෙන් යම් ලාභ ගෙවන යම් තැනැත්තකු, යම් හවුල් ව්‍යාපාරයක්, යම් පුද්ගල මණ්ඩලයක් හෝ යම් සංවිධානයක්; හෝ

(ඇ) කලින් සේවා නියුක්තයකුව සිටි සේවා නියුක්තයකුගේ පූර්ව සේවා සඳහා ඒ සේවා නියුක්තයාට හෝ වෙනත් තැනැත්තකුට යම් විශ්‍රාම වැටුපක් හෝ වෙනත් යම් පාරිශ්‍රමිකයක් ගෙවන යම් තැනැත්තකු, යම් හවුල් ව්‍යාපාරයක්, යම් පුද්ගල මණ්ඩලයක් හෝ යම් සංවිධානයක්

අදහස් වන අතර, මෙහි පහත I වන තීරයෙහි නිශ්චිත මණ්ඩලයක්, ආයතනයක් නැතහොත් තැනැත්තකු සම්බන්ධයෙන් වූ විට II වන තීරයෙහි අනුරූප සටහනෙහි නිශ්චිත තැනැත්තෙක් ඊට ඇතුළත් වේ.

I වන තීරය	II වන තීරය
1. සංස්ථාගත වූ හෝ සංස්ථාගත නොවූ සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක්	ඒ සමාගමෙහි හෝ පුද්ගල මණ්ඩලයෙහි ලේකම්, කළමනාකරු හෝ අන් ප්‍රධාන නිලධරයා
2. හවුල් ව්‍යාපාරයක්	ශ්‍රී ලංකාවෙහි පදිංචි ප්‍රමුඛ හවුල්කරු හෝ යම් සක්‍රීය හවුල්කරුවකු; යම් සක්‍රීය හවුල්කරුවකු ශ්‍රී ලංකාවෙහි වාසිකව නොසිටින හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වූ විට ඒ හවුල් ව්‍යාපාරයෙහි ශ්‍රී ලංකාවේ සිටින අනුයෝජිතයා
3. මියගිය තැනැත්තකු ගේ බූදලය	පොල්මඃකරු හෝ අද්මීනිස්ත්‍රාසිකරු

4. භාරයක්	භාරයෙහි භාරකරු හෝ භාර කරුවෝ
5. නිර්වාසික තෙක්	තැනැත්තා ශ්‍රී ලංකාවෙහි සිටින එම තැනැත්තාගේ අනුයෝජිතයා හෝ ඇටෝර්නි බලකරු

එහෙත්—

(i) ශ්‍රී ලංකාවේ ආණ්ඩුව;

(ii) යම් පළාත් පාලන ආයතනයක්;

(iii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 170 වන ව්‍යවස්ථාවේ අර්ථානුකූලව යම් රාජ්‍ය සංස්ථාවක්;

(iv) 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත යටතේ පිහිටුවන ලද හෝ පිහිටුවන ලද ලෙස සලකනු ලබන විශ්ව විද්‍යාලයක්;

(v) 1971 අංක 35 දරන වෙළඳ ව්‍යාපාර (අත්කර ගැනීමේ) පනත යටතේ ආණ්ඩුව විසින් අත්කර ගනු ලැබූ හෝ සතු කරගනු ලැබූ යම් වෙළඳ ව්‍යාපාරයක්: සහ

(vi) යම් මණ්ඩලයක හෝ කොමිෂන් සභාවක සියලු සාමාජිකයන් ජනාධිපතිවරයා විසින් හෝ අමාත්‍යවරයකු විසින් හෝ පත් කරනු ලැබේ ද එවැනි මණ්ඩලයක් හෝ කොමිෂන් සභාවක් වන්නා වූ ද, යම් නීතියක් මඟින් හෝ නීතියක් යටතේ පිහිටුවන ලද්දා වූ ද යම් මණ්ඩලයක් හෝ පරීක්ෂණ කොමිෂන් සභාවක්;

ඊට ඇතුළත් නොවේ;

"ගෙවීම් කාල සීමාව" යන්නෙන් සේවා යෝජකයකු විසින් සේවා නියුක්තයකුට පාරිශ්‍රමික ගණන් බලා ගෙවනු ලබන්නේ යම් මාසයක්, සතියක් හෝ වෙනත් එවැනි කාල සීමාවක් වෙනුවෙන් ද ඒ මාසය, සතිය හෝ වෙනත් කාල සීමාව අදහස්වේ;

"පාරිශ්‍රමිකය" යන්නෙන් 4 වන වගන්තියෙහි අර්ථානුකූල ව සේවා නියුක්තියෙන් අත්වන ලාභ අදහස් වේ.

XVI වන පරිච්ඡේදය

ඇතැම් අර්ථසාධක අරමුදල්වල මුදල් රඳවා ගැනීම

නිශ්චිත අර්ථසාධක අරමුදලක, දායකයාගේ බැරට නිබෙන මුදලින් සියයට පහළොවක් එම මුදල් වෙනුවෙන් ගෙවිය යුතු බද්ද ගෙවීමට රඳවාගත යුතු බව.

114. (1) නිශ්චිත අර්ථසාධක අරමුදලක දායකයකුගේ බැරට, එම අරමුදලෙහි තිබෙන මුදල්වලින් යම් කොටසක් සඳහා ආදායම් බදු ගෙවිය යුතු වූ එම දායකයාගේ එම මුදල භාරව සිටින තැනැත්තකු විසින් දායකයාට එම මුදල් ගෙවීමේ දී, 1954 අප්‍රේල් මස 1 වන දිනයෙන් පසු ඒ දායකයා විසින් ගෙවන ලද දායක මුදල නියෝජනය කරන කොටස නොවන ඒ දායක මුදලින් සියයට පහළොවකට සමාන මුදලක් ඔහු විසින් තම භාරයෙහි රඳවාගත යුතු ය. එවැනි මුදලක් තම භාරයෙහි රඳවා ගන්නා තැනැත්තා විසින් එසේ රඳවා ගන්නා ලද මුදල කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම් දිය යුතු අතර

කොමසාරිස් ජනරාල්වරයා විසින් ක්‍රියාත්මක කරනු ලබන යම් නීති යක් යටතේ ගෙවිය යුතු යම් බද්දක් වෙනුවෙන් අඩු කරන ලෙස කොමසාරිස් ජනරාල්වරයා විසින් ලියවිල්ලකින් වූ දැන්වීමකින් ඔහුට විධාන කරනු ලබන මුදල එයින් අඩු කළ යුතු ය. එසේ අඩු කරන ලද මුදල කොමසාරිස් ජනරාල්වරයාට ගෙවිය යුතු ය. එසේ අඩු කිරීමෙන් පසු ඉතිරි වන යම් ශේෂයක් ඒ දායකයාට ගෙවිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි කාර්යයන් සඳහා, "නිශ්චිත අර්ථ සාධක අරමුදල" යන්නෙන් 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ පිහිටුවන ලද සේවක අර්ථ සාධක අරමුදල හෝ යම් පාලිත අර්ථ සාධක අරමුදලක් අදහස් වේ.

XVII වන පරිච්ඡේදය

තක්සේරු කිරීම්

තක්සේරු කිරීම් සහ අතිරේක තක්සේරු කිරීම්.

115. (1) තක්සේරුකරුවකුගේ මතයට අනුව යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් ආදායම් බද්දකට, ධන බද්දකට හෝ තෑගි බද්දකට යටත් යම් තැනැත්තකු ඒ බද්ද ගෙවා නොමැති හෝ ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ බද්ද වශයෙන් ඔහු විසින් ගෙවිය යුතුව තිබුණු නිසි මුදලට වඩා අඩු මුදලක් ගෙවා ඇති හෝ අවස්ථාවක, (3) වන, සහ (5) වන උපවගන්තිවල විධිවිධානවලට යටත් ව සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම යෙදෙන නොවැම්බර් මස පහළොස් වන දිනයට පසුව, ඒ තක්සේරුකරු විසින්, ඒ තක්සේරුකරුගේ විනිශ්චයට අනුව ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු වන මුදල තක්සේරු කළ යුතු ය; තව ද ලියවිල්ලකින් වූ දැන්වීමක් කිරීමෙන්—

(අ) එම තැනැත්තා ඒ තක්සේරු වර්ෂය සඳහා කිසිම බද්දක් ගෙවා නොමැති නම්, එසේ තක්සේරු කරන ලද බදු මුදල; හෝ

(ආ) ඒ තැනැත්තා ඒ තක්සේරු වර්ෂය සඳහා බද්ද ලෙස යම් මුදලක් ගෙවා ඇත් නම්, එසේ තක්සේරු කරන ලද බදු මුදල සහ ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තා විසින් ගෙවන ලද බදු මුදල අතර වෙනස

නොපමාව ගෙවන ලෙස ඒ තැනැත්තාට නියම කළ යුතු ය:

එසේ වුව ද යම් තැනැත්තකු ශ්‍රී ලංකාව හැර යාමට ආසන්න යයි හෝ ආදායම ආරක්ෂා කිරීම පිණිස කලින් තක්සේරු කිරීම සුදුසු යයි හෝ තක්සේරුකරුගේ මතය වෙයි නම් ඔහු විසින් (3) වන සහ (5) වන උපවගන්තිවල විධිවිධානවලට යටත් ව යම් තැනැත්තකු, යම් තක්සේරු වර්ෂයක් සඳහා, ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම වූ නොවැම්බර් මාසයේ පහළොස් වන දිනට පෙර ඕනෑම අවස්ථාවක දී තක්සේරු කරනු ලැබිය හැකි අතර, එම බද්ද 97 (1) වන වගන්තිය යටතේ නියමිත දිනට පෙර කොමසාරිස් ජනරාල්වරයාට ගෙවන ලෙස ද ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකි ය.

(2) යම් තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බද්දට, ධන බද්දට හෝ තෑගි බද්දට යටත් යම් තැනැත්තකු නිසි ප්‍රමාණයට වඩා අඩු ප්‍රමාණයකට තක්සේරු කරනු ලැබ ඇතැයි තක්සේරුකරුවකුට

පෙනී යන අවස්ථාවක, (3) වන උපවගන්තියෙහි සහ (5) වන උපවගන්තියෙහි විධිවිධානවලට යටත් ව ඒ තක්සේරුකරු විසින්, ඔහුගේ මතයට අනුව ඒ තැනැත්තා තක්සේරු කරනු ලැබිය යුතුව තිබුයේ යම් අතිරේක මුදලකට ද ඒ මුදලට ඒ තැනැත්තා තක්සේරු කරනු ලැබිය යුතු අතර, ඒ අතිරේක තක්සේරුව සහ එය යටතේ අය කළ බද්ද සම්බන්ධයෙන් ද තක්සේරු දැන්වීම, අභියාචනය සහ වෙනත් කටයුතු පිළිබඳ මේ පනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

(3) යම් තැනැත්තකු විසින් ආදායම, ධනය හෝ ත්‍යාග පිළිබඳ වාර්තාවක් සපයා ඇති අවස්ථාවක, ඒ තැනැත්තා පිළිබඳව (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ තක්සේරුවක් කිරීමේ දී තක්සේරුකරු විසින්—

(අ) ඒ තැනැත්තා විසින් සාදන ලද වාර්තාව පිළිගනු ලැබිය හැකි ය; නැතහොත්

(ආ) ඒ තැනැත්තා විසින් සාදන ලද වාර්තාව පිළිගනු නොලැබේ නම් ඔහු විසින් ඒ තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායමෙහි, බදු අයකළ හැකි ධනයෙහි සහ බදු අය කළ හැකි ත්‍යාගවල ප්‍රමාණය ඇස්තමේන්තු කර ඒ අනුව ඒ තැනැත්තා තක්සේරු කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු විසින් සාදන ලද වාර්තාවක් තක්සේරුකරුවකු විසින් නොපිළිගෙන, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තා පිළිබඳ තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් කරනු ලබන අවස්ථාවක, වාර්තාව පිළි නොගැනීම සඳහා ස්වකීය හේතු තක්සේරුකරු විසින් ලියවිල්ලකින් ඒ තැනැත්තා වෙත දන්වා සිටිය යුතු ය.

(4) යම් තැනැත්තකු විසින් ආදායම, ධනය හෝ තෑගි පිළිබඳ වාර්තාවක් සපයා නොමැත්තා වූ ද, ඒ තැනැත්තා ආදායම් බද්ද, ධන බද්ද හෝ ත්‍යාග බද්ද ගෙවීමට යටත් බව තක්සේරුකරුගේ මතය වන්නා වූ ද අවස්ථාවක, තක්සේරුකරු විසින් (1) වන උපවගන්තිය යටතේ හෝ (2) වන උපවගන්තිය යටතේ හෝ ඒ තැනැත්තා පිළිබඳව තක්සේරුවක් කිරීමේ දී ඒ තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායමෙහි, බදු අය කළ හැකි ධනයෙහි හෝ බදු අය කළ හැකි ත්‍යාගවල ප්‍රමාණය ඇස්තමේන්තු කර ඒ අනුව, ඔහු තක්සේරු කරනු ලැබිය හැකි ය. එසේ වුවත් වාර්තාවක් සැපයීම පැහැර හැරීම හෝ අතපසු කිරීම හෝ සම්බන්ධයෙන් මේ පනත යටතේ, ඒ තැනැත්තා දණ්ඩනයකට යටත් වීම කෙරෙහි ඒ තක්සේරුව බල නොපෑ යුතු ය.

(5) 62 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව යම් තක්සේරු වර්ෂයක් සඳහා මේ පනත යටතේ ගෙවිය යුතු, අවස්ථාවෝචිත පරිදි ආදායම් බද්ද නැතහොත් ධන බද්ද සම්බන්ධයෙන් හෝ, යම් තක්සේරු වර්ෂයක් තුළ දී දෙන ලද්දා වූ ද, එම තක්සේරු

වර්ෂයට පසුව එළඹෙන නොවැම්බර් මාසයේ තිස්වන දින හෝ එදිනට පෙර ත්‍යාගදායක විසින් සාදන ලද වාර්තාවක ඔහු විසින් ඇතුළත් කරනු ලැබූ ද, ත්‍යාගයක් වෙනුවෙන් මේ පනත යටතේ ගෙවිය යුතු ත්‍යාග බද්ද සම්බන්ධයෙන් හෝ ඒ තක්සේරු වර්ෂයෙහි අවසානයේ සිට අවුරුදු තුනක් ගත වූ පසුව කිසිම තක්සේරුවක් නොකළ යුතු ය:

එසේ වුව ද යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු තක්සේරු නොකිරීම හෝ අඩුවෙන් තක්සේරු කිරීම වංචාවක් නිසා හෝ වුවමනාවෙන් ම වැළකීමක් නිසා වන අවස්ථාවක, ඒ තක්සේරු වර්ෂය අවසාන වීමෙන් පසු ඕනෑම අවස්ථාවක දී ඒ තැනැත්තා පිළිබඳ ව තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් කරනු ලැබිය හැකි ය.

(6) යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය යටතේ තක්සේරුවක් හෝ (2) වන උපවගන්තිය යටතේ අතිරේක තක්සේරුවක්, 125 (2) වන වගන්තියෙහි නිශ්චිත දණ්ඩනයට එම තැනැත්තා යටත් වීම කෙරෙහි බල නොපැවැත්විය යුතු අතර, එසේ තක්සේරු කරන ලද මුදල, ඒ තක්සේරු වර්ෂය සඳහා එම තැනැත්තා විසින් ගෙවිය යුතු ව තිබුණු ආදායම් බද්ද, ධන බද්ද නැතහොත් ත්‍යාග බද්ද ලෙස ඒ වගන්තියෙහි කාර්යයන් සඳහා සලකනු ලැබිය යුතු ය.

තක්සේරු දන්වීම.

116. තක්සේරු කරනු ලැබූ ආදායමෙහි, ධනයෙහි හෝ ත්‍යාගවල ප්‍රමාණය ද ගෙවීමට නියම කරනු ලැබූ බදු මුදල ද සඳහන් කරමින් තක්සේරු කිරීමේ දැන්වීමක් තක්සේරු කරනු ලැබූ එක් එක් තැනැත්තාට තක්සේරුකරු විසින් දෙනු ලැබිය යුතු ය:

එසේ වුව ද XV වන පරිච්ඡේදයේ විධිවිධාන යටතේ සේවා යෝජකයකු වෙත එවැනි දැන්වීමක් දෙනු ලැබූ අවස්ථාවක, ගෙවීමට නියම කළ බදු මුදල පමණක් එහි සඳහන් කිරීම ප්‍රමාණවත් විය යුතු ය.

XVIII වන පරිච්ඡේදය

අභියාචන

අ—කොමසාරිස් ජනරාල්වරයා වෙත කරනු ලබන අභියාචන

කොමසාරිස් ජනරාල් වරයා වෙත කරනු ලබන අභියාචන.

117. (1) මේ පනත යටතේ කරනු ලැබූ තක්සේරුවක මුදල හෝ මේ පනතේ කාර්යයන් සඳහා කරනු ලැබූ යම් වටිනාකම් තක්සේරුවක මුදල සම්බන්ධයෙන් හෝ අනාප්තියට පත් යම් තැනැත්තකු විසින්, තක්සේරුව පිළිබඳ දැන්වීමේ දිනයෙන් පසු දින තිහක කාල සීමාවක් ඇතුළත, ඒ තක්සේරුවට හෝ වටිනාකම් තක්සේරුවට විරුද්ධව කොමසාරිස් ජනරාල්වරයා වෙත අභියාචනයක් කළ හැකි ය:

එසේ වුව ද ශ්‍රී ලංකාවෙහි නොසිටීම, රෝගාතුර වීම හෝ වෙනත් යුක්ති සහගත හේතුවක් නිසා ඒ කාල සීමාව ඇතුළත අභියාචනය කිරීමට අභියාචකට නොහැකි වූ බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් වූ විට, අභියාචනය ඉදිරිපත් කිරීම සඳහා වූ කාල සීමාව දීර්ඝ කරනු ලැබිය යුතු ය.

(2) සෑම අභියාචනයක් ම, කොමසාරිස් ජනරාල්වරයා වෙත යොමු කරනු ලබන ලිඛිත පෙත්සමක මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු අතර ඒ අභියාචනයට හේතු පැහැදිලිව සඳහන් කළ යුතු ය.

(3) අභියාචනය කරනු ලබන්නේ යම් තක්සේරුවකට විරුද්ධව ද, ඒ තක්සේරුව, වාර්තාවක් සපයා නැති අවස්ථාවක කරන ලද නම්, නිසියාකාරව පිළියෙල කරන ලද වාර්තාවක් සමග අභියාචන පෙත්සම ඉදිරිපත් කළ යුතු ය.

(4) (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට අනුකූල නොවන අභියාචන පෙත්සමක් වලංගු නොවිය යුතු ය.

(5) වලංගු අභියාචන පෙත්සමක් ලැබීමෙන් පසු කොමසාරිස් ජනරාල්වරයා විසින්, තක්සේරුකරුවකුගේ මාර්ගයෙන් වැඩදුර පරීක්ෂණ කිරීමට සැලැස්විය හැකි අතර, අභියාචන පෙත්සමෙහි දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් ඒ පරීක්ෂණයේ දී එකඟවීම කට එළඹුනහොත් තක්සේරුවෙහි අවශ්‍ය සකස් කිරීම් කළ යුතු ය.

(6) (5) වන උපවගන්තියෙහි විධිවිධාන සලස්වා ඇති ආකාරයට අභියාචක හා තක්සේරුකරු අතර එකඟවීමක් ඇති නොවූ අවස්ථාවක, 120 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, අභියාචනය විභාග කිරීම සඳහා වේලාවක් සහ ස්ථානයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කළ යුතු ය.

(7) සෑම අභියාචකයකු ම අභියාචනය විභාග කිරීම සඳහා නියම කරනු ලැබූ වේලාවෙහි සහ ස්ථානයේ කොමසාරිස් ජනරාල්වරයා ඉදිරියේ පැමිණ සිටිය යුතු ය. පුද්ගලිකව හෝ බලයලත් නියෝජිතයකුගේ මාර්ගයෙන් හෝ අභියාචකට අභියාචන විභාගයට පෙනී සිටිය හැකි ය. අභියාචනයක විභාගය අඩාලව කල් තැබීම සුදුසු යයි කොමසාරිස් ජනරාල්වරයා කල්පනා කරන්නේ නම්, නියම කරනු ලබන වේලාවක දී සහ ස්ථානයක දී පැවැත්වීම පිණිස එය ඔහු විසින් එසේ කලින් කල අඩාලව කල් තැබිය හැකි ය. අභියාචක වෙනුවෙන් බලයලත් නියෝජිතයකු පැමිණ සිටින කවර හෝ අවස්ථාවක අභියාචනයේ විභාගය කොමසාරිස් ජනරාල්වරයා විසින් අඩාලව කල් තැබිය හැකි අතර, අභියාචනය විභාග කිරීම සඳහා අභියාචක පුද්ගලිකව පැමිණ සිටීම අවශ්‍ය යයි කොමසාරිස් ජනරාල්වරයා සලකන්නේ නම්, අඩාලව කල් තැබූ අභියාචනයේ විභාගය සඳහා නියමිත වේලාවෙහි සහ ස්ථානයේ අභියාචක පුද්ගලිකව පැමිණ සිටිය යුතුයයි ඔහු විසින් නියම කරනු ලැබිය හැකි ය. අභියාචනයේ විභාගය සඳහා හෝ අඩාලව කල් තැබූ විභාගය සඳහා හෝ නියම කරනු ලැබූ වේලාවෙහි හා ස්ථානයේ පැමිණ සිටීම අභියාචක විසින් හෝ ඔහුගේ නියෝජිතයා විසින් හෝ පැහැර හරිනු ලැබුවහොත් නැතහොත් කොමසාරිස් ජනරාල්වරයා විසින් පුද්ගලිකව පැමිණ සිටීමට අභියාචකට නියම කරනු ලැබ එසේ පැමිණ සිටීම ඔහු විසින් පැහැර හරිනු ලැබුවහොත් කොමසාරිස් ජනරාල්වරයා විසින් අභියාචනය නිෂ්ප්‍රභ කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද අභියාචනය නිෂ්ප්‍රභ කරනු ලැබීමෙන් පසු යුක්ති සහගත කාලයක් ඇතුළත ඒ අභියාචන විභාගයේ දී හෝ අඩාලව කල් තැබූ යම් විභාගයක දී ඔහු හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයා නිසි පරිදි පැමිණ සිටීම වළක්වනු ලැබූ යේ ශ්‍රී ලංකාවේ

නොසිටීම, රෝගාතුර භාවය හෝ වෙනත් නොවැළැක්විය හැකි හේතුවක් නිසා බවට අභියාචක විසින් කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් කරනු ලැබුවහොත් කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්ප්‍රභ කිරීමේ නියමය ඉවත් කොට අභියාචනයේ විභාගය සඳහා වේලාවක් සහ ස්ථානයක් නියම කළ හැකි ය.

(8) අභියාචනය සම්බන්ධයෙන් සාක්ෂි දිය හැකි යයි කොමසාරිස් ජනරාල්වරයා සලකන යම් තැනැත්තකු තමා ඉදිරියෙහි පෙනී සිටින ලෙස කැඳවීමේ බලය කොමසාරිස් ජනරාල්වරයාට තිබිය යුතු අතර, ඒ තැනැත්තා දිවුරුම් පිට හෝ අන් ලෙසකින් හෝ විභාග කරනු ලැබිය හැකි ය. එසේ පැමිණීමේ දී ඒ තැනැත්තා විසින් අවශ්‍යයෙන් ම දරන ලද යම් යුක්තිසහගත වියදමක් ලබා ගැනීමට කොමසාරිස් ජනරාල්වරයා විසින් ඔහුට ඉඩ සැලසිය හැකිය.

(9) යම් අභියාචනයක් පිළිබඳ ස්වකීය තීරණය කිරීමට පෙර, අවශ්‍ය යයි කොමසාරිස් ජනරාල්වරයා සලකතහොත් යම් තැනැත්තකු වෙත ලියවිල්ලකින් වූ දැන්වීමක් කිරීමෙන්, එම තැනැත්තා සන්තකයෙහි තිබෙන්නා වූ ද එම දැන්වීමෙහි නිශ්චය කරනු ලබන්නා වූ ද යම් ඔප්පු, පිඹුරු, සාධනපත්‍ර, පොත්, ගිණුම්, වෙළෙඳ ලැයිස්තු, තොග ලැයිස්තු, නාමලේඛන, චෙක්පත්, ගෙවීම් පත්‍රිකා, විගණක වාර්තා හෝ වෙනත් ලේඛන, ඒ දැන්වීමෙහි නිශ්චිත කාල සීමාව ඇතුළත, පරීක්ෂා කිරීම පිණිස ඉදිරිපත් කරන ලෙස හෝ කොමසාරිස් ජනරාල්වරයා වෙත එවන ලෙස හෝ ඒ තැනැත්තාට නියම කළ හැකි ය.

(10) අභියාචනය සම්බන්ධයෙන් අභියාචකගේ හෝ වෙනත් යම් තැනැත්තකුගේ සාක්ෂි කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග කරනු ලබන අවස්ථාවක, ඒ සාක්ෂි පිළිබඳ වාර්තාවක් තබා ගැනීම හෝ තබා ගැනීමට සැලැස්වීම කොමසාරිස් ජනරාල්වරයා විසින් කළ යුතු ය.

(11) අභියාචනය කරනු ලබන්නේ යම් තක්සේරුවකට විරුද්ධ ව ද එම තක්සේරුව, මේ වගන්තිය යටතේ අභියාචනයක් තීරණය කිරීමේ දී කොමසාරිස් ජනරාල්වරයා විසින් ස්ථිර කරනු ලැබිය හැකි ය; නැතහොත් අඩු කරනු ලැබිය හැකි ය; නැතහොත් වැඩි කරනු ලැබිය හැකි ය; නැතහොත් අවලංගු කරනු ලැබිය හැකිය.

ආ—සමාලෝචන මණ්ඩලය වෙත කරනු ලබන අභියාචන

සමාලෝචන මණ්ඩලයේ සංයුතිය.

118. (1) මෙහි මින් මතු විධිවිධාන සලස්වනු ලබන ආකාරයට අභියාචන විභාග කිරීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් විසි දෙනකුට වැඩි නොවන ගණනකින් සමන්විත (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) සමාලෝචන මණ්ඩලයක් විය යුතු ය. මණ්ඩලයේ සාමාජිකයන් අවුරුදු තුනක කාලයකට ධුර දැරිය යුතු අතර ඔවුන් නැවත පත් කරනු ලැබීම සඳහා සුදුසු විය යුතුය.

(2) මණ්ඩලයේ ලේකම්වරයකු විය යුතු අතර, ඔහු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

(3) මණ්ඩලයේ නීති උපදේශකයකු විය යුතු අතර ඔහු මණ්ඩලය විසින් පත් කරනු ලැබිය යුතු ය.

(4) අභියාචන විභාග කරන රැස්වීම්වලට සහභාගි වීම සඳහා මණ්ඩලයේ සාමාජිකයන් තුන් දෙනකු හෝ ඊට වැඩි ගණනක් අමාත්‍යවරයා විසින් නම් කරනු ලැබිය යුතු අතර ඔවුන් ලේකම්වරයා විසින් කැඳවනු ලැබිය යුතු ය. එවැනි රැස්වීමක ගණපූරණය සාමාජිකයන් දෙදෙනකුගෙන් සමන්විත විය යුතු ය.

(5) මුලු මණ්ඩලයේ ම රැස්වීමක් කැඳවීම කොමසාරිස් ජනරාල්වරයාගේ ඉල්ලීම පිට මණ්ඩලයේ ලේකම්වරයා විසින් කළ යුතු ය. එවැනි රැස්වීමක ගණපූරණය සාමාජිකයන් පස් දෙනකුගෙන් සමන්විත විය යුතු ය.

(6) මණ්ඩලයේ සාමාජිකයන්ගේ, ලේකම්වරයාගේ සහ නීති උපදේශකගේ පාරිශ්‍රමික, අමාත්‍යවරයා විසින් නියම කළ යුතු ය.

සමාලෝචන මණ්ඩලය වෙත අභියාචන කිරීම.

119. (1) 117 වන වගන්තිය යටතේ වූ අභියාචනයක් සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල්වරයා විසින් කරන ලද තීරණයක් පිළිබඳව සෑහීමට පත් නොවූ යම් අභියාචකයකු හෝ බලයලත් නියෝජිතයකු හෝ විසින් ඒ තීරණය පිළිබඳව තමා සෑහීමට පත් නොවන බව කොමසාරිස් ජනරාල්වරයා වෙත ලියවිල්ලකින් දැනුම් දිය හැකි ය. එවැනි සෑම දැනුම් දීමක් ම, තීරණයේ දින සිට සතියක් ඇතුළත දී කළ යුතු ය.

(2) කොමසාරිස් ජනරාල්වරයාගේ තීරණයෙන් තමා සෑහීමට පත් නොවන බව (1) වන උපවගන්තියට අනුව අභියාචක විසින් දැනුම් දී ඇති අවස්ථාවක කොමසාරිස් ජනරාල්වරයා විසින් තමාගේ එම තීරණයට හේතු ඒ තීරණයේ දින සිට එක් මාසයක් ඇතුළත අභියාචක වෙත හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා වෙත හෝ ලියවිල්ලකින් දන්වා යැවිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් ස්වකීය තීරණයට හේතු දන්වා යැවූ දිනයේ සිට එක් මාසයක් ඇතුළත, ඒ තීරණයට විරුද්ධව, අභියාචක විසින් හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා විසින් හෝ මණ්ඩලය වෙත යොමු කරන ලද ලියවිල්ලකින් වූ පෙත්සමක් මගින් අභියාචනයක් කළ හැකි අතර—

(අ) අභියාචනය කරනු ලබන්නේ කොමසාරිස් ජනරාල්වරයාගේ යම් තීරණයකට හා හේතුවලට විරුද්ධව ද ඒ තීරණයෙහි සහ හේතුවල පිටපතක් එවැනි සෑම පෙත්සමක් සමග විය යුතු ය;

(ආ) එවැනි සෑම පෙත්සමකම අභියාචනයට හේතු පැහැදිලිව දක්වා තිබිය යුතු ය; තව ද

(ඇ) එවැනි සෑම පෙත්සමක් ම මණ්ඩලයේ ලේකම්වරයා වෙත භාර දිය යුතු ය.

කොමසාරිස් ජනරාල්වරයා විසින් සමාලෝචන මණ්ඩලය වෙත අභියාචනා යොමු කළ හැකි බව.

120. 117 වන වගන්තියෙහි විධිවිධානවල කුමක් සඳහන් ව ඇත ද කොමසාරිස් ජනරාල්වරයා වෙත යොමු කරන ලද යම් වලංගු අභියාචනයක් ඔහු විසින් සමාලෝචන මණ්ඩලය වෙත යොමු කරනු ලැබිය හැකි ය. මණ්ඩලය විසින් එවැනි අභියාචනයක් විභාග කොට තීරණ කළ යුතු අතර, එසේ යොමු කරනු ලබන යම් අභියාචනයක් විභාග කර තීරණය කිරීම සම්බන්ධයෙන් 121 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

සමාලෝචන මණ්ඩලය විසින් අභියාචනා විභාග කිරීම සහ තීරණය. කිරීම.

121. (1) අභියාචනයක් ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මණින්, අභියාචනය විභාග කිරීම සඳහා දිනයක්, වේලාවක් සහ ස්ථානයක් මණ්ඩලයේ ලේකම්වරයා විසින් නියම කළ යුතු අතර ඒ පිළිබඳ ව අභියාචක සහ කොමසාරිස් ජනරාල්වරයා යන දෙදෙනාටම දින දහහතරක දැනුම් දීමක් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් ලැබුණු විට, 117 (10) වන වගන්තිය යටතේ තබාගන්නා ලද සාක්ෂි වාර්තාවෙහි පිටපතක් මණ්ඩලය වෙත යැවිය යුතු ය.

(3) අභියාචනය විභාග කරනු ලබන මණ්ඩලයේ රැස්වීමකදී සෑම අභියාචකයකු ම පුද්ගලිකව හෝ බලය ලත් නියෝජිතයකුගේ මාර්ගයෙන් පෙනී සිටිය යුතු ය:

එසේ වුව ද අභියාචනයක් විභාග කිරීමේ දී අභියාචක විසින් බලය පවරන ලද නියෝජිතයා පැමිණ සිටින අවස්ථාවක, අභියාචකට පුද්ගලිකව පැමිණ සිටීමට හැකි වීම පිණිස අවශ්‍ය යැයි මණ්ඩලය සලකන කාලයකට විභාගය කල් තැබිය හැකි ය.

(4) අභියාචනය කරනු ලබන්නේ යම් තක්සේරුවකට විරුද්ධව ද ඒ තක්සේරුව කළ තක්සේරුකරු හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් බලය පවරන ලද වෙනත් නැනැත්තකු හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් තීරණය කරන ලද තක්සේරුව සනාථ කිරීම පිණිස, ඒ අභියාචනය විභාග කරනු ලබන මණ්ඩලයේ රැස්වීමට පැමිණ සිටිය යුතු ය.

(5) අවස්ථාවෝචිත පරිදි, කොමසාරිස් ජනරාල්වරයා විසින් අභියාචනයේ දී තීරණය කරන ලද හෝ 120 වන වගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් යොමු කරන ලද හෝ තක්සේරුව අධිකය යි හෝ වැරදි සහිත යයි ඔප්පු කිරීමේ භාරය අභියාචක සතු විය යුතු ය.

(6) සියලු අභියාචනා රහසිගතව විභාග කළ යුතු ය.

(7) අභියාචනය සම්බන්ධයෙන් සාක්ෂි දිය හැකි යයි මණ්ඩලය සලකන යම් නැනැත්තකු විභාගයේ දී පැමිණ සිටීම සඳහා කැඳවීමට මණ්ඩලයට බලය තිබිය යුතු අතර, ඒ නැනැත්තා දිවුරුම් පිට හෝ අන් ලෙසකින් හෝ සාක්ෂිකරුවකු ලෙස විභාග කරනු ලැබිය හැකි ය. එසේ පැමිණීමේ දී ඒ නැනැත්තා විසින් අවශ්‍යයෙන් ම දරන ලද යම් යුක්ති සහගත වියදමක් ලබා ගැනීමට මණ්ඩලය විසින් ඔහුට ඉඩ සැලසිය හැකි ය.

(8) මණ්ඩලයේ අනුමැතිය ඇතිව සහ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන නියමයන්ට අනුව මිස මණ්ඩලය විසින් පවත්වනු ලබන විභාගයක දී කොමසාරිස් ජනරාල්වරයා ඉදිරියේ ඉදිරිපත් කරනු නොලැබූ යම් ලේඛනයක් ඉදිරිපත් කිරීමට හෝ කොමසාරිස් ජනරාල්වරයා ඉදිරියේ සාක්ෂි මෙහෙයවනු නොලැබූ නැතහොත් කොමසාරිස් ජනරාල්වරයා ඉදිරියේ පවත්වනු ලැබූ විභාගයේ දී සාක්ෂි එවකටත් සටහන් කර ගනු ලැබ ඇති සාක්ෂිකරුවකුගේ සාක්ෂි මෙහෙයවීමට අභියාචකට ඉඩ නොදිය යුතු ය.

(9) අභියාචනය විභාග කිරීමේ දී ඉදිරිපත් කරනු ලැබූ වාචික හෝ ලේඛනමය යම් සාක්ෂියක් (8) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව මණ්ඩලය විසින් පිළිගත හැකි ය; නැතහොත් ප්‍රතික්ෂේප කළ හැකි ය. තව ද සාක්ෂිවල ආවේශ්‍යතාව සම්බන්ධයෙන් සාක්ෂි ආඥාපනතෙහි විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(10) අවස්ථාවෝචිත පරිදි අභියාචනය මත කොමසාරිස් ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබූ හෝ 120 වන වගන්තිය යටතේ ඔහු විසින් යොමු කරනු ලැබූ තක්සේරුව, මණ්ඩලය විසින් අභියාචනය විභාග කිරීමෙන් පසු, ස්ථිර කිරීම, අඩු කිරීම, වැඩි කිරීම නැතහොත් අවලංගු කිරීම කළ යුතු ය. නැතහොත් ඒ සම්බන්ධයෙන් මණ්ඩලයේ නිර්දේශ ද සමඟ එය කොමසාරිස් ජනරාල්වරයා වෙත ආපසු යැවිය හැකි ය. මණ්ඩලය විසින් තක්සේරුව සහ නිර්දේශ එසේ ආපසු යවනු ලැබූ අවස්ථාවක, කොමසාරිස් ජනරාල්වරයා විසින් මණ්ඩලයේ නිර්දේශයට අනුව තක්සේරුව අවශ්‍ය පරිදි ප්‍රතිශෝධනය කළ යුතු ය. මණ්ඩලයේ තීරණය අභියාචක සහ කොමසාරිස් ජනරාල්වරයා වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

(11) (10) වන උපවගන්තිය යටතේ මණ්ඩලය විසින් ඒ තක්සේරුව අඩු නොකළ විට හෝ අවලංගු නොකළ විට රුපියල් පන්සියයක් නොඉක්මවන මුදලක් මණ්ඩලයේ ශාස්තු වශයෙන් ගෙවන ලෙස මණ්ඩලය විසින් අභියාචකට නියම කළ හැකි අතර, තක්සේරුව මගින් ගෙවීමට නියම කරනු ලැබූ බද්දට එය එකතු කොට බද්ද සමඟ අයකර ගත යුතු ය.

ඇ—අභියාචනාධිකරණය වෙත කරනු ලබන අභියාචන

නීති ප්‍රශ්නයක් මත අභියාචනාධිකරණය වෙත කරනු ලබන අභියාචනය.

122. (1) මණ්ඩලයේ තීරණය අවසානාත්මක විය යුතු ය:

එසේ වුව ද නීති ප්‍රශ්නයක් ගැන තීරණයක් සඳහා අභියාචනාධිකරණය වෙත කරුණු සැලකිරීමක් ඉදිරිපත් කරන ලෙස අභියාචක විසින් හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් මණ්ඩලයෙන් ඉල්ලීමක් කළ හැකි ය. මණ්ඩලයේ තීරණය අවස්ථාවෝචිත පරිදි කොමසාරිස් ජනරාල්වරයා වෙත හෝ අභියාචක වෙත ලියවිල්ලකින් දැනුම් දෙන ලද දිනයෙහි සිට මාසයක් ඇතුළත, රුපියල් පණහක ශාස්තුවක් ද සමඟ ලියවිල්ලක් මගින් මණ්ඩලයේ ලේකම්වරයා වෙත භාර දෙනු ලැබුවහොත් මිස, එවැනි ඉල්ලීමක් භාර නොගනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලය විසින් ඉදිරිපත් කරන කරුණු සැලකිරීමෙහි, අදාළ කාරණා ද මණ්ඩලයේ තීරණය ද ආරාවුලට හේතු වූ බදුවල ප්‍රමාණය රුපියල් පන්දහසකට වැඩි නම් ඒ බදු ප්‍රමාණය ද දක්වා තිබිය යුතු අතර එම කරුණු සැලකිරීම ඉදිරිපත් කරන ලෙස මණ්ඩලයෙන් ඉල්ලා සිටින පාර්ශ්වකරු විසින්, කරුණු සැලකිරීම, සැලකිරීමෙන් සහ අත්සන් කිරීමෙන් පසු තමා වෙත ලැබීමෙන් දින දහ හතරක් ඇතුළත අභියාචනාධිකරණය වෙත යැවිය යුතු ය.

(3) මූල්‍යාඥාපනතේ විධිවිධාන අදාළ කිරීමේ කාර්ය සඳහා—

(අ) අභියාචනාධිකරණය වෙත මේ වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද කරුණු සැලකිරීමක් පිළිබඳව හෝ එබඳු කරුණු සැලකිරීමක් විභාග කිරීමට, නිශ්චය කිරීමට හෝ එබඳු කරුණු සැලකිරීමකට සුදුස්සක් කිරීමට අදාළ ව අභියාචනාධිකරණය ඉදිරියේ පවත්වනු ලබන සියලු නඩු කටයුතු, රුපියල් පන්දහසක හෝ ඉදිරිපත් කරන ලද කරුණු සැලකිරීමෙහි ආරාවුලට හේතු වූ බදු ප්‍රමාණය වශයෙන් මණ්ඩලය විසින් දක්වනු ලබන වැඩි මුදලක හෝ වටිනාකම ඇති, අභියාචනාධිකරණය ඉදිරියෙහි වූ සිවිල් නඩු කටයුතු ලෙස සැලකිය යුතු ය;

(ආ) එසේ ඉදිරිපත් කරන ලද සෑම කරුණු සැලකිරීමක් ම මණ්ඩලය විසින් අමුණනු ලැබූ පොත්, ලේඛන සහ කඩදාසි සමඟ අභියාචනාධිකරණය ඉදිරියෙහි වූ සිවිල් නඩු කටයුත්තක එකම ඉදිරිපත් කළ දෙය ලෙස සැලකිය යුතු ය; තව ද

(ඇ) කොමසාරිස් ජනරාල්වරයා අභියාචක නම්, නිල බලයෙන් වූ නඩුවක, නඩු පවරන රජයේ නිලධරයකු වශයෙන් ද, ඔහු අභියාචනයෙහි විගළත්තරකරු නම්, නිල බලයෙන් වූ නඩුවක, තමාට විරුද්ධව නඩු පවරන ලද රජයේ නිලධරයකු වශයෙන් ද ඔහු සලකනු ලැබිය යුතු ය.

(4) අභියාචනාධිකරණය වෙත කරුණු සැලකිරීමක් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටින පාර්ශ්වකරු විසින් ඒ කරුණු සැලකිරීම එසේ ඉදිරිපත් කරන වේලෙහි හෝ ඊට පෙර, ස්වකීය ඉල්ලීම පරිදි කරුණු සැලකිරීමක් කරනු ලැබූ බව දන්වමින් ලියවිල්ලකින් වූ දැන්වීමක් අනෙක් පාර්ශ්වකරු වෙත යැවිය යුතු අතර, ඉදිරිපත් කරන ලද කරුණු සැලකිරීමෙහි පිටපතක් ද ඒ පාර්ශ්වකරු වෙත සැපයිය යුතු ය.

(5) ඉදිරිපත් කරන ලද කරුණු සැලකිරීමක්, සංශෝධනය කිරීම පිණිස, අභියාචනාධිකරණයෙහි යම් විනිශ්චයකාරවරයන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් විසින් මණ්ඩලය වෙත ආපසු එවනු ලැබිය හැකි ය. ඒ අනුව මණ්ඩලය විසින් කරුණු සැලකිරීම සංශෝධනය කළ යුතු ය.

(6) ඉදිරිපත් කරන ලද කරුණු සැලකිරීමෙන් උද්ගත වන යම් නීති ප්‍රශ්නයක් අභියාචනාධිකරණයෙහි විනිශ්චයකාරවරයන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් හෝ විසින් විභාග කොට නිශ්චය කළ යුතු ය. ඒ ප්‍රශ්නය පිළිබඳව අධිකරණයෙහි තීරණයට අනුව, මණ්ඩලය විසින් කරන ලද තක්සේරුව ස්ථිර කිරීම, අඩු කිරීම, වැඩි කිරීම හෝ අවලංගු කිරීම ඒ විනිශ්චයකාරවරයන් විසින් කළ

හැකි ය. නැතහොත් ඒ පිළිබඳව අධිකරණයෙහි නිර්දේශ සමඟ, කරුණු සැලකිරීම, මණ්ඩලය වෙත යැවිය හැකිය. අධිකරණය විසින් කරුණු සැලකිරීමක් එසේ යවනු ලැබූ කල්හි අධිකරණයේ නිර්දේශ යට අනුව මණ්ඩලය විසින් ඒ තක්සේරුව ප්‍රතිශෝධනය කළ යුතු ය.

(7) අභියාචනාධිකරණය ඉදිරියේ මේ වගන්තිය යටතේ වූ යම් නඩුවක දී අභියාචනාධිකරණයේ ගාස්තු සම්බන්ධයෙන් ද (1) වන උපවගන්තිය යටතේ ගෙවනු ලැබූ මුදල සම්බන්ධයෙන් ද සුදුසු යයි අධිකරණයට පෙනී යන ආඥුවක් අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය.

(8) (6) වන උපවගන්තිය යටතේ අභියාචනාධිකරණය විසින් කරනු ලැබූ යම් ආඥුවකට විරුද්ධව කොමසාරිස් ජනරාල් වරයා විසින් නැතහොත් වෙනත් පාර්ශ්වකරුවකු විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනය කිරීමට හැකි කරවීමේ කාර්යය සඳහාත් අභියාචනාධිකරණයේ තීරණය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනය කිරීමට අදාළ යම් ලිඛිත නීතියක විධිවිධාන අදාළ කිරීමේ කාර්යය සඳහාත්—

(අ) (6) වන උපවගන්තිය යටතේ අභියාචනාධිකරණය විසින් කරනු ලැබූ යම් ආඥුවක් සහ (7) වන උපවගන්තිය යටතේ ඒ අධිකරණය විසින් කරන ලද යම් ආඥුවක්, කොමසාරිස් ජනරාල්වරයා සහ ඒ අනෙක් පාර්ශ්වකරු අතර සිවිල් නඩුවක දී අභියාචනාධිකරණය විසින් කළ අවසාන නඩු තීන්දුවක් ලෙස සැලකිය යුතු ය;

(ආ) එවැනි සිවිල් නඩුවක, ආරාවුලට තුඩු දුන් කාරණයෙහි වටිනාකම රුපියල් පන්දහසක් ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද මණ්ඩලය විසින් ආරාවුලට හේතු වූ බදු ප්‍රමාණය වශයෙන් රුපියල් පන්දහසකට වැඩි ප්‍රමාණයක්, ඉදිරිපත් කරන ලද කරුණු සැලකිරීමෙහි දක්වා ඇති අවස්ථාවක, එවැනි සිවිල් නඩුවක ආරාවුලට තුඩු දුන් කාරණයෙහි වටිනාකම, එසේ දක්වා ඇති වැඩි ප්‍රමාණය ලෙස සලකනු ලැබිය යුතු ය; තව ද

(ඇ) එවැනි යම් අභියාචනයක් සම්බන්ධයෙන් එවැනි යම් ලිඛිත නීතියකින් නියමිත යම් මුදලක් තැන්පත් කරන ලෙස හෝ, යම් ගාස්තුවක් ගෙවන ලෙස හෝ යම් ඇපයක් තබන ලෙස කොමසාරිස් ජනරාල්වරයාට නියම කරනු නොලැබිය යුතු ය.

XIX වන පරිච්ඡේදය

තක්සේරු කිරීම්වල අවසානාත්මක භාවය සහ වැරදි වාර්තා සම්බන්ධයෙන් දණ්ඩන

තක්සේරු හෝ සංශෝධිත තක්සේරු අවසානාත් මක කිරීය යුතු බව.

123. තක්සේරු කළ හැකි ආදායම් ප්‍රමාණය හෝ බදු අය කළ හැකි ධනය හෝ බදු අය කළ හැකි ත්‍යාග හෝ සම්බන්ධයෙන් කරන ලද තක්සේරුවකට විරුද්ධව 117 (1) වන වගන්තියෙහි නිශ්චිත කාලය ඇතුළත විලංගු අභියාචනයක් ඉදිරිපත් කර නොමැති අවස්ථාවක, හෝ එබඳු තක්සේරුවකට විරුද්ධව ඉදිරිපත් කරනු ලැබූ අභියාචනයක් 117 වන වගන්තියේ (7) වන උපවගන්තිය යටතේ

නිශ්ප්‍රභ කර ඇති අවස්ථාවක හෝ 117 (5) වන වගන්තිය යටතේ ඒ තක්සේරු කළ හැකි ආදායම හෝ බදු අය කළ හැකි ධනය හෝ බදු අය කළ හැකි ත්‍යාගවල මූදල පිළිබඳව එකඟත්වයක් ඇති කර ගනු ලැබූ අවස්ථාවක හෝ ඒ තක්සේරු කළ හැකි ආදායම හෝ බදු අය කළ හැකි ධනය හෝ බදු අය කළ හැකි ත්‍යාගවල මුදල අභ්‍යාවාහයේ දී තීරණය කරනු ලැබ ඇති අවස්ථාවක හෝ, අවස්ථාවෝචිත පරිදි තක්සේරු කරනු ලැබූ හෝ එකඟ වනු ලැබූ හෝ අභියාචනයේ දී නිශ්චය කරනු ලැබූ තක්සේරුව, අවස්ථාවෝචිත පරිදි ඒ තක්සේරු කළ හැකි ආදායමේ හෝ බදු අය කළ හැකි ධනයේ හෝ බදු අය කළ හැකි ත්‍යාගවල ප්‍රමාණය සම්බන්ධයෙන් මේ පනතේ සියලු කාර්යයන් සඳහා අවසානාත්මක හා තීරණාත්මක විය යුතු ය:

එසේ වුව ද යම් තක්සේරු වර්ෂයක් සඳහා අභියාචනයකින් නිශ්චය කරනු ලැබූ යම් කාරණාවක් නැවත සලකා බැලීමක් සිදු නොවන යම් තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් ඒ වර්ෂය සඳහා තක්සේරුකරුවකු විසින් 115 වන වගන්තියේ විධිවිධාන වලට යටත් ව කරනු ලැබීම මේ පනතෙහි කිසිවකින් වැළැක්වෙතැයි නොසැලකිය යුතු අතර එසේ වැළැක්වෙතැයි තේරුම් නොගත යුතු ය.

සාවද්‍ය වාර්තා සම්බන්ධයෙන් දණ්ඩනය.

124. (1) යම් තැනැත්තකු සම්බන්ධයෙන් කරනු ලැබූ තක්සේරුවක, තක්සේරු කළ හැකි ආදායමෙහි හෝ බදු අය කළ හැකි ධනයෙහි හෝ බදු අය කළ හැකි ත්‍යාගවල ප්‍රමාණය, 92(1) වන හෝ 92(2) වන වගන්තිය යටතේ ඔහු විසින් සපයන ලද වාර්තාවෙහි තමාගේ තක්සේරු කළ හැකි ආදායම හෝ බදු අය කළ හැකි ධනය හෝ බදු අය කළ හැකි ත්‍යාග හෝ ලෙස නිශ්චය කොට ඇති ප්‍රමාණයට වඩා වැඩි වන්නා වූ ද, ඒ තක්සේරුව 123 වන වගන්තිය යටතේ අවසානාත්මක හා තීරණාත්මක වන්නා වූ ද අවස්ථාවක, ඒ තැනැත්තා විසින් ඒ වාර්තාවෙහි ආදායම හෝ ධනය හෝ දෙන ලද ත්‍යාග හෝ හෙළි කිරීමේ දී වංචා කිරීමක් හෝ වුවමනාවෙන් ම අතපසු කිරීමක් සිදු වී නැති බව කොමසාරිස් ජනරාල් වරයා සෑහීමට පත් වන පරිදි ඒ තැනැත්තා විසින් ඔප්පු කරනු ලැබුවහොත් මිස, සාවද්‍ය වාර්තාවක් සැපයීම ගැන දණ්ඩනයක් වශයෙන් එකතුව රුපියල් දෙදහසකට වැඩි නොවන මුදලක් සහ අතිරික්ත ප්‍රමාණයට අදාළ බද්දෙහි දෙගුණයකට සමාන මුදලක් නියම කරනු ලබන දිනයක හෝ ඊට පෙර ගෙවන ලෙස කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ තැනැත්තාට ලියවිල්ලකින් නියම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නියමයක් කරනු ලැබුවේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද, ඒ තැනැත්තා විසින්, නියමය ඔහුවෙත දැනුම් දෙනු ලැබීමෙන් පසු දින විසි එකක් අතුළත ඊට විරුද්ධව සමීක්ෂණ මණ්ඩලය වෙත ලියවිල්ලකින් අභියාචනයක් කළ හැකි ය. නියමයට විරුද්ධ වීමේ හේතු අභියාචනයෙහි පැහැදිලිව සඳහන් කළ යුතු ය.

(3) මේ වගන්තියේ ඉහත සඳහන් විධිවිධාන යටතේ වූ යම් අභියාචනයක් විභාග කර ඊට සුදුස්සක් කිරීම සම්බන්ධයෙන් හැකි තාක් දුරට 121 වන වගන්තියෙහි විධිවිධාන අදාළ විය යුතු ය.

කොමසාරිස් ජනරාල්වරයාගේ නියමය මගින් පනවනු ලැබුවා වූ ද අභියාචනයට විෂය වූ ද දණ්ඩන මුදල් ස්ථිර කිරීම, අඩු කිරීම, වැඩි කිරීම් නැතහොත් අවලංගු කිරීම සමීක්ෂණ මණ්ඩලය විසින් කරනු ලැබිය හැකිය. එහෙත් ඒ දණ්ඩන මුදලෙහි යම් වැඩි කිරීමක්, ඒ දණ්ඩන මුදල් වශයෙන් කොමසාරිස් ජනරාල්වරයා විසින් (1) වන උපවගන්තිය යටතේ පනවනු ලැබිය හැකි උපරිම ප්‍රමාණයට වඩා වැඩි නොවිය යුතු ය.

(4) යම් තැනැත්තකුගේ ආදායම හෝ ධනය හෝ ත්‍යාග පිළිබඳ වාර්තාවක් සම්බන්ධයෙන් මේ වගන්තිය යටතේ යම් දණ්ඩන මුදලක් ඒ තැනැත්තා කෙරෙහි පනවනු ලැබූ අවස්ථාවක 151 වන වගන්තියේ (4) වන උපවගන්තියෙහි (අ) ඡේදය යටතේ හෝ 153 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි (අ) ඡේදය යටතේ හෝ, ඒ වාර්තාව සම්බන්ධයෙන් වූ වරදකට නඩු පවරනු ලැබීමට ඔහු යටත් නොවිය යුතු ය.

XX වන පරිච්ඡේදය

පැහැර හරිනු ලැබූ බද්ද සහ එයට එකතු කරනු ලබන මුදල්

පැහැර හරිනු ලැබූ බද්ද සහ එයට එකතු කරනු ලබන මුදල්.

125. (1) යම් තක්සේරු වර්ෂයක් සඳහා වූ බද්දක ත්‍රෛමාසික වාරිකය හෝ එවැනි වාරිකයකින් කොටසක් හෝ ගෙවීම සඳහා 97 (1) වන වගන්තියෙහි නිශ්චිත දිනයෙහි හෝ ඒ දිනයට පෙර හෝ බද්දෙහි එම වාරිකය හෝ වාරිකයකින් කොටස ගෙවා නොමැති අවස්ථාවක හෝ යම් තක්සේරු වර්ෂයක් සඳහා තක්සේරු කරුවන් විසින් තක්සේරු කරනු ලැබුවා වූ ද තක්සේරු දැන්වීමෙහි නිශ්චිත දිනයෙහි (එම දිනය, 97 (1) වන වගන්තිය යටතේ ගෙවිය යුතු වන යම් බද්දක් සම්බන්ධයෙන් වූ විට එම බද්ද හෝ එහි කොටස ගෙවිය යුතු වන්නේ යම් දිනයකට පෙර ද ඒ දිනයට පූර්වයෙන් වූ දිනයක් විය යුතු ය.) හෝ ඒ දිනයට පෙර ගෙවීමට නියමව ඇත්තා වූ ද බද්දක් හෝ බද්දකින් කොටසක් ගෙවා නොමැති අවස්ථාවක එම බද්ද හෝ බද්දෙහි කොටස ගෙවීම පැහැර හැර ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර—

(අ) එම බද්ද එක් තැනැත්තකු විසින් ගෙවිය යුතු වන අවස්ථාවක ඒ තැනැත්තා ද;

(ආ) ඒ බද්ද එක් තැනැත්තකුට වැඩි ගණනක් විසින් හෝ හවුල් ව්‍යාපාරයක් විසින් හෝ ගෙවිය යුතු වන අවස්ථාවක, ඒ එක් එක් තැනැත්තා සහ හවුල් ව්‍යාපාරයේ එක් එක් හවුල්කරු ද

මේ පනතේ කාර්ය සඳහා ගෙවීම් පැහැර හරින්නකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු යම් බද්දක් ගෙවීම පැහැර හැර තිබෙන අවස්ථාවක, ගෙවීම පැහැර හරින්නා විසින්, ගෙවීම පැහැර හරින ලද බද්දට අමතරව—

(අ) ගෙවීම පැහැර හරින ලද ප්‍රමාණයෙන් සියයට පහකට සමාන මුදලක්; සහ

(ආ) යම් ප්‍රමාණයක් ගෙවීම් පැහැර හරින ලද්දේ ද ඒ ප්‍රමාණය ගෙවීම පැහැර හැරීම ආරම්භ වීමෙන් පසු දින තිහක් ඉකුත් වීමට පෙර නොගෙවනු ලබන අවස්ථාවක, තව දුරටත් ගෙවීම පැහැර හැර තිබෙන්නා වූ කාලසීමාවේ එක් එක් ත්‍රෛමාසික හෝ ඉන් කොටසක කාලසීමාව වෙනුවෙන්, ගෙවීම පැහැර හරින ලද ප්‍රමාණයෙන් සියයට පහකට සමාන වැඩිපුර මුදලක්

දණ්ඩන මුදලක් ලෙස හෙවිය යුතු ය:

එසේ වුව ද—

(i) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ දණ්ඩන මුදලක් ලෙස ගෙවිය යුතු මුළු මුදල කිසිම අවස්ථාවක, ගෙවීම පැහැර හරින ලද බද්දෙන් සියයට විසි පහක් නොඉක්මවිය යුතු ය;

(ii) යම් තක්සේරු වර්ෂයකට ඉහතින් ම වූ වර්ෂය සඳහා යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු ආදායම් බද්දෙන් හා ධන බද්දෙන් සතරෙන් එකකට අඩු නොවන මුදලක් ත්‍රෛමාසික වාරිකය ලෙස ඒ තැනැත්තා විසින් ඒ තක්සේරු වර්ෂය සඳහා ගෙවනු ලැබ ඇති අවස්ථාවක, ඒ තැනැත්තා ඒ ත්‍රෛමාසික වාරිකය වෙනුවෙන් මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ කිසියම් දණ්ඩන මුදලක් ගෙවීමට යටත් නොවිය යුත්තේ ය;

(iii) කාරණයේ සියලු අවස්ථාගත කරුණු අනුව, අඩු කිරීමක් නැතහොත් අත් හැරීමක් කිරීම සාධාරණ යයි සහ යුක්ති සහගත යයි කොමසාරිස් ජනරාල්වරයාට පෙනී යන්නේ නම් මේ වගන්තිය යටතේ ගෙවිය යුතු යම් දණ්ඩන මුදලක් අඩු කිරීම හෝ අත් හැරීම කොමසාරිස් ජනරාල්වරයා විසින් කරනු ලැබිය හැකි ය.

(3) තක්සේරුකරුවකු විසින් යම් තැනැත්තකු සම්බන්ධයෙන් යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තක්සේරුවක් කරනු ලැබ ඇති අවස්ථාවක, තක්සේරු දැන්වීමෙහි නිශ්චිත බදු මුදල, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තා විසින් ගෙවනු ලැබිය යුතු බද්ද ලෙස, (2) එන උපවගන්තියෙහි කාර්යයන් සඳහා සලකනු ලැබිය යුතු ය.

(4) තක්සේරුවට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කර ඇත ද, ඒ අභියාචනයේ තීරණය ලැබෙන තෙක් යම් බද්දක් හෝ එහි යම් කොටසක් ගෙවීම අත්හිටුවා තබන ලෙස කොමසාරිස් ජනරාල් වරයා නියම කළහොත් මිස, එය ගෙවිය යුතු ය. එසේ ගෙවීම අත්හිටුවා තබන ලද බද්දෙහි හෝ ඒ කොටසෙහි මුදල ගෙවීම පැහැර හරින ලද්දක් ලෙස නොසැලකිය යුතු ය.

(5) (4) වන උපවගන්තිය යටතේ, ගෙවීම අත්හිටුවා තබන ලද බද්ද හෝ එහි යම් කොටසක් අයකර ගත නොහැකිවීමට ඉඩ ඇති බව හෝ අභියාචක තම අභියාචනයේ කටයුතු අයුක්තිසහගත ලෙස ප්‍රමාද කරන බව හෝ කොමසාරිස් ජනරාල්වරයාගේ මතය වන අවස්ථාවක, තමා ඒ උපවගන්තිය යටතේ කළ නියමය අවලංගු කර කාරණයට අවශ්‍ය යයි ඔහුට පෙනී යා හැකි යම් අලුත් නියමයක් ඔහු විසින් කරනු ලැබිය හැකි ය. අලුත් නියමයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි දිනයකදී හෝ ඊට පෙර නොගෙවන ලද යම් බද්දක මුදල, ගෙවීම පැහැර හරින ලද්දක් ලෙස සැලකිය යුතු ය.

(6) XVIII වන පරිච්ඡේදය යටතේ අභියාචනයක් පිළිබඳ අවසාන තීරණය කරනු ලැබූ විට හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් කරනු ලැබූ යම් නියමයක් අනුව හෝ, (4) වන උපවගන්තිය යටතේ ගෙවීම අත්හිටුවා තබන ලද යම් බද්දක් ගෙවිය යුතු බවට පත්වන අවස්ථාවක හෝ මුල් තක්සේරුවෙන් නියම කරන ලද බද්ද වැඩි කරනු ලැබූ අවස්ථාවක, යම් බද්දක් හෝ බද්දක ශේෂයක් යම් දිනයක හෝ ඊට පෙර ගෙවිය යුතු ද ඒ දිනය නියම කරමින් කොමසාරිස් ජනරාල්වරයා විසින් අභියාචක වෙත ලිඛිත දැන්වීමක් යැවිය යුතු ය. ඒ අනුව ගෙවනු නොලැබූ යම් බද්දක්, ගෙවීම පැහැර හරින ලද්දක් ලෙස සැලකිය යුතු ය.

(7) මේ වගන්තියෙහි කුමක් සඳහන්ව ඇත ද, තක්සේරුවකට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කර ඇත්තාවූ ද, තක්සේරු දැන්වීමෙහි නිශ්චිත බද්ද ගෙවීම කොමසාරිස් ජනරාල්වරයාගේ නියමයක් පිට අත්හිටුවා තබන ලද්දාවූ ද අවස්ථාවක, ඒ තක්සේරුව වෙනුවෙන් තමාගෙන් යම් කිසි මුදලක් අයවිය යුතුව ඇති බවට

හෝ අයවිය යුතු වීමට ඉඩ ඇති බවට, ඒ අභියාචනය පරීක්ෂා කරනු ලබන හෝ විභාග කරනු ලබන අවස්ථාවේ දී අභියාචක එකඟ වුවහොත් කොමසාරිස් ජනරාල්වරයා විසින් අභියාචක වෙත ලිය්ල්ලකින් කරනු ලබන දැන්වීමක් මගින්, එම දැන්වීමෙහි නිශ්චිත දිනයෙහි හෝ එදිනට පෙර හෝ ඒ මුදල ගෙවන ලෙස අභියාචකට විධාන කළ හැකි ය. එසේ ගෙවනු නොලැබූ යම් මුදලක්, ගෙවීම පැහැර හරින ලද්දක් ලෙස සැලකිය යුතු ය.

(8) ගෙවීම පැහැර හැර ඇත්තාවූ ද (2) වන උපවගන්තිය යටතේ යම් මුදලක් හෝ මුදල් එකතු කර ඇත්තා වූ ද යම් බද්දක් XVIII වන පරිච්ඡේදය යටතේ යම් අභියාචනයක් පිළිබඳව වූ අවසාන තීරණයක් අනුව අවකරණය කරනු ලැබූ අවස්ථාවක, ඒ මුදල හෝ මුදල් ගණන් එසේ අවකරණය කරනු ලැබූ බද්ද මත ගණන් බලනු ලැබිය යුතු ය.

(9) යම් බද්දක් ගෙවීමට යටත් යම් තැනැත්තකු ආණ්ඩුව විසින් තමාට ගෙවනු ලැබීමට ඇති යම් මුදලකින් හෝ ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙහි තමාගේ ඵරට ඇති මුදල්වලින් හෝ කොමසාරිස් ජනරාල්වරයා අනුමත කළ යම් විශ්‍රාම වැටුපකින් නැතහොත් අර්ථසාධක අරමුදලකින් තමාට ගෙවනු ලැබීමට ඇති මුදල්වලින් හෝ යම් බද්දක් හෝ වාරිකයක් ගෙවීමට කටයුතු පිළියෙල කර ඇති බවට ඒ බද්ද හෝ වාරිකය ගෙවීමට තමාට නියම කර ඇති දිනයෙහි හෝ එදිනට පෙර කොමසාරිස් ජනරාල් වරයා සැහීමට පත් කරන්නා වූ අවස්ථාවක එම බද්ද හෝ වාරිකය ගෙවීම සඳහා වැඩිපුර කාලයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් ඔහුට දෙනු ලැබිය හැකි ය. එම වැඩිපුර දෙන ලද කාලය ඉකුත් වන තුරු ඒ බද්ද හෝ වාරිකය, ගෙවීම පැහැර හරින ලද බද්දක් ලෙස නොසැලකිය යුතු ය.

(10) මියගිය තැනැත්තකුගේ බුදලයෙන් යම් බද්දක් අයවිය යුතුව ඇත්තාවූ ද, ඒ බද්ද හෝ එහි යම් වාරිකයක් ගෙවීමට ඒ මියගිය තැනැත්තාගේ පොල්මෑකරුට නියම කරනු ලැබ ඇති දින හෝ එදිනට පෙර එම බද්ද හෝ වාරිකය ගෙවීම, ප්‍රොබේට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය තමා වෙත නිකුත් කර නොතිබීම නිසා ඒ දිනයෙහි හෝ ඒ දිනට පෙර කළ නොහැකි බවට ඒ පොල්මෑකරු කොමසාරිස් ජනරාල්වරයා සැහීමට පත් කරන්නාවූ ද අවස්ථාවක, ප්‍රොබේට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය දෙනු ලැබූ දිනයට පසු මාස දෙකක කාලයක් ඇතුළත ඒ බද්ද හෝ වාරිකය ගෙවනු ලැබී නම්, ඒ බද්ද හෝ වාරිකය ගෙවීම පැහැර හරින ලද්දක් සේ නොසැලකිය යුතු ය.

මේ උපවගන්තියෙහි "පොල්මෑකරු" යන යෙදුමට මියගිය තැනැත්තකුගේ දේපළෙහි සන්තකය ලබාගන්නා හෝ ඒ දේපළ සම්බන්ධයෙන් අයුතු ලෙස මැදිහත් වන හෝ යම් තැනැත්තෙක් ඇතුළත් නොවේ.

(11) මේ වගන්තියෙහි "බද්ද" යන්නෙන් යම් තක්සේරු වෂීයක් සඳහා යම් තැනැත්තකුගේ ලාභ සහ ආදායම හෝ බදු අය කළ හැකි ධනය හෝ බදු අය කළ හැකි ත්‍යාග හෝ වෙනුවෙන් ගෙවිය යුතු ආදායම් බද්ද, ධන බද්ද හෝ තෑගි බද්ද අදහස් වේ.

XXI වන පරිච්ඡේදය

බදු අයකර ගැනීම

බද්දට දඩ ආදිය ඇතුළත් විය යුතු බව.

126. මේ පරිච්ඡේදයෙහි "බද්ද" යන්නට ආදායම් බද්ද, ධන බද්ද, ත්‍යාග බද්ද සහ XV වන පරිච්ඡේදයෙහි විධිවිධාන යටතේ ගෙවන ලෙස සේවායෝජකයකුට නියම කරනු ලබන යම් ආදායම් බද්දක් ද ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් එම බද්දකට එකතු කරනු ලැබූ යම් මුදලක් ද ගෙවීම් පැහැර හැරීමේ හේතුවෙන් 125 (2) වන වගන්තිය යටතේ ආදායම් බද්දට, ධන බද්දට හෝ ත්‍යාග බද්දට එකතු කරනු ලැබූ යම් මුදලක් හෝ මුදල් ද යම් දඩ, දණ්ඩන මුදල්, ගාස්තු හෝ මේ පනත යටතේ දරන ලද කවර වූ හෝ වියදම් ද ඇතුළත් වේ.

බද්ද ප්‍රථම වැය බරක් විය යුතු බව.

127. (1) ගෙවීම පැහැර හරිනු ලැබූ බදු, (2) වන උපවගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, පැහැර හරින්නකුගේ සියලු වත්කම් විෂයෙහි ප්‍රථම වැය බරක් විය යුතු ය:

එසේ වුව ද—

(i) 129 වන වගන්තියේ විධිවිධානවලට අනුව තහනම් කරනු ලැබීමට පෙර, පැහැර හරින්නා විසින් වටිනාකම සඳහා සද්භාවයෙන් මිලදී ගන්නකුට විකුණන ලද වත්කම් වලට ඒ වැයබර ව්‍යාප්ත නොවිය යුතු ය; නැතහොත් එයට බල නොපෑ යුතු ය.

(ii) නිශ්චල දේපළ සම්බන්ධයෙන් වූ විට, 129 වන වගන්තිය යටතේ දේපළ තහනම් කරන ලද දිනයට පෙර, වටිනාකම සඳහා සද්භාවයෙන් ඇති කරන ලදුව ලියාපදිංචි කරන ලද බදුකරයකට හෝ බැඳීමකට වැඩි ප්‍රමුඛත්වයක් බද්දට නොලැබිය යුතු ය; තව ද

(iii) චංචල දේපළ සම්බන්ධයෙන් වූ විට, තක්සේරු වර්ෂ එකකට වැඩි ගණනක් සඳහා බදු නොගෙවා පැහැර හැර තිබෙන අවස්ථාවක, කොමසාරිස් ජනරාල්වරයා විසින් තෝරාගත යුතු එක් අවුරුද්දක් පමණක් සඳහා වූ බදුවලට, පැහැර හැරීමේ දිනයට පෙර, වටිනාකම සඳහා සද්භාවයෙන් ඇති කරනු ලැබූ යම් කැප අයිතියකට හෝ බැඳීමකට වඩා වැඩි ප්‍රමුඛත්වයක් ලැබිය යුතු ය.

(2) වස්තු භංගත්වයේ, බංකොලොත් භාවයේ නැතහොත් ඈවර කිරීමේ දිනට පෙරාතුව වූ, කොමසාරිස් ජනරාල්වරයා විසින් තෝරා ගනු ලබන, එක් සම්පූර්ණ තක්සේරු වර්ෂයක් සඳහා නියම කරන ලද හෝ නියම කරනු ලබන බද්ද, දේපළ භාරගැනුම්කරුවකු විසින්, තමාගේ පාලනය යටතේ ඇති වත්කම්වලින්, ඒ වත්කම් වල ප්‍රථම වැය බරක් වශයෙන් ගෙවිය යුතු ය; තව ද ඒ දිනයට පෙරාතුව වූ කාල සීමා සඳහා නියම කරන ලද හෝ නියම කරනු ලබන වෙනත් යම් බද්දක්, අනාරක්ෂිත ණයක් විය යුතු ය:

එසේ වුව ද තමා ගෙවීමට යටත් යම් ගෙවීම් පැහැර හරින ලද බද්දක් අධික යයි, දේපළ භාරගන්නකු විසින් කොමසාරිස් ජනරාල් වරයා සෑහීමට පත් වන පරිදි ඔප්පු කරනු ලබන අවස්ථාවක,

බද්ද අයකරනු ලබන්නේ යම් තක්සේරුවක් සම්බන්ධයෙන් ද ඒ තක්සේරුව 123 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් ව ඇත ද කොමසාරිස් ජනරාල්වරයා විසින් සමීක්ෂණය කර, කාරණ යෙහි අවස්ථාවෝචිත සියලු කරුණු අනුව සාධාරණ යයි සහ යුක්ති සහගත යයි ඔහු ට පෙනී යන සකස් කිරීම් ඔහු විසින් කරනු ලැබිය හැකි ය.

පැහැර හරින්නන් වෙත කරනු ලබන දැනුම්දීම්.

128. (1) යම් බද්දක් ගෙවීම පැහැර හැර තිබෙන අවස්ථාවක, මෙහි මතු විධිවිධාන සලසා ඇති කවර වූ හෝ ආකාරයකින් ඒ බද්ද අයකර ගැනීමට කටයුතු කිරීමට පෙර, කොමසාරිස් ජනරාල්වරයා විසින්,—

(අ) ඒ බද්දෙහි විස්තර; සහ

(ආ) ඒ බද්ද අයකර ගැනීමට කටයුතු කිරීමට අදහස් කරන බව සඳහන් කරමින් පැහැර හරින්නා වෙත ලියවිල්ලකින් වූ දැන්වීමක් නිකුත් කළ යුතු ය.

(2) බද්ද අය කරනු ලබන්නේ යම් තක්සේරුවක් සම්බන්ධ යෙන් ද ඒ තක්සේරුවට විරුද්ධව නිසි කාලසීමාව ඇතුළත පැහැර හරින්නා අභියාචනය කර නොමැති නම්, ඔහු විසින්, ඒ දැන්වීමේ දිනයෙහි සිට දින තිහක් ඇතුළත දී, එසේ අය කරනු ලබන බද්දට යම් විරෝධතාවක් ඉදිරිපත් කළ හැකි ය. 123 වන වගන්තියෙහි කුමක් සඳහන්ව ඇත ද කොමසාරිස් ජනරාල්වරයා විසින් එම විරෝධතාවන් සලකා බලා ඒ පිළිබඳ ව ස්වකීය තීරණය දිය යුතු අතර, ඒ තීරණය අවසානාත්මක විය යුතු ය.

තහනම් කොට විකිණීමෙන් බද්ද අයකර ගැනීම.

129. (1) කොමසාරිස් ජනරාල්වරයා විසින් බදු එකතු කරන්නන් ලෙස යම් තැනැත්තන් පත් කළ හැකි ය.

(2) (අ) යම් බද්දක් නොගෙවා පැහැර හැර ඇති අවස්ථාවක, ඒ බද්ද පිළිබඳ විස්තර ද පැහැර හැරි තැනැත්තාගේ නම ද ඇතුළත් සහතිකයක් දිසාපතිවරයා වෙත හෝ උප දිසාපතිවරයා වෙත හෝ පිස්කල් වෙත හෝ නියෝජ්‍ය පිස්කල් වෙත හෝ බදු එකතු කරන්නා වෙත හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කළ හැකි ය. ඒ සහතිකයෙහි නම් කරනු ලැබූ පැහැර හැරි තැනැත්තාගේ චංචල දේපළ තහනම් කොට විකිණීමෙන් ඒ තැනැත්තාගේ බද්ද අයකර ගැනීමට ඒ සහතිකය නිකුත් කරනු ලැබූ නිලධරයාට බලය ඇතිවිය යුතුවත් හැර එය එසේ අය කරන ලෙස ද ඒ නිලධරයාට මෙයින් නියම කරනු ලැබේ.

(ආ) ඉහාමත් යෝග්‍යයැයි එහි නිලධරයා කල්පනා කරන ආකාර යකට තහනම සිදු කළ යුතු අතර එම නිලධරයා විසින් යම් චංචල දේපළක් තහනම් කළ විගස එම දේපළවල ලැයිස්තුවක් වහාම පිළි යෙල කොට ඔහු විසින් එය අත්සන් කර බද්ද පැහැර හැරිය තැනැත්තාට එය දී එහි පිටපතක් කොමසාරිස් ජනරාල්වරයා වෙත යැවිය යුතු ය.

(ඇ) එසේ තහනම් කරනු ලැබූ දේපළ—

(i) ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් වන අවස්ථාවක, නොගෙවා පැහැර හැරිය බද්ද පියවීම සඳහා ඒ මුදල් මයදිය යුතු ය;

(ii) විදේශිය ව්‍යවහාර මුදල් වන අවස්ථාවක, ඒ මුදල් ශ්‍රී ලංකා මහ බැංකුවෙහි තැන්පත් කළ යුතු අතර එසින් ලැබෙන මුදල් නොගෙවා පැහැර හැරිය බද්ද පියවීම සඳහා යෙදිය යුතු ය;

(iii) මුදල් නොවන දේපළක් වන අවස්ථාවක, පැහැර හැරිය තැනැත්තා විසින් අය කිරීම් හා ගාස්තු ගෙවීමට යටත් ව, ඒ දේපළ දින පහක කාලයක් තබා ගත යුතු ය. පැහැර හැරිය තැනැත්තා විසින් නොගෙවා පැහැර හරිනු ලැබූ බද්ද එකී දින පහ ඇතුළත ගාස්තු හා අයකිරීම්ද සමඟ, නොගෙවුව හොත් දිසාපතිවරයා, උප දිසාපතිවරයා, පිස්කල්, නියෝජ්‍ය පිස්කල් හෝ බදු එකතුකරන්නා විසින් ඒ දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට සැලැස්විය යුතු ය. ඒ දේපළ ගනුදෙනු කළ හැකි සාධන පත්‍රයක් හෝ යම් සංස්ථාවක නැතහොත් පොදු සමාගමක කොටසක් වූ අවස්ථාවක බ්‍රෝකර් කෙනකු මගින් එදින පවතින වෙළෙඳ අගයට ඒ දේපළ විකිණීමට සැලැස්විය යුතු ය.

(ඇ) (iii) වන අනුඡේදයේ සඳහන් විකිණීමෙන් ලැබෙන මුදල්—

(i) පළමුව, දේපළ තහනම් කිරීමේ, තබා ගැනීමේ හා විකිණීමේ ගාස්තු හා අයකිරීම් ගෙවීම සඳහා ද

(ii) දෙවනුව, නොගෙවා පැහැර හැර ඇති බද්ද පියවීම සඳහා ද

යෙදිය යුතු ය. ශේෂයක් වෙතොත් එය, තහනම් කරනු ලැබූ දේපළෙහි අයිතිකරුට ගෙවිය යුතු ය.

(3) යම් බද්දක් නොගෙවා පැහැර හැර ඇත්තාවූ ද (2) වන උප වගන්තියේ විධිවිධාන සලසා ඇති ආකාරයට එය අයකර ගැනීම කළ නොහැකි බව හෝ යෝග්‍ය නොවන බව කොමසාරිස් ජනරාල් වරයාගේ මතය වන්නාවූ ද අවස්ථාවක, ගෙවීම පැහැර හැරිය තැනැත්තා පදිංචිව සිටින හෝ පැහැර හැරි තැනැත්තාට අයත් චංචල හෝ නිශ්චල දේපළක් පිහිටි හෝ යම් දිස්ත්‍රික්කයක් විෂයෙහි අධිකරණ බලය ඇති දිසා අධිකරණයකට ඒ බද්දේ විස්තර ද ඒ බද්ද ගෙවිය යුත්තේ යම් තැනැත්තකු හෝ තැනැත්තන් හෝ විසින් ද ඒ තැනැත්තාගේ හෝ තැනැත්තන්ගේ හෝ නම නැතහොත් නම් ද ඇතුළත් සහතිකයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කළ හැකි ය. එවිට අධිකරණය විසින්, ගෙවීම පැහැර හැරිය තැනැත්තාගේ චංචල හා නිශ්චල දේපළ සියල්ල ම හෝ ඉන් යමක් හෝ පැහැර හැරිය බද්ද අයකර ගැනීම පිණිස අවශ්‍යයෙයි පිස්කල් සලකන ඉන් යම් කොටසක් හෝ තහනම් කොට විකිණීමට බලය දෙන හා නියම කරන ක්‍රියාවේ යෙදවීමේ රිට් ආඥාවක්

පිස්කල් වෙත නිකුත් කිරීමට විධාන කළ යුතු ය. තව ද සිවිල් නඩු විධාන සංග්‍රහයේ 226 වන වගන්තියේ සිට 297 වන වගන්තිය තෙක් ඇති වගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිත ව, ඒ තහනම් කිරීමට හා විකිණීමට අදාළ විය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ සහතිකයක් කොමසාරිස් ජනරාල් වරයා විසින් නිකුත් කරන කවර හෝ අවස්ථාවක පැහැර හැරිය තැනැත්තා වාසික වුව ද නිර්වාසික වුව ද ඒ තැනැත්තා වෙත ඒ වේලාවෙහි ම ඒ පිළිබඳ නිවේදනයක්, පෞද්ගලිකව භාර කිරීමෙන් හෝ තැපෑලෙන් යවනු ලබන ලියාපදිංචි කළ ලිපියකින් හෝ විදුලි පුවතක් මගින් හෝ නිකුත් කළ යුතු ය. එහෙත් පැහැර හැරිය තැනැත්තාට ඒ නිවේදනය නොලැබීම, මේ වගන්තිය යටතේ වූ නඩු කටයුතු බලරහිත වීමට හේතුවක් නොවිය යුතු ය.

අයකර ගැනීම සඳහා මහෙස්ත්‍රාත් වරයකු ඉදිරියේ පැවැත්වෙන නීති කෘත්‍ය.

130. (1) නොගෙවා පැහැර හැරිය බද්ද, තහනම් කොට විකිණීමෙන් අයකර ගැනීම කළ නොහැකි බව හෝ යෝග්‍ය නොවන බව හෝ කොමසාරිස් ජනරාල්වරයාගේ මතය වන අවස්ථාවක නැත හොත් තහනම් කොට විකිණීමෙන් සම්පූර්ණ මුදල අයකර ගනු නොලැබූ අවස්ථාවක, ඒ බද්දේ විස්තර ද පැහැර හැරිය තැනැත්තාගේ අන්තිමට දැන සිටි ව්‍යාපාරික ස්ථානය හෝ පදිංචි ස්ථානය ද දැක්වෙන සහතිකයක්, ඒ ස්ථානය පිහිටි කොට්ඨාසය විෂයෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයා වෙත කොමසාරිස් ජනරාල් වරයා විසින් නිකුත් කළ හැකි ය. එවිට මහෙස්ත්‍රාත්වරයා විසින්, බද්ද අයකර ගැනීම සඳහා ගෙවීම පැහැර හැරිය තැනැත්තාට විරුද්ධව වැඩිදුර නඩු කටයුතු නොපැවැත්විය යුත්තේ මන්ද යන්නට කරුණු දැක්වීමට ඔහු තමා වෙත කැඳවිය යුතු ය. ප්‍රමාණවත් හේතු නොපෙන්වුවහොත් නොගෙවා පැහැර හැරිය බද්ද, දඩයකින් පමණක් දඬුවම් කළයුතු හෝ බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් නොකළ යුතු වරදක් සඳහා, ඒ පැහැර හැරිය තැනැත්තාට ඒ මහෙස්ත්‍රාත්වරයාගේ දණ්ඩන නියමයකින් නියමිත දඩයක් ලෙස සැලකිය යුතු අතර එවිට, එවැනි වරදක් සඳහා නියම කරන ලද දඩයක් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් 1979 අංක 15 දරන අපරාධ නඩුවිධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන (එහි (අ), (ඇ) සහ (එ) ඡේදවල විධිවිධාන හැර) අදාළ විය යුතු ය. ඒ දණ්ඩන නියමය කරන වේලාවෙහි ඒ උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර මහෙස්ත්‍රාත්වරයා විසින් කළ හැකි වූ විධානයක් ඔහු විසින් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා කොමසාරිස් ජනරාල් වරයා විසින් නිකුත් කරන ලද සහතිකයක ඇති යම් ප්‍රකාශයක නිවැරදි බව මේ වගන්තිය යටතේ වූ යම් නඩු කටයුත්තක දී මහෙස්ත්‍රාත්වරයා විසින් ප්‍රශ්න කිරීම හෝ විභාග කිරීම නොකළ යුතු අතර ඒ අනුව ඒ සහතිකයෙහි ඇති යම් ප්‍රකාශයක නිවැරදි බව සලකා බැලීමට හෝ තීරණය කිරීමට හෝ ගෙවීම පැහැර හැරිය බද්ද අයකරනු ලැබ ඇත්තේ යම් තක්සේරුවක් සම්බන්ධයෙන් ද ඒ තක්සේරුවට විරුද්ධ ව අභියාචනයක් විභාග වීමට නිබීමේ හේතුව මත පමණක් ඒ නඩු කටයුත්ත තිස් දවසකට වැඩි කාලයක් කල්

දැමීමට හෝ පමා කිරීමට ඒ උපවගන්තියෙහි වූ කිසිවකින් මහෙස්ත්‍රාත්වරයකුට බලය පැවරෙන්නේ යැයි කියවා නොගත යුතු ය.

(3) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තියේ (2) සිට (5) තෙක් වූ උපවගන්තිවල විධිවිධාන කිසිවක්, මේ වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් අවස්ථාවකට අදාළ නොවිය යුතු ය.

(4) (1) වන උපවගන්තියේ සඳහන් වූ ද පැහැර හැරිය තැනැත්තා වෙත නියම කරන ලදැයි ඒ උපවගන්තියෙන් සැලකෙන දඩය නොගෙවා පැහැර හැරීම නිසා පැහැර හැරිය තැනැත්තා බන්ධනාගාරගත කිරීමකට නියම කරනු ලැබූ ද යම් අවස්ථාවක ඒ දඩ මුදල ගෙවීම සඳහා මහෙස්ත්‍රාත්වරයා විසින් කල් දිය හැකි ය. නැතහොත් ඒ මුදල වාරික මගින් ගෙවන ලෙස විධාන කළ හැකි ය.

(5) (1) වන උපවගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති පරිදි හේතු දැක්වීම සඳහා ඒ උපවගන්තිය යටතේ කල් දීමෙහි හෝ (4) වන උපවගන්තිය යටතේ දඩය ගෙවීම සඳහා කල් දීමෙහි හෝ මූලික කොන්දේසියක් වශයෙන්, අධිකරණය විසින් ඇප නියම කළ හැකි ය. තව ද පැහැර හැරිය තැනැත්තාට එලෙස ඇප දීමට නියම කළ විටක 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XXXIV වන පරිච්ඡේදයේ විධිවිධාන අදාළ විය යුතු ය.

(6) යම් ගෙවීමක් වාරික මගින් ගෙවීමට මහෙස්ත්‍රාත්වරයකු විසින් (4) වන උපවගන්තිය යටතේ නියම කරනු ලැබ තිබියදී, ඉන් යම් වාරිකයක් නොගෙවා පැහැර හරිනු ලැබූ අවස්ථාවක, ඒ වන විට නොගෙවා ඉතිරිව ඇති සියලුම වාරික ගෙවීම පැහැර හැර ඇත්තාක් සේ නඩු කටයුතු පැවරිය හැකි ය.

(7) (1) වන උපවගන්තිය යටතේ යම් නඩු කටයුත්තක දී, බද්ද යටා පරිදි තක්සේරු කරනු ලැබූ බවට හා එය නොගෙවා පැහැර හැරිය බවට කොමසාරිස් ජනරාල්වරයාගේ සහතිකය, ප්‍රමාණවත් සාක්ෂියක් විය යුතු අතර, බද්ද අධික බවට හෝ සාවද්‍ය බවට හෝ එයට විරුද්ධව අභියාචනය කොට ඇති බවට කරනු ලබන කිසිම උත්තරවාදයක් පිළි නොගත යුතු ය.

බදු ගෙවීමෙන් බේරීම සඳහා අයකරගැනීම.

131. (1) යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු බද්ද නොගෙවා පැහැර හැර ඇත්තාවූ ද—

(අ) යම් තැනැත්තකු, පැහැර හරින්නාට හෝ ඔහුගේ අනුමයේ ජීතයාට ණය ගැනීම සිටීමේ හෝ ඔහුට මුදල් ගෙවීමට සූදානම්ව සිටීමේ ශක්‍යතාවක් ඇති බව; හෝ

(ආ) යම් තැනැත්තකු, පැහැර හරින්නා හෝ ඔහුගේ අනුයෝජීතයා හෝ සඳහා නැතහොත් වෙනුවෙන් මුදල් තබාගෙන සිටීමේ ශක්‍යතාවක් ඇති බව; හෝ

(ඇ) පැහැර හරින්නාට හෝ ඔහුගේ අනුයෝජීතයාට ගෙවීම් සඳහා වෙනයම් තැනැත්තකු වෙනුවෙන් යම් තැනැත්තකු මුදල් තබා ගෙන සිටීමේ ශක්‍යතාවක් ඇති බව; හෝ

(ඇ) පැහැර හරින්නාට හෝ ඔහුගේ අනුයෝජිතයාට මුදල් ගෙවීමට යම් තැනැත්තකු අන්කිසි තැනැත්තකුගේ බලය ලබා සිටීමේ ශක්‍යතාවක් ඇති බව

කොමසාරිස් ජනරාල්වරයාට පෙනී යන්නා වූ ද අවස්ථාවක, නොගෙවා පැහැර හැරිය මුදල් ප්‍රමාණයට වැඩි නොවන මුදලක් දැන්වීමේ නම් කරනු ලැබූ නිලධරයාට ගෙවන ලෙස නියම කරන (පැහැර හරින්නා වෙත පිටපතක් තැපෑලෙන් යැවිය යුතු) ලියවිල්ලකින් වූ දැන්වීමක් ඒ තැනැත්තාට කොමසාරිස් ජනරාල්වරයා විසින් දිය හැකි ය. ඒ දැන්වීම ලැබුණු දිනයෙහි දී ඔහු අතෙහි ඇති හෝ ඔහුගෙන් අයවිය යුතු හෝ මුදල්වලටද දැන්වීමේ දිනට පසු මාස තුනක කාලයක් ඇතුළත යම් අවස්ථාවක ඔහු අතට පත් වන හෝ ඔහුගෙන් අයවිය යුතු හෝ ඔහු විසින් ගෙවීමට සූදානම් වන හෝ සියලු මුදල්වලට ද ඒ දැන්වීම අදාළ විය යුතු ය.

(2) මේ වගන්තිය ප්‍රකාර යම් ගෙවීමක් කළ තැනැත්තකු ගෙවීම පැහැර හැරිය තැනැත්තාගේ ද සම්බන්ධතාවක් ඇති අන් සියලු තැනැත්තන්ගේ ද බලය යටතේ ක්‍රියා කළ ලෙස සැලකිය යුතු ය. තව ද යම් ලිඛිත නීතියක, හිවිසුමක හෝ එකඟවීමක කවර විධි විධානයක් තිබුණ ද සියලු සිවිල් හෝ අපරාධ නඩු කටයුතුවලදී ඒ ගෙවීම සම්බන්ධ වගකීමෙන් ඒ තැනැත්තා මෙයින් නිදහස් කරනු ලැබේ.

(3) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් දෙනු ලැබූ යම් තැනැත්තකුට, ඒ උපවගන්තියේ සඳහන් මුදල් ඔහුගේ අතට නොලැබීමේ හෝ ඒ උපවගන්තියේ සඳහන් කාලසීමාව ඇතුළත එවැනි මුදල් ඔහුගෙන් අයවිය යුතු නොවීමේ හේතුවෙන් ඒ දැන්වීම අනුව ක්‍රියා කිරීමට නොහැකි වූ විට ඔහු විසින් ඒ කාලසීමාව ඉකුත් වීමෙන් දහ හතර දිනක් ඇතුළත ඒ කරුණු දන්වා කොමසාරිස් ජනරාල්වරයා වෙත ලියවිල්ලකින් වූ දැන්වීමක් දිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් දෙනු ලැබූ යම් තැනැත්තකුට ඒ දැන්වීම අනුව ක්‍රියා කිරීමට නොහැකි වී ඇත්තාවූ ද (3) වන උපවගන්තියෙන් විධිවිධාන සලසා ඇති පරිදි කොමසාරිස් ජනරාල්වරයාට දැනුම්දීම ඒ තැනැත්තා විසින් පැහැර හැර ඇත්තා වූ ද අවස්ථාවක, නැතහොත් දැන්වීම හා සම්බන්ධ බද්ද හෝ ඉන් කොටසක් හෝ ඒ තැනැත්තා විසින් අඩුකර ගනු ලැබ හෝ අඩුකර ගැනීමට හැකි ව තිබී ඒ බද්ද හෝ ඉන් කොටස (1) වන උපවගන්තියේ සඳහන් කරනු ලැබූ කාලසීමාව ඉකුත්වීමෙන් දින දහහතරක් ඇතුළත කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලැබූ පරිදි ගෙවා නොමැති අවස්ථාවක, ඒ තැනැත්තා පුද්ගලයකු නම් ඒ තැනැත්තා ද ඒ තැනැත්තා සංස්ථාගත කරනු ලැබූ හෝ නොලැබූ සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් නම් ඒ සමාගමේ හෝ පුද්ගල මණ්ඩලයේ ලේකම්, කළමනාකරු හෝ ප්‍රධාන නිලධරයා ද, අඩුකර ගැනීමට ඔහුට නියම කරනු ලැබූ සම්පූර්ණ බද්ද සඳහා පුද්ගලිකව වගකිව යුතු ය. ඒ මුදල මේ පනතින් සලස්වනු ලැබූ සෑම මාර්ගයකින්ම අවස්ථෝචිත පරිදි ඒ පුද්ගලයාගෙන්, ලේකම්ගෙන්, කළමනාකරුගෙන් හෝ වෙනත් ප්‍රධාන නිලධරයාගෙන් අයකර ගත හැකි ය.

(5) මේ වගන්තියේ කාර්ය සඳහා "පැහැර හරින්නා" යන යෙදුමට නොගෙවා පැහැර හැරිය තැනැත්තකුගේ අනුයෝජිතයකු ද ඇතුළත් වන ලෙස සැලකිය යුතු අතර, යම් තැනැත්තකු ජීවත්ව සිටියේ නම් ඔහු විසින් ගෙවිය යුතු විය හැකිව තිබූ බද්ද ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවකට මේ වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය. තවද එබඳු අවස්ථාවකට මෙම විධිවිධාන අදාළ කිරීමේ කාර්යය සඳහා (1) වන උපවගන්තියේ "පැහැර හරින්නා" යන යෙදුමෙන්—

(අ) නැසිගිය තැනැත්තකුගේ පොල්මෑකරු හෝ අද්මිනිස්ත්‍රාසි කරු, හෝ

(ආ) නැසීගිය තැනැත්තකුගේ දේපළවල සන්තකය භාරගන්නා වූ හෝ එබන්දකුගේ දේපළ පාලනයට මැදිහත් වන්නාවූ යම් තැනැත්තෙක්, හෝ

(ඇ) නැසීගිය තැනැත්තකුගේ බූදලය සම්බන්ධයෙන් අන්තිම කැමති පත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය ප්‍රදානය කරන ලෙස හෝ නැවත මුද්‍රා තැබීම සඳහා හෝ දිසා අධිකරණයෙන් ඉල්ලා සිටි හෝ එසේ ඉල්ලුම් කිරීමට හිමිකම් ඇති හෝ තැනැත්තෙක්

අදහස් වේ.

පැහැර හරින ලද බදු සේවා නියුක්තයාගේ පාරිශ්‍රමිකයෙන් අය කර ගත යුතු බව.

132. (1) යම් සේවා නියුක්තයකුගේ සේවා යෝජකයකු වෙත හෝ සේවා නියුක්තයකුගේ පාරිශ්‍රමිකය ගෙවීම සම්බන්ධයෙන් වගකිවයුතු තැනැත්තා වෙත කොමසාරිස් ජනරාල්වරයා විසින් දෙනු ලබන ලියවිල්ලකින් වූ දැන්වීමකින්, ඒ සේවා නියුක්තයා විසින් ගෙවිය යුතු වූ ද ගෙවීම පැහැර හැර ඇත්තා වූ ද යම් බදු මුදලක් ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන යම් කාල පරිච්ඡේදයක් තුළ දී, ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන යම් මාසික වාරික ගණනකින්, ඒ සේවානියුක්තයාගේ පාරිශ්‍රමිකයෙන් අඩුකරන ලෙස ඒ සේවා යෝජකයාට හෝ ඒ තැනැත්තාට විධාන කරනු ලැබිය හැකි ය. එක් එක් මාසයේ දී සේවා නියුක්තයකුගේ වැටුපෙන් එසේ අඩු කර ගනු ලබන මුදල, අවස්ථාවෝචිත පරිදි, ඒ සේවා යෝජකයා විසින් හෝ ඒ තැනැත්තා විසින් කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සේවා නියුක්තයකුගේ පාරිශ්‍රමිකයෙන් ඔහුගේ සේවා යෝජකයා විසින් හෝ ඒ පාරිශ්‍රමිකය ගෙවීම සම්බන්ධයෙන් වග කිවයුතු තැනැත්තා විසින් හෝ යම් බද්දක් අඩුකරනු ලැබූ අවස්ථාවක, ඒ අඩුකිරීම කරනු ලැබූ දිනයෙහි ඒ සේවා නියුක්තයා විසින් ඒ බද්ද හෝ එහි කොටසක් හෝ ගෙවනු ලැබූ ලෙස මේ පනතේ කාර්ය සඳහා සැලකිය යුතු ය.

(3) ගෙවීම පැහැර හරිනු ලැබූ බද්ද කොමසාරිස් ජනරාල්වරයා සැහීමට පත්වන අයුරු ගෙවීමට සේවා නියුක්තයා විසින් කටයුතු සලස්වනු ලැබුවේ නම්, (1) වන උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් කරනු ලැබූ විධානයෙන් පසු යම් අවස්ථාවක, සේවා යෝජකයාට හෝ සේවා නියුක්තයාගේ පාරිශ්‍රමිකය ගෙවීම

සම්බන්ධයෙන් වගකිව යුතු තැනැත්තාට දෙනු ලබන ලිඛිත දැන් වීමකින් ඒ විධානය සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් කොමසාරිස් ජනරාල්වරයා විසින් ඉල්ලා අස්කර ගනු ලැබිය හැකි ය.

(4) සේවා යෝජකයා විසින් හෝ ඒ පාරිශ්‍රමිකය ගෙවීම සම්බන්ධ යෙන් වගකිව යුතු තැනැත්තා විසින් මේ වගන්තියේ පෙරාතුව වූ විධිවිධාන යටතේ යම් සේවා නියුක්තයකුගේ පාරිශ්‍රමිකයෙන් යම් බද්දක් අඩු කළ යුතු අවස්ථාවකදී ඒ සේවා නියුක්තයා ඔහුගේ සේවා නියුක්තියෙන් අස්වීමට ආසන්න නම් හෝ අස්ව සන්නේ නම්, ඔහු එසේ තම සේවා නියුක්තියෙන් අස්ව යන බව හෝ අස් වූ බව ඒ සේවා යෝජකයාට හෝ පාරිශ්‍රමික ගෙවීම සම්බන්ධයෙන් වගකිව යුතු තැනැත්තාට හෝ දැනගන්නට ලැබුණු පසු ඔහු විසින් ඒ සේවා නියුක්තයාට ගෙවනු ලබන සියලුම ගෙවීම් වලින් හෝ යම් ගෙවීමකින් අඩුකර ගැනීමට කොමසාරිස් ජනරාල්වරයා විසින් ඔහුට දෙනු ලැබූ දැන්වීමෙන් විධාන කරනු ලැබූ බද්දේ සම්පූර්ණ මුදල හෝ එහි යම් ඉතිරි කොටසක් ඒ සේවා යෝජකයා විසින් හෝ ඒ තැනැත්තා විසින් අඩුකළ යුතු ය.

(5) සේවා නියුක්තයකුගේ පාරිශ්‍රමිකයෙන් යම් බද්දක් අඩු කිරීම පිණිස (1) වන උපවගන්තිය යටතේ ඔහුගේ සේවා යෝජ කයා වෙත හෝ ඔහුට පාරිශ්‍රමිකය ගෙවීම සම්බන්ධයෙන් වගකිව යුතු තැනැත්තා වෙත විධානයක් කරනු ලැබුවේ යම් සේවා නියුක් තයකු සම්බන්ධයෙන් ද ඒ සේවා නියුක්තයා ඔහුගේ සේවා නියුක් තියෙන් ඉවත්ව ගොස් ඇති නිසා හෝ වෙන යම් හේතුවක් නිසා ඒ සේවා යෝජකයාට හෝ එකී තැනැත්තාට ඒ බද්ද සම්පූර්ණ යෙන්ම හෝ එහි යම් කොටසක් අඩුකර ගැනීමට නොහැකි වූ අවස් ථාවක, ඒ සිද්ධියේ කරුණු දක්වමින් ඒ සේවා යෝජකයා විසින් හෝ ඒ තැනැත්තා විසින් ඒ බව කොමසාරිස් ජනරාල්වරයා වෙත නොපමාවම ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය. එකී සේවා යෝජකයා විසින් හෝ එකී තැනැත්තා විසින් අඩුකර ගනු නොලැබූ හෝ එකී සේවා යෝජකයා හෝ එකී තැනැත්තා විසින් අඩුකර ගත නොහැකි වූ යම් බද්දක්, සේවා නියුක්තයා විසින් ගෙවිය යුතු බද්දක් බවට එකෙණෙහිම පත්විය යුතු ය.

(6) (1) වන උපවගන්තිය යටතේ යම් සේවා නියුක්තයකුගේ පාරිශ්‍රමිකයෙන් අඩුකර ගන්නා ලෙස සේවා යෝජකයාට හෝ ඒ පාරිශ්‍රමිකය ගෙවීම සම්බන්ධයෙන් වගකිව යුතු තැනැත්තාට විධාන කරනු ලැබූ යම් බද්දක් අඩුකර ගැනීමට ද (5) වන උපවගන් තියෙන් නියමිත පරිදි ඒ අඩුකිරීම කළයුතු දිනයේ සිට දින දහ හතරක් ඇතුළත ඒ බවට කොමසාරිස් ජනරාල්වරයා වෙත දැන්වී මක් කිරීමට ද ඒ සේවා යෝජකයා හෝ තැනැත්තා අපොහොසත් වූ අවස්ථාවක හෝ, (1) වන උපවගන්තිය යටතේ කරන ලද විධානයක් අනුව යම් පාරිශ්‍රමිකයකින් යම් මාසයකදී ඒ සේවා යෝජ කයා හෝ තැනැත්තා විසින් අඩුකර ගෙන හෝ අඩුකර ගත හැකිව තිබුණු නමුත් ඊළඟ මාසයේ පහළොස් වන දිනට පෙර ඒ බද්දෙහි මුදල කොමසාරිස් ජනරාල්වරයාට නොගෙවනු ලැබූ අවස්ථාවක, ඒ සේවා යෝජකයා හෝ තැනැත්තා තනි පුද්ගලයෙක් නම්, ඔහු ද ඒ සේවා යෝජකයා හෝ තැනැත්තා සංස්ථාගත කරනු ලැබූ හෝ නොලැබූ සමාගමක් නැතහොත් පුද්ගල මණ්ඩලයක් නම්, ඒ සමාගමේ හෝ මණ්ඩලයේ ලේකම්, කළමනාකරු හෝ වෙනත්

ප්‍රධාන නිලධරයකු ද මේ වගන්තිය යටතේ අඩුකර ගැනීමට ඒ සේවා යෝජකයාට හෝ ඒ තැනැත්තාට විධාන කරනු ලැබූ සම්පූර්ණ බද්ද ගෙවීමට පෞද්ගලික වශයෙන් යටත් විය යුතු ය. ඒ බද්ද ඒ පුද්ගලයාගෙන්, ලේකම්ගෙන්, කළමනාකරුගෙන් හෝ වෙනත් ප්‍රධාන නිලධරයකුගෙන් මේ පනතෙහි විධිවිධාන සලස්වනු ලැබ ඇති සියලුම මාර්ගවලින් අයකර ගත හැකි අතර, ඒ බද්ද පැහැර හැර ඇති බද්දක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(7) (1) වන උපවගන්තිය යටතේ වූ විධානයකට අනුකූලව යම් සේවා නියුක්තයකුගේ පාරිශ්‍රමිකයෙන් බදු අඩු කරන සෑම සේවා යෝජකයකුම හෝ සෑම අන් තැනැත්තකුම විසින්, ඒ සේවා නියුක්තයා විසින් කරනු ලබන ඉල්ලීමක් මත, ඒ අඩුකළ බද්දෙහි මුදල සඳහන් සහතිකයක්, කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කොට ඇති ආකෘතිය අනුසාරයෙන් නිකුත් කරනු ලැබිය යුතු ය.

හවුල් කරුවකුගේ පැහැර හරිනු ලැබූ බද්ද හවුල් ව්‍යාපාරයේ වත්කම් වලින් අයකර ගත යුතු බව.

133. හවුල් ව්‍යාපාරයක හවුල්කරුවකු වූ යම් තැනැත්තකුගේ යම් තක්සේරු වර්ෂයක ව්‍යවස්ථාපිත ආදායමට හවුල් ව්‍යාපාරයේ ඔහුගේ බෙදිය හැකි ලාභවල කොටස ඇතුළත් කරන්නා වූ ද ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු බද්ද ගෙවීම පැහැර හැර ඇත්තා වූ ද අවස්ථාවක, කොමසාරිස් ජනරාල්වරයාගේ මතය අනුව, බෙදිය හැකි ලාභවල ඔහුගේ කොටසට, එසේ ගෙවීම පැහැර හැර ඇති ඒ බද්දෙන් ආරෝපණය කළ හැකි කොටස හවුල් ව්‍යාපාරයේ වත්කම් වලින් අයකර ගත හැකි අතර, එපරිද්දෙන්, 129 වන වගන්තියේ කාර්ය සඳහා හවුල් ව්‍යාපාරයේ වත්කම් ඒ හවුල්කරුගේ වත්කම් ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද එසේ අයකර ගනු ලබන මුදල ඒ හවුල්කරුට ඒ හවුල් ව්‍යාපාරයේ ඇති අයිතිය නොඉක්මවිය යුතු ය.

දරුවකුගේ ආදායමෙන් හෝ ධනයෙන් ආදායම් බදු හෝ ධන බදු අය කර ගැනීම.

134. දරුවකුගේ මුළු ව්‍යවස්ථාපිත ආදායම හෝ ධනය ඒ දරුවාගේ මව්පිය දෙදෙනාගෙන් කෙනකුගේ මුළු ව්‍යවස්ථාපිත ආදායමට හෝ ධනයට එකතු කරනු ලැබූ ද එම ආදායමේ හෝ ධනයේ කොටසක් වන්නා වූ ද ඒ මවගෙන් නැතහොත් පියාගෙන් ආදායම් බදු හෝ ධන බදු එකතු කර ගත නොහැකි වන්නා වූ ද අවස්ථාවක, ඒ දරුවාගේ ආදායමට හෝ ධනයට ආරෝපණය කළ යුතු යයි කොමසාරිස් ජනරාල්වරයාට පෙනී යන ආදායම් බද්දේ හෝ ධන බද්දේ යම් කොටසක්, ඒ දරුවා සම්බන්ධයෙන් කිසිම තක්සේරුවක් කරනු නොලැබුව ද ඒ දරුවාගෙන් අයකර ගනු ලැබිය යුතු අතර, බදු එකතු කර ගැනීම හා අයකර ගැනීම පිළිබඳ ව මේ පනතේ ඇති විධිවිධාන ඒ අනුව ඒ අයකර ගැනීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

අර්ථලාභියකු විසින් ගෙවිය යුතු ආදායම් බද්ද සහ ධන බද්ද භාරකරු වකුගෙන් අයකර ගැනීම.

135. භාරයක අර්ථලාභියකුට ඒ භාරයෙන් හිමිවන ආදායම හෝ ශුද්ධ ධනය සම්බන්ධයෙන් ඔහුගෙන් අයකර ගත යුතු ආදායම් බද්ද හෝ ධන බද්ද හෝ ඉන් යම් කොටසක් භාරකරු සම්බන්ධයෙන් තක්සේරුවක් කර නොතිබුණේ වුව ද ඒ ගැන නොතකා, ඒ භාරයේ භාරකරුගෙන් අයකර ගනු ලැබිය හැකි අතර බදු එකතු කිරීමට හා අයකර ගැනීමට අදාළ වූ මේ පනතේ විධිවිධාන ඒ භාරකරු විෂයෙහි ද අදාළ විය යුතුය. ඒ භාරයෙන්,

ඒ අර්ථලාභියාට ගෙවිය යුතු වන ආදායමෙන් ඒ බදු ප්‍රමාණය හෝ එහි කොටස අඩුකර ගැනීමට ඒ භාරකරුට හිමිකම් තිබිය යුතු ය.

අර්ථලාභියකු විසින් ගෙවිය යුතු ආදායම් බද්ද සහ ධන බද්ද පොල්මෑ කරුගෙන් අයකර ගැනීම්.

136. මියගිය තැනැත්තාගේ බුදලයෙන් තමාට ලැබීමට හිමිකම් ඇති ආදායම හෝ ශුද්ධ ධනය සම්බන්ධයෙන් අර්ථලාභියකුගෙන් අයකර ගත යුතු ආදායම් බද්ද හෝ ධන බද්ද හෝ එහි යම් කොටසක්, මියගිය තැනැත්තාගේ පොල්මෑකරු සම්බන්ධයෙන් තක්සේරුවක් කර නොතිබුණේ වුව ද ඒ නොතකා ඒ පොල්මෑ කරුගෙන් අයකර ගනු ලැබිය හැකි අතර බදු එකතුකිරීම හා අය කිරීම සම්බන්ධයෙන් මේ පනතේ ඇති විධිවිධාන ඒ අනුව ඒ පොල්මෑකරු විෂයෙහි ලා අදාළ විය යුතු ය. තවද ඉවතකී මියගිය තැනැත්තාගේ බුදලයේ ආදායමෙන් ඒ අර්ථලාභියාට ගෙවනු ලැබිය යුතු මුදලින් ඒ බදු ප්‍රමාණය හෝ ඒ කොටස හෝ අඩු කිරීමට ඒ පොල්මෑකරුට හිමිකම් තිබිය යුතු ය.

ඇතැම් අවස්ථාවල දී තෑගි බද්ද ත්‍යාගලාභියා ගෙන් අය කර ගත යුතු බව.

137. ත්‍යාග බද්ද ත්‍යාගදායකගෙන් අයකර ගත නොහැකි අවස්ථාවක, ත්‍යාගලාභියා සම්බන්ධයෙන් කිසි තක්සේරුවක් කර නොතිබුණේ වුව ද ඒ නොතකා, ඒ බද්ද ත්‍යාගලාභියාගෙන් අයකර ගත හැකි ය. තව ද ත්‍යාග බද්ද එකතු කිරීම හා අයකර ගැනීම පිළිබඳව මේ පනතේ ඇති විධිවිධාන ඒ අනුව ඊට අදාළ විය යුතු ය:

එසේ වුව ද ත්‍යාගලාභියාගෙන් අයකර ගත් මුදල් ප්‍රමාණය, ත්‍යාගදායක විසින් ත්‍යාගලාභියා වෙත ත්‍යාගය දුන් දිනයෙහි ඒ ත්‍යාගයේ වටිනාකමට ආරෝපණය කළ හැකි යැයි කොමසාරිස් ජනරාල්වරයාට පෙනී යන්නා වූ ත්‍යාග බද්දේ කොටසට වැඩි නොවිය යුතු ය.

ශ්‍රී ලංකාවෙන් බැහැර යන තැනැත්තන් ගෙන් බදු අය කර ගැනීම්.

138. (1) යම් තැනැත්තකු සම්බන්ධයෙන් තක්සේරු කරනු ලැබූ සියලුම ආදායම් බදු, ධන බදු හෝ ත්‍යාග බදු නොගෙවා ඒ තැනැත්තා ශ්‍රී ලංකාවෙන් බැහැර යාමට ආසන්න බව හෝ එසේ බැහැර යාමට ඉඩ ඇති බව හෝ කොමසාරිස් ජනරාල්වරයාගේ මතය වූ අවස්ථාවක, ඒ බදුවල විස්තර ද ඒ තැනැත්තාගේ නම ද අඩංගු සහතිකයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් මහෙස්ත්‍රාත්වරයකු වෙත නිකුත් කරනු ලැබිය හැකි ය. ඒ මහෙස්ත්‍රාත්වරයා වෙත, එය ලැබුණු විට, බදු ගෙවීම හෝ එය ගෙවීම සඳහා කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන ආකාරයක ඇප තැබීම හෝ නොකර ඒ තැනැත්තා ශ්‍රී ලංකාවෙන් බැහැර යාම වැළැක්වීම සඳහා අවශ්‍ය වන පියවර ගැනීමට විධානයක් ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් පොලිස්පතිවරයා වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) මහෙස්ත්‍රාත්වරයා වෙත තමාගේ සහතිකය නිකුත් කරන වේලාවෙහි, කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ තැනැත්තාට ඒ පිළිබඳව නිවේදනයක් පෞද්ගලිකව භාර කිරීමෙන් හෝ ලියාපදිංචි කරනු ලැබූ ලිපියක් තැපැලෙන් යැවීමෙන් හෝ විදුලි පුවතක් මඟින් හෝ නිකුත් කරනු ලැබිය යුතු ය. එහෙත් එවැනි යම් නිවේදනයක් ඒ තැනැත්තාට නොලැබීමේ හේතුවෙන් මේ වගන්තිය යටතේ වූ නඩු කටයුතු බල රහිත නොවිය යුතු ය.

(3) බදු ගෙවූ බවට හෝ බදු ගෙවීම සඳහා ඇප තැබූ බවට කොමසාරිස් ජනරාල්වරයා හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයකු විසින් අත්සන් කරනු ලැබූ සහතිකයක් ඉදිරිපත් කිරීම නැතහොත් පොලිස් ස්ථානයක් භාර පොලිස් නිලධරයකුට ඒ බදු මුදල ගෙවීම, ඒ තැනැත්තාට ශ්‍රී ලංකාවෙන් බැහැර යාමට ඉඩ හැරීම සඳහා ප්‍රමාණවත් බලයක් විය යුතු ය. යම් බදු මුදලක් යම් පොලිස් නිලධරයකුට ගෙවනු ලැබූ විට ඒ පොලිස් නිලධරයා විසින් ඒ මුදල කොමසාරිස් ජනරාල්වරයා වෙත නොපමා ව ගෙවනු ලැබිය යුතු ය.

බදු අයකර ගැනීමේ මාර්ගවලින් එකකට වැඩි ගණනක් ප්‍රයෝජනයට ගැනීම.

139. මේ පනත යටතේ යම් තැනැත්තකුගෙන් අයවිය යුතු සම්පූර්ණ බද්ද හෝ ඉන් යම් කොටසක් හෝ මේ පරිච්ඡේදයේ යම් විධිවිධානයක් අදාළ කිරීමෙන් අයකර ගත නොහැකි බව හෝ නොහැකි විය හැකි බව හෝ කොමසාරිස් ජනරාල්වරයාගේ මතය වූ අවස්ථාවක, ඒ තැනැත්තා සම්බන්ධයෙන් 130 වන වගන්තිය යටතේ මහෙස්ත්‍රාත්වරයකු විසින් ආඥාවක් කර එය ක්‍රියාත්මක කර තිබුණ ද ඒ නොතකා එසේ නොහෙවා ඉතිරිව ඇති යම් මුදලක් අයකර ගැනීම සඳහා මේ පරිච්ඡේදයෙන් විධිවිධාන සලස්වනු ලැබූ බදු අයකර ගැනීමේ වෙනත් යම් මාර්ගයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුගමනය කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය.

බදු අයකර ගැනීම සඳහා තොරතුරු ලබාගැනීම පිළිබඳ ව කොමසාරිස් ජනරාල් වරයා සතු බලය.

140. යම් තැනැත්තකුගෙන් හෝ වෙන යම් තැනැත්තකුගෙන් හෝ අයවිය යුතු ආදායම් බදු, ධන බදු හෝ තෑගි බදු අයකර ගැනීමේ කාර්යය සඳහා, කොමසාරිස් ජනරාල්වරයාට අවශ්‍ය වන යම් තොරතුරක්, කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ තැනැත්තා වෙත දෙනු ලබන ලිඛිත දැන්වීමක් මගින්, ඒ දැන්වීමෙහි සඳහන් කර ඇති කාලය ඇතුළත තමා වෙත සපයන ලෙස, කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකි ය.

ඇවර කරනු ලබන පුද්ගලික සමාගමක අධ්‍යක්ෂවරයන්ගේ වගකීම.

141. (1) සමාගම් ආඥාපනතෙහි කුමක් සඳහන් වුව ද, පුද්ගලික සමාගමක් ඇවර කරනු ලැබ ඒ සමාගම විසින් ගෙවනු ලැබිය යුතු ආදායම් බදු අයකර ගත නොහැකි වූ අවස්ථාවක, ඒ බද්ද ගෙවිය යුත්තේ යම් තක්සේරු වර්ෂයක් සඳහා ද ඒ වර්ෂය තුළ යම් අවස්ථාවක ඒ සමාගමේ අධ්‍යක්ෂවරයකු වූ සෑම තැනැත්තකු ම, ඒ බදු ගෙවීම පැහැර හැරීම සිදු වූයේ ඒ සමාගමේ කටයුතු සම්බන්ධයෙන් තමාගේ දැඩි නොසැලකිල්ල, බලය නොනිසි ලෙස පාවිච්චි කිරීම හෝ යුතුකම් පැහැර හැරීම නිසා නොවන බව ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඒ බදු ගෙවීම සඳහා එක්ව හා වෙන් වෙන්ව යටත් විය යුතු ය.

(2) මේ වගන්තියේ "පුද්ගලික සමාගම" යන යෙදුමට සමාගම් ආඥාපනතෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය.

කොමසාරිස් ජනරාල්වරයාගේ බලතල හා කර්තව්‍ය පැවරීම.

142. (1) මේ පරිච්ඡේදයෙන් කොමසාරිස් ජනරාල්වරයා වෙත පැවරුණු හෝ පිරිනැමුණු බලතල හෝ කර්තව්‍ය කිසිවක්, කොමසාරිස් ජනරාල්වරයා විසින් තමාගේ අත්සන යටතේ වූ ලියවිල්ලකින් යම් තක්සේරුකරුවකු වෙත පවරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ බලතල හෝ කර්තව්‍ය කිසිවක් ඵවරනු ලැබූ සෑම තක්සේරුකරුවකු විසින් ම, ඒ බලතල හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හෝ ඉටුකිරීම කොමසාරිස් ජනරාල් වරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව කරනු ලැබිය යුතු ය.

XXII වන පරිච්ඡේදය

විවිධ කරුණු

අත්සන සහ දැන්වීම් භාරදීම.

143. (1) මේ පනත යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයකු විසින් හෝ තක්සේරුකරුවකු විසින් දිය යුතු සෑම දැන්වීමක ම අවස්ථාවෝචිත පරිදි, කොමසාරිස් ජනරාල්වරයාගේ හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයාගේ හෝ තක්සේරුකරුගේ නම තිබිය යුතු අතර, එවැනි සෑම දැන්වීමක් ම, කොමසාරිස් ජනරාල්වරයාගේ, නියෝජ්‍ය කොමසාරිස්වරයාගේ හෝ තක්සේරුකරුගේ නම එහි නිසි පරිදි මුද්‍රණය කර හෝ අත්සන් කර තිබුණ හොත්, වලංගු විය යුතු ය.

(2) මේ පනතේ බලය ප්‍රකාර දෙනු ලබන සෑම දැන්වීමක් ම, පුද්ගලිකව භාරදීමෙන් හෝ, යම් තැනැත්තකුගේ අන්තිමට දැන සිටි වාසස්ථානයට නැතහොත් දැන්වීම අදාළවන අවුරුද්ද ඇතුළත ඔහු ව්‍යාපාරයේ නියුක්තව සිටි හෝ සිටින ස්ථානයට භාරදීමෙන් නැතහොත් තැපැලෙන් යැවීමෙන් හෝ ඔහු වෙත භාර දිය හැකි ය:

එසේ වුව ද 115 වන වගන්තිය යටතේ වූ තක්සේරු කිරීමේ දැන්වීමක් පුද්ගලිකව හෝ ඉහත සඳහන් කරනු ලැබූ යම් ස්ථානයකට ලියාපදිංචි කළ ලිපියක මාර්ගයෙන් තැපැලෙන් යැවීමෙන් භාර දිය යුතු ය.

(3) තැපැලෙන් යවනු ලැබූ දැන්වීමක්, තැපැලට ගතවන සාමාන්‍ය කාලය අනුව එය ලැබිය යුතු දිනයට ඉක්බිතිව ම එළඹෙන දිනයෙහි භාරදෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) තැපැලෙන් භාරදීම ඔප්පු කිරීමේ දී, දැන්වීම ඇතුළත් ලිපිය යථාපරිදි ලිපිනය ලියා තැපැල් කළ බව ඔප්පු කිරීම ප්‍රමාණවත් විය යුතු ය.

(5) මේ පනතේ කාර්ය සඳහා වූ යම් දැන්වීමක් හෝ සහතිකයක් හෝ දීමට නැතහොත් නිකුත් කිරීමට බලය ඇති තැනැත්තාගේ නම යයි සලකනු ලැබිය යුතු නමක් එවැනි යම් දැන්වීමක මුද්‍රණය කර හෝ අත්සන් කර හෝ තිබේද නැතහොත් එවැනි යම් සහතිකයක අත්සන් කර තිබේ ද ඒ සෑම නමක් ම අධිකරණමය වශයෙන් පිළිගනු ලැබිය යුතු ය.

දැන්වීම්, තක්සේරු කිරීම් ආදියෙහි වලංගු භාවය.

144. (1) මේ පනතේ විධිවිධානවලට අනුකූලයයි සලකනු ලබන යම් දැන්වීමක්, තක්සේරුවක්, සහතිකයක් හෝ වෙනත් කටයුත්තක්, එහි සාරය හා බලපෑම අනුව මේ පනතේ අධ්‍යාශයට හා අර්ථයට අනුකූල වේ නම් හෝ ගැලපේ නම් සහ තක්සේරු කරනු ලැබූ හෝ තක්සේරු කිරීමට අදහස් කරනු ලැබූ හෝ තක්සේරුව බලපාන හෝ තැනැත්තා පොදු අධ්‍යාශයට සහ වැටහීමට අනුව, ඒ

දැන්වීමෙහි, තක්සේරුවෙහි, සහතිකයෙහි හෝ වෙනත් කටයුත්තෙහි නම් කර තිබේ නම්, එහි ආකෘතියේ ඌනතාවක් හේතුවෙන් නිෂ්ප්‍රභ කරනු නොලැබිය යුතු ය; නැතහොත් ශූන්‍ය ලෙස හෝ ශූන්‍ය කළහැකි ලෙස හෝ සලකනු නොලැබිය යුතු ය; එසේ ම එහි ඇති යම් වරදක්, දෝෂයක් හෝ අඩුපාඩුවක් එය කෙරෙහි බල නොපෑ යුතු ය.

(2) යම් තක්සේරුවක් පිළිබඳ දැන්වීම ආදායම් බදු ගෙවීමට යටත් තැනැත්තා වෙත යථා පරිදි භාර දී ඇත් නම් සහ මේ උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් විස්තර සාරාංශුකූල ව ඒ දැන්වීමේ අඩංගුව ඇත්නම් හා ඒ ඡේදයේ සඳහන් බලපෑම ඒ දැන්වීමේ ඇත්නම්, (1) වන උපවගන්තියේ ව්‍යාප්තියට හානියක් නොමැතිව යම් තක්සේරුවක්—

(අ) ආදායම් බදු අයකරනු ලැබීමට යටත් තැනැත්තාගේ නම හෝ පෙළපත් නාමය පිළිබඳව හෝ තක්සේරු කරනු ලැබූ ආදායමේ, ධනයේ නැතහොත් ත්‍යාගවල ප්‍රමාණය පිළිබඳව හෝ අයකරනු ලැබූ බදුවල ප්‍රමාණය පිළිබඳව හෝ වරදක් ඒ තක්සේරුවෙහි තිබීම; හෝ

(ආ) තක්සේරුව හා ඒ පිළිබඳ දැන්වීම අතර යම් වෙනයක් තිබීම

ඒ තක්සේරුව කෙරෙහි බල නොපෑ යුතු අතර, එකී හේතුවක් මත ඊට විරුද්ධ නොවිය යුතු ය.

හවුල් ව්‍යාපාරයක් වෙනුවෙන් ප්‍රමුඛ හවුල්කරු ක්‍රියා කළ යුතු බව.

145. (1) හවුල් ව්‍යාපාරයක තැනැත්තන් දෙදෙනකු හෝ ඊට වැඩි දෙනකු, භාරකරුවන් නැතහොත් පොල්මෑකරුවන් වශයෙන් හෝ අනුයෝජිතයන් නැතහොත් සේවා යෝජකයන් වශයෙන් හෝ ක්‍රියා කරන්නාවූ එසේ නැතහොත් 93 වන වගන්තිය අදාළ වන මුදල්, වටිනාකම් හෝ ලාභ ලබන තැනැත්තන් වන්නා වූ හෝ, තමන් වෙනුවෙන් ම නැතහොත් අන් තැනැත්තකු වෙනුවෙන් කිනම් තත්ත්වයකින් වුව ද ක්‍රියා කරන්නාවූ කවර වුව ද අවස්ථාවක, මේ පනතේ විධිවිධාන යටතේ එවැනි යම් තත්ත්වයකින් ක්‍රියා කරන පුද්ගලයකු විසින් කරනු ලැබීමට නියමිත සියලු කාර්ය, කාරණා හෝ දේවල් සම්බන්ධයෙන් ඒ හවුල් ව්‍යාපාරයේ ප්‍රමුඛ හවුල්කරු වගකිව යුතු ය:

එසේ වුව ද හවුල් ව්‍යාපාරයක ප්‍රමුඛ හවුල්කරු වශයෙන් මේ පනතේ විධිවිධාන යටතේ දැන්වීම් දෙනු ලැබූ යම් තැනැත්තකු, ඒ හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවකු නොවේ යයි හෝ ශ්‍රී ලංකාවේ වාසික වෙන යම් තැනැත්තකු එහි ප්‍රමුඛ හවුල්කරු යයි හෝ ඔප්පු කරතහොත් මිස, ඔහු ප්‍රමුඛ හවුල්කරු ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) හවුල් ව්‍යාපාරයකට සම්බන්ධ නොවූ තැනැත්තන් දෙදෙනකු හෝ ඊට වැඩි දෙනකු (1) වන උපවගන්තියේ සඳහන් යම් තත්ත්වයකින් එක්ව ක්‍රියා කරන අවස්ථාවක, එබඳු යම් තත්ත්වයකින් ක්‍රියා කරන යම් පුද්ගලයකු විසින් මේ පනතේ විධිවිධාන යටතේ කරනු ලැබීමට නියමිත සියලු කාර්ය, කාරණා හා දේවල් කිරීම සඳහා ඔවුන් එක්ව ද වෙන් වෙන්ව ද වගකිව යුතු ය.

සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් වෙනුවට ප්‍රධාන නිලධරයා ක්‍රියා කළ යුතු බව.

146. (1) සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ සෑම සමාගමක හෝ පුද්ගල මණ්ඩලයක ලේකම්, කළමනාකරු, අධ්‍යක්ෂ හෝ අනෙක් ප්‍රධාන නිලධරයා මේ පනතේ විධිවිධාන යටතේ එවැනි සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලැබීමට නියමිත සියලු ක්‍රියා, කාරණා සහ දේවල් කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු ය:

එසේ වුව ද සමාගමක් හෝ, පුද්ගල මණ්ඩලයක් වෙනුවෙන් මේ පනත යටතේ දැන්වීමක් දෙනු ලැබූ යම් තැනැත්තකු ඒ සමාගම හෝ පුද්ගල මණ්ඩලය සමඟ තමාගේ සම්බන්ධයක් නොමැති බව හෝ ශ්‍රී ලංකාවේ වාසික අන් තැනැත්තකු එහි ප්‍රධාන නිලධරයා බව ඔප්පු කරතහොත් මිස, ඔහු එහි ප්‍රධාන නිලධරයා ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් විසින් මේ පනත යටතේ වරදක් කරනු ලැබූ අවස්ථාවක, ඒ වරද කරනු ලැබූ අවස්ථාවේ ඒ සමාගමේ හෝ පුද්ගල මණ්ඩලයේ ලේකම්, කළමනාකරු, අධ්‍යක්ෂ හෝ අනෙක් ප්‍රධාන නිලධරයා වශයෙන් සිටි සෑම තැනැත්තකු ම, ඒ වරද කර ඇත්තේ තමාගේ අනු දැනුම නොමැතිව බව සහ එම තනතුරේ තම කර්තව්‍ය වල ස්වභාවය සහ යෙදී ඇති වෙනත් සියලු කරුණු ගැන සැලකිලිමත්ව එම වරද කිරීම වැළැක්වීමට ක්‍රියා කළ යුතු වූ පරිදි සියලු උද්‍යෝගයෙන් තමා ක්‍රියා කළ බව ඔප්පු කරතහොත් මිස, ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය.

බෙලහීන වූ හෝ නිර්වාසික තැනැත්තන් වෙනුවෙන් කවරකු විසින් ක්‍රියා කළ හැකි ද යන බව.

147. යම් තැනැත්තකු විසින් කරනු ලැබිය යුතු යයි මේ පනතින් හෝ එය යටතේ හෝ නියමිත යම් ක්‍රියාවක් නැතහොත් දෙයක් ඉටුකිරීම, ඒ තැනැත්තා බෙලහීන වූ හෝ නිර්වාසික හෝ තැනැත්තකු වේ නම්, අවස්ථාවෝචිත පරිදි, ඒ බෙලහීන තැනැත්තාගේ භාරකරුවන් විසින් හෝ ඒ නිර්වාසික තැනැත්තාගේ අනුශෝජිතයා විසින් හෝ කළ යුතු ලෙස සලකනු ලැබිය යුතු ය.

අනුශෝජිතයා ආරක්ෂා කිරීම.

148. (1) භාරකරුවකු, පොල්මෑකරුවකු හෝ අනුශෝජිතයකු වශයෙන් මේ පනත යටතේ බද්ද ගෙවීමට යටත් වන හෝ වෙනත් යම් තැනැත්තකුගේ ආදායම හෝ ධනය වෙනුවෙන් බද්ද අය කර ගනු ලැබීමට යටත් වන සෑම තැනැත්තකු විසින්, ඒ වෙනත් යම් තැනැත්තා වෙනුවෙන් හෝ භාරකරු, පොල්මෑකරු නැතහොත් අනුශෝජිතයා වශයෙන් හෝ තම සන්තකයට හෝ පාලනය යටතට පත්වන වත්කම්වලින්, බද්දේ මුදල ලබා ගැනීමට හැකි තරම් වූ ප්‍රමාණයක වත්කම් කොටසක් රඳවා ගත හැකිය. තව ද, ඒ වත්කම් රඳවා ගැනීම හෝ එම මුදල ගෙවීම සම්බන්ධයෙන් කවර හෝ තැනැත්තකුගෙන් ඔහු ආරක්ෂා කරනු ලැබිය යුතු අතර, ඔහුට එම ආරක්ෂාව මෙයින් සලසනු ලැබේ.

(2) භාරකරු වශයෙන් හෝ පොල්මෑකරු වශයෙන් හෝ ක්‍රියා කරන යම් තැනැත්තකු විසින් බද්ද ගෙවා ඇත්තා වූ ද ඒ ගෙවනු ලැබූ බද්ද රඳවා ගැනීමට හැකිවන පරිදි භාරයේ හෝ බූදලයේ වත්කම් ඔහුගේ සන්තකයට හෝ පාලනයට පත්ව නොමැත්තා වූ ද අවස්ථාවක ඒ බද්ද, භාරයෙහි හෝ බූදලයෙහි අර්ථලාභීන් විසින් භාරකරුට හෝ පොල්මෑකරුට ගෙවිය යුතු ණයක් ම්‍ය යුතු ය.

(3) වෙනත් යම් තැනැත්තකුගේ ආදායම හෝ ධනය වෙනුවෙන් බදු ගෙවීමට යටත් වන හෝ බදු අය කරගනු ලැබීමට යටත් වන තැනැත්තකු ඒ බදු ගෙවන්නා වූද එසේ ගෙවනු ලැබූ බද්දේ මුදල රඳවා ගැනීමට හැකිවන පරිදි වෙනත් යම් තැනැත්තාගේ වත්කම් කිසිවක් ඔහුගේ සන්තකයට හෝ පාලනයට පත්වූ නැත්තා වූ ද අවස්ථාවක එසේ ගෙවන ලද බද්ද ඒ වෙනත් යම් තැනැත්තාගෙන් ඔහුට අය විය යුතු ණයක් විය යුතු ය.

XXIII වන පරිච්ඡේදය

ආපසු ගෙවීම

වැඩිපුර ගෙවනු ලැබූ බද්ද ආපසු ගෙවිය යුතු බව.

149. (1) යම් නක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු විසින් බදු වශයෙන් ගෙවිය යුතු ගණනට වඩා වැඩි මුදලක්, ඔහු විසින්, අඩු කර ගැනීම මගින් හෝ අන් ලෙසකින් යම් ආදායම් බදු, ධන බදු හෝ ත්‍යාග බදු වශයෙන් ගෙවා ඇති බව ඒ නක්සේරු වර්ෂය අවසානයේ සිට තුන් වර්ෂයක් ඇතුළත ඒ තැනැත්තා විසින් යථා පරිදි ලියවිල්ලකින් කරනු ලැබූ හිමිකම් පෑමක් මගින් කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි ඔප්පු කළහොත්, එසේ වැඩිපුර ගෙවනු ලැබූ මුදල ආපසු ලබා ගැනීමට ඔහුට හිමිකම් තිබිය යුතු ය:

එසේ වුවද—

(i) අභියාචනයක් කිරීම සඳහා හෝ ආපසු ගෙවීම් සඳහා හෝ වෙනත් යම් වගන්තියකින් නියමිත කාල සීමාවක් දීර්ඝ කිරීම හෝ අඩු කිරීම නැතහොත් අන්‍යාකාරයකින් බලපෑ රහිත වූ විරෝධතාවක් හෝ අභියාචනයක් බල සහිත කිරීම්, එසේත් නැත්නම් අවසානාත්මක වූ හෝ තීරණාත්මක වූ යම් නක්සේරු කිරීමක් හෝ වෙනත් කාරණයක් ප්‍රතිශෝධනය කිරීම සඳහා අවකාශ ලැබීමේ වරම මේ වගන්තියෙන් නොලැබිය යුතු ය; තව ද

(ii) 38 වන වගන්තිය අනුව ලාභාංශයක් සම්බන්ධයෙන් හෝ 81 වන වගන්තිය අනුව පොලිය, බදු කුලිය, බිම් කුලිය, රාජ්‍ය භාගය හෝ වෙනත් වාර්ෂික ගෙවීමක් වෙනුවෙන් අඩු කිරීම් මගින් ආදායම් බදු ගෙවූ තැනැත්තකුට 38 වන වගන්තියේ (3) වන උපවගන්තිය හෝ 38 වන වගන්තියේ (4) වන උපවගන්තිය හෝ 38 වන වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ හෝ 81 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ හෝ හිමිකම් ලැබිය යුතු යම් සහනයකට වඩා වැඩි සහනයකට මේ වගන්තිය ප්‍රකාර හිමිකම් නොලැබිය යුතු ය;

(iii) අඩු කර ගැනීම් මගින්, යම් ආදායම් බද්දක්, ධන බද්දක් හෝ ත්‍යාග බද්දක් ගෙවූ තැනැත්තකු විසින්, ඉහත සඳහන් අවුරුදු තුන ඇතුළත දී, හිමිකම් පෑමක් කළ හැකිව නොතිබුණු බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් වන අවස්ථාවක දී, එම අඩුකර ගැනීම් කරනු ලැබූ නක්සේරු වර්ෂය අවසානයේ සිට එක් අවුරුද්දක්

ඇතුළත දී, එවැනි ඉල්ලීමක් කරනු ලැබුවහොත්, එසේ වැඩිපුර ගෙවනු ලැබූ මුදල ආපසු ලබා ගැනීමට ඒ තැනැත්තාට හිමිකම තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ හිමිකම්පෑමක් කිරීමට හිමිකම ඇති යම් තැනැත්තකුට මරණය, අශක්‍යතාව, බුන්වත් බව, ගනු දෙනු බේරා වසා දැමීම, හෝ වෙනත් හේතුවක් නිසා, හිමිකම්පෑමක් කිරීමට නොහැකි වූ අවස්ථාවක (1) වන උපවගන්තියේ අර්ථානුකූලව වැඩිපුර ගෙවනු ලැබූ යම් බද්දක්, එම තැනැත්තාගේ හෝ ඔහුගේ බූදලයේ භාසිය සඳහා ආපසු ලබා ගැනීමට, අවස්ථාවෝචිත පරිදි ඔහුගේ පොල්මඃකරුට, භාරකරුට හෝ දේපළ ලබන්නාට හිමිකම තිබිය යුතු ය.

(3) යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු විසින් ගෙවීමට යටත් ආදායම් බදු, ධන බදු හෝ ත්‍යාග බදු මුදලට වැඩිපුර ප්‍රමාණයක් ඒ තැනැත්තා විසින් ගෙවා ඇති බවට ද, ඒ අතිරික්තය ගෙවීමට සිදු වූයේ (තක්සේරු කිරීමේදී හෝ ප්‍රතිශෝධනය කිරීමේදී මේ පනතේ යම් විධිවිධානයක් අදාළ කිරීමේ හෝ තේරුම් ගැනීමේ ලා සිදුවූ දෝෂයක් හැර) ඒ තැනැත්තාගේ ආදායම, ධනය හෝ ත්‍යාග තක්සේරු කිරීමෙහි හේ ඒ තැනැත්තාගේ ආදායම්, ධන හෝ ත්‍යාග වාර්තාවේ දෝෂයක් නිසා බවට ද, කොමසාරිස් ජනරාල් වරයා සෑහීමට පත්වන පරිදි ඒ තක්සේරු වර්ෂයේ අවසානයේ සිට වර්ෂ තුනක් ඇතුළත ලියවිල්ලකින් කරනු ලබන හිමිකම් පෑමක් මඟින් ඔප්පු කරනු ලැබූ අවස්ථාවක, එසේ වැඩිපුර ගෙවනු ලැබූ මුදල ආපසු ලබා ගැනීමට ඒ තැනැත්තාට හිමිකම තිබිය යුතු ය.

(4) 125 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් යම් දඩ මුදලක් යම් තැනැත්තකු විසින් ගෙවනු ලැබූ බව ද එය 125 වන වගන්තියේ (8) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව ගණන් බලන ලද නම් ඔහු විසින් ගෙවිය යුතු මුදලට වැඩි බව ද ලිඛිත ලිල්ලකින් වූ හිමිකම් පෑමක් මඟින් කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි ඔප්පු කරනු ලැබූ අවස්ථාවක, ඒ හිමිකම්පෑම ඉහත කී 125 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් දඩ මුදල ගෙවනු ලැබූ තක්සේරු වර්ෂයෙහි අවසානයේ සිට අවුරුදු තුනක් ඇතුළත කරනු ලැබුවහොත්, එසේ වැඩිපුර ගෙවනු ලැබූ මුදල ආපසු ලබාගැනීමට ඒ තැනැත්තාට හිමිකම තිබිය යුතු ය.

(5) යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් සේවා යෝජකයකු විසින් ගෙවිය යුතුව තිබූ මුදලට වැඩිපුර මුදලක් ඒ සේවා යෝජකයා විසින් XV වන පරිච්ඡේදයෙහි විධිවිධාන යටතේ ඒ තක්සේරු වර්ෂය සඳහා කොමසාරිස් ජනරාල්වරයාට ගෙවා ඇති බව, ඒ තක්සේරු වර්ෂයේ අවසානයේ සිට වර්ෂ තුනක් ඇතුළත ඔහු විසින් ඉදිරිපත් කරනු ලබන ලියවිල්ලකින් වූ හිමිකම්පෑමක් මඟින් කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි ඔප්පු කරනු ලැබූ අවස්ථාවක, එසේ වැඩිපුර ගෙවනු ලැබූ මුදල ආපසු ලබා ගැනීමට ඒ සේවා යෝජකයාට හිමිකම් තිබිය යුතු ය:

එසේ වුවද, 108 වන වගන්තිය යටතේ සේවා යෝජකයකු සම්බන්ධයෙන් කරන ලද තක්සේරුවක් මත ආදායම් බදු ගෙවන ලද අවස්ථාවක, මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

ඇතැම් අවස්ථාවලදී ආපසු ගෙවන මුදලක් වෙනුවෙන් ගෙවිය යුතු පොළිය.

150. 1979 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, අඩුකර ගැනීමකින් හෝ අන්‍යාකාරයකින් තමා විසින් ගෙවූ යම් ආදායම් බද්දක, ධන බද්දක හෝ ත්‍යාග බද්දක මුදල ආපසු ලබා ගැනීමට යම් තැනැත්තකුට හිමිකම් ඇත්තා වූ ද—

(අ) එම ආපසු ගෙවීම උද්ගතවන්නේ 117 වන වගන්තියේ (ඊ) වන උපවගන්තිය යටතේ තක්සේරුකරු සමඟ වූ එකඟත්වයක් අනුව, හෝ එම තක්සේරුව සම්බන්ධයෙන් කරන ලද අභියාචනයක් පිළිබඳ තීරණය අනුව හෝ තක්සේරුවක මුදල අඩු කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් නම් ඒ එකඟත්වයේ දින සිට හෝ එම තීරණය ඒ තැනැත්තා හට දන්වනු ලැබූ දින සිට මාස හයක කාලයක් ඇතුළත; හෝ

(ආ) වෙනත් යම් අවස්ථාවක දී, එම ආපසු ගෙවීම සඳහා කොමසාරිස් ජනරාල්වරයාට එම තැනැත්තා විසින්, ලියවිල්ලකින් වූ හිමිකම්පෑම කරනු ලැබූ දිනය හෝ එම තක්සේරු වර්ෂයේ මාර්තු මස තිස් එක් වන දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන කවර හෝ දිනයක සිට මාස හයක් ඇතුළත,

එම මුදල කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ තැනැත්තාට ආපසු ගෙවනු ලැබ නොමැත්තා වූද අවස්ථාවක (අ) හෝ (ආ) ඡේදවලින් සඳහන් මාස හයක කාලසීමාවෙන් පසුව එකී ආපසු ගෙවිය යුතු මුදලෙන් නොගෙවා ඉතිරිව ඇති මුදල නොගෙවා ඉතිරිව පවතින එක් එක් සම්පූර්ණ මාසයක කාලයක් සඳහා එකී නොගෙවා ඉතිරිව පවතින මුදල වෙනුවෙන් සියයට එකක අනුප්‍රමාණය මත ගණන් බලනු ලැබූ පොළියකට එම තැනැත්තාහට හිමිකම් තිබිය යුතු ය.

XXIV වන පරිච්ඡේදය

වැරදි සහ දණ්ඩන

වාර්තා සැපයීම් පැහැර හැරීම්, සාවද්‍ය වාර්තා සැපයීම් ආදිය සම්බන්ධයෙන් දඬුවම්.

151. (1) (අ) 60 වන වගන්තියේ (1) වන උපවගන්තිය හෝ 63 වන වගන්තියේ (1) වන උපවගන්තිය හෝ 65 වන වගන්තියේ (3) වන උපවගන්තිය හෝ 81 වන වගන්තියේ (1) වන උපවගන්තිය හෝ 92 වන වගන්තියේ (2) වන උපවගන්තිය හෝ 92 වන වගන්තියේ (3) වන උපවගන්තිය හෝ 92 වන වගන්තියේ (4) වන උපවගන්තිය හෝ 92 වන වගන්තියේ (5) වන උපවගන්තිය හෝ 93 වන වගන්තිය හෝ 94 වන වගන්තිය හෝ 95 වන වගන්තිය හෝ 140 වන වගන්තිය යටතේ තමාට කරන ලද දන්වීමක නියමයක් අනුව ක්‍රියා කිරීම පැහැර හරින්නා වූ; හෝ

(ආ) 96 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ (ii) අනුඡේදය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් තමාට කරන ලද නියමයක් අනුව ක්‍රියා කිරීම පැහැර හරින්නා වූ; හෝ

(ඇ) 92 වන වගන්තියේ (4) වන උපවගන්තිය හෝ 92 වන වගන්තියේ (5) වන උපවගන්තිය හෝ 117 වන වගන්තියේ (8) වන උප වගන්තිය හෝ 121 වන වගන්තියේ (7) වන උපවගන්තිය හෝ යටතේ තමාට කරන ලද දැන්වීමකට අනුකූලව පැමිණ නොසිටින්නා වූ හෝ එවැනි යම් දන්වීමකට අනුකූලව පැමිණ සිට, නීත්‍යනුකූලව තමාගෙන් අසනු ලබන යම් ප්‍රශ්නවලට පිළිතුරු දීම සඳහා හේතුවක් කොමැතිව පැහැර හරින්නා වූ; හෝ

(ඈ) 60 වන වගන්තියේ (3) වන උපවගන්තියේ හෝ 63 වන වගන්තියේ (3) වන උප වගන්තියේ හෝ 65 වන වගන්තියේ (4) වන උපවගන්තියේ හෝ 92 වන වගන්තියේ (1) වන උපවගන්තියේ හෝ 127 වන වගන්තියේ (2) වන උපවගන්තියේ හෝ 132 වන වගන්තියේ (7) වන උපවගන්තියේ හෝ නියමයන් අනුව ක්‍රියා කිරීම පැහැර හරින්නා වූ

සෑම තැනැත්තකු ම මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගය කින් පසුව, වරදකරු කරනු ලැබූ විට, රුපියල් දෙදහසකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

(2) XV වන පරිච්ඡේදයෙහි කාර්ය සඳහා සේවා යෝජකයකු ව සිටිමින්—

(i) 99 වන වගන්තියේ (1) වන උපවගන්තිය හෝ 99 වන වගන්තියේ (2) වන උපවගන්තිය අනුව කොමසාරිස් ජනරාල්වරයාට දැනුම් දීම පැහැර හරින; හෝ

(ii) 98 (1) වන වගන්තියෙහි විධිවිධාන යටතේ අඛණ්ඩකර ගනු ලැබීමට නියමිත සම්පූර්ණ ආදායම් බද්ද හෝ ඉන් යම් කොටසක් අඛණ්ඩකර ගැනීම පැහැර හරින; හෝ

(iii) 101 වන වගන්තියේ (2) වන උපවගන්තියේ හෝ 102 වන වගන්තියෙහි (අ), (ආ) හෝ (ඇ) ඡේදවල හෝ 103 වන වගන්තියෙහි (අ), (ආ), (ඇ), (ඈ) හෝ (ඉ) ඡේදවල නියමයන් අනුව ක්‍රියා කිරීම පැහැර හරින

සෑම තැනැත්තකු ම, මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට හෝ හය මාසයක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කරනු ලැබීම යන දඬුවම් දෙකට ම හෝ ඈහු යටත් විය යුතු ය.

(3) XV වන පරිච්ඡේදයෙහි කාර්ය සඳහා සේවා නියුක්තයකු ව සිටිමින් 105 වන වගන්තියේ (1) වන උපවගන්තියේ නියම යන් අනුව ක්‍රියා කිරීම පැහැර හරින සෑම තැනැත්තකු ම මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකදී වරදකරු කරනු ලැබූ විට **රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය.**

(4) සාධාරණ නිදහසට කරුණක් නොමැත්ව—

(අ) තමා වෙනුවෙන් ම හෝ වෙනත් තැනැත්තකු වෙනුවෙන් හෝ හවුල් ව්‍යාපාරයක් වෙනුවෙන් හෝ ආදායම, ධනය හෝ තෑග පිළිබඳව තමා විසින් සැපයීමට හෝ ඉදිරිපත් කිරීමට මේ පනතින් නියමිත වාර්තාවක යම් ආදායමක්, ධනයක් හෝ තෑගයක් අත්හැර දැමීමෙන් නැතහොත් අඩුවෙන් සඳහන් කිරීමෙන්, සාවද්‍ය වාර්තාවක් සපයන්නා වූ හෝ ඉදිරිපත් කරන්නා වූ; හෝ

(ආ) VII වන පරිච්ඡේදය යටතේ අඩුකර ගැනීමක් හෝ දීමනාවක් සඳහා වූ හිමිකම් පෑමක් සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශයක් සපයන්නා වූ; හෝ

(ඇ) බදුවලට තමා යටත්වීම හෝ ඉවතත් තැනැත්තකු යටත් වීම හෝ හවුල් ව්‍යාපාරයක් යටත් වීම කෙරෙහි බලපාන යම් කාරණයක් හෝ දෙයක් සම්බන්ධයෙන් සාවද්‍ය තොරතුරක් සපයන්නා වූ

සෑම තැනැත්තකු ම මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි දැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට—

(i) **එම සාවද්‍ය වාර්තාව, ප්‍රකාශය හෝ තොරතුර හේතු කොට** ගෙන අඩුවෙන් අය කරනු ලැබූ බද්ද හෝ එම වාර්තාව, ප්‍රකාශය හෝ තොරතුර නිවැරදි ලෙස පිළිගන්නා ලද නම් එසේ අඩුවෙන් අය කරනු ලැබිය හැකි වූ බදු මුදලට සමාන මුදලකින්, සහ

(ii) රුපියල් **දහස්** දහසක් නොඉක්මවන මුදලකින් සමන්විත දඩයක් ගෙවීමට ද

නැතහොත් මාස හයක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීම හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

(5) XV වන පරිච්ඡේදයෙහි කාර්ය සඳහා, සේවා යෝජකයකු ව සිටිමින්, තමා විසින් සේවයේ නියුක්ත කර ඇති යම් සේවා නියුක්තයකුගේ වේතන මුදල අත්හැරීමෙන් හෝ අඩුවෙන් දැක්වීමෙන් යුක්ති සහගත හේතුවක් නොමැතිව, සාවද්‍ය ප්‍රකාශයක් කරන, නැතහොත් යම් සේවා නියුක්තයකුගේ වේතනයෙන් **අඩුකර ගන්නා ලද ආදායම්බදු මුදල අත්හරින හෝ අඩුවෙන්** දක්වන සෑම තැනැත්තකු ම මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්

දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කරනු ලැබීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

(6) XV වන පරිච්ඡේදයේ කාර්ය සඳහා සේවා නියුක්තයකුට සිටිමින් 105 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ඔහු විසින් කොමසාරිස් ජනරාල්වරයාට දෙනු ලැබූ යම් දැන්වීමක සාවද්‍ය ප්‍රකාශයක් කරන සෑම තැනැත්තකු ම මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කරනු ලැබීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

(7) වරද සිදු කරනු ලැබුවේ යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් ද නැතහොත් යම් තක්සේරු වර්ෂයක් ඇතුළත ද, ඒ තක්සේරු වර්ෂයෙහි දී හෝ ඒ තක්සේරු වර්ෂය ඉකුත් වීමෙන් පසු වර්ෂ පහක් ඇතුළත හෝ ඒ වරද පිළිබඳව පැමිණිලි කළ හොත් විනා, මේ වගන්තිය යටතේ යම් දඬුවමකට කිසිම තැනැත්තකු යටත් නොවිය යුතු ය.

(8) මේ වගන්තිය යටතේ වූ වරදක් කොමසාරිස් ජනරාල්වරයා විසින් සමථයට පත් කළ හැකි ය. තව ද එය යටතේ වූ යම් නඩු කටයුත්තක් නඩු තීන්දුවට පෙර නතර කිරීම හෝ සමථයට පත් කිරීම ඔහු විසින් කළ හැකි ය.

රහස්‍යතාව කඩ කිරීම හා වෙනත් කාරණා වැරදි මත බව.

152. (1) 158 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ රහස්‍යතාව පිළිබඳ දිවුරුම දීමට නියමිත තැනැත්තකුව සිටිය දී එම දිවුරුම නොදී මේ පනත යටතේ කටයුතු කරන්නා වූ; හෝ

(2) 158 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන හෝ 158 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ දෙන ලද දිවුරුම කඩ කරමින් කටයුතු කරන්නා වූ; හෝ

(3) මේ පනතේ විධිවිධාන කඩ කරමින් කටයුතු කිරීමට වෙන යම් තැනැත්තකුට ආඥා දෙන්නා වූ, අනුබල දෙන්නා වූ හෝ වෙන යම් තැනැත්තකු පොළඹවන්නා වූ

සෑම තැනැත්තකු ම මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

වංචාව ආදිය සම්බන්ධයෙන් දණ්ඩන විධිවිධාන.

153. (1) (අ) මේ පනත යටතේ සපයනු ලැබූ හෝ ඉදිරිපත් කරනු ලැබූ වාර්තාවක ඇතුළත් කළ යුතු යම් ආදායමක්, ධනයක් හෝ න්‍යාගයක් ඒ වාර්තාවක ඇතුළත් නොකර අත්හරින්නා වූ; හෝ

(ආ) මේ පනත යටතේ සපයනු ලබන හෝ ඉදිරිපත් කරනු ලබන යම් වාර්තාවක යම් අසත්‍ය ප්‍රකාශයක් හෝ සටහනක් කරන්නා වූ; හෝ

(ඇ) VII වන පරිච්ඡේදය යටතේ අඩු කිරීමක් හෝ දීමනාවක් සඳහා කරනු ලබන හිමිකම් පෑමක් සම්බන්ධයෙන් අසත්‍ය ප්‍රකාශයක් කරන්නා වූ; හෝ

(ඈ) මේ පනත යටතේ සපයනු ලැබූ හෝ ඉදිරිපත් කරනු ලැබූ යම් ප්‍රකාශයක් හෝ වාර්තාවක් සත්‍ය යයි විශ්වාස කිරීමට යුක්ති සහගත හේතු නොමැති ව ඊට අත්සන් තබන්නා වූ; හෝ

(ඉ) මේ පනතෙහි විධිවිධාන අනුව අසනු ලැබූ ප්‍රශ්නයකට හෝ තොරතුරු සපයන ලෙස කරනු ලැබූ ඉල්ලීමකට වාචිකව හෝ ලියවිල්ලක් මාර්ගයෙන් අසත්‍ය පිළිතුරක් දෙන්නා වූ; හෝ

(ඊ) අසත්‍ය ගණන් පොත් හෝ වෙනත් වාර්තා පිළියෙළ කරන්නා වූ හෝ පවත්වාගෙන යන්නා වූ, හෝ එබන්දක් පිළියෙළ කිරීමට හෝ පවත්වාගෙන යාමට බලය දෙන්නා වූ නැත හොත් ගණන් පොත් හෝ වාර්තා වරදවා පෙන්වන්නා වූ හෝ එසේ වරදවා පෙන්වීමට බලය දෙන්නා වූ; හෝ

(උ) කවර අන්දමක හෝ වංචාවක්, ප්‍රයෝගයක් හෝ උපක්‍රමයක් ප්‍රයෝජනයට ගන්නා වූ හෝ එබඳු වංචාවකින්, ප්‍රයෝගයකින් හෝ උපක්‍රමයකින් ප්‍රයෝජනය ගැනීමට බලය දෙන්නා වූ ද,

එමගින් ආදායම් බදු, ධන බදු හෝ න්‍යාග බදු ගෙවීම මග හරින්නා වූ හෝ මග හැරීමට තැත් කරන්නා වූ හෝ වෙනත් තැනැත්තකුට ඒ බදු මග හැරීමට ආධාර කරන්නා වූ නැතහොත් ඒ බදු මග හැරීමට තැත් කිරීමට ආධාර කරන්නා වූ හෝ යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට—

(i) වරද කරනු ලැබුවේ යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් ද නැතහොත් ඇතුළත ද, ඒ තක්සේරු වර්ෂය සම්බන්ධයෙන්, අවස්ථාවෝචිත පරිදි ඒ තැනැත්තා හෝ සහාය ලැබූ අන් තැනැත්තා හෝ මේ පනත යටතේ යටත් විය යුතු වූ ද මග හැරියා වූ හෝ මග හැරීමට තැත් කළා වූ ද ආදායම් බදු ප්‍රමාණයට සමාන මුදලකින්; සහ

(ii) රුපියල් දස දහසක් නොඉක්මවන මුදලකින්

සමන්විත දඩයක් ගෙවීමට හෝ මාස හයක කාලයකට දෙයාකාර යෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඒ තැනැත්තා යටත් විය යුතු ය.

(2) XV වන පරිච්ඡේදයෙහි කාර්ය සඳහා සේවා යෝජකයකු ව සිටිමින්—

(i) 103 වන වගන්තියේ (අ) ඡේදය හෝ (ඇ) ඡේදය හෝ (ඉ) ඡේදය යටතේ කරන ලද ප්‍රකාශයකින් ස්වකීය සේවයෙහි නියුක්ත සේවා නියුක්තයකුගේ යම් වේතනයක් අත්හරින හෝ එම ප්‍රකාශනයේ එම වේතනයෙන් අඩු කරන ලද ආදායම් බදු ප්‍රමාණය අත්හරින හෝ අඩුවෙන් දක්වන; නැතහොත්

(ii) 103 වන වගන්තියෙහි (ආ) ඡේදය හෝ (ඇ) ඡේදය යටතේ වූ ආදායම් බදු අඩු කිරීම පිළිබඳ ව්‍යාජ සහතිකයක් දෙන

සහ එසේ කිරීමෙන් ආදායම් බද්ද මග හරින හෝ මග හැරීමට තැත් කරන නැතහොත් එම බද්ද මග හැරීමට හෝ මග හැරීම තැත් කිරීමට වෙනත් යම් තැනැත්තකුට ආධාර කරන සෑම තැනැත්තකු ම මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත් වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට, හෝ මාස හයක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කරනු ලැබීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ වූ වරදක්, කොමසාරිස් ජනරාල්වරයා විසින් සමථයට පත් කළ හැකි ය. තවද එය යටතේ වූ යම් නඩු කටයුත්තක් නඩු තීන්දුවට පෙර නතර කිරීම හෝ සමථයට පත් කිරීම හෝ ඔහු විසින් කළ හැකි ය.

මේ පනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් නඩු පැවරීම් කිරීම

154. මේ පනත යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් නඩු පැවරීමක් කිරීම හෝ එවැනි යම් වරදක් සම්බන්ධයෙන් දණ්ඩනයක්, දඩයක් නැතහොත් බන්ධනාගාරගත කිරීමක් නියම කිරීම හේතුකොටගෙන තක්සේරු කරනු ලැබීමට හෝ ගෙවීමට යම් තැනැත්තකු යටත් වන්නේ හෝ යටත් විය හැක්කේ යම් බද්දකට ද ඒ බද්ද තක්සේරු කරනු ලැබීමට හෝ ගෙවීමට ඒ තැනැත්තාට ඇති බැඳීමෙන් ඔහු නිදහස් නොවිය යුතු ය.

නඩු පැවරීම් කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමතය ඇතිව විය යුතු බව.

155. 151 වන වගන්තිය හෝ 153 වන වගන්තිය හෝ යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් කිසිම නඩු පැවරීමක් කොමසාරිස් ජනරාල්වරයාගේ මෙහෙයවීමෙන් හෝ ඔහුගේ අනුමතය ඇතිව හෝ හැර, ආරම්භ කරනු නොලැබිය හැකි ය.

ප්‍රකාශ සහ ලේඛන සාක්ෂ්‍යයේ දී ඇවේක්ෂා කිරීම.

156. මේ පනත යටතේ බදු අය කර ගනු ලැබීමට යටත් තැනැත්තකු විසින් හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා විසින් මේ පනත යටතේ පැන නැගෙන යම් කාරණයක් සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල්වරයා වෙත හෝ කොමසාරිස්වරයකු වෙත හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයකු වෙත හෝ තක්සේරුකරුවකු වෙත හෝ යම්

ප්‍රකාශයක් කරනු ලැබූ හෝ ලේඛනයක් ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක, වෙනත් යම් නීතියක කුමක් සඳහන් වුව ද, මේ පනතේ 151 වන වගන්තියෙහි හෝ 152 වන වගන්තියෙහි හෝ 153 වන වගන්තියෙහි සඳහන් යම් වරදක් සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධව වූ යම් නඩු කටයුතුවල දී ඒ ප්‍රකාශය හෝ ලේඛනය සාක්ෂ්‍යයේ දී ආවේශ්‍ය කරනු ලැබිය යුතු ය.

XXV වන පරිච්ඡේදය

පරිපාලනය

කොමසාරිස් ජනරාල්වරයා.

157. (1) මේ පනතේ කාර්ය සඳහා, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයකු ද අවශ්‍ය විය හැකි දේශීය ආදායම් කොමසාරිස්වරයන්, දේශීය ආදායම් නියෝජ්‍ය කොමසාරිස්වරයන් සහ දේශීය ආදායම් තක්සේරුකරුවන් යම් සංඛ්‍යාවක් ද පත් කරනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ යම් විධිවිධානයක් මගින් කොමසාරිස් ජනරාල් වරයා වෙත පවරා ඇති, නියම කොට ඇති හෝ භාර කොට ඇති යම් බලයක් ක්‍රියාත්මක කරන හෝ යම් කාර්යයක් හෝ කර්තව්‍ය යක් ඉටු කරන කොමසාරිස්වරයකු හෝ නියෝජ්‍ය කොමසාරිස්වර යකු, පටහැනිව කරුණු ඔප්පු කරනු ලබන තෙක්, ඒ බලය ක්‍රියාත් මක කිරීමට හෝ ඒ කාර්ය හෝ කර්තව්‍ය ඉටු කිරීමට, ඒ කොමසාරිස් වරයාට හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයාට බලය දෙනු ලැබූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(3) මේ පනතේ යම් විධිවිධානයක් මගින් දේශීය ආදායම් තක්සේරුකරුවකු වෙත පවරනු ලැබූ යම් බලයක් නියෝජ්‍ය කොමසාරිස්වරයකු විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(4) මේ පනත ක්‍රියාත්මක වන දිනයෙහි දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වශයෙන් හෝ දේශීය ආදායම් කොම සාරිස්වරයකු වශයෙන් හෝ දේශීය ආදායම් නියෝජ්‍ය කොමසාරිස් වරයකු වශයෙන් හෝ දේශීය ආදායම් තක්සේරුකරුවකු වශයෙන් හෝ බුර දරන සෑම තැනැත්තකු ම (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

රහස්‍යතාව.

158. (1) මේ පනත යටතේ ස්වකීය කාර්ය ඉටු කිරීමෙහි ලා හැර, මේ පනත යටතේ පත් කරනු ලැබූ හෝ පත් කරන ලදැයි සලකනු ලබන සෑම තැනැත්තකු ම හෝ මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා හෝ ක්‍රියාත්මක කිරීමෙහි ලා යම් තැනැත්තකුට සහාය වීම සඳහා හෝ සේවයෙහි නියුක්ත කරවනු ලැබ සිටින හෝ ලැබ සිටි සෑම තැනැත්තකු ම, මේ පනත යටතේ ස්වකීය කාර්ය ඉටු කිරීමේදී යම් තැනැත්තකුගේ කටයුතු පිළිබඳව තමාට දැනගැනීමට ලැබෙන සියලු කාරණා සම්බන්ධයෙන් රහස්‍යතාවය ආරක්ෂා කිරීම හා ආරක්ෂා කිරීමෙහිලා සහායවීම කළ යුතු ය. තව ද ඒ කාරණය අදාළ වන්නේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තාට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයාට හෝ අමාත්‍යවරයාට හෝ මුදල්

අමාත්‍යාංශයේ ලේකම්වරයාට හෝ හැර යම් තැනැත්තකුට එවැනි යම් කාරණයක් දැන්විය නොයුතු අතර කොමසාරිස් ජනරාල්වරයාගේ සන්තකයෙහි, භාරයෙහි හෝ පාලනයෙහි ඇති ලේඛන කිසිවක් ලබා ගැනීමට යම් තැනැත්තකුට ඉඩහැරීම හෝ අවසර දීම හෝ නොකළ යුතු ය.

(2) මේ පනත යටතේ පත් කරනු ලැබූ හෝ පත් කරන ලදැයි සලකනු ලබන හෝ මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා සේවයෙහි නියුක්ත කරවනු ලැබූ හෝ සෑම තැනැත්තකු විසින් මේ පනත යටතේ ක්‍රියා කිරීමට පෙර සමාදාන විනිශ්චයකාරවරයකු ඉදිරිපිට දී නියමිත ආකෘතියෙහි වූ රහස්‍යතාව පිළිබඳ දිවුරුමක් දී ඊට අත්සන් කළ යුතු අතර, අමාත්‍යවරයා විසින් සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් මේ පනත යටතේ ක්‍රියා කිරීමට පෙර, සමාදාන විනිශ්චයකාරවරයකු ඉදිරිපිට දී නියමිත ආකෘතියෙහි වූ රහස්‍යතාව පිළිබඳ දිවුරුමක් දී ඊට අත්සන් කළ හැකි ය.

(3) මේ පනත යටතේ පත් කරනු ලැබූ හෝ පත් කරන ලදැයි සලකනු ලබන හෝ මේ පනතෙහි විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා සේවයෙහි නියුක්ත කරවනු ලැබූ කිසිම තැනැත්තකුට, මේ පනතෙහි හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් ක්‍රියාවෙහි යොදවනු ලබන වෙනත් යම් ලිඛිත නීතියක හෝ විධිවිධාන බලාත්මක කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි පරිදි හැර, යම් වාර්තාවක්, ලේඛනයක් හෝ තක්සේරුවක් යම් අධිකරණයක දී ඉදිරිපත් කිරීමට හෝ මේ පනත යටතේ ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී තමාට දැනගැනීමට ලැබෙන යම් කාරණයක් හෝ දෙයක් යම් අධිකරණයකට හෙළිදරව් කිරීමට නැතහොත් දැන්වීමට හෝ නියම කරනු නොලැබිය යුතු ය.

(4) මේ වගන්තියෙහි කුමක් සඳහන්ව ඇත ද, මේ පනත යටතේ හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් ක්‍රියාවෙහි යොදවනු ලබන්නවනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී තමාට දැනගැනීමට ලැබෙන යම් කාරණයක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු විසින්—

(අ) මේ පනත යටතේ හෝ එකී වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ යම් කාර්යයක් ඉටු කිරීම සඳහා ඒ කාරණය දැනුම්දීම අවශ්‍ය නම්, ඒ දෙපාර්තමේන්තුවේ වෙන යම් නිලධරයකුට,

(ආ) පොදු රාජ්‍ය මණ්ඩලයේ යම් දේශයක අය කළ යුතු ආදායම් බද්දෙන් හෝ ධන බද්දෙන්, ශ්‍රී ලංකාවෙහි ගෙවන ලද ආදායම් බදු හෝ ධන බදු වෙනුවෙන් දිය යුතු සහනය දීමට, ඒ දේශයේ ආදායම් බදු අධිකාරියකට හැකි වීම පිණිස අවශ්‍ය යයි කොමසාරිස් ජනරාල්වරයා සලකන ප්‍රමාණයට ඒ අධිකාරියට, සහ

(ඇ) ද්විත්ව බදු අය කිරීමෙන් සහන සැලසීම සඳහා ගිවිසුමකට ඇතුළත් වී ඇති යම් රටක ආදායම් බදු අධිකාරියට

දැනුම්දිය හැකි අතර, කොමසාරිස් ජනරාල්වරයා විසින්, මේ පනත යටතේ හෝ ඔහු විසින් ක්‍රියාවේ යොදවනු ලබන වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ තමා වෙත සපයනු ලැබූ හෝ අන්‍යාකාරයකින් තම සන්තකයෙහි ඇති, යම් වාර්තාවක හෝ ලේඛනයක සඳහන් යම් විස්තරවල පිටපතක්, එය ඒ විස්තරවල සත්‍ය පිටපතක් බවට ඔහු විසින් හෝ ඔහු වෙනුවෙන් සහතික කරනු ලැබ, මේ පනත යටතේ වූ යම් නඩු කටයුත්තක දී ඉදිරිපත් කිරීම හෝ ඉදිරිපත් කිරීමට සැලැස්වීම හෝ කළ හැකි ය. තව ද ලේඛන ඔප්පු කිරීම සම්බන්ධයෙන් සාක්ෂි ආඥාපනතේ කුමක් සඳහන් ව ඇත ද, ඒ පිටපත සාක්ෂ්‍යයේ දී ආවේශ්‍ය කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, එවැනි යම් වාර්තාවක් හෝ ලේඛනයක් ලියූ, සෑදූ, අත්සන් කළ හෝ සැපයූ තැනැත්තාගේ අත්අකුරු හෝ අත්සන ඔප්පු කිරීමට අවශ්‍ය කවර හෝ විටක එසේ ඔප්පු කිරීමේ කාර්යය සඳහා පමණක්, ඒ වාර්තාවේ හෝ ලේඛනයේ මුල් පිටපත කොමසාරිස් ජනරාල්වරයා විසින් ඉදිරිපත් කිරීම හෝ ඉදිරිපත් කිරීමට සැලැස්වීම හෝ කළ හැකි ය:

එසේම තවදුරටත්, එවැනි ලේඛනයක හෝ වාර්තාවක මුල් පිටපත හෝ එවැනි ලේඛනයක හෝ වාර්තාවක සඳහන් යම් විස්තර වල පිටපතක් හෝ යම් අධිකරණයකට ඉදිරිපත් කිරීමට කවර හෝ විටක දී කොමසාරිස් ජනරාල්වරයාට බල කරනු නොලැබිය යුතු ය.

(5) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවල කුමක් සඳහන් ව ඇත ද—

(i) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 7 දරන විශේෂ ජනාධිපති කොමිෂන් සභා පනත යටතේ පිහිටුවනු ලැබූ කොමිෂන් සභාවක් විසින් ඉල්ලා සිටිනු ලැබුවහොත් කොමිෂන් සභාව විසින් පරීක්ෂා කරනු ලබන්නේ යම් තැනැත්තකුගේ පැවැත්ම සම්බන්ධයෙන් ද ඒ තැනැත්තාගේ කටයුතුවලට අදාළ, තමා වෙත ඇති සියලු තොරතුරු හෝ ඒ තැනැත්තාගේ ස්වාමිපුරුෂයාගේ හෝ භාර්යාවගේ හෝ පුත්‍රයකුගේ හෝ දුවකගේ හෝ කොමිෂන් සභාව විසින් සඳහන් කරනු ලබන වෙන යම් තැනැත්තකුගේ කටයුතු වලට අදාළ සියලු තොරතුරු එම කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලැබූ දැන්වීමක සඳහන් පරිදි, කොමසාරිස් ජනරාල්වරයා විසින් සැපයිය යුතු අතර, කොමසාරිස් ජනරාල්වරයාගේ සන්තකයේ හෝ පාලනය යටතේ ඇති, අවස්ථෝචිත පරිදි ඒ තැනැත්තාට, ඒ තැනැත්තාගේ ස්වාමිපුරුෂයාට හෝ භාර්යාවට හෝ පුත්‍රයාට හෝ දුවට හෝ වෙනත් තැනැත්තාට අදාළ වන්නා වූ යම් ලේඛනයක් එසේ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් වන පරිදි ඉදිරිපත් කළ යුතු ය; නැතහොත් සැපයිය යුතු ය.

(ii) යම් තැනැත්තකුට විරුද්ධව වූ අල්ලස් චෝදනාවක් විමර්ශනය කරන අතරතුර දී අල්ලස් ගැනීම සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධව වූ නඩුවක් හෝ යම්

තැනැත්තකු විනිශ්චයට භාජන කිරීමක් ආරම්භවීමෙන් පසු නීතිපතිවරයා විසින් ඉල්ලා සිටිනු ලැබුවහොත් ඒ තැනැත්තාගේ හෝ ඒ තැනැත්තාගේ ස්වාමිපුරුෂයාගේ හෝ භාර්යාවගේ හෝ පුත්‍රයකුගේ හෝ දුවකගේ කටයුතුවලට අදාළව තමා වෙත ඇති සියලු තොරතුරු තමාට නිකුත් කරනු ලැබූ දැන්වීමෙහි සඳහන් පරිදි කොමසාරිස් ජනරාල් වරයා විසින් සැපයිය යුතු අතර, කොමසාරිස් ජනරාල් වරයාගේ සන්තකයේ හෝ පාලනය යටතේ ඇති ඒ තැනැත්තා, ඒ තැනැත්තාගේ ස්වාමිපුරුෂයා හෝ භාර්යාව, පුත්‍රයා හෝ දුව සම්බන්ධයෙන් වූ යම් ලේඛනයක් හෝ යම් ලේඛනයක සහතික පිටපතක් දැන්වීමේ සඳහන් කරනු ලැබූ පරිදි ඔහු විසින් ඉදිරිපත් කළ යුතු ය; නැතහොත් සැපයිය යුතු ය;

(iii) පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත් කරනු ලැබූ කොමිෂන් සභාවක් විසින් ඉල්ලා සිටිනු ලැබුවහොත්, කොමිෂන් සභාව විසින් පරීක්ෂා කරනු ලබන්නේ යම් තැනැත්තකුගේ පැවැත්ම සම්බන්ධයෙන් ද, ඒ තැනැත්තාගේ හෝ ඒ තැනැත්තාගේ ස්වාමිපුරුෂයාගේ හෝ භාර්යාවගේ හෝ පුත්‍රයකුගේ හෝ දුවකගේ කටයුතුවලට අදාළ, තමා වෙත ඇති සියලු තොරතුරු තමා වෙත නිකුත් කරනු ලැබූ දැන්වීමක සඳහන් පරිදි කොමසාරිස් ජනරාල් වරයා විසින් සැපයිය යුතු අතර, කොමසාරිස් ජනරාල් වරයාගේ සන්තකයේ හෝ පාලනය යටතේ ඇති ඒ තැනැත්තාගේ හෝ ඒ තැනැත්තාගේ ස්වාමිපුරුෂයාගේ හෝ භාර්යාවගේ, පුත්‍රයකුගේ හෝ දුවකගේ කටයුතුවලට අදාළ, යම් ලේඛනයක් හෝ යම් ලේඛනයක සහතික පිටපතක් ඒ දැන්වීමෙහි සඳහන් පරිදි ඉදිරිපත් කළ යුතු ය; නැතහොත් සැපයිය යුතු ය.

(iv) යම් තැනැත්තකු අල්ලස් ගැනීමේ වරදක් කර ඇති බව තමා වෙත ඇති තොරතුරක් අනුව තමා සෑක කරන අවස්ථාවක දී, පරීක්ෂා කිරීම සඳහා කොමසාරිස් ජනරාල් වරයා විසින් නීතිපතිවරයාට ඒ කාරණය වාර්තා කළ යුතු ය.

(6) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ පිහිටුවනු ලැබූ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ඉල්ලා සිටි විට, ඒ පනත යටතේ කොමිෂන් සභාවේ බලතල ක්‍රියාත්මක කිරීම සහ එහි කර්තව්‍ය ඉටු කිරීම සඳහා කොමිෂන් සභාවට අවශ්‍ය වන්නා වූ ද මේ පනත යටතේ තම කාර්ය කිරීමේ දී තමාට දැන ගැනීමට ලැබෙන්නා වූ ද යම් තැනැත්තකුගේ කටයුතුවලට අදාළ යම් තොරතුරු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු විසින් කොමිෂන් සභාවට හෙළිදරව් කළ යුතු ය.

(7) මේ වගන්තියේ කුමක් සඳහන් වුව ද, විගණකාධිපතිවරයාට හෝ ඔහු විසින් තත් කාර්ය සඳහා නිසියාකාරව බලය දෙනු ලැබූ විගණකාධිපතිවරයාගේ දෙපාර්තමේන්තුවේ වෙන යම් නිලධරයකුට, ස්වකීය නිල කාර්ය කිරීමට අවශ්‍ය විය හැකි යම් පොත්, වාර්තා, වාර

වාර්තා හෝ වෙනත් ලේඛන ලබා ගැනීමට කොමසාරිස් ජනරාල් වරයා විසින් අවසර දිය හැකි ය. විගණකාධිපතිවරයා හෝ මේ උප වගන්තිය යටතේ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු, මේ පනතේ විධිවිධාන ඉෂ්ට කිරීම සඳහා සේවයෙහි නියුක්ත කරවනු ලැබූ තැනැත්තකු වශයෙන් (2) වන උපවගන්තියේ කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(8) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ කොමසාරිස් ජනරාල් වරයා විසින් තත් කාර්ය සඳහා බලය පවරනු ලැබූ වෙන යම් තැනැත්තකු විසින්—

(අ) සියලුම බදු ගෙවන්නන්ගේ නම් සහ ලිපිනයන් ද යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් ඒ බදු ගෙවන්නන් ගේ මාර වාර්තාවල ප්‍රකාශ කොට ඇති මුළු ආදායම ද අවශ්‍ය යයි කොමසාරිස් ජනරාල්වරයා අදහස් කරන අවස්ථාවක ඔවුන්ගේ ප්‍රධාන ආදායම් මාර්ග ද ඇතුළත් ලැයිස්තුවක්; සහ

(ආ) මේ පනත යටතේ යම් වරදක් සඳහා යම් අධිකරණයක දී වරදකරු කරනු ලැබූ තැනැත්තකුට හෝ 96 වන වගන්තිය යටතේ හෝ 124 වන වගන්තිය යටතේ හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් දණ්ඩනයක් පනවනු ලැබූ තැනැත් තකුට අදාළ තොරතුරු,

කොමසාරිස් ජනරාල්වරයා විසින් සුදුසු යයි අදහස් කරන ආකාරය ඇට කලින් කල පළ කරවිය හැකි ය.

(9) රක්ෂණ ව්‍යාපාරයක් වෙනුවෙන් නිකුත් කරන ලද රක්ෂණ ඔප්පු හිමියන්ගේ අයිතියට හානිකර වන ආකාරයකින් ක්‍රියා කොට සිටින ඒ රක්ෂණ ව්‍යාපාරයේ යම් අධ්‍යක්ෂවරයකුට, කළමනාකරුව කුට හෝ වෙනත් නිලධරයකුට හෝ සේවා නියුක්තයකුට විරුද්ධව නඩු පැවරීමේ කාර්ය සඳහා ඒ අධ්‍යක්ෂවරයාගේ, කළමනාකරුගේ, වෙනත් නිලධරයාගේ හෝ සේවා නියුක්තයාගේ වත්කම්වලට අදාළව කොමසාරිස් ජනරාල්වරයා සන්තකයේ තිබෙන යම් තොර තුරු සපයන ලෙස නීතිපතිවරයා විසින් ලිඛිත දැන්වීමකින් කොම සාරිස් ජනරාල්වරයාට නියම කරන අවස්ථාවක, මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, කොමසාරිස් ජනරාල් වරයා විසින් නීතිපතිවරයා වෙත ඒ තොරතුරු සැපයිය යුතු ය.

(10) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, විනිමය පාලන පනත හෝ රේගු ආඥාපනත යටතේ යම් තැනැත්තකු විසින් වරදක් කර ඇති බව, මේ පනත යටතේ තමාගේ, කාර්ය ඉටු කිරීමේ දී තමාට දැනගැනීමට ලැබෙන යම් කාරණයකින් කොමසාරිස් ජනරාල්වරයාට පෙනී යන අවස්ථාවක, ඒ වරද කිරීම හා සම්බන්ධ යම් තොරතුරක් හෝ ඒ වරද සිදු කරනු ලැබූ බව ඔප්පු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය හෝ ප්‍රයෝජන වත් යම් භාණ්ඩ, ගණන් පොත් හෝ අන්කිසි ලේඛන පිළිබඳව අවස්ථාවෝචිත පරිදි, විනිමය පාලකට හෝ ප්‍රධාන රේගු අයකැමිට ඔහු විසින් දැනුම්දීම හෝ ඒවා භාරදීම කළ හැකි ය.

(11) විනිමය පාලන පනත හෝ රේගු ආඥාපනත යටතේ යම් තැනැත්තකු විසින් වරදක් සිදු කිරීම පිළිබඳ යම් තොරතුරක් හෝ ඒ වරද කරනු ලැබූ බව ඔප්පු කිරීමේ කාර්ය සඳහා අවශ්‍ය හෝ ප්‍රයෝජනවත් යම් භාණ්ඩ, ගණන් පොත් හෝ වෙනත් ලේඛන පිළිබඳව (10) වන උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින්, අවස්ථාවෝචිත පරිදි විනිමය පාලකට හෝ ප්‍රධාන රේගු අය කැමිට දැනුම්දී හෝ ඒවා භාරදී ඇති අවස්ථාවක, මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවලට පටහැනිව කුමක් සඳහන් වුව ද, ඒ වරද සඳහා ඒ තැනැත්තාට විරුද්ධව පවරනු ලැබූ යම් නඩු කටයුත්තක දී ඒ තොරතුරු, භාණ්ඩ, ගණන් පොත් හෝ වෙනත් ලේඛන පිළිබඳව සාක්ෂිදීමට ද ඉදිරිපත් කරන ලෙස ඒ නඩු කටයුත්තේ දී තමාට නියම කරනු ලැබිය හැකි වාර වාර්තා, ගණන් පොත් හෝ වෙනත් ලේඛන හෝ භාණ්ඩ කිසිවක් ඉදිරිපත් කිරීම හෝ ඉදිරිපත් කරනු ලැබීමට සැලැස්වීම ද කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අන්කිසි නිලධරයකු විසින් කළ හැකි ය. ඒ නඩු කටයුතුවල කාර්යය සඳහා, යම් වාර වාර්තාවක, ගණන් පොත්වල හෝ වෙනත් ලේඛනවලට ඇතුළත් යම් තොරතුරුවල පිටපතක් කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ එවැනි වෙනත් නිලධරයකු විසින් අධිකරණයට ඉදිරිපත් කළ හැකි හෝ ඉදිරිපත් කරනු ලැබීමට සැලැස්විය හැකි අතර ලේඛන ඔප්පු කිරීමට අදාළ වූ සාක්ෂි ආඥාපනතේ කුමක් සඳහන්ව ඇත ද ඒ පිටපත සාක්ෂි වශයෙන් ආවේශ්‍ය විය යුතු ය:

එසේ වුව ද,

(අ) ඒ වාර වාර්තාව, ගණන් පොත් හෝ වෙනත් ලේඛන ලිඛිත, සැදූ, අත්සන් කළ හෝ සැපයූ තැනැත්තාගේ අත් අකුරු හෝ අත්සන ඔප්පු කිරීම අවශ්‍ය වන යම් අවස්ථාවක ඒ වාර වාර්තාවේ, ගණන් පොත්වල හෝ වෙනත් ලේඛනයෙහි මුල් පිටපත ඉදිරිපත් කිරීම හෝ ඉදිරිපත් කරනු ලැබීමට සැලැස්වීම කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ වෙනත් නිලධරයා විසින් කළ හැකි ය. එහෙත් එය ඔප්පු කිරීමේ කාර්ය සඳහා පමණක් විය යුතු ය;

(ආ) එම වාර වාර්තාවෙහි, ගණන් පොත්වල හෝ වෙනත් ලේඛනයෙහි මුල් පිටපත හෝ ඒ වාර වාර්තාවෙහි, ගණන් පොත්වල හෝ ලේඛනයෙහි ඇතුළත් විස්තරවල පිටපතක් හෝ අධිකරණයට ඉදිරිපත් කරන ලෙස කිසිම අවස්ථාවක කොමසාරිස් ජනරාල්වරයාට හෝ වෙනත් නිලධරයාට බල නොකළ යුතු ය.

XXVI වන පරිච්ඡේදය

පොදු කාරණා

නියෝග.

159. (1) මේ පනතේ ප්‍රතිපත්ති සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හා බල ගැන්වීමේ කාර්ය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග කළ හැකි ය.

(2) (1) වන උපවගන්තියෙන් පවරනු ලැබූ බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, විශේෂයෙන් ම පහත සඳහන් කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග කළ හැකි ය:—

(අ) ආදායමේ, ධනයේ හෝ තෑගවල ප්‍රමාණය ඒකාන්ත ලෙස නිශ්චය කළ නොහැකි අවස්ථාවල දී, බදු අය කිරීමට යටත් ආදායමේ, ධනයේ සහ තෑගවල ඇස්තමේන්තුවක් පිළියෙළ කරනු ලැබිය හැකි ක්‍රම;

(ආ) මේ පනත යටතේ ගෙවනු ලැබූ යම් බද්දක් ආපසු ගෙවීම් සඳහා හෝ මේ පනත යටතේ ඉල්ලා සිටිනු ලැබිය හැකි යම් දීමනාවක් හෝ අඩු කිරීමක් සඳහා කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය;

(ඇ) නියම කිරීමට මේ පනතින් නියමිතව හෝ බලය ලැබී ඇති යම් කාරණයක්;

(ඈ) මේ උපවගන්තිය යටතේ සාදනු ලැබූ නියෝග කඩ කිරීම සඳහා හෝ ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හැරීම සඳහා නියම කරනු ලබන්නා වූ ද එක් එක් අවස්ථාව සම්බන්ධයෙන් රුපියල් පන්සියයකට වැඩි නොවිය යුතු වූ ද දණ්ඩන.

(3) මේ වගන්තිය යටතේ සාදනු ලැබූ නියෝගයක් කඩ කිරීම සම්බන්ධයෙන් හෝ ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හැරීම සම්බන්ධයෙන්—

(අ) දණ්ඩනයක් නියම කිරීමේ; හෝ

(ආ) නියම කරන ලද දණ්ඩනයක් වැඩිකිරීමේ

නියෝගයක්, මේ වගන්තිය යටතේ සාදනු ලැබූ නියෝගයක් එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ දිනයට වඩා කලින් වූ දිනයක සිට බලපැවැත්වෙන ලෙස ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.

(4) නියෝගයක් කඩ කිරීම හෝ ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හැරීම සඳහා දඬුවමක් නියම කරන නියෝගයක්, පාර්ලිමේන්තුව විසින් අනුමත කරන තුරු ද, ඒ අනුමතය පිළිබඳ දැන්වීමක් ගැසට් පත්‍රයෙහි පළ කරන තුරු ද ක්‍රියාත්මක නොවිය යුතු ය.

(5) (4) වන උපවගන්තියෙහි සඳහන් කරනු ලැබූ නියෝගයක් නොවන, අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයෙහි එය පළ කරනු ලැබූ දින සිට හෝ එම නියෝගයෙහි සඳහන් කරනු ලැබිය හැකි යම් දිනයක දී ක්‍රියාත්මක විය යුතු ය.

(6) (5) වන උපවගන්තියෙහි සඳහන් කරනු ලැබූ සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි තාක් ඉක්මනින් අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත නොකරනු ලබන සෑම නියෝගයක් ම ඒ අනනුමතයේ දින සිට, එහෙත් එය යටතේ ඊට කලින් කරන ලද කිසිවකට හානියක් නොවන පරිදි පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු ය. යම් නියෝගයක් පරිච්ඡින්න වූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

ආකෘති. 160. මේ පනතේ කාර්ය සියල්ල හෝ ඉන් කිසිවක් සඳහා භාවිත කළ යුතු ආකෘති කොමසාරිස් ජනරාල්වරයා විසින් කලින් කල නිශ්චය කොට දක්වනු ලැබිය හැකි ය. එසේ නිශ්චය කොට

දක්වනු ලැබූ යම් ආකෘතියක් කලින් කල සංශෝධනය කිරීම හෝ වෙනස් කිරීම හෝ එසේ නිශ්චය කොට දක්වනු ලැබූ යම් ආකෘතියක් වෙනුවට වෙනයම් ආකෘතියක් ආදේශ කිරීම කොමසාරිස් ජනරාල්වරයා විසින් කළ හැකි ය. තව ද, කොමසාරිස් ජනරාල්වරයා විසින් එසේ නිශ්චය කොට දක්වනු ලැබූ යම් ආකෘතියක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය හැකි ය.

ගොඩනැගිලි හෝ ස්ථාන සෝදිසි කිරීමට ඇති බලය.

161. (1) මේ පනතේ කාර්ය සඳහා පත් කරනු ලැබූ ද, කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ සඳහා විශේෂයෙන් බලය පවරනු ලැබූ ද, යම් නිලධරයකු විසින්, සාම නිලධරයකු සමඟ ගොස් පහත සඳහන් ක්‍රියා සියල්ලම හෝ ඉන් කිසිවක් ඉටු කළ හැකි ය: —

(i) මේ පනත යටතේ වූ යම් කටයුත්තක් සඳහා ප්‍රයෝජන වන්නේ යයි හෝ කටයුත්තකට අදාළ වන්නේ යයි ඔහු අදහස් කරන යම් භාණ්ඩ, ගිණුම් පොත් හෝ වෙනත් ලේඛන ඇතැයි විශ්වාස කිරීමට ඔහුට හේතු ඇති යම් ගොඩනැගිල්ලකට හෝ ස්ථානයකට ඇතුළුවීම හා සෝදිසි කිරීම සහ එවැනි යම් භාණ්ඩ, ගිණුම් පොත් හෝ වෙනත් ලේඛන සොයා ගනු ලැබුවහොත් ඒවා පරීක්ෂා කිරීම;

(ii) එබඳු භාණ්ඩ, ගිණුම් පොත්, හා වෙනත් ලේඛන තහනමට ගෙන, කොමසාරිස් ජනරාල්වරයාට භාර දීම හෝ ඒහි අඳුනා ගැනීමේ ලකුණු තැබීම හෝ එයින් උධෘත හෝ පිටපත් ගැනීම;

(iii) එසේ භාරදීමේ කාර්ය සඳහා එබඳු යම් භාණ්ඩ ගිණුම් පොත් හෝ වෙනත් ලේඛන ආරක්ෂා කිරීම හෝ ආරක්ෂා කිරීමට සැලැස්වීම;

(iv) මේ පනත යටතේ පැන නගින යම් කාරණයක් සම්බන්ධයෙන් හෝ එබඳු යම් භාණ්ඩවල, ගිණුම් පොත්වල හෝ වෙනත් ලේඛනවල අයිතිය සම්බන්ධයෙන් එම ගොඩනැගිල්ලෙහි දී හෝ ඒ ස්ථානයෙහි දී තමාට හමුවන යම් තැනැත්තකුගෙන් ප්‍රශ්න කිරීම;

(v) මේ වගන්තිය යටතේ යම් සෝදිසියක් කිරීමේ දී සොයා ගනු ලැබූ මේ පනත යටතෙහි වූ යම් කටයුතුවලට ප්‍රයෝජනවත් වන්නේ යයි හෝ අදාළ වන්නේ යයි ඔහුට අදහස් වන වෙන යම් සටහනක් හෝ දේපළ ලැයිස්තුවක් සැදීම.

තව ද 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතෙහි ඇති සෝදිසි කිරීම්වලට අදාළ වූ විධිවිධාන මේ වගන්තිය යටතේ වූ සෝදිසි කිරීම්වලට ද හැකිතාක් දුරට අදාළ විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් බලතල ක්‍රියාත්මක කිරීමට යම් නිලධරයකුට බලය පැවරීමට පෙර, ඒ නිලධරයා විසින් ඒ බලතල ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වීමට තුඩු දුන් හේතු කොමසාරිස් ජනරාල්වරයා විසින් වාර්තා ගත කළ යුතු ය.

(3) (අ) මේ වගන්තිය යටතේ සෝදිසි කිරීමක් කරන නිලධරයා විසින් යම් භාණ්ඩයක් තහනමට ගෙන—

(i) කොමසාරිස් ජනරාල්වරයා විසින් ක්‍රියාවේ යොදවන යම් ලිඛිත නීතියක් යටතේ ඒ භාණ්ඩයේ අයිතිකරු විසින් ගෙවිය යුතු යම් බද්දක් ගෙවීම පැහැර හැර තිබේ නම් නැතහොත්

(ii) ඒ අයිතිකරු විසින් ගෙවිය යුතු නමුදු ඔහු විසින් එසේ ගෙවා නැති බද්දට අදාළ වූ ලාභවලින් සහ ආදායමෙන් ඒ භාණ්ඩය එහි අයිතිකරු විසින් මිල දී ගෙන ඇතැ යි හෝ ඒ භාණ්ඩය ඒ ලාභ හා ආදායම් වෙතැ යි තමා විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි පරීක්ෂණයකින් පසු ඒ නිලධරයා සෑහීමට පත් වුවහොත්

පමණක් එය කොමසාරිස් ජනරාල්වරයාට භාර දිය යුතු ය.

(ආ) මේ වගන්තිය යටතේ සෝදිසි කිරීමක් කරන නිලධරයකු විසින් යම් භාණ්ඩයක් තහනමට ගනු ලැබුවහොත් එසේ තහනමට ගනු ලැබූ භාණ්ඩය පිළිබඳව ලදු පතක් එම නිලධරයාගෙන් ලබා ගැනීමට එම භාණ්ඩයේ අයිතිකරුට හිමිකම් තිබිය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ යම් භාණ්ඩයක් තහනමට ගෙන කොමසාරිස් ජනරාල්වරයා වෙත භාර දී ඇති අවස්ථාවක, කොමසාරිස් ජනරාල්වරයා විසින්—

(අ) එම භාණ්ඩය මුදල් නම් සහ ඒ මුදල් ගෙවීම පැහැර හැර ඇති බදු මුදලට හෝ ඒ භාණ්ඩ සඳහා කොමසාරිස් ජනරාල්වරයාගේ අදහස පරිදි ගෙවිය යුතු බදු මුදලට අඩු හෝ සමාන නම්, ඒ මුදල් ඒ බද්දේ කොටසක් හෝ සම්පූර්ණ බද්ද හෝ පියවීම සඳහා හිලව් කළ හැකි ය, නැතහොත්

(ආ) ඒ මුදල හිලව් කළ යුතු බදු මුදලට වඩා වැඩිනම්, ඒ බද්ද සම්පූර්ණයෙන් පියවීම සඳහා අවශ්‍ය ඒ බදු මුදලට සමාන තරම් මුදලක් හිලව් කර ඉතිරි මුදල් ඒ භාණ්ඩයේ අයිතිකරුට ආපසු දිය හැකි ය:

එසේ වුව ද, ඒ මුදල විදේශීය ව්‍යවහාර මුදලින් වූ අවස්ථාවක දී, ඒ ඉතිරි මුදල බැංකුවක ඒ භාණ්ඩයේ අයිතිකරුගේ ගිණුමට බැර කළ යුතු ය.

(ඇ) ඒ භාණ්ඩය මුදල් නොවේ නම්—

(i) අවස්ථාවෝචිත පරිදි, ගෙවීම පැහැර හැරිය බද්ද හෝ ඒ භාණ්ඩය මිල දී ගැනීමට යෙදූ වූ ලාභ සහ ආදායම් සඳහා කොමසාරිස් ජනරාල්වරයාගේ අදහස පරිදි ගෙවිය යුතු බද්ද ගෙවන තෙක්; හෝ

(ii) කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් වන ආකාරයට ඒ ආදායම් බද්ද ගෙවීමට කටයුතු පිළියෙළ කරන තෙක්

(5) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව ඒ භාණ්ඩය තම භාරයේ තබා ගත හැකි ය.

(5) ඒ භාණ්ඩය තහනමට ගැනීමේ දිනයෙන් පසු මාස හයක් ඇතුළත ඒ භාණ්ඩයේ අයිතිකරු විසින්, (4) වන උපවගන්තියේ (ඇ) ඡේදයෙන් නිශ්චිතව සඳහන් ලෙස බද්ද නොගෙ වූ හෝ ගෙවීමට කටයුතු පිළියෙළ නොකළ අවස්ථාවක, කොමසාරිස් ජනරාල් වරයා විසින් ඒ භාණ්ඩය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට සැලැස්විය යුතු ය.

(6) මේ වගන්තිය යටතේ යම් භාණ්ඩයක් විකිණීමෙන් ලබා ගත් මුදල—

(i) පළමු ව, ඒ භාණ්ඩය තහනමට ගැනීමේ, තබා ගැනීමේ සහ විකිණීමේ ගාස්තු සහ අය කිරීම් ගෙවීම සඳහා; සහ

(ii) දෙවනුව, ඒ භාණ්ඩය අයිතිකරු විසින් ගෙවිය යුතු ආදායම් බද්ද පියවීම සඳහා

යොදවා, ඉතිරි මුදලක් ඇත්නම්, එය ඒ භාණ්ඩයේ අයිතිකරු වෙත ගෙවිය යුතු ය.

(7) මේ වගන්තියේ—

"භාණ්ඩය" යන්නට, ශ්‍රී ලංකාවේ ව්‍යවහාර වන හෝ නොවන මුදල්, තැපැල් ඇණවුමක්, මුදල් ඇණවුමක්, සංචාරක චෙක් පතක්, ණයවර ලිපියක්, විනිමය බිල් පත්‍රයක්, පොරොන්දු නෝට්ටුවක්, රත්රන් ආභරණ, මැණික්කක් සහ අතේ ඇති යම් බඩු තොගයක් ඇතුළත් වේ;

"සාම නිලධරයා" යන්නෙහි 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය.

XXVII වන පරිච්ඡේදය

1979 අප්‍රේල් මස 1 වන දින ආරම්භවන තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු ආදායම් බද්ද සම්බන්ධ විශේෂ විධිවිධාන

1979 අප්‍රේල් මස 1 වන දින යෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු ආදායම් බද්දට අදාළ වන විශේෂ විධිවිධාන.

162. (1) 1979 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා සෑම තැනැත්තකුගෙන් ම, මේ පනතේ ඉහතින් වූ විධිවිධාන යටතේ ඒ තැනැත්තා ගෙවීමට යටත්වන ආදායම් බද්ද වෙනුවට නොව ඊට අතිරේකව, වෙනම නිශ්චය කරන ලද (මේ වගන්තියේ "අදාළ බද්ද" යනුවෙන් සඳහන් කරනු ලබන) බද්දක්, 3(ආ) වන වගන්තියේ අර්ථානුකූලව සේවානියුක්තියෙන් ලැබෙන ලාභ හැර, ඒ තක්සේරු වර්ෂයට පෙරාතුව වූ (මේ වගන්තියේ "අදාළ වර්ෂය" යනුවෙන් සඳහන් කරනු ලබන) වර්ෂය සඳහා,—

(අ) අදාළ වර්ෂය තුළ ඒ තැනැත්තා ශ්‍රී ලංකාවේ වාසික වූයේ නම් කවර ස්ථානයක වුව ද ඇතිවන; සහ

(ආ) වෙනත් යම් තැනැත්තකු සම්බන්ධයෙන් වූ විට ශ්‍රී ලංකාවේ ඇතිවන හෝ ශ්‍රී ලංකාවෙන් ලබාගන්නා,

(මේ වගන්තියේ "අදාළ ලාභ සහ ආදායම" යනුවෙන් සඳහන් කරනු ලබන) ඒ තැනැත්තාගේ ලාභ සහ ආදායම වෙනුවෙන් අයකරනු ලැබිය යුතු අතර ඒ අදාළ බද්ද පහත සඳහන් පරිදි ආගණනය කළ යුතු ය:—

(i) අදාළ වර්ෂයේ ආරම්භයේ දී යම් පිරියත, යන්ත්‍ර සූත්‍ර හෝ සවිකිරීම්, යම් තැනැත්තකුට අයිතිව තිබී ඔහු විසින් ඒ වර්ෂය තුළ දී කර ගෙන ගිය හෝ ක්‍රියාත්මක කළ යම් වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රක්ෂාවක යොදවා—

(1) ඒ පිරියත, යන්ත්‍ර සූත්‍ර හෝ සවිකිරීම් ක්ෂය වීම් වෙනුවෙන් දීමනාවක් 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 10(1)(ඌ) වගන්තිය යටතේ ප්‍රදානය කර ඇති, සහ

(2) ක්ෂය වීම සඳහා එසේ දීමනාවක් ප්‍රදානය කරනු ලැබුවේ යම් ප්‍රයෝජනයට ගැනීමට ඉඩ ඇති කාලය කට යොමු කිරීමෙන් ද ඒ ප්‍රයෝජනයට ගැනීමට ඉඩ ඇති කාලය අදාළ වර්ෂය ආරම්භ වන විට ඉකුත් වී නොතිබූ අවස්ථාවක

(අ) ඒ පිරියත, යන්ත්‍ර සූත්‍ර හෝ සවිකිරීම් අත් කර ගැනීමේ වියදම, සහ

(ආ) ඒ වෙනුවෙන් ක්ෂය වීම සඳහා ප්‍රදානය කරන ලද දීමනාවේ ද ක්ෂය වීම සඳහා දීමනාව ප්‍රදානය කිරීමේ දී යොමු කරනු ලැබූ ප්‍රයෝජනයට ගැනීමට ඉඩ ඇති කාලයේ ඉකුත් නො වූ කොටසට කොමසාරිස් ජනරාල්වරයාගේ මතය අනුව ආරෝපණය කළ හැකි අත් කර ගැනීමේ වියදමේ කොටසට සමාන මුදලක ද එකතුව

අතර ඇති වෙනසට සමාන දීමනාවක් ඔහුගේ අදාළ ලාභ සහ ආදායම ආගණනය කිරීමේ දී අඩු කිරීමට හිමිකම් ලැබිය යුතුය යන වෙනස් කිරීමට යටත්ව, II වන, III වන, IV වන සහ XII වන පරිච්ඡේදවල විධිවිධාන ඒ තැනැත්තාගේ අදාළ ලාභ සහ ආදායම නිශ්චය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(ii) ඉහත කී පරිදි නිශ්චය කරනු ලැබූ ඔහුගේ ලාභවල සහ ආදායමේ සෑම ප්‍රභවයකින් ම ලැබෙන ඒ තැනැත්තාගේ අදාළ ලාභ සහ ආදායම එම ප්‍රභවයෙන් ලැබෙන ඔහුගේ ව්‍යවස්ථාපිත ආදායම වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඔහුගේ සම්පූර්ණ ව්‍යවස්ථාපිත ආදායම ඒ අනුව ආගණනය කළ යුතු ය;

(iii) ඒ තැනැත්තා අදාළ වර්ෂයේ දී ශ්‍රී ලංකාවෙහි වාසිකව සිටියේ නම්, එම තැනැත්තාගේ යම් දරුවකුගේ සම්පූර්ණ ව්‍යවස්ථාපිත ආදායම,—

(අ) එම දරුවාගේ පියා ඔහු වී නම් සහ ඔහුගේ විවාහය අදාළ වර්ෂයේ දී පැවතියේ නම්, හෝ

(ආ) ඒ අදාළ වර්ෂයේ දී ඔහුගේ විවාහය නොපැවතියේ නම්, දෙමව්පියන්ගෙන් ඒ දරුවා නඩත්තු කළ තැනැත්තා ඔහු වූයේ නම් හා එම අදාළ වර්ෂයේ දී එම දරුවා ජීවත් වූයේ ඔහු සමග නම්

එම තැනැත්තාගේ සම්පූර්ණ ව්‍යවස්ථාපිත ආදායම සමග එකතු කොට, එය එහි කොටසක් වශයෙන් සලකනු ලැබිය යුතු ය;

(iv) එවැනි යම් විධිවිධානයක් යටතේ යම් තක්සේරු වර්ෂයක් සඳහා මුළු ව්‍යවස්ථාපිත ආදායමෙන් යම් අඩු කිරීමකට ඇති හිමිකම හෝ අඩු කළ යුතු මුදල, ඒ තක්සේරු වර්ෂයට යොමු කිරීමෙන් තීරණය කළ යුතු වන අවස්ථාවක, අදාළ වර්ෂයට යොමු කිරීමෙන් එය තීරණය කළ යුතුය යන සංශෝධනයට යටත් ව, ඒ තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායම ආගණනය කිරීම සම්බන්ධයෙන් VI වන පරිච්ඡේදයේ විධිවිධාන අදාළ විය යුතු ය;

(v) ඒ තැනැත්තාගේ බදු අය කළ හැකි ආදායම්,—

(අ) ඒ තැනැත්තා අදාළ තක්සේරු වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ වාසිකයකු වූ යම් තැනැත්තකු නම්, රුපියල් දෙලොස් දහසකට සමාන දීමනාවකින්, සහ

(ආ) අදාළ තක්සේරු වර්ෂයේ දී ඔහු විසින් 31 වන වගන්තියේ අර්ථානුකූල්ව කරන ලද යම් සුදුසුකම් ලැබීමේ ගෙවීමක එකතුව සම්බන්ධයෙන් වූ විට, ඒ වගන්තියේ විධිවිධානවලට අනුව ආගණනය කරන ලද දීමනාවක්,

අඩු කර ගැනීමෙන් පසු, ඉහත කී පරිදි ආගණනය කරනු ලැබූ ඔහුගේ තක්සේරු කළ හැකි ආදායම විය යුතු ය;

(vi) එම තැනැත්තා විසින් ගෙවනු ලැබිය යුතු අදාළ බද්ද—

(අ) එම තැනැත්තා සමාගමක් වන අවස්ථාවක, ඉහත සඳහන් පරිදි ආගණනය කරන ලද එම සමාගමේ බදු අය කළ යුතු ආදායම සහ අදාළ වර්ෂයේ දී අවස්ථාෝචිත පරිදි බෙදා දෙන ලද ලාභාංශ නැතහොත් කරන ලද ප්‍රේෂණය මත IX වන පරිච්ඡේදයෙහි නිශ්චිත අදාළ ප්‍රමාණ අනුව; සහ

(ආ) එම තැනැත්තා සමාගමක් නොවන තැනැත්තකු වන අවස්ථාවක, ඉහත සඳහන් පරිදි ආගණනය කරන ලද එම තැනැත්තාගේ බදු අය කළ යුතු ආදායම මත, පළමුවන උපලේඛනයෙහි හෝ තුන්වන උපලේඛනයෙහි දක්වා ඇති අදාළ ආදායම් බදු ප්‍රමාණ අනුව

ආගණනය කරනු ලැබිය යුතු ය.

(vii) යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු අදාළ බද්ද ආගණනය කිරීමේ කාර්යය සඳහා, මේ පනතේ යම් විධිවිධානයක් අදාළ කිරීමේ දී, ඒ තැනැත්තාගේ සම්පූර්ණ ව්‍යවස්ථාපිත ආදායමෙන් හෝ තක්සේරු කළ හැකි ආදායමෙන් යම් අඩු කිරීමකට ඒ තැනැත්තාට ඇති හිමිකම, හෝ ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු ආදායම් බදු අනුප්‍රමාණය ඒ තැනැත්තා ශ්‍රී ලංකාවේ වාසිකව සිටීම හෝ එම තැනැත්තා සම්බන්ධයෙන් ඇතැම් නියමිත කොන්දේසි සම්පූර්ණ කිරීම සැලකිල්ලට ගෙන තීරණය කළ යුතු වන අවස්ථාවක දී එම අඩු කිරීමට ඇති හිමිකම සහ ඒ බද්දේ අනුප්‍රමාණය අදාළ වර්ෂයේ දී ඒ තැනැත්තා ශ්‍රී ලංකාවේ වාසිකව හෝ ශ්‍රී ලංකාවේ නිර්වාසිකව සිටීම හා අදාළ වර්ෂයේ දී ඒ කොන්දේසි සම්පූර්ණ කිරීම සැලකිල්ලට ගෙන තීරණය කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ අර්ථානුකූලව යම් සමාගමක් 1979 මාර්තු මස 31 වන දින යෙන් අවසන් වන මුළු වර්ෂය තුළ මහජන සමාගමක් වූයේ නම් අදාළ වර්ෂය වෙනුවෙන් අදාළ බද්ද ආගණනය කිරීම සඳහා එය මහජන සමාගමක් ලෙස සලකනු ලැබිය යුතු ය;

(viii) වාර්තා හා තොරතුරු සැපයීමට අදාළ 60(1), 63(1), 65(3), 92(2), 92(3), 92(4) සහ 92(5) වන වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අයුතු ලාභ සහ ආදායම් ලබන්නා වූ යම් තැනැත්තකුට, අදාළ විය යුතු ය. තව ද

(i) අදාළ ලාභ සහ ආදායම සම්බන්ධයෙන් යම් වාර්තාවක් හෝ තොරතුරක් සැපයීම පැහැර හැරීම ඉහත සඳහන් 60, 63, 65 සහ 92 වන වගන්තිවල විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීම පැහැර හැරීමක් ලෙස, 96 හා 151 වන වගන්ති අදාළ කිරීමේ කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය; තව ද

(ii) එම අදාළ ලාභ සහ ආදායම සම්බන්ධයෙන් සපයනු ලැබූ යම් වාර්තාවක් හෝ තොරතුරක් සඳහා ඉහත සඳහන් කළ 60, 63, 65 සහ 92 වන වගන්ති යටතේ සපයනු ලැබූ වාර්තාවක් හෝ තොරතුරක් ලෙස, 124, 151 සහ 153 වන වගන්ති අදාළ කිරීමේ කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(2) යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු අදාළ බද්ද තක්සේරු කරුවකු විසින් තක්සේරු කළ යුතු අතර, තක්සේරුකරු විසින් එම තැනැත්තාට නිකුත් කරනු ලැබූ තක්සේරු දැන්වීමකින් නියම කරනු ලැබිය හැකි පරිදි, විස්සකට වැඩි නොවන වාරික ගණනකින් එම බද්ද ගෙවීමට යටත් තැනැත්තා විසින් එය ගෙවනු ලැබිය යුතු ය. එසේ වුව ද එම වාරික ගණන නියම කළ යුතු වන්නේ එම බද්දෙන් සියයට විස්සකට වැඩි නොවන ප්‍රමාණයක් 1980 මැයි මස 15 වන දින හෝ ඉන් පෙර ද එම බද්දෙන් සියයට හතළිහකට වැඩි නොවන ප්‍රමාණයක් 1981 මැයි මස 15 වන දින

හෝ ඊට පෙර ද සියයට හැටකට වැඩි නොවන ප්‍රමාණයක් 1982 මැයි මස 15 වන දින හෝ ඊට පෙර ද සියයට අසූවකට වැඩි නොවන ප්‍රමාණයක් 1983 මැයි මස 15 වන දින හෝ ඊට පෙර ද ගෙවිය යුතු වන ආකාරයට විය යුතු අතර තක්සේරු කිරීම්, අතිදේක තක්සේරු කිරීම් සහ අභියාචනාවලට අදාළ මේ පනතේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මේ පනත යටතේ ගෙවිය යුතු යම් අදාළ බද්දකට අදාළ විය යුතු ය. එසේ ගෙවනු නොලැබූ ඒ බද්දේ යම් වාරිකයක් පැහැර හැර ඇති ගෙවීමක් ලෙස 125 වන වගන්තියේ (4) වන, (5) වන, (6) වන, (7) වන, (9) වන සහ (10) වන උපවගන්තිවල විධිවිධානවලට යටත් ව සලකනු ලැබිය යුතු අතර, එම වාරිකය ගෙවිය යුතු තැනැත්තා හෝ එම වාරිකය එක් තැනැත්තකුට වඩා වැඩි තැනැත්තන් ගණනක් විසින් හෝ හවුල් ව්‍යාපාරයක් විසින් හෝ ගෙවිය යුතු වන අවස්ථාවක, ඒ එක් එක් තැනැත්තා හෝ ඒ හවුල් ව්‍යාපාරයේ එක් එක් හවුල්කරු පැහැර හරින්නකු ලෙස මේ පනතේ කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය. තව ද ඒ අනුව, ඒ තැනැත්තන්ට XXI වන පරිච්ඡේදයේ විධිවිධාන අදාළ විය යුතු ය.

(3) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවල කුමක් සඳහන් ව ඇත ද අදාළ බද්දේ යම් වාරිකයක් හෝ එහි යම් කොටසක් නොගෙවා පැහැර හැර ඇති අවස්ථාවක, ඒ පැහැර හරින්නා විසින්, පැහැර හැර ඇති බදු ප්‍රමාණයට අමතරව—

(අ) පැහැර හැර ඇති ප්‍රමාණයෙන් සියයට පහකට සමාන වූ මුදලක්; සහ

(ආ) එම පැහැර හැරීම ආරම්භ වී මාස තුනක් අවසන් වීමට පෙර එය ගෙවා නොමැති අවස්ථාවක දී, එම පැහැර හැරීම කරනු ලැබූ එක් එක් මාස තුනේ වැඩිදුර කාල සීමාව හෝ ඒ කාල සීමාවේ කොටසක් හෝ වෙනුවෙන් පැහැර හරිනු ලැබ ඇති මුදලෙන් සියයට පහකට සමාන වූ වැඩිපුර මුදලක්,

දණ්ඩනයක් වශයෙන් ගෙවිය යුතු අතර, XXI වන පරිච්ඡේදයේ විධිවිධාන ඒ අනුව අදාළ විය යුතු ය:

එසේ වුව ද—

(i) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ දණ්ඩනයක් වශයෙන් ගෙවිය යුතු මුළු මුදල, කිසිම අවස්ථාවක, පැහැර හැර ඇති බද්දෙන් සියයට විසිපහකට වඩා වැඩි නොවිය යුතු ය; තව ද

(ii) සිද්ධියේ අවස්ථාගත සියලුම කරුණු අනුව, යම් අඩුකිරීමක් හෝ අත්හැරීමක් සාධාරණ බව සහ යුක්ති සහගත බව කොමසාරිස් ජනරාල්වරයාට පෙනී යන්නේ නම්, මේ උපවගන්තිය යටතේ ගෙවිය යුතු යම් දණ්ඩනයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් අඩු කළ හැකි ය නැතහොත් අත්හැර දැමිය හැකි ය.

XXVIII වන පරිච්ඡේදය

අර්ථ නිරූපණය

අර්ථ නිරූපණය.

163. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"අත් කර ගනු ලැබූ" යන්න, දේපළ සම්බන්ධයෙන් යොදනු ලැබූ විට, මිල දී ගැනීමෙන්, ත්‍යාගයක් වශයෙන්, උරුම වීමෙන් හෝ හුවමාරු කර ගැනීමෙන් නැතහොත් වෙනත් යම් ආකාරයකින් අත්කර ගනු ලැබූ බව ඉන් අදහස් වන අතර, "අත්කර ගැනීම" යන යෙදුම ඒ අනුව අර්ථ නිරූපණය කරනු ලැබිය යුතු ය;

"සක්‍රීය හවුල්කරු" යන්න, හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් යෙදෙන විට, ඒ හවුල් ව්‍යාපාරයේ වෙළෙඳාම හෝ ව්‍යාපාරය පාලනය කිරීම, කළමනාකරණය කිරීම හෝ පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් සක්‍රීය කොටසක් ඉටු කරන හවුල්කරුවෙක් ඉන් අදහස් වේ;

"අනුයෝජිතයා" යන්න, නිර්වාසික තැනැත්තකු සම්බන්ධයෙන් හෝ නිර්වාසික තැනැත්තකු යම් හවුල්කරුවෙකු වන හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් හෝ යෙදෙන විට—

(අ) ඒ තැනැත්තාගේ හෝ හවුල් ව්‍යාපාරයේ ශ්‍රී ලංකාවේ සිටින අනුයෝජිතයා, ඇටෝර්නි බලකරු, වෙළෙඳ නියෝජිතයා, දේපළ භාරගන්නා හෝ කළමනාකරු ; සහ

(ආ) ශ්‍රී ලංකාවෙහි උද්ගතවන හෝ ශ්‍රී ලංකාවේ දී ලබා ගනු ලබන යම් ලාභ හෝ ආදායම් ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ සිටින යම් තැනැත්තකු මගින් ලබාගන්නේ ද ඒ තැනැත්තා

ඊට ඇතුළත් වේ;

"කෘෂිකාර්මික ව්‍යවසාය" යන්නෙන්, යම් කෘෂිකාර්මික නිෂ්පාදන, උද්‍යාන, විද්‍යාත්මක නිෂ්පාදන හෝ යම් සත්ව නිෂ්පාදන නිෂ්පාදනය කිරීමේ කාර්යය සඳහා වූ යම් ව්‍යවසායක් අදහස් වන අතර, එළු, ගව ආදී සතුන් හෝ කුකුළන් ඇති කිරීමේ කාර්යය සඳහා වූ යම් ව්‍යවසායක් ද ඊට ඇතුළත් වේ;

"කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද" යන්න, අර්ථ සාධක හෝ විශ්‍රාම වැටුප් අරමුදලක් සම්බන්ධයෙන් යොදනු ලැබූ විට, ඒ අරමුදල් සම්බන්ධයෙන් දායක යන්ට ඇති සම්බන්ධතා ආරක්ෂා කිරීම සහ ආදායම ආරක්ෂා කිරීම කෙරෙහි සැලකිලිමත්ව, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දැන්වීමක් මගින් කොමසාරිස් ජනරාල්

වරයා විසින් සඳහන් කරනු ලබන යම් කොන්දේසිවලට අනුකූල වන බවට කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද බව ඉන් අදහස් වේ;

"අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ" යන්න, ව්‍යවසායක් හෝ සමාගමක් හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ ආයතනයක් නැතහොත් යම් අරමුදලක් සම්බන්ධයෙන් යොදනු ලැබූ විට, ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රගතිය සඳහා අත්‍යවශ්‍ය බවට අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ බව ඉන් අදහස් වේ;

"තක්සේරු කළ හැකි ආදායම" යන්නෙන්, 29 වන වගන්තිය යටතේ යම් තැනැත්තකු හිමිකම් ලබන අඩුකිරීම්වල සමස්තය අඩුකිරීමෙන් පසු ඒ තැනැත්තාගේ සම්පූර්ණ ව්‍යවස්ථාපිත ආදායමෙහි ශේෂය අදහස් වේ;

"තක්සේරුකරු" යන්නෙන්, මේ පනත යටතේ පත් කරනු ලැබූ හෝ පත් කරනු ලැබුවේ යයි සලකනු ලබන දේශීය ආදායම් තක්සේරුකරුවක් අදහස් වේ;

"බලයලත් නියෝජිතයා" යන්නෙන්, —

(1) මේ පනතේ කාර්ය සඳහා යම් තැනැත්තකු වෙනුවෙන් ක්‍රියා කිරීමට ඒ තැනැත්තා විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබුවා වූ ද—

(අ) (i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ සාමාජිකයකු වන්නා වූ ද,

(ii) කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරනු ලැබූ ගණකාධිකාරීවරයෙක් වන්නා වූ ද,

(iii) නීතිඥවරයකු වන්නා වූ ද,

(iv) ඒ තැනැත්තා විසින් නිතිපතා සේවයෙහි නියුක්ත කරනු ලැබූ සේවා නියුක්තියකු වන්නා වූ ද,

(ආ) පුද්ගලයකු සම්බන්ධයෙන් වන විට ඔහුගේ ඥාතියකු වන්නා වූ ද;

(ඇ) සමාගමක් සම්බන්ධයෙන් වන විට, ඒ සමාගමේ අධ්‍යක්ෂවරයකු හෝ ලේකම් වරයා වන්නා වූ ද;

(ඈ) හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන විට, ඒ හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවකු වන්නා වූ ද;

(ඉ) පුද්ගල මණ්ඩලයක් සම්බන්ධයෙන් වන විට, ඒ පුද්ගල මණ්ඩලයේ සාමාජිකයකු වන්නා වූ; නැතහොත්

(2) බලය දීමේ ලියවිල්ලෙහි සඳහන් තක්සේරු වර්ෂයට අදාළ කාරණා සම්බන්ධයෙන් මේ පනතේ කාර්ය සඳහා තමා වෙනුවෙන් ක්‍රියා කිරීම පිණිස යම් තැනැත්තකු විසින් කලින් කල ලියවිල්ලකින් බලය දෙනු ලැබූ සහ සමාගම් (විගණක) නියෝගයටතේ විගණකවරයකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබූ පුද්ගලයකුව කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරනු ලැබුවා වූ ද

යම් පුද්ගලයෙක් අදහස් වේ;

"බැංකුකරු" යන්නෙන්, බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යන යම් සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් හෝ අදහස් වේ;

"පුද්ගල මණ්ඩලය" යන්නට, පළාත් පාලන ආයතනයක් හෝ රාජ්‍ය අධිකාරයක්, යම් සංස්ථාගත මණ්ඩලයක් හෝ විද්‍යායතනයක්, යම් සහෝදරත්වයක්, මිත්‍ර සංගමයක්, සංගමයක් හෝ සංස්ථාගත කරන ලද හෝ සංස්ථාගත නොකරන ලද තැනැත්තන්ගේ සමිතියක් සහ යම් ඒකාබද්ධ හින්දු පවුලක් ද ඇතුළත් වන නමුත් සමාගමක් හෝ හවුල් ව්‍යාපාරයක් ඊට ඇතුළත් නොවේ;

"ව්‍යාපාරය" යන්නට, කෘෂිකාර්මික ව්‍යවසායක්, තුරඟ තරඟ පැවැත්වීම සහ සමාගමක් විසින් වාණිජමය ස්ථාන කුලියට දීම ඇතුළත් වේ;

"ලංකා සංචාරක මණ්ඩලය" යන්නෙන්, 1966 අංක 10 දරන ලංකා සංචාරක මණ්ඩල පනතින් පිහිටුවන ලද ලංකා සංචාරක මණ්ඩලය අදහස් වේ;

"පුණ්‍යායතනය" යන්නෙන්, පුණ්‍ය කාර්යයක් සඳහා පමණක් පිහිටුවනු ලැබූ හෝ හුදෙක් පුණ්‍ය කාර්යයක් කර ගෙන යාමෙහි ලා යෙදී සිටින භාරයක භාරකරුවකු හෝ භාර කරුවන් නැතහොත් සංස්ථාවක් හෝ සංස්ථාගත නොකරන ලද පුද්ගල මණ්ඩලයක් අදහස් වේ;

"පුණ්‍ය කාර්යය" යන්නෙන්, ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර මහජනයාගේ හෝ මහජනයාගෙන් කොටසක යහපත සඳහා වූ පහත දැක්වෙන කාර්ය වර්ග අතුරින් යම් කාර්ය වර්ගයක් අදහස් වේ:—

(අ) දරිද්‍රතාවට සහනය දීම;

(ආ) අධ්‍යාපනය හෝ දැනුම දියුණු කිරීම;

(ඇ) ආගම දියුණු කිරීම හෝ ආගමික චාරිත්‍ර හා පිළිවෙත් පවත්වාගෙන යාම හෝ පොදු පූජනීය ස්ථානයක් පරිපාලනය කිරීම;

(ඈ) ඉහතින් වූ වර්ග අතුරින් කිසිවකට අයත් නොවන්නා වූ ද මනුෂ්‍ය වර්ගයාට ප්‍රයෝජනවත් වූ හෝ ඔවුන්ගේ යහපත සඳහා වූ වෙනත් යම් කාර්යයක්;

"දරුවා" යන්න, මේ පනත අදාළ වන පුද්ගලයකු සම්බන්ධයෙන් යෙදෙන විට වයස අවුරුදු දහ අටට අඩු දරුවකු ඉන් අදහස් වන අතර, ඒ පුද්ගලයා විසින් ලමයින් දරුකමට හදා ගැනීමේ ආඥාපනත යටතේ දරුකමට හදා ගනු ලැබූ දරුවකු ද ඒ පුද්ගලයා ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන අවස්ථාවක, ඔහු යටත් වැසියකු හෝ පුරවැසියකු වන්නේ යම් රටක ද ඒ රටෙහි නීතිය අනුව ඔහු විසින් දරුකමට හදා ගනු ලැබූ දරුවකු ද ඊට ඇතුළත් වන නමුත්—

(i) වෙනත් යම් නීතියක් යටතේ දරුකමට හදාගනු ලැබූ යම් දරුවකු,

(ii) විවාහක දරුවකු,

(iii) අවජාත දරුවකු

ඊට ඇතුළත් නොවේ;

"කොමසාරිස් ජනරාල්වරයා" යන්නෙන්, මේ පනත යටතේ පත් කරනු ලැබූ හෝ පත් කරනු ලැබූ ලෙස සලකනු ලබන දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා අදහස් වන අතර, කොමසාරිස් ජනරාල්වරයා වෙනුවෙන් සාමාන්‍යයෙන් හෝ යම් විශේෂ කාර්යයක් සඳහා හෝ ක්‍රියා කිරීමට ඔහු විසින් විශේෂයෙන් බලය දෙනු ලැබූ කොමසාරිස්වරයෙක් සහ නියෝජ්‍ය කොමසාරිස්වරයෙක් ද ඊට ඇතුළත් වේ;

"සමාගම" යන්නෙන්, ශ්‍රී ලංකාවේ හෝ අන්කිසි තැනක හෝ බලපවත්නා යම් නීතියක් යටතේ සංස්ථාගත කරනු ලැබූ හෝ ලියාපදිංචි කරනු ලැබූ යම් සමාගමක් අදහස් වන අතර, යම් රාජ්‍ය සංස්ථාවක් ද ඊට ඇතුළත් වේ;

"විනිමය පාලක" යන්නෙන්, ශ්‍රී ලංකා මහ බැංකුවේ විනිමය පාලක දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා ලෙස නාමෝද්දිෂ්ඨ කරනු ලැබූ නිලධරයා අදහස් වේ;

"නියෝජ්‍ය කොමසාරිස්වරයා" යන්නෙන්, මේ පනත යටතේ පත් කරනු ලැබූ හෝ පත් කරනු ලැබූ ලෙස සලකනු ලබන දේශීය ආදායම් නියෝජ්‍ය කොමසාරිස්වරයෙක් අදහස් වේ;

"ලාභාංශය" යන්නට—

(අ) සමාගමක් විසින් ස්වකීය කොටස්කරුවන්ට දෙනු ලබන—

(i) මුදල් හෝ මුදල් ගෙවීම සඳහා වූ ඇණවුමක්; හෝ

(ii) වෙනත් යම් සමාගමක කොටස්; හෝ

(iii) ඒ සමාගමේ හෝ වෙනත් යම් සමාගමක ණය පත්‍ර

ස්වරූපයෙන් වූ යම් ලාභ බෙදා දීමක් ද

(ආ) යම් ප්‍රාග්ධනයක මුදල් ආපසු දෙන ලද හෝ බෙදා දෙන ලද දිනයට ඉහතින් වූ අවුරුදු හය ඇතුළත සමාගම විසින් ස්වකීය කොටස්කරුවන්ට බෙදා දෙන ලද යම් කොටස්වල, සමාගමේ මුළු ලාභ ප්‍රමාණය හෝ එයින් යම් කොටසක් ප්‍රාග්ධනය බවට හැරවීම දක්වන ගෙවා නිමි අගයෙහි ප්‍රමාණයට ආපසු දෙන ලද හෝ බෙදා දෙන ලද යම් ප්‍රාග්ධන මුදලක් ද

ඇතුළත් වේ;

"ත්‍යාගලාභියා" යන්නෙන්, තෑගි කිරීමක් යටතේ යම් දේපළක් අත්කර ගත් යම් තැනැත්තකු අදහස් වන අතර, යම් තැනැත්තකුගේ අර්ථලාභය සඳහා භාරකරුවකුට ත්‍යාග යක් දෙනු ලැබූ අවස්ථාවක භාරකරු හා අර්ථලාභියා යන දෙදෙනාම එයට ඇතුළත් වෙති;

"ත්‍යාගදායකයා" යන්නෙන්, ත්‍යාගයක් කරන යම් තැනැත්තෙක් අදහස් වේ;

"**විධායක නිලධරයා**" **යන්නෙන්, සමාගමක හෝ සංස්ථාවක්** අධ්‍යක්ෂවරයෙක් හෝ (සියලු දීමනා ඇතුළුව) රුපියල් එක් දහසකට අඩු නොවන මාසික පඩිනඩි ලබන යම් වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රක්ෂාවක නියුක්ත යම් සේවා නියුක්තයෙක් අදහස් වේ;

"පොල්මෑකරු" යන්නෙන්, මිය ගිය තැනැත්තකුගේ පොල්මෑ කරු හෝ අද්මිනිස්ත්‍රාසිකරු අදහස් වන අතර—

(අ) මියගිය තැනැත්තකුගේ දේපළවල සන්තකය ලබා ගන්නා හෝ ඒ සම්බන්ධයෙන් මැදිහත් වන යම් තැනැත්තෙක්;

(ආ) මියගිය තැනැත්තකුගේ බුදලය සම්බන්ධයෙන් ප්‍රොබේට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය ප්‍රදානය කිරීම හෝ නැවත මුද්‍රා තැබීම සඳහා දිසා අධිකරණයකට ඉල්ලුම් කර ඇති හෝ ඉල්ලුම් කිරීමට හිමිකම ඇති යම් තැනැත්තෙක්; හෝ

(ඇ) භාරය පිහිටුවන තැනැත්තාගේ අන්තිම කැමති පත්‍රයෙන් පිහිටුවනු ලැබූ භාරයක් යටතේ ක්‍රියා කරන භාරකරුවෙක්

එයට ඇතුළත් වේ;

"විදේශීය ව්‍යවහාර මුදල්" යන්නෙහි, විනිමය පාලන පනතෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය;

"මැණික්" යන්නෙහි, 1971 අංක 13 දරන රාජ්‍ය මැණික් සංස්ථා පනතෙහි ඊටදී ඇති අර්ථය ම ඇත්තේ ය;

"ත්‍යාගය" යන්නෙන්, 52 වන වගන්තියේ අර්ථානුකූල වූ ත්‍යාග යක් අදහස් වේ;

"ආණ්ඩුවේ ආයතනය" යන්නෙන්, ශ්‍රී ලංකා ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක් හෝ ව්‍යවසායක් අදහස් වේ;

"**අශක්‍යතාවට පත් තැනැත්තා**" **යන්නෙන්, යම් බාලවයස් කරුවෙක්, උම්මත්තකයෙක්, මුග්ධයෙක් හෝ සිහිවිකල් තැනැත්තෙක්** අදහස් වේ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, යම් මහ නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වන අතර, යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම්කිසි නීතියකින් හෝ නීතියක් යටතේ හෝ පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරයක් ඊට ඇතුළත් වේ;

"වෙළෙඳ අගය" යන්නෙන්, එය යම් දේපලක් හා යම් දිනයක් සම්බන්ධයෙන් යෙදෙන විට විවෘත වෙළෙඳ පොළක දී, ඒ දිනයෙහි දී ඒ දේපල සඳහා තක්සේරුකරුගේ මතය අනුව ලබාගත හැකි මිල ඉන් අදහස් වේ;

"ශුද්ධ ධනය" යන්නෙන්, 47 වන වගන්තියේ අර්ථානුකූල වූ ශුද්ධ ධනය අදහස් වේ;

"නිර්වාසික" හෝ "නේවාසික නොවන" යන්නෙන්, 67 වන වගන්තියේ අර්ථානුකූලව ශ්‍රී ලංකාවේ වාසික නොවූ බව අදහස් වේ;

"අසිනිකරු" යන්න, ඉඩමක් හා එහි වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් යෙදෙන විට, බිම් බද්දකට හෝ වෙනත් වාර්ෂික ගාස්තුවකට යටත්ව ඒ ඉඩම වැඩි දියුණු කිරීම භුක්ති විඳින තැනැත්තෙක් ඉන් අදහස් වේ;

"**තැනැත්තා**" යන්නට, සමාගමක්, පුද්ගල මණ්ඩලයක් හෝ යම් ආණ්ඩුවක් ඇතුළත් වේ;

"ප්‍රමුඛ හවුල්කරු" යන්නෙන්, ශ්‍රී ලංකාවේ පදිංචිව සිටින සක්‍රිය හවුල්කරුවන් අතුරින්—

(අ) හවුල් ව්‍යාපාර ගිවිසුමේ පළමුවෙන් නම් කොට ඇති; හෝ

(ආ) එවැනි ගිවිසුමක් නොමැති නම්, හවුල් ව්‍යාපාර හෝ සාමාන්‍ය නාමයෙන් තනිව ම හෝ අනික් හවුල්කරුවන්ට ප්‍රමුඛව නමින් හෝ මූලකුරුවලින් සඳහන් කොට ඇති; හෝ

(ඇ) ව්‍යාපාර නාම ආඥාපනතේ 4 වන වගන්තිය යටතේ කරනු ලැබූ ප්‍රකාශනයෙහි පළමුවෙන් නම් කොට ඇති

හවුල්කරු අදහස් වේ;

"නියමිත" යන්නෙන්, මේ පනත යටතේ සාදනු ලැබූ නියෝගවලින් නියමිත බව අදහස් වේ;

"ලාභ" හෝ "ආදායම" යන්නෙන්, යම් කාලසීමාවක දී කවර හෝ ප්‍රභවයකින් ලැබෙන, මේ පනතේ විධිවිධානවලට අනුකූලව ආගණනය කරනු ලැබූ ශුද්ධ ලාභ හෝ ආදායම අදහස් වේ;

"දේපළ" යන්නට, යම් චංචල හෝ නිශ්චල දේපළක යම් සම්බන්ධතාවයක් ද ඇතුළත් වේ;

"වරිපනම්" යන්නෙන්, දේපළ වෙනුවෙන් යම් පළාත් පාලන ආයතනයක් විසින් නියම කරනු ලැබූ යම් බදු අදහස් වේ;

"භාරගැනුම්කරු" යන්නට, යම් ඇවරකරුවකු ද යම් පැවරුම්ලාභියකු, භාරකරුවකු හෝ වස්තුභංගත්වයට හෝ බංකොලොත් භාවයට පත්වීමේ හේතුවෙන් යම් තැනැත්තකුගේ දේපළවල සන්තකය හෝ පාලනය සතුව සිටින වෙනත් තැනැත්තකු ද ඇතුළත් වෙති;

"පරිපාලිත අර්ථසාධක අරමුදල" යන්නෙන්—

(අ) ස්වකීය ලාභ හා ආදායම යම් ලිඛිත නීතියක් යටතේ ආදායම් බද්දෙන් නිදහස් කරන ලද සංස්ථාවක් විසින් පිහිටුවනු ලැබූ, සහ

(ආ) ඒ සංස්ථාව සංස්ථාපනය කරනු ලැබූ ලිඛිත නීතිය යටතේ පරිපාලිත කොට පවත්වනු ලබන

යම් අර්ථසාධක අරමුදලක් අදහස් වේ;

"වාසික" හෝ "ශ්‍රී ලංකාවේ වාසික" යන්නෙන්, 67 වන වගන්තියෙහි අර්ථානුකූලව ශ්‍රී ලංකාවේ පදිංචිව සිටින බව අදහස් වේ;

"කොටස්කරු" යන්නට, සමාගමක ප්‍රාග්ධනය කොටස්වලට බෙදනු ලැබුව ද නොලැබුව ද ඒ සමාගමේ ප්‍රාග්ධනයෙහි හෝ ලාභවල හෝ ආදායමෙහි කොටසක් හෝ එහි ලා සම්බන්ධතාවක් හෝ ඇති ඒ සමාගමේ යම් සාමාජිකයෙක් ඇතුළත් වේ; තව ද

"කොටස" යන්නට, සමාගමක ප්‍රාග්ධනයෙහි හෝ ලාභවල හෝ ආදායමෙහි යම් සම්බන්ධතාවක් ඇතුළත් වේ;

"රාජ්‍ය මැණික් සංස්ථාව" යන්නෙන්, 1971 අංක 13 දරන රාජ්‍ය මැණික් සංස්ථා පනතින් පිහිටුවනු ලැබූ රාජ්‍ය මැණික් සංස්ථාව අදහස් වේ;

"ව්‍යවස්ථාපිත ආදායම" යන්නෙන්, 25 වන වගන්තිය අනුව ආගණනය කරනු ලැබූ කවර හෝ ප්‍රභවයකින් ලැබුණු ආදායම අදහස් වේ;

"බදු අය කළ හැකි ආදායම" යන්නෙන්, 30 වන වගන්තිය යටතේ යම් තැනැත්තකු හිමිකම් ලබන දීමනාවල සමස්තය අඩු කිරීමෙන් පසුව ඒ තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායමේ ශේෂය අදහස් වේ;

"වෙළෙඳාම" යන්නට, සෑම වෙළෙඳාමක් හා නිෂ්පාදනයක් ද වෙළෙඳ ස්වභාවය ඇති සෑම ප්‍රයත්නයක් හා ආයතන යක් ද ඇතුළත් වේ;

"දේපළ පැවරීම" යන්නෙන්, යම් බැහැර කිරීමක්, සමර්පණය කිරීමක්, වෙන් කර පැවරීමක්, නිරවුල් කිරීමක්, භාර දීමක්, ගෙවීමක් හෝ වෙනත් අන්දමකින් දේපළ අන්සතු කිරීමක් අදහස් වන අතර—

(අ) දේපළ සම්බන්ධයෙන් භාරයක් ඇති කිරීම, සහ

(ආ) යම් දේපළක යම් සම්බන්ධතාවක් ප්‍රදානය කිරීම හෝ ඇති කිරීම ද

එයට ඇතුළත් වේ;

"භාරකරු" යන්නට, යම් භාරකරුවෙක්, ආරක්ෂකයෙක්, දේපළ ආරක්ෂකයෙක්, කළමනාකරුවෙක් හෝ යම් තැනැත්තෙක් වෙනුවෙන් යම් දේපළක සංවිධානය, පාලනය හෝ කළමනාකරණය සතුව ඇති වෙනත් තැනැත්තෙක් ඇතුළත් වන නමුත් පොල්මෑකරුවෙක් ඊට ඇතුළත් නොවේ;

"ධනය" යන්නෙන්, 43 වන වගන්තියේ අර්ථානුකූලව වූ ධනය අදහස් වේ;

"ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමතය ඇතිව" යන්න, ගිණුමක් ආරම්භ කිරීම හෝ ආයෝජනයක් කිරීම සම්බන්ධයෙන් යොදනු ලැබූ විට, ඒ ගිණුම ආරම්භ කිරීම හෝ ඒ ආයෝජ නය කිරීම ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රගතිය සඳහා අත්‍යවශ්‍ය වන හෙයින් ඒ සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමතය ඇතිව බව ඉන් අදහස් වේ;

"තක්සේරු වර්ෂය" යන්නෙන්, යම් වර්ෂයක අප්‍රේල් මස පළමුවන දිනයෙන් ආරම්භ වී ඉක්බිතිව ම එළඹෙන වර්ෂ යේ මාර්තු මස තිස්එක් වන දිනයෙන් අවසන් වන මාස දොළහක කාලපරිච්ඡේදය අදහස් වේ;

"තක්සේරු වර්ෂයකට ඉහතින් වූ වර්ෂය" යන්නෙන්, තක් සේරු වර්ෂයකට පෙරාතුව ම වූ මාර්තු මස තිස් එක් වන දිනයෙන් අවසන් වන මාස දොළහක කාල පරිච්ඡේදය අදහස් වේ.

XXIX වන පරිච්ඡේදය

1963 අංක 4 දරන දේශීය ආදායම් පනත අදාළ කිරීම

1963 අංක 4 දරන දේශීය ආදායම් පනත අදාළ කිරීම.

164. 1963 අංක 4 දරන දේශීය ආදායම් පනත—

(අ) 1979 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා තැනැත්තකු යටත් වන්නේ යම් ආදායම් බද්දකට ද නැතහොත් ධන බද්දකට ද ඒ ආදායම් බද්දට හෝ ධන බද්දට, සහ

(ආ) 1980 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා තැනැත්තකු යටත් වන්නේ යම් ත්‍යාග බද්දකට ද ඒ ත්‍යාග බද්දට

(32 වන වගන්තිය)

පළමු වන උපලේඛනය

ආදායම් බද්දෙහි අනු ප්‍රමාණය—යම් දේපළ භාරගන්නන්, භාරකරුවන්, පොල්මෑකරුවන් හෝ ඇවරකරුවන් නොවන පුද්ගලයන්

	බද්දෙහි අනු ප්‍රමාණය
බදු අය කළ හැකි ආදායමෙහි පළමු වන රු. 4,800 සම්බන්ධයෙන් සියයට	7½
බදු අය කළ හැකි ආදායමෙහි ඊළඟ රු. 4,800 සම්බන්ධයෙන් සියයට	10
බදු අය කළ හැකි ආදායමෙහි ඊළඟ රු. 4,800 සම්බන්ධයෙන් සියයට	15
බදු අය කළ හැකි ආදායමෙහි ඊළඟ රු. 4,800 සම්බන්ධයෙන් සියයට	20
බදු අය කළ හැකි ආදායමෙහි ඊළඟ රු. 4,800 සම්බන්ධයෙන් සියයට	25
බදු අය කළ හැකි ආදායමෙහි ඊළඟ රු. 4,800 සම්බන්ධයෙන් සියයට	30
බදු අය කළ හැකි ආදායමෙහි ඊළඟ රු. 4,800 සම්බන්ධයෙන් සියයට	35
බදු අය කළ හැකි ආදායමෙහි ඊළඟ රු. 4,800 සම්බන්ධයෙන් සියයට	40
බදු අය කළ හැකි ආදායමෙහි ඊළඟ රු. 7,200 සම්බන්ධයෙන් සියයට	45
බදු අය කළ හැකි ආදායමෙහි ඊළඟ රු. 7,200 සම්බන්ධයෙන් සියයට	50
බදු අය කළ හැකි ආදායමෙහි ඊළඟ රු. 7,200 සම්බන්ධයෙන් සියයට	55
බදු අය කළ හැකි ආදායමෙහි ඊළඟ රු. 7,200 සම්බන්ධයෙන් සියයට	60
බදු අය කළ හැකි ආදායමෙහි ඊළඟ රු. 7,200 සම්බන්ධයෙන් සියයට	65
බදු අය කළ හැකි ආදායමෙහි ඉතිරි කොටස සම්බන්ධයෙන් සියයට	70

(33 වන වගන්තිය)

දෙවන උපලේඛනය

ආදායම් බද්දෙහි අනු ප්‍රමාණය—සමාගම්

I වන කොටස

II වන කොටසෙහි හෝ III වන කොටසෙහි සඳහන් සමාගමක් නොවන ශ්‍රී ලංකාවේ වාසික සමාගමක්

ශ්‍රී ලංකාවේ වාසික සමාගමක බදු අය කළ හැකි ආදායම සම්බන්ධයෙන් සියයට	50

II වන කොටස

නිකුත් කරන ලද ප්‍රාග්ධනය රු. 500,000 නොඉක්මවන ශ්‍රී ලංකාවේ වාසික සමාගමක්

සමාගමේ බදු අය කළ හැකි ආදායමෙහි පළමුවන රු. 50,000 සම්බන්ධයෙන් සියයට	20
සමාගමේ බදු අය කළ හැකි ආදායමෙහි ඊළඟ රු. 1,00,000 සම්බන්ධයෙන් සියයට	30
සමාගමේ බදු අය කළ හැකි ආදායමෙහි ඉතිරි කොටස සම්බන්ධයෙන් සියයට	40

III වන කොටස

මහජන සමාගමක්—

මහජන සමාගමක බදු අය කළ හැකි ආදායම සම්බන්ධයෙන් සියයට	40

IV වන කොටස

ශ්‍රී ලංකාවෙහි වාසික නොවන සමාගමක්—

ශ්‍රී ලංකාවෙහි වාසික නොවන සමාගමක බදු අය කළ හැකි ආදායම සම්බන්ධයෙන් සියයට	50

(32 වන වගන්තිය)

තුන්වන උපලේඛනය

ආදායම් බද්දෙහි අනු ප්‍රමාණය—පළමුවන උපලේඛනය අදාළ වන පුද්ගලයන් සහ සමාගම් නොවන වෙනත් කැනැත්තන්

1. ඒකාබද්ධ හින්දු පවුල්—

බදු අය කළ හැකි ආදායමෙහි පළමුවන රු. 25,000 සම්බන්ධයෙන් සියයට	30
බදු අය කළ හැකි ආදායමෙහි ඊළඟ රු. 25,000 සම්බන්ධයෙන් සියයට	40
බදු අය කළ හැකි ආදායමෙහි ඊළඟ රු. 25,000 සම්බන්ධයෙන් සියයට	50
බදු අය කළ හැකි ආදායමෙහි ඊළඟ රු. 25,000 සම්බන්ධයෙන් සියයට	60
බදු අය කළ හැකි ආදායමෙහි ඉතිරි කොටස සම්බන්ධයෙන් සියයට	70

2. පුණ්‍යායතන—

පුණ්‍යායතන වල බදු අය කළ හැකි ආදායම ... ... සියයට 20

3. (අන්තිම කැමති පත්‍ර යටතේ භාරකරුවන් නොවන) පොල්මෑකරුවන් සහ (ඇවරකරුවන් නොවන) දේපළ භාරගන්නෝ—

(අන්තිම කැමති පත්‍ර යටතේ භාරකරුවන් නොවන) පොල්මෑ කරුවන් ගේ සහ (ඇවරකරුවන් නොවන) දේපළ භාරගන්නන්ගේ බදු අය කළ හැකි ආදායම සියයට 30

4. (අන්තිම කැමති පත්‍රය යටතේ භාරකරුවන් ඇතුළුව) භාරකරුවෝ—

(අ) භාරය 1978 නොවැම්බර් මස 15 වන දිනට පෙර පිහිටුවනු ලැබූ අවස්ථාවක සියයට 50

(ආ) භාරය 1978 නොවැම්බර් මස 15 වන දින හෝ ඉන් පසු ව පිහිටුවනු ලැබූ අවස්ථාවික සියයට 70

5. භවුල් ව්‍යාපාර—

භවුල් ව්‍යාපාරයක බදු අය කළ හැකි ආදායම ... සියයට 50

6. ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමූපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කරන ලද හෝ ලියා පදිංචි කරන ලදැයි සලකනු ලබන සමූපකාර සමිති—

සමූපකාර සමිතියක බදු අය කළ හැකි ආදායම සියයට 35

7. අන්‍යෝන්‍ය ජීවිත රක්ෂණ සමාගම්—

අන්‍යෝන්‍ය ජීවිත රක්ෂණ සමාගම්වල බදු අය කළ හැකි ආදායම සියයට ... 20

8. සමාගම්වල ඇවරකරුවෝ—

සමාගමක ඇවරකරුවන්ගේ බදු අය කළ හැකි ආදායම—අදාළ සමාගම සම්බන්ධයෙන් අය කළ හැකි බද්දෙහි අනු ප්‍රමාණය

9. (ශ්‍රී ලංකා ආණ්ඩුව සහ එක්සත් රාජධානියේ ආණ්ඩුව නොවන) ආණ්ඩු—

ශ්‍රී ලංකා ආණ්ඩුව සහ එක්සත් රාජධානියේ ආණ්ඩුව නොවන වෙනත් ආණ්ඩුවල බදු අය කළ හැකි ආදායම ... ... සියයට ... 55

10. රාජ්‍ය සංස්ථා— ... ... සියයට ... 50

11. 1971 අංක 35 දරන වෙළෙඳ ව්‍යාපාර (අත්කර ගැනීමේ) පනත යටතේ ආණ්ඩුව සතු කරනු ලැබූ වෙළෙඳ ව්‍යාපාර— ... ... සියයට ... 50

12. (ඉහත සඳහන් සහ පළමුවන හා දෙවන උපලේඛනයන්හි සඳහන් කැනැත්තන් නොවන) කැනැත්තෝ— සියයට ... 20

හතරවන උපලේඛනය (41 වන වගන්තිය)

ධන බද්දෙහි අනු ප්‍රමාණ

1. පුණ්‍යායතනයක් හෝ ශ්‍රී ලංකාවේ නිශ්චල දේපළ ඇති නිර්වාසික සමාගමක් හෝ නොවන යම් කැනැත්තකු සම්බන්ධයෙන් වූ විට—

බදු අය කළ හැකි ධනයෙහි පළමුවන රු. 2,00,000 සම්බන්ධයෙන්	සියයට ... 1/2
බදු අය කළ හැකි ධනයෙහි ඊළඟ රු. 5,00,000 සම්බන්ධයෙන්	සියයට ... 3/4
බදු අය කළ හැකි ධනයෙහි ඊළඟ රු. 10,00,000 සම්බන්ධයෙන්	සියයට ... 1
බදු අය කළ හැකි සියලුම ධනයෙහි ඉතිරි මුකාටස සම්බන්ධයෙන්	සියයට ... 2

2. පුණ්‍යායතනයක් සම්බන්ධයෙන් වූ විට—
බදු අය කළ හැකි සියලුම ධනය සම්බන්ධයෙන් සියයට ... $\frac{1}{2}$

3. ශ්‍රී ලංකාවේ නිශ්චල දේපළ ඇති නිර්වාසික සමාගමක් සම්බන්ධයෙන් වූ විට—
බදු අය කළ හැකි සියලුම ධනය සම්බන්ධයෙන් සියයට ... 1

(61 වන වගන්තිය)

පස් වන උපලේඛනය

ත්‍යාග බද්දෙහි අනු ප්‍රමාණ

1. පුද්ගලයන් සම්බන්ධයෙන් වන විට—
බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි පළමුවන රු. 50, 000 සම්බන්ධයෙන් ... ... කිසිවක් නැත
බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඊළඟ රු. 1,00,000 සම්බන්ධයෙන් ... ... සියයට ... 5
බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඊළඟ රු. 1,00,000 සම්බන්ධයෙන් ... ... සියයට ... 10
බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඊළඟ රු. 1,00,000 සම්බන්ධයෙන් ... ... සියයට ... 15
බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඊළඟ රු. 1,00,000 සම්බන්ධයෙන් ... ... සියයට ... 20
බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඊළඟ රු. 1,00,000 සම්බන්ධයෙන් ... ... සියයට ... 25
බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඊළඟ රු. 2,00,000 සම්බන්ධයෙන් ... ... සියයට ... 30
බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඊළඟ රු. 2,00,000 සම්බන්ධයෙන් ... ... සියයට ... 35
බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඊළඟ රු. 2,00,000 සම්බන්ධයෙන් ... ... සියයට ... 40
බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඊළඟ රු. 2,00,000 සම්බන්ධයෙන් ... ... සියයට ... 45
බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඊළඟ රු. 2,00,000 සම්බන්ධයෙන් ... ... සියයට ... 50
බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඊළඟ රු. 5,00,000 සම්බන්ධයෙන් ... ... සියයට ... 55
බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඊළඟ රු. 5,00,000 සම්බන්ධයෙන් ... ... සියයට ... 60
බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඉතිරි කොටස සම්බන්ධයෙන් සියයට ... 70

2. සමාගම් සම්බන්ධයෙන් වන විට—
බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙන් ... සියයට ... 50

(81 වන වගන්තිය)

හය වන උපලේඛනය

ශ්‍රී ලංකාවෙන් පිටත යම් කැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයකට ගෙවනු ලැබූ හෝ බැර කරනු ලැබූ පොළී, ගෙවල් කුලී, බිම් කුලී, රාජ්‍ය භාග හෝ වාර්ෂික සම්බන්ධයෙන් ආදායම් බද්ද අඩුකිරීමේ අනු ප්‍රමාණය

ශ්‍රී ලංකාවෙන් පිටත යම් කැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයකට ගෙවනු ලැබූ හෝ බැර කරනු ලැබූ පොළී, ගෙවල් කුලී, බිම් කුලී, රාජ්‍ය භාග හෝ වාර්ෂික සම්බන්ධයෙන් ආදායම් බද්ද අඩුකිරීමේ අනු ප්‍රමාණය ... සියයට ... $33\frac{1}{3}$